Sri Lanka Library Association

PRATHIRAWA

VOL. 4 | 2026



PRATHIRAWA VOL.4, 2026

ISSN 2950-7278

Editor

Mrs. M. K. G. Yanika Nandasena

© Disclaimer Notice

මෙම සඟරාවේ අන්තර්ගතය තුළ ප්‍රකාශ වන අදහස් තනිකරම කතුවරුන් සතු වන අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය කිසිදු වගකීමක් නොදරයි.

உள்ளடக்கத்தில்வெளிப்படுத்தப்படும் பிப்பிராயங்களுக்கு ஆசிரியர்களே பொறுப்பாவர். இலங்கை நூலகச் சங்கம் உள்ளடக்கத்தின் எந்தவொரு அபிப்பிராயங்களுக்கும் பொறுப்புடையதல்ல.

The opinions expressed within the content are solely the author's and the Sri Lanka Library Association does not hold any responsibility over the opinions.

Publisher
Sri Lanka Library Association
275/75, OPA Centre
Stanley Wijesundara Mawatha
Colombo 07
Sri Lanka
Email: slla@sltnet.lk, sllaoffice@gmail.com
Telephone: 0112589103

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිතුමාගේ පණිවිඩය



දැනුමෙන් පිරිපුන්, බුද්ධිමත් හා නිර්මාණශීලී සමාජයක් ගොඩනැඟීමේදී පුස්තකාල හා තොරතුරු සේවාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. කියවීමේ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමල දැනුමට ප්‍රවේශ වීමේ අවස්ථා පුළුල් කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීම සඳහා ජනතාව යොමු කිරීම තුළින් පුස්තකාල සමාජ සංවර්ධනයට සෘජුවම දායක වේ. එබැවින් පුස්තකාලය යනු පොත්පත් ගබඩා කරන ස්ථානයක් පමණක් නොවල දැනුම නිර්මාණය වනල බෙදාහදා ගන්නා සහ අනාගතය හැඩගස්වන වැදගත් සමාජ ආයතනයකි.

වර්තමානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය ද විශාල පරිවර්තනයකට ලක්වෙමින් පවතී. ඩිජිටල් සම්පත්, කෘත්‍රිම බුද්ධිය, ස්වයංක්‍රීයකරණය, සහ නවීන තොරතුරු කළමනාකරණ ක්‍රමවේදයන් හඳුන්වා දීම තුළින් පුස්තකාල සේවාව වඩාත් කාර්යක්ෂම හා පරිශීලක කේන්ද්‍රීය සේවාවක් බවට පත් කිරීමේ අවස්ථා උදා වී තිබේ. මෙම වෙනස්කම් සමඟ ඉදිරියට යාමට නම් පුස්තකාල වෘත්තිකයන් නව දැනුම, තාක්ෂණික නිපුණතා සහ වෘත්තීය ආචාරධර්මවලින් සන්නද්ධ වීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයල මෙරට පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපනය සහ ප්‍රගතිය වෙනුවෙන් දිගුකාලීනව කටයුතු කරන ප්‍රමුඛ වෘත්තීය සංවිධානයකි. පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීමල වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීමල පර්යේෂණ හා දැනුම භුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ නව තාක්ෂණය සමඟ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යාම අපගේ ප්‍රධාන අරමුණු අතර වේ. එසේම නාගරික හා ග්‍රාමීය ප්‍රජාවන් ඇතුළු සියලුම ජනකොටස් සඳහා දැනුමට හා තොරතුරුවලට සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම ද අපගේ වගකීමකි.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංගමයේ සියලුම සාමාජිකයන්ගේ සහයෝගයල කැපවීම හා සක්‍රීය දායකත්වය අතිශයින් වැදගත් වේ. පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත්, වෘත්තීය ගැටලු සඳහා සාමූහික විසඳුම් සෙවීමටත්, නව පරපුරේ පුස්තකාල වෘත්තිකයන් දිරිමත් කිරීමටත් අප සියලු දෙනා එක්ව කටයුතු කළ යුතුය. ඒ සඳහා වෘත්තීය සමගිය, අන්‍යෝන්‍ය ගෞරවය, විනිවිදභාවය සහ නව අදහස් පිළිගැනීම මූලික කරගත් ක්‍රියාකාරී පරිසරයක් ගොඩනැඟීම මගේ අපේක්ෂාවයි.

මෙවන් පසුබිමක ප්‍රතිරාව සඟරාව පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ නව අදහස්, අත්දැකීම් සහ වෘත්තීය දැනුම පාඨකයන් වෙත ගෙන යන වැදගත් ප්‍රකාශනයක් ලෙස මම අගය කරමි. මෙවැනි ප්‍රකාශන තුළින් දැනුම භුවමාරු කර ගැනීමටත්ල වෘත්තීය සංවාදය ශක්තිමත් කිරීමටත්ල ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ අවබෝධය පුළුල් කිරීමටත් හැකි වේ. මෙම සඟරාවේ ප්‍රගතිය වෙනුවෙන් දායක වන එහි සංස්කාරකතුමියටත් ලේඛකයන්ට සහ අනෙකුත් සියලු දෙනාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

අනාගතයේ අභියෝග ජය ගනිමින් දැනුමෙන් සවිබල ගැන්වුණු සමාජයක් ගොඩනැඟීම සඳහා ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු සේවාව තවදුරටත් ශක්තිමත් කිරීමට අපි එක්ව කැපවෙමු. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ඉදිරි ගමනට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරන අතරලිප්‍රතිරාව' සඟරාවේ අඛණ්ඩ සාර්ථකත්වය ද ප්‍රාර්ථනා කරමි.

සුගත් ගුණතිලක
සභාපති
ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
2025/2026

සංස්කාරකගේ සටහන



දැනුම පසු කාලීන පරපුරට භාවිතා කල හැකි අයුරින් වාර්තා ගත කිරීමට ඇති හැකියාව මානව සමාජයේ වර්තමාන දියුණු තත්ත්වයට හේතු වී ඇත. මෙසේ වාර්තා ගත වන තොරතුරු සෙසු අයගේ දැනුම වැඩිකිරීමට ප්‍රයෝජනයට ගත හැකි පරිදි ලබා ගැනීම, සැකසුම, ගබඩා කිරීම, සමුද්ධරණය හා සන්නිවේදනය පිණිස ඇති ප්‍රධාන විඥාපන ඒකකයක් වනුයේ පුස්තකාලයයි. ඉතිහාසය පුරාම පුස්තකාලයේ සංවිධාන ව්‍යුහය, සංකල්ප හා කාර්යයන් නොකඩවා වෙනස් වෙමින් පවතී. දැනුම මූලික සමාජයේ අවශ්‍යතා වලට ගැලපෙන පරිදි ඇතැම් කාර්යයන් ඉවතලන ලද අතර නව කාර්යයන් හඳුන්වා දී ඇත. වෙනත් ඕනෑම ගතික සංවිධානයක් මෙන්ම පුස්තකාලයද සමාජයේ පවත්නා වෙනස්කම් අනුව එහි සේවාවන් හා නිෂ්පාදනය වෙනස් කරනු ලබන අතර පුස්තකාලය පුද්ගලයන්ගේ හෝ සංවිධානවල තොරතුරු අවශ්‍යතා සපුරාලීමට බැඳී සිටී. සත්‍ය වශයෙන්ම පුස්තකාලයේ හැඩය, ප්‍රතිරූපය හා සංකල්පය සමාජය විසින් එහි අවශ්‍යතා වලට ගැලපෙන ලෙස විග්‍රහ කරනු ලබයි. සමාජය එහි තොතුරු අවශ්‍යතාවන් වෙනස් කරන විට පුස්තකාලයේ තොරතුරු භාවිතා කිරීමේ ක්‍රම, තොරතුරු ඇගයීමේ උපායමාර්ග හා පුස්තකාලයේ භූමිකාව වෙනස් වේ. කෙසේ වෙතත් සමාජයට අදාල දැනුම බෙදාහැරීම යන පුස්තකාලයේ මූලික පරමාර්ථය වෙනස් නොවී පවතී. පුස්තකාලය යනු මූලික වශයෙන් තොරතුරු ද්‍රව්‍ය සංවිධානාත්මකව එකතු කර එහි අන්තර්ගතය උපරිම ලෙස භාවිතා කිරීමට පහසුකම් සලසන ආයතනයකි.

එවන් වූ සේවාවන් සපයන පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තිකයින්ගේ නිර්මාණශීලී අදහස් හා ශාස්ත්‍රීය ලිපි එකතුවකට ඉඩ හසර ලබා දෙමින් මෙම ප්‍රතිරාව විද්‍යුත් සඟරාවේ සිව්වැනි කලාපය එළිදැක්වීම මෙවර සිදු කරන්නේ 2026 ඔක්තෝබර් ජාතික කියවීමේ මාසය සැමරීම වෙනුවෙනි.

හැටහය වසරක අභිමානවත් අතීතයකට උරුමකම් කියන පුස්තකාලයාධිපතිවරුන් සහ තොරතුරු විද්‍යාඥයින්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ රටේ අනාගත පුස්තකාල අවශ්‍යතා සපුරාලීම සඳහා නායකත්ව භූමිකාවක් ඉටු කරන ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනුග්‍රාහකත්වය හා මගපෙන්වීම යටතේ මෙවන් සමරු කලාපයක් එළි දැක්වීමට හැකිවීම මා ලද ඉමහත් භාග්‍යයක් ලෙස සලකමි. මෙම කටයුතු සාර්ථක කර ගැනීමට උපදෙස් සැපයූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිව සිටි ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතාටත්, වත්මන් සභාපති සුගත් ගුණතිලක මහතාටත් බෙහෙවින් සතුතිවන්ත වෙමි. එමෙන්ම මේ සඳහා සහයෝගය දැක්වූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පාලක සභාවේ 2025-2026 සාමාජිකයින්ටත්, රජයේ පුස්තකාලයාධිපතිවරුන්ගේ කණ්ඩායමේ කැඳවුම්කරු මේනකා සුබසිංහ මහත්මිය ඇතුලු කණ්ඩායමටත් එමෙන්ම තම නිර්මාණ අප වෙත ලබා දීමෙන් දායකත්වය සැපයූ ශ්‍රී ලාංකික සහ ඉන්දියානු ලේඛක ලේඛිකාවන්ටත්, සුභපැතුම් පණිවිඩ එවූ අපගේ ජ්‍යෙෂ්ඨයින්ටත් මාගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිමි.

එම්. කේ. ගිවෝන් යානිකා නන්දසේන
සංස්කාරක
ප්‍රතිරාව සිව්වන කලාපය
2026 ඔක්තෝබර් 31 දින

Contents

Articles 9

CATMELK v2.0 ශ්‍රී ලාංකේය ප්‍රකාශන ලොවට ගෙන යාම සඳහා ඉදි වූ පාලමක් - මහාචාර්ය රුවන් ගමගේ 9

පොත් තොග සමීක්ෂණ හිසරදයට තිතක් : නොමිලේ ලැබෙන විවෘත මූලාශ්‍ර මෙවලම් සමඟ **SLASA** සහ **HRS** *නාක්ෂණය* පෙරළිය - හර්ෂ බාලසූරිය 12

විමර්ශන මූලාශ්‍රය වර්ගයක් වශයෙන් වාරික ප්‍රකාශනවල ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ හැඳින්වීමක් - ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස 17

Constructive Alignment රොබට් සහ සූසන්ගේ කතාවෙන් ඉගෙන ගනිමු - ආර්.එම් නදීකා රත්නභාහු 24

වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය ගැටලු හා ඒවාට විසඳුම්: 31

ඩිජිටල් යුගයේ පුස්තකාල වෘත්තියේ අභියෝග සහ අවස්ථා - ප්‍රියානී බාලසූරිය 31

අංගංපොර සටන් ශාස්ත්‍රයේ ශිල්පීය ප්‍රාගුණ්‍යන් පිළිබිඹු කිරීම අරභයා කලා නිර්මාණ වළ භූමිකාව ශ්‍රී ලංකාවේ පෞරාණික කැටයම් ආශ්‍රයෙන් - ඒ. පී කුමාරසිංහ 37

ශ්‍රී ලාංකේය පුස්කොළ ලේඛන කලාව - ඒ.පී.එම්.එම්.ඩී.බී දයානන්ද, 44

Beyond Copy and Paste: The Librarian's Role in Preventing Plagiarism - Sakunthala Senevirathna 48

A study on reading habits among Ordinary level students of B/Bandanayaka National School, Mahiyangana - KPGI Karunanayaka, SAAN Weerasinghe 61

THE BENGAL LIBRARY ASSOCIATION AND SRI LANKA 73

Relationship of More Than Seven Decades - Dr. Joydeep Chanda 73

A Memorable Academic Visit to Sri Lanka: Professional Excellence, Cultural Exploration, and a 40th Wedding Anniversary - Dr. Salek Chand 78

The Role of Librarians in modern school library services - R.A.A.Nelun Raanasingha 80

මාධ්‍ය පුස්තකාලයක් භාවිතා කරන විකාශන මාධ්‍යවේදීන් හා ඒවා ගබඩා කිරීම - ප්‍රියන්ත ගොඩකන්ද 86

ළමා සාහිත්‍යය හා ලාංකේය ළමා සාහිත්‍යය - ආර්. ඒ. ඒ. නෙලුන් රණසිංහ 97

පුස්තකාලය සහ තරුණ පරපුර - ඩී. එල්. ඒ. නදීකා 103

උගුරේ කෙසෙල් ගෙඩි කැල්ලක් හිර වී හුස්ම හිරවීම - **Dr. Asela K. Dissanayake, Dr W.A. Deepthi Kumari Jayawardane, Mrs. Dilhani Munasinghe** 109

இந்திய வம்சாவளி மலையகத் தமிழரின் ஆரம்பகால பதிப்பு முயற்சிகள் (1823–1948வரை)– கலாநிதி ஆர். மகேஸ்வரன் 113

මගේ ජීවිතයට ආලෝකයක් වූ පාසල් පුස්තකාලය - **S. Menaka. Mudithangani Subasinghe** 121

Short Stories 124

වැලන්ටයින් ඩේ.... - ගිවෝන් යාතිකා නන්දසේන 124

පුණ්‍යකර්මය - ඩී රොෂානි ලක්මිනී විජේනන්ද 129

Book Talk 133

ග්‍රන්ථ විචාරය - සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය - සකුන්තලා සෙනෙවිරත්න 133

ග්‍රන්ථ විචාර දෙකක් - උදිත අලහකෝන් 137

මැයි මාර ප්‍රසංගය - ගිවෝන් යානිකා නන්දසේන 140

'මම ලියන හැටි':සුනේත්‍රා රාජකරුණානායක - කෞශල්‍ය කුමාරසිංහ 142

Poems 148

(Page No. 149-181)

කන්නන්ගරෝ මහා බුද්ධෝ - සඳරැසී සුදුසිංහ

The River Remembers - Sourav Dutta

නිහඬ සේවයක දැනුමේ නියමුවෝ නොවෙමුද.....??? - අයි. නිල්මිණී පොල්ගම්පල

නුඹගෙම සුවඳ - ඉලක්ෂ ජයවර්ධන

මවපු වැස්ස - ඉලක්ෂ ජයවර්ධන

සයිබර් කුනාටුව - ප්‍රසන්න ගුණවර්ධන

නුඹ මට කුමට - නදීකා රත්නභාහු

දවස් තුනකට ඇවිත් නුඹ කරපු හරියක්..... - සකුන්තලා සෙනෙවිරත්න

වෙනසක අරුමය - සකුන්තලා සෙනෙවිරත්න

ගල් පිළිමය - ගිවෝන් යානිකා නන්දසේන

පිරියම් - ගිවෝන් යානිකා නන්දසේන

සිත්තමක් - ගිවෝන් යානිකා නන්දසේන

ටිව මං ඇන්දේ ඒ ලස්සන ම අහසය - දිමන්ති රත්නායක

හැර ගිය මතක - දිමන්ති රත්නායක

ජීවිතේ මල් යළි පිපේ...- නිමල් ප්‍රනාන්දු

ප්‍රේමයේ තරු එළිය - නිමල් ප්‍රනාන්දු

මතකය - කේ. ජී. වයි. රජිත් කුමාරසිංහ

ධීවර ජීවිතය - ප්‍රීති ලියනගේ

නිමිත්ත : සම්ප්‍රදායික මත බිඳින තරුණියක් - ඉෂානි ලියනගේ

කැලණි කන්දේ දෝංකාරය... - ඒ.පී කුමාරසිංහ

මධුසමය.. - **ඒ.පී කුමාරසිංහ**

බඹර හදක් - ධම්න්ද මනම්පේරි

පපුවේ කඳුළු - සකුන්තලා පෙරේරා

Unicorn මනාලියක් අවශ්‍ය කර තිබේ - සකුන්තලා පෙරේරා

අහිමි නුඹට….. - ඩී. එල්. ඒ. නදීකා

හිත බැඳිලා - දනන්ජ වර්ණකුලසුරිය


කැකුළු මතක - එච්. එම්. ජී. ලහිරුණී

කෝවිඩ් ඉලව් ගෙය.... – සමන්තිකා බාලසූරිය

නොමියන ජීවිත - මනෝහා වික්‍රමතිලක

★★★★★




ARTICLES

CATMELK v2.0 ශ්‍රී ලාංකේය ප්‍රකාශන ලොවට ගෙන යාම සඳහා ඉදි වූ පාලමක්

මහාචාර්ය රුවන් ගමගේ

අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය

ශ්‍රී ලංකාවේ පළ වන ප්‍රකාශන ලෝකය වෙත ගෙන යාමේ ක්‍රම කිහිපයක් ඇත. ඉන් ප්‍රධාන වන්නේ ඩිජිටල්කරණය (digitization) යි. ඩිජිටල් මාධ්‍යයට හරවන ලද ප්‍රකාශන, මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ලොව ඕනෑම රටකින් කියවීමට පහසුකම් සැපයිය හැකි ය. ඒවා ලොවට අනාවරණය කළ හැකි අනෙකුත් උපක්‍රමය වන්නේ උසස් තත්ත්වයේ මෙටා දත්ත භාවිතයෙන් පහසුවෙන් සොයා ගත හැකි ස්වභාවයට පත් කිරීම යි. නිසි මෙටා දත්ත නොමැති ස්කෑන් කළ ලේඛනයක් පවා, පුස්තකාලයක වැරදි කාමරයක තැන්පත් කළ පොතක් බඳු ය. එය භෞතිකව පැවතුණද ප්‍රායෝගිකව අස්ථානගත වූවකි. මේ නිසා ඩිජිටල් සම්පත් මතු නොව, මුද්‍රිත ප්‍රකාශනවල පවා සැබෑ පරීක්ෂාව වන්නේ අදාළ සම්පතෙහි 'සොයාගතහැකි බව' (Findability) තහවුරු කිරීම යි. ඒ සඳහා තොරතුරු සම්පත් සූචිකරණය නමැති විද්‍යාත්මක ක්‍රියාවලියට නතු කෙරේ. එහි දී සිදු කෙරෙන්නේ අදාළ සම්පත පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය (bibliographic description) පද්ධතියට ඇතුළත් කිරීම යි. පරිගණක භාෂාවෙන් මෙම දත්ත හැඳින්වෙන්නේ මෙටා දත්ත (metadata) යන නමිනි.

දේශීය භාෂා (සිංහල හා දෙමළ) කෘති කෙටි කාලයක් තුළ විධිමත් ලෙස සූචිකරණය (Cataloguing) කිරීම ශ්‍රී ලාංකේය පුස්තකාල වෘත්තිකයන් දශක ගණනාවක් තිස්සේ මුහුණ දුන් අභියෝගයක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය සැකසීමේ දී මතුවන ප්‍රමාදය ඊට හේතුව යි. මේ නිසා බොහෝ පුස්තකාලවල අනුගමනය කරන ලද ක්‍රමවේදය වූයේ අවම දත්ත ප්‍රමාණයක් ඇතුළත් කිරීම යි. එසේ ම අත්හුරු ක්‍රමයට මෙම දත්ත ඇතුළත් කිරීමේ දී ටයිප් කිරීමේ දෝෂ, අක්ෂර වින්‍යාස දෝෂ ආදිය බහුල වේ. එවිට සෙවුම් යන්ත්‍රයකින් අදාළ ද්‍රව්‍ය සොයා ගැනීම අපහසු වේ.

මෙම අභියෝගය ජය ගනිමින්, ප්‍රතිනිර්මාණය වූ CATMELK (කැට්-මී-එල්-කේ) Version 2.0 යෙදුම, අද වන විට පුස්තකාලයාධිපතිවරුන්ට නොමිලයේ භාවිත කළ හැකි ප්‍රබල කෘත්‍රිම බුද්ධි සහායකයකු බවට පත්ව ඇත.

CATMELK බිහිවීමේ ආරම්භ සිදු වූයේ මීට වසර දෙකකට පමණ පෙරාතුව ය. සරළ පරීක්ෂණ කිහිපයකින් ඇරඹී, පසුව ක්‍රමවත් විද්‍යාත්මක හැදෑරීම් සිදු කෙරුණු අතර ක්‍රම ක්‍රමයෙන් යෙදුමේ ඵලදායීතාව ඉහළ නැංවිණි. එහි මුඛ්‍ය අරමුණ වූයේ, සූචිකාරක අත ඇති මුද්‍රිත පොතක හෝ පොත් කිහිපයක ඇති ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත ස්කෑන් කරමින් ඒවා MARC21 ආකෘතියට අනුගත සූචි සංලේඛ බවට හැරවීම යි. ඉන්පසු මෙම MARC21 සංලේඛ පුස්තකාල මෘදුකාංගයට ආනයනය කරමින් පුස්තකාල එකතුවට අත් පත් කර ගත හැකි ය. එම පළමු සංස්කරණයේ පවා පැවති ප්‍රායෝගිකත්වය සලකමින්, ඊට දෙස් විදෙස් සම්මාන කිහිපයක් ම පිරිනැමිණි. මෙම පර්යේෂණ කටයුතු සඳහා සූචිකරණය විෂය පිළිබඳ ප්‍රාමාණිකාචක වූ කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය ප්‍රියන්වදා වනිගසූරිය මහත්මිය දැක්වූ දායකත්වය ද සිහි කළ යුතු ම ය.

කෙසේ වෙතත්, වත්මන් Version 2.0 යනු හුදු යාවත්කාලීන කිරීමක් පමණක් නොව, එහි මෘදුකාංග ගෘහ නිර්මාණ ශිල්පය මුළුමනින්ම නැවත ප්‍රතිසංස්කරණය කිරීමකි. නවීන Multimodal AI සහ දෘශ්‍ය අක්ෂර හඳුනාගැනීමේ (OCR) තාක්ෂණය ඒකාබද්ධ කරමින්, සිංහල සහ දෙමළ භාෂා පෙළ ක්ෂණිකව

විශ්ලේෂණය කර, නිරවද්‍ය සූචිකරණ දත්ත බවට පරිවර්තනය කිරීමේ හැකියාව Version 2 හරහා තහවුරු කර ඇත. එසේම වෙනත් සූචිකරණ පද්ධතියක පවතින මෙටා දත්ත ක්ෂණිකව විමර්ශනය කරමින්, අදාළ සූචි සංලේඛය වඩාත් පරිපූර්ණ ලෙස නිර්මාණය කිරීම එමගින් සිදු වේ. පොතක පිට කවරයේ ඡායාරූපයක් පමණක් වුවද භාවිත කරමින් පරිපූර්ණ සංලේඛයක් නිර්මාණය කිරීමේ හැකියාව මෙ මගින් ලැබී ඇත. එසේම, වරකට පොත් කවර 25ක් හෝ ඊටත් වැඩි තරම් විශාල සංඛ්‍යාවක් පවා එක වර පිරික්සුම් කරමින්, ඒ සියල්ලේ සංලේඛ එක වර නිර්මාණය කිරීම මගින් ඉතා ඉහළ කාර්යක්ෂමතාවයක් අත් පත් කර ගැනීමට ද ඊට හැකි වී ඇත.

CATMELK හි ඇති වැදගත්ම ලක්ෂණයක් වන්නේ එමගින් නිර්මාණය කෙරෙන සංලේඛ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ DBIB (Descriptive Bibliographic Framework) රාමුවට මෙන් ම, සම්පත් විස්තරය හා ප්‍රවේශය (RDA) වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ද අනුගත වීම යි. මෙම සංලේඛ පොකුරු, පළමුව තනි ගොණුවක් ලෙස බාගත කර, ඉන්පසු පුස්තකාල ස්වයංක්‍රියකරන පද්ධතිවලට ඍජුව ම ආනයනය කළ හැකි ය. ඊට පෙර අවශ්‍ය නම් යෙදුම තුළ දී ම සංස්කරණය කර ගැනීමේ හැකියාව ද ඇත.


CATMELK v2.0 මඟින් දේශීය භාෂා කෘතිවල ග්‍රන්ථවිද්‍යාත්මක විස්තර ක්ෂණිකව හා නිවැරදිව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පරිවර්තනය කරන බැවින් දේශීය පර්යේෂකයන්ට, විවිධ පුස්තකාලවල විසිරී ඇති දුර්ලභ දේශීය භාෂා සම්පත් නිවැරදි විෂය ශීර්ෂ ඔස්සේ පහසුවෙන් සොයාගත හැකිය. එසේ ම දකුණු ආසියානු අධ්‍යයන, දේශීය ඉතිහාසය, භාෂා ශාස්ත්‍රය හා සංස්කෘතික පර්යේෂණවල නියැලෙන විදේශීය විද්වතුන්ට ශ්‍රී ලාංකේය ප්‍රකාශන පිළිබඳ මෙටා දත්ත වෙත ප්‍රවේශ වීමේ, ඒවා සෙවීමට ලක් කිරීමේ ඉඩකඩ මෙමගින් පුළුල් වේ.

ඒ අනුව, 2026 සැප්තැම්බර් 30 වැනි දා රාජ්‍ය අනුග්‍රහයෙන් පැවැත්වූ ජාතික කෘත්‍රිම බුද්ධි සම්මාන උළෙලේදී (National AI Awards), සිංහල හා දෙමළ දේශීයකරණ නවෝත්පාදන (Sinhala/Tamil Localization Innovation) කාණ්ඩය යටතේ ලෝකඩ සම්මානය දිනා ගැනීමට CATMELK v2.0 සමත් විය.

වාණිජ අරමුණුවලින් ඔබ්බට ගොස්, පුස්තකාල වෘත්තිකයන් මුහුණ දුන් සැබෑ ගැටලුවකට දේශීය මට්ටමින් බිහිවූ කෘත්‍රිම බුද්ධි විසඳුමක් එසේ රාජ්‍ය මට්ටමින් ඇගයීමට ලක්වීම ශ්‍රී ලාංකේය පුස්තකාල ප්‍රජාවට මහත් ප්‍රබෝධයක් මෙන්ම අභිමානයට කරුණකි. මෙතැන් සිට පහත විස්තර වන්නේ, අදාළ යෙදුම භාවිත කළ හැකි ආකාරය යි.

භාවිත කළ හැකි ආකාරය

පාසල් පුස්තකාල, විශ්වවිද්‍යාල, විශේෂ පුස්තකාල මෙන්ම මහජන පුස්තකාලවල සේවය කරන ඕනෑම නිලධාරියකුට මෙය ප්‍රායෝගිකව භාවිත කළ හැකි ය. ඒ සඳහා අන්තර්ජාල බ්‍රව්සරයක් හරහා පහත වෙබ් අඩවියට පිවිසිය යුතු ය. ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණකයකින් මෙන් ම ජංගම දුරකථනයකින් ද එය සිදු කළ හැකි ය. ජංගම දුරකථනයක් භාවිත කිරීමේ වාසිය එයින් අදාළ අවස්ථාවේ ම ඡායාරූප ගැනීමට ඇති හැකියාව යි. ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණකයකින් නම්, කලින් ගත් පොත් කවර ඡායාරූප එකතුවකින් ඡායාරූප තෝරා ගත යුතු වේ.



රූපය: CATMELK තිර සටහන

1. **ප්‍රවේශ වීම:** පරිගණකයකින් හෝ ජංගම දුරකථනයකින් https://catme.lk වෙබ් අඩවියට පිවිසෙන්න. කිසිදු ගෙවීමක් හෝ බලපත්‍ර ගාස්තුවක් අවශ්‍ය නොවේ.
2. **යෙදුම ක්‍රියාත්මක කිරීම**: Launch CATMELK නම් බොත්තම ඔබන්න.
3. **ආකෘතිය තේරීම:** ඔබ ඇතුළත් කරන්නේ පොතක විස්තරය නම්, Book යන්න තෝරන්න. නැතිනම් අදාළ ආකෘතිය තෝරා ගන්න. පහත දක්වා ඇත්තේ පොතක විස්තරය ඇතුළත් කරන ආකාරය යි.
4. **දත්ත ඇතුළත් කිරීම:** අදාළ පොතේ ISBN අංකය ඇතුළත් කිරීම හෝ පොතේ මුල් පිටුවේ ඡායාරූපයක් උඩුගත කිරීම සිදු කරන්න.
5. **ස්වයංක්‍රීය මෙටා දත්ත උත්පාදනය:** තත්පර කිහිපයක් ඇතුළත කෘත්‍රිම බුද්ධිය මඟින් පොතේ හෝ පොත්වල කර්තෘ, නම, ප්‍රකාශක, වර්ෂය, භෞතික විස්තර හා විෂය ක්ෂේත්‍ර වෙන්කර හඳුනාගෙන සම්මත MARC 21/DBIB වාර්තාව සකස් කරනු ලබයි.
6. **පරීක්ෂා කර බාගත කිරීම:** සකස් වූ වාර්තාවේ නිරවද්‍යතාව අවශ්‍ය පරිදි සංස්කරණය කර, `.mrc` ගොනුවක් ලෙස බාගත කර ඔබගේ පුස්තකාල කළමනාකරණ මෘදුකාංගයට (Koha/OpenBiblio) එක් ක්ලික් කිරීමකින් ආනයනය කරගත හැකිය.

CATMELK v2.0 යනු ශ්‍රී ලාංකේය පුස්තකාල ක්ෂේත්‍රය ඩිජිටල් යුගයට සරිලන සේ නවීකරණය කරන, දේශීය දැනුම ගෝලීය පර්යේෂණ ලෝකයට විවෘත කරන ප්‍රායෝගික මෙවලමකි. වැඩිදුර විස්තර සහ මෘදුකාංගය භාවිතය සඳහා ඉහත වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

පොත් තොග සමීක්ෂණ හිසරදයට තිතක් : නොමිලේ ලැබෙන විවෘත මූලාශ්‍ර මෙවලම් සමඟ SLASA සහ HRS *තාක්ෂණය* පෙරළිය

හර්ෂ බාලසූරිය

(hbala@ou.ac.lk)

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (පද්ධති)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

"මේ අවුරුද්දේ පොත් තොග පරීක්ෂාව කවදාද?"

පුස්තකාලයක සේවය කරන කෙනෙකුට මේ ප්‍රශ්නය ඇසුණු විට මුලින්ම මතක් වන්නේ කුමක්ද? දිගු පොත් ලැයිස්තු, රාක්ක අතර ගෙවන පැය ගණන්, පොත් එකින් එක පිටතට ගැනීම, අංක කියවීම, සටහන් තැබීම සහ ඒවා නැවත නැවත සැසඳීම විය හැකියි. අතුරුදන් යැයි සටහන් කළ පොතක් අවසානයේ වෙනත් රාක්කයකින් හමුවීමත් බොහෝ දෙනාට සුපුරුදු අත්ද්දකීමකි.



පොත් තොග පරීක්ෂාව පුස්තකාලයක අත්‍යවශ්‍ය කාර්යයකි. එහෙත් එය මෙතරම් වෙහෙසකර විය යුතුද? පුහුණු කාර්ය මණ්ඩලයක වටිනා කාලය එකම ක්‍රියාව දහස් වාරයක් කිරීම සඳහා වැය විය යුතුද?


ශ්‍රී ලාංකික පුස්තකාල වෘත්තිකයකු සහ මෘදුකාංග සංවර්ධකයකු වන හර්ෂ බාලසූරිය විසින් හඳුන්වා දී ඇති **SLASA සහ HRS** මෙවලම් අප ඉදිරියේ තබන්නේ මේ ප්‍රශ්නවලට ප්‍රායෝගික පිළිතුරකි.

රාක්කයේ පොත හඳුනාගැනීමට පහසු ක්‍රමයක්

අද බොහෝ පුස්තකාලවල පරිගණකගත පොත් නාමාවලියක් තිබේ. පොත්වල බාර්කෝඩ් ලේබල් ද ඇත. නමුත් බාර්කෝඩ් එක පොතේ ඇතුළු කවරයේ තිබේ නම්, තොග පරීක්ෂාවේදී තවමත් පොත රාක්කයෙන් පිටතට ගෙන, කවරය විවෘත කර, ලේබලය සොයා ස්කෑන් කර, නැවත පොත තැබීමට සිදුවේ.

එක පොතකට වැය වන්නේ තත්පර කිහිපයක් පමණක් විය හැකියි. එහෙත් පොත් ලක්ෂයකට හෝ ඊට වැඩි ගණනකට ඒ ක්‍රියාව නැවත සිදු කරන විට, ඒ තත්පර පැය ගණනක් බවට පත්වෙයි.

නව **HRS ලේබල් සැලැස්ම** අවධානය යොමු කරන්නේ මෙවැනි දෛනික අපහසුතාවයකටය. පොතේ පිටුපස දාරයේ අලවන, වර්ගීකරණ අංකය දැක්වෙන ලේබලයටම එම පොත් පිටපත හඳුනාගන්නා බාර්කෝඩ් එකක් එක් කිරීම මෙහි මූලික අදහසයි.




එවිට ලේබලය කාර්ය මණ්ඩලයට කියවා තේරුම්ගත හැකි සේම ස්කෑනරයකින් ද කියවිය හැකිය. බාර්කෝඩ් එක පැහැදිලිව පෙනෙන, පහසුවෙන් ස්කෑන් කළ හැකි ස්ථානයක තිබීම නිසා පොත් නැවත නැවත හැසිරවීමේ අවශ්‍යතාව අඩු කළ හැකිය. මෙය විශේෂයෙන් සම්පත් සීමිත පුස්තකාල සඳහා සංවර්ධකයා ඉදිරිපත් කර ඇති යෝජිත ලේබල් සැලැස්මකි. බැලූ බැල්මට මෙය ඉතා සුළු වෙනසකි. නමුත් පුස්තකාලයක කුඩා වෙනසක වටිනාකම මැනිය යුත්තේ එය නැවත නැවත සිදු කරන වාර ගණනත් සමඟය. එක පොතකට ඉතිරි වන සුළු වෙහෙසක්, පොත් 160,000කට යොදන විට විශාල වෙනසක් බවට පත්වේ.

ලේබල් සෑදීමත් පහසු වෙයි

මේ වෙනස සාර්ථක කරගැනීමට ලේබල් සකස් කිරීම ද පහසු විය යුතුය.

සාමාන්‍යයෙන් ලේබලයක් සෑදීමට පොතේ තොරතුරු සෙවීම, වර්ගීකරණ අංකය පිටපත් කිරීම, අකුරු හා පේළි සකස් කිරීම, මුද්‍රණය කර බැලීම සහ වැරදි නිවැරදි කිරීම වැනි පියවර කිහිපයක් අවශ්‍ය වේ. අලුතින් ලැබුණු පොත් සිය ගණනක් තිබේ නම් මෙය සැලකිය යුතු කාලයක් ගතවන කාර්යයකි.

HRS ClassPrint ඇතුළු HRS ලේබල් මුද්‍රණ මෙවලම් මෙම කටයුතු එකම ක්‍රියාවලියක් තුළ පහසු කිරීමට සැලසුම් කර ඇත. පුස්තකාල පද්ධතියෙන් ලබාගත් දත්ත භාවිතයෙන් පොත් තොරතුරු සොයාගැනීම, ලේබලය මුද්‍රණයට පෙර පරීක්ෂා කිරීම සහ PDF ගොනුවක් ලෙස ලබාගැනීම වැනි පහසුකම් එහි ඇතුළත් බව සංවර්ධකයා සඳහන් කරයි. බාර්කෝඩ් ඇතුළත් ලේබල් සැලැස්මක් ද එහි ඇත. මෙහි අරමුණ වන්නේ කාර්ය මණ්ඩලය එකම තොරතුර පද්ධති කිහිපයකට නැවත නැවත ඇතුළත් කරන කාලය අඩු කර, ලේබල්වල එකම පිළිවෙළක් පවත්වා ගැනීමයි.




ස්කෑන් කිරීමෙන් ඔබ්බට යන SLASA

SLASA යනු පුස්තකාල පොත් තොග පරීක්ෂාව, විගණනයට අවශ්‍ය තොරතුරු සකස් කිරීම සහ පොත් රාක්කගත කිරීම සඳහා සහාය දෙන මෘදුකාංගයකි.

තොග පරීක්ෂාවේදී ස්කෑන් කරන බාර්කෝඩ්, සකස් කරගත් පොත් නාමාවලියේ දත්ත සමඟ සැසඳීමට එය උපකාරී වේ. හමු වූ පොත්, එකම බාර්කෝඩ් එක නැවත ස්කෑන් කළ අවස්ථා සහ වැඩිදුර පරීක්ෂා කළ යුතු පොත් වෙන්කර හඳුනාගැනීමට ද එය සහාය වේ. වැරදි ස්ථානයක තබා ඇති පොතක් ගැන සිතා බලන්න. එය පුස්තකාලයේ තිබිය හැකිය. නාමාවලියේ ද සටහන්ව තිබිය හැකිය. නමුත් නිවැරදි රාක්කයේ සොයන පාඨකයාට එය හමුවන්නේ නැත්නම්, ඒ මොහොතේ එය අතුරුදන් පොතකට සමානය. එවැනි පොතක් හඳුනාගෙන නිවැරදි ස්ථානයට නැවත තැබීමෙන්, පුස්තකාලය සතු සම්පතක් යළිත් පාඨකයාට ලබාදිය හැකිය.

මේ නිසා තොග පරීක්ෂාව අවසානයේ පොත් ගණනක් සනාථ කරන කාර්යයකට පමණක් සීමා විය යුතු නැත. එය රාක්කවල පිළිවෙළ, නාමාවලියේ දත්ත සහ පාඨකයාට පොතක් සොයාගැනීමේ පහසුව වැඩිදියුණු කරන අවස්ථාවක් බවට පත් කළ හැකිය.



පොත් එකතුව ගැන වඩා හොඳින් තේරුම්ගැනීමට

SLASA හි නව පහසුකම් මඟින් පුස්තකාලයේ පොත් එකතුව පිළිබඳ වැදගත් තොරතුරු ද සොයා බැලිය හැකිය. කුමන එකතුවල පොත් මෑතකදී බැහැර ගෙන තිබේද? පසුගිය වසර තුන තුළ භාවිතය පිළිබඳ සටහන් ඇත්තේ කුමන විෂය ක්ෂේත්‍රවලද? පොත්වල ප්‍රකාශන වර්ෂ අනුව සාමාන්‍ය වයස කොපමණද? මිල සටහන් ඇති පොත්වල වටිනාකම කොපමණද? කිසිදු බැහැර දීමක් සටහන් නොවූ පොත් සහ කලකට පෙර බැහැර දී ඇති නමුත් මෑතකදී එසේ නොවූ පොත් මොනවාද?

මෙවැනි තොරතුරු අලුත් පොත් මිලදී ගැනීම, පරණ සංස්කරණ සමාලෝචනය, පාඨකයන්ට පොත් හඳුන්වාදීම සහ එකතුවේ සමබරතාව ගැන සිතා බැලීමට උපකාරී වේ. එහෙත් සංඛ්‍යා පමණක් අවසන් තීරණය නොවේ. විමර්ශන පොතක් පුස්තකාලයෙන් පිටතට ගෙන නොගියත් එය නිතර භාවිත විය හැකිය.


ප්‍රාදේශීය ඉතිහාසය පිළිබඳ පොතකට බැහැර දීම් අඩු වුවත් එය සුරැකීමට වැදගත් හේතුවක් තිබිය හැකිය. පැරණි ණයගනුදෙනු දත්ත සම්පූර්ණ නොවීම නිසා ද භාවිතය අඩුවෙන් පෙනිය හැකිය.

මෘදුකාංගය තොරතුරු ඉදිරිපත් කරයි. පුස්තකාල වෘත්තිකයාගේ දැනුම හා විනිශ්චය ඒවාට අර්ථයක් ලබාදෙයි.

Koha සමඟ තවත් ඉදිරි පියවරක්

ශ්‍රී ලංකාවේ බොහෝ පුස්තකාලවලට හුරුපුරුදු **Koha පුස්තකාල කළමනාකරණ පද්ධතිය** සමඟ මෙම ලේබල් ක්‍රියාවලිය සම්බන්ධ කිරීම තවත් වැදගත් දියුණුවකි.

සංවර්ධකයා සඳහන් කරන පරිදි, ඔහුගේ නව Koha අමතර මෙවලම එනම් plugin එක මඟින් Koha හි ඇති පොත් සහ පොත් පිටපත් තොරතුරු භාවිත කර HRS ආකාරයේ ලේබල් සකස් කළ හැකිය.



Koha තුළ දැනටමත් ලේබල් සෑදීමේ පහසුකම් ඇත. මෙහි විශේෂත්වය වන්නේ HRS ලේබල් සැලැස්ම සහ ඒ සඳහා සකස් කළ ක්‍රියාවලිය Koha සමඟ සම්බන්ධ කිරීමයි. එමඟින් නාමාවලි දත්ත සකස් කිරීමේ සිට ලේබලය මුද්‍රණය කිරීම දක්වා ඇති වෙනම පියවර අඩු කළ හැකිය. නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම, එකම පිළිවෙළකට ලේබල් සෑදීම සහ පසුව එම බාර්කෝඩ් භාවිතයෙන් පොත් තොග පරීක්ෂා කිරීම—මේ සියල්ල එකිනෙකට සම්බන්ධ වැඩ පිළිවෙළක් බවට පත්වීම මෙහි වටිනාකමයි.

ශ්‍රී ලාංකික පුස්තකාල අතරින් ඉදිරියට

හර්ෂ බාලසූරිය ලබාදුන් තොරතුරු අනුව, මෙම තාක්ෂණය භාවිතයට ගත් ආයතන අතර **කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ මහජන පුස්තකාලය, ගල්කිස්ස මහජන පුස්තකාලය, ITUM සහ මොරටුව විශ්වවිද්‍යාලය** ඇතුළත් වේ.

මෙවලම් භාවිතයට අවශ්‍ය පුහුණුව ලබාදීම ද වැදගත්ය. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වාර්තා කළ SLASA සහ HRS ප්‍රායෝගික වැඩමුළුවකට සහභාගීවූවන් 34 දෙනකු එක්ව තිබිණි. පොත් තොග පරීක්ෂාව, අතුරුදන් හා වැරදි ස්ථානවල ඇති පොත් හඳුනාගැනීම සහ රාක්කවල නිවැරදි පිළිවෙළ වැනි කරුණු එහිදී අවධානයට ලක්විය. මෙවැනි ප්‍රායෝගික අත්දැකීම් හුවමාරුව, හොඳ මෘදුකාංගයක් සැබෑ පුස්තකාල සේවාවක සාර්ථකව භාවිත කිරීමට ඇති වැදගත් පාලමකි.

ඉතිරි වන්නේ මුදල් පමණක්ද?

පොත් තොග පරීක්ෂාවේ සැබෑ වියදම කුමක්ද? කාර්ය මණ්ඩලයේ කාලය, නැවත නැවත පොත් හැසිරවීම, ලැයිස්තු සැසඳීම සහ වාර්තා සකස් කිරීම ද ඇතුළත් කළ විට එය අප සිතනවාට වඩා විශාල විය හැකිය.

මෙවැනි වැඩිදියුණු කිරීම් පුස්තකාල රැසක වසර ගණනාවක් පුරා භාවිත කළහොත් රුපියල් බිලියන ගණනක ඉතිරියක් ඇති කළ හැකිද? එය නිසි ජාතික මට්ටමේ ඇගයීමකින් පිළිතුරු සෙවිය යුතු විශාල ප්‍රශ්නයකි. එතරම් මුදලක් දැනටමත් ඉතිරි කර ඇතැයි තහවුරු කළ ප්‍රතිඵලයක් ලෙස ප්‍රකාශ කළ නොහැකිය. කෙසේ වෙතත්, අනවශ්‍ය පුනරාවර්තන වැඩ අඩු කර කාර්ය මණ්ඩලයේ කාලය පාඨක සේවා සඳහා යොමු කිරීමේ අවස්ථාව ඉතා වැදගත්ය.

මෙම මෙවලම් පුස්තකාල භාවිතය සඳහා නොමිලේ ලබාදීම, සම්පත් සීමිත ආයතනවලට විශේෂ වටිනාකමක් ලබාදෙයි. විශාල තාක්ෂණික ආයෝජනයක් කිරීමට අපහසු ආයතනයකට වුවද, හුරුපුරුදු බාර්කෝඩ් උපකරණ භාවිතයෙන් වැඩ පිළිවෙළ දියුණු කරගැනීමට එය අවස්ථාවක් විය හැකිය.

ශ්‍රී ලාංකික පුස්තකාලයක හඳුනාගත් ගැටලුවකට ශ්‍රී ලාංකික පුස්තකාල වෘත්තිකයකු විසඳුමක් සකස් කිරීම තුළ තවත් වටිනාකමක් තිබේ. එම අත්දැකීම්, ක්‍රමවේද සහ සංවර්ධන කටයුතු හුවමාරු කිරීමෙන් ලෝකයේ සමාන ගැටලුවලට මුහුණ දෙන පුස්තකාලවලට ද ප්‍රයෝජනයක් ලැබිය හැකිය.අවසානයේ සිදුවන වෙනස සංඛ්‍යාවලින් පමණක් මැනිය නොහැකිය. තවත් රාක්කයක් පරීක්ෂා කර අවසන් වීම, තවත් ගැටලුවක් විසඳීම, වැරදි තැනක තිබූ පොතක් නැවත පාඨකයාට සොයාගත හැකි තැනට පැමිණීම මේවා කාර්ය මණ්ඩලයට ද දැනෙන ප්‍රගතියකි.

පොත් තොග පරීක්ෂාවට සැලකිල්ල, සූදානම සහ වගකීම සැමදා අවශ්‍යය. එහෙත් එය සැමදා හිසරදයක් විය යුතු නැත.

සමහර විට පුස්තකාලයක ලොකු වෙනසක් ඇරඹෙන්නේ ඉතා පුංචි දෙයකිනි: හොඳ ලේබලයක්, හුරුපුරුදු බාර්කෝඩ් එකක් සහ රාක්ක අතර වැඩ කරන මිනිසුන්ගේ අවශ්‍යතා තේරුම්ගත් මෘදුකාංගයක්!

විමර්ශන මූලාශ්‍රය වර්ගයක් වශයෙන් වාරික ප්‍රකාශනවල ශාස්ත්‍රීය දායකත්වය පිළිබඳ හැඳින්වීමක්

ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස

වැඩබලන පුස්තකාලයාධිපති,

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යක්කල.

සාරාංශය

වර්තමාන සමජය තොරතුරුමත පදනම් වී ඇත. පාඨක ප්‍රජාව මෙන් ම, තොරතුරු ගවේෂකයන්, පාඨකයන්, පර්යේෂකයන් හෝ උපයෝජකයන් පුස්තකාලය හෝ විඥාපන මධ්‍යස්ථානය කරා සමීප වන්නේ තමන්ගේ තොරතුරු අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ය. එසේ පැමිණෙන්නා වූ උපයෝජකයින් හමුවේ පුස්තකාලයෙන් ඉටුවිය යුතු සේවාවන් නිසි පරිදි ඉටුවීම අනිවාර්යය කාර්යයකි. එකී පුස්තකාල සේවාවන් අතර විමර්ශන සේවයට ලැබෙනුයේ ප්‍රමුඛස්ථානයකි. එසේ ම, තොරතුරු සොයා එන උපයෝජකයින්ට විමර්ශන සේවයෙන් සිදුවන්නේ ඉමහත් සේවයකි. අන්තර්ගතය, තොරතුරු වින්‍යාසය, යාවත්කාලීන බව හා සාධිකාරිත්වය යන කරුණුවලින් විමර්ශන ග්‍රන්ථ අනෙකුත් සාමාන්‍ය තොරතුරු මූලාශ්‍රයන්ට වඩා සුවිශේෂිත්වයක් උසුලනු ලැබේ. විමර්ශන මූලාශ්‍ර වර්ග අතරෙන් වාරික ප්‍රකාශනවල ඇති වැදගත්කම පිළිබඳව කරුණු සාකච්ඡා කෙරේ.

1. හැඳින්වීම

තොරතුරු මූලික මානව අවශ්‍යතා අතර ප්‍රමුඛ වේ. සෑම පුද්ගලයකුටම දෛනික කටයුතු සඳහා නවතම තොරතුරු අවශ්‍ය වේ. එම තොරතුරු පුද්ගලයන්, රාජ්‍ය හා පුද්ගලික ආයතන, සමිති, සමාගම්, කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර ආදී වශයෙන් විවිධ විෂයිකව වර්ගීකරණය වේ. කිසියම් තොරතුරු විද්‍යාත්මකව ඇතුළත් කර පිළිවෙළකට සංවිධානය කළ කෘති තොරතුරු සංග්‍රහය යන පාරිභාෂික වචනයෙන් ද හැඳින්වේ. තොරතුරු ජාතික හා ජාත්‍යන්තර සම්පතක් බවට පත් වී අවසාන ය. නූතන සමාජය විවිධ මිනිස් අයිතිවාසිකම් හේතු කොට ගෙන තොරතුරු බිහි වීමේ වේගය දෙගුණ තෙගුණ වෙමින් පවතියි.

වෙනස් වන තොරතුරු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ලෝකයේ සෑම රජයක ම සාදාචාරාත්මක වගකීමක් බවට පත්ව ඇති අතර එවන් තොරතුරු වෙත නිදහසේ පිය නැගීමත් තොරතුරු දැනගැනීමත් පොදුජන අයිතියක් බවට පත්ව ඇත. මෙලෙස වෙනස් වන තොරතුරු ජනතාව වෙත ගෙනයාමේ උත්කෘෂ්ඨ වගකීම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙත පැවරී ඇත. එහි විද්‍යමාන ගැටලුව වන්නේ ''අවශ්‍ය තොරතුරු අවශ්‍ය වේලාවට අවශ්‍ය පරිදි ලබා දීමට'' මෙම සන්නිවේදන මාධ්‍ය පොහොසත් වනවාද යන්න ය. එබැවින් මෙම කාර්යය නිතැතින්ම පැවරී ඇති ආයතන විශේෂයක් ලෙසින් පුස්තකාලය වර්ග හා විඥාපන මධ්‍යස්ථාන ද හඳුන්වා දිය හැකි ය.

පුස්තකාලය හා විඥාපන මධ්‍යස්ථාන පාඨක සේවාවන් පවත්වා ගෙන යනු ලබන සේවාවන්ගේ හදවත ලෙස හඳුන්වනු ලබන්නේ විමර්ශන සේවය යි. පුස්තකාලයෙහි හදවත බදු විමර්ශන සේවාවෙහි ජීව රුධිරය නම් විමර්ශන මූලාශ්‍රයන් ය. පාඨකයින් නගනු ලබන්නා වූ විවිධාකාර වූ විමර්ශන ගැටලුවලට පිළිතුරු ලබා දීමේ අරමුණින් පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථාන විවිධ වූ විමර්ශන මූලාශ්‍රය ප්‍රතිග්‍රහණය කරනු ලබයි. මේ සෑම විමර්ශන මූලාශ්‍රයකින් ම විවිධාකාර වූ තොරතුරු අවශ්‍යතා සපුරනු ලැබේ. කුමන

තොරතුරු මූලාශ්‍ර පුස්තකාලයේ තිබුණ ද අනිවාර්යයෙන් ම ප්‍රතිග්‍රහණය කරගත යුතු වන්නේ ඉතාමත් සාධිකාරී තොරතුරු අන්තර්ගත මනා නිමාවකින් යුත් විමර්ශන මූලාශ්‍රයන් බව පිළිගත් කරුණකි.

2. අධ්‍යයන අරමුණු හා වැදගත්කම

විමර්ශන මූලාශ්‍රය වර්ග පිළිබඳවත්, එහි ඇති වැදගත්කම පිළිබඳවත් එකින් එක වෙන් වෙන්ව විශ්ලේෂණය කිරීමත් මෙහි දී සිදු නොකෙරේ. විමර්ශන මූලාශ්‍රයක් පරිහරණය කිරීමේ දී උපයෝජකයින් මුහුණපාන ගැටලු හඳුනා ගෙන සිදුවන අපහසුතාවන්ගෙන් පාඨක ප්‍රජාව මුදවා විමර්ශන කෘතියක් හඳුනා ගැනීමට අවශ්‍ය මූලික කරුණු විමර්ශනය මෙහි තවත් අරමුණකි. ලෝකයේ විවිධ රටවල විවිධ පුද්ගලයන් හා ප්‍රකාශන සමාගම් විසින් විවිධ වර්ගයේ තොරතුරු මූලාශ්‍රය දහස් ගණනින් බිහි කරනු ලැබේ. එහෙත්, එලෙස යම් යම් දෑ බිහි වූ සැණින් ඒවා පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයන්ට මිල දී ගනු නොලැබෙන්නේ එහි ඇති සාධිකාරී භාවයෙහි අඩු ලුහුඬුකම් නිසා ය.

පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථාන විමර්ශන මූලාශ්‍ර මිල දී ගනු ලබන්නේ කිසියම් නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව ය. විශේෂයෙන් ම, විමර්ශන මූලාශ්‍රයක් මිල දී ගනු ලබන්නේ එම විමර්ශන මූලාශ්‍රය කිසියම් ඇගයීම් ක්‍රමවේදයකට ලක් කිරීමෙන් අනතුරුව ය. මේ කරුණ වඩාත් සරලව සඳහන් කරන්නේ නම්, මෙම ලක්ෂණ විමර්ශන මූලාශ්‍රයක අන්තර්ගත විය යුතු මූලික කරුණු ලෙස ද සඳහන් කළ හැකි ය. විමර්ශන මූලාශ්‍රය ඇගයීම පුස්තකාලය විසින් අනිවාර්යයෙන් ම කළ යුතු ක්‍රියාවලියකි. විමර්ශන මූලාශ්‍රය ඇගයීමෙන් පාඨකයාට අවශ්‍ය විමර්ශන පොතපත මොනවාද ?, පාඨකයන් විසින් නගනු ලබන විවිධාකාර විමර්ශන ප්‍රශ්නවලට පුස්තකාලය සතු විමර්ශන මූලාශ්‍රය පිළිතුරු ලබා දීමට සමත් වන්නේ ද? යන කරුණුවලට පිළිතුරු ලබා ගත හැකි ය. මේ අනුව විමර්ශන මූලාශ්‍රය ප්‍රධාන වශයෙන් ආකාර දෙකක් යටතේ හඳුනා ගත හැකි ය. පළමුවැන්න, මුද්‍රිත මූලාශ්‍රය වන අතර දෙවැන්න, ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍රය වශයෙන් නිර්වචනය කෙරේ.

මාධ්‍ය දෙකක් වශයෙන් පැවතියත් මෙම මූලාශ්‍රය දෙකින් ම සිදු වන්නේ එකම ක්‍රියාවලියකි. එහි දර්ශනය වන වෙනස වන්නේ එහි ඇති මුද්‍රිත හා අමුද්‍රිත යන ස්වරූපය පමණකි. විමර්ශන මූලාශ්‍රයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැ යි විලියම් වර්නර් බිෂෝප් මෙසේ නිර්වචනය කොට ඇත. ''විමර්ශන මූලාශ්‍රයක් යනු පුස්තකාලයට පැමිණෙන පාඨකයන්ට අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා පුස්තකාලයාධිපති විසින් සපයා ඇති මූලාශ්‍රයන් ය. ඒ අනුව, විමර්ශන මූලාශ්‍රයක් සෑම පාඨකයෙකුට ම පෞද්ගලිකව ම උපකාරී වන්නකි.''

සෑම පුස්තකාලයක ම හෝ විඥාපන මධ්‍යස්ථානයක ම ශක්තිමත් බව රඳා පවතින්නේ එහි ඇති විමර්ශන ග්‍රන්ථ එකතුව මතය. විමර්ශන ග්‍රන්ථ හෙවත් මුද්‍රිත විමර්ශන මූලාශ්‍රය ලෙසින් අදහස් කරනු ලබන්නේ විවිධාකාර තොරතුරු නොපමාව ලබා ගත හැකි වන පරිදි ප්‍රමිති ගත අන්දමට අනුපිළිවෙළකට සංවිධානය කර ඇති ග්‍රන්ථ විශේෂයකට ය. සාමාන්‍ය ග්‍රන්ථයකට වඩා විමර්ශන ග්‍රන්ථයක් තරමක් වෙනස් ස්වරූපයක් ගනු ලබයි. එහි දක්නට ලැබෙන විශේෂතා කීපයක් ඇත. ඒවා පහත සඳහන් කෙරේ.

(අ) පොත මුල සිට අගට කියවීම අවශ්‍ය නොවේ.

(ආ) ක්ෂණිකව තොරතුරු උද්ධරණය කරගත හැකි වන පරිදි සැකසී තිබීම.

(ඇ) කෘතිවල අන්තර්ගත කරුණු නිරන්තරයෙන් යාවත් කාලීන වීම.

(ඈ) සාමාන්‍ය ග්‍රන්ථවලට වඩා මිල අධික වීම.

(ඉ) පුස්තකාලයෙන් බැහැරට ගෙන යාමට නොහැකි වීම.

රොබට් එම්. මර්ෆි (Robart M. Merfi) සඳහන් කරන ආකාරයට විමර්ශන ග්‍රන්ථයක් මෙසේ අර්ථ කථනය කෙරේ. ''විමර්ශන අරමුණු සඳහා පමණක් පුස්තකාලයෙහි තිබෙන ග්‍රන්ථ විශේෂය විමර්ශන මූලාශ්‍ර වන අතර යම් විත්දනයක් සඳහා එක දිගට ම නොකිය විය යුතු මේවායින් තමාට අවශ්‍ය තොරතුරු පමණක් පරිශීලනය කළ යුතු ය.''

එමෙන් ම, ඇමෙරිකානු පුස්තකාලය සංගමයේ පාරිභාෂික ශබ්දමාලාව (American Library Association Glossary) සඳහන් කරන ආකාරයට විමර්ශන මූලාශ්‍රයක් යනුවෙන් අදහස් කරන්නේ, ''යම් විත්දනයක් උදෙසා එක දිගටම නොකිය විය යුතු සුවිශේෂී තොරතුරක් දැන ගැනීමට පමණක් භාවිත කළ යුතු ග්‍රන්ථ විශේෂයකි. කිසිදු හේතුවක් නිසා පුස්තකාලයෙන් බැහැරට ගෙන යාමට නොදෙන අතර පුස්තකාලය තුළදී පමණක් පරිශීලනය කළ යුතු ග්‍රන්ථයකි.'' මෙම නිර්වචනයන්ට අනුව විමර්ශන මූලාශ්‍රයක් යනු අතිශය වටිනා ග්‍රන්ථ විශේෂයක් ලෙස අර්ථ කථනය කර ඇත.

3. විමර්ශන මූලාශ්‍ර වර්ග

අනෙකුත් සෑම පුස්තකාල ද්‍රව්‍යයක් සේම විමර්ශන මූලාශ්‍ර ද විවිධාකාරයෙන් නිරූපිත ය. ඒ එහි ස්වභාවය හා අන්තර්ගත තොරතුරු පදනම් කරගෙන ය. අන්තර්ජාතික පුස්තකාලය හා විඥාපන විද්‍යා විශ්වකෝෂයෙහි (International Encyclopaedia of Information Technology and Library Science) දැක්වෙන පරිදි ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර වර්ග 12ක් පිළිබඳ ව අනාවරණය කරගත හැකි ය.

3. 1. ග්‍රන්ථනාමාවලී (Bibliographies)

3. 2. ශබ්දකෝෂ (Dictionaries)

3. 3. විශ්වකෝෂ (Encyclopedias)

3. 4. වාර්ෂික ග්‍රන්ථ (Yearbooks)

3. 5. නියමාවලී (Manuals)

3. 6. චරිතාපදානාත්මක මූලාශ්‍ර (Biographical Resources)

3. 7. අනුක්‍රමණිකා (Indexes)

3. 8. මාලික ප්‍රකාශන (Serial Publications)

3. 9. අත්පොත් (Handbooks)

3. 10. නාමාවලී (Directories)

3. 11. භූගෝල විද්‍යාත්මක මූලාශ්‍ර (Geographical Resources)

3. 12. රජයේ ප්‍රකාශන (Government Publications) යන මූලාශ්‍ර දොළසයි. මෙයින් අංක තුනයි අට යටතේ සඳහන් වන (3. 8.) මාලික ප්‍රකාශන (Serial Publications) විමර්ශන මූලාශ්‍රයක් වශයෙන් වැදගත් වන්නේ කෙසේද ? එහි විවිධ ස්වරූපයන් මොනවාද? යන කරුණු සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය වේ.

4. මාලික ප්‍රකාශන (Serial Publications)

වාර සාහිත්‍යය නැතහොත් වාර ප්‍රකාශන යනුවෙන් මෙම විමර්ශන මූලාශ්‍රය හඳුන්වනු ලැබේ. පොදුවේ ගත්කල්හි මෙම ප්‍රකාශන සඟරා ලෙස නම් කරන අතර මේවා යම් නිශ්චිත කාල පරාසයක් තුළ යම් යම්

සම්මතයන් තුළ පිහිටා ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙසේ ප්‍රකාශයට පත්වන එමෙන් ම ඉතා ප්‍රකට වාර ප්‍රකාශන වර්ගයක් ලෙසින් පුවත්පත් හඳුන්වා දිය හැකි ය. මේවා දිනපතා, සතිපතා හෝ සම්මත කරගත් කාල පරාසයන් තුළ මුද්‍රණය කරනු ලබයි. මාසික, ද්වි මාසික, ත්‍රෛමාසික, සිවු මාසික ආදී වශයෙන් මෙන් ම අර්ධ වාර්ෂික ලෙසින් ද ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙසේ ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන අතර පුවත් හසුන් (News Letters) ශාස්ත්‍රීය ලිපි සරණි (Literary Magazines) හා අධ්‍යාපනික සඟරා ආදිය ද වෙත්. එපමණක් ද නොව වාර්ෂික පළවන වාර්ෂික වාර්තා (Yearbooks) ද වාර සඟරා ගණයට අයත් වේ.

වාර සඟරා කලාප හෝ කාණ්ඩ (Volume) වශයෙන් ආරම්භයේ සිට කිනම් ප්‍රකාශනය ද යන්නත්, කුමන මුද්‍රණය (Issue) ද යන්නෙන් එකී වර්ෂයෙහි කී වැනි මුද්‍රණය ද යන්නත් සඳහන් කරනු ලබයි. ඒ අනුව ආරම්භයේ සිට අදාළ සඟරාව කොපමණ වාර ගණනක් ප්‍රකාශයට පත් කර ඇති ද යන්න පිළිබඳ සංක්ෂිප්ත විවිරණයක් ලෙසින් ද මෙය පෙන්වා දිය හැකි ය. නිදසුනක් ලෙසින් 2005 වර්ෂයේ ආරම්භ කරන ලදුව මාසිකව අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන ලද්දේ නම්, 2026 වර්ෂයේ අප්‍රේල් මාසයේ එය ප්‍රකාශයට පත් කරන්නේ නම් ද, එහි කාණ්ඩය (Volume) අංකගත කෙරෙන්නේ අංක 22 වශයෙනි.

වාර සඟරා කාණ්ඩය යන්නෙන් ආරම්භයේ සිට කොපමණ වර්ෂයක් ගත වී ඇද්ද යන්න පිළිබඳ ව සඳහන් වේ. එමෙන් ම, මුද්‍රණය (Issue) යන්නෙන් අදාළ වර්ෂයේ කුමන වාරය ද යන්නත් සඳහන් වේ. වාර සඟරා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කර දැක්විය හැකි ය. එනම්, පළමුවැන්න සාමාන්‍ය වාර සඟරා (Popular) වන අතර දෙවැන්න, විද්වත් වාර සඟරා (Scholarly) වශයෙන් ද වර්ගීකරණය කෙරේ. සාමාන්‍ය වාර ප්‍රකාශන යටතේ දිනපතා හා සතිපතා පළවන ලංකාදීප, දිනමිණ, Times, Daily News ආදී පුවත්පත් ද, විද්වත් වාර ප්‍රකාශන යටතේ වෛද්‍යවරයා, සමාජ විමර්ශී, The Journal of Psychology, Journal of Social Work වැනි සඟරා ද පෙන්වා දිය හැකි ය. පොදු අර්ථයෙන් ගෙන විශ්ලේෂණය කිරීමේ දී වාර සඟරා හෙවත් මාලික ප්‍රකාශන එහි ස්වරූපීය ලක්ෂණ අනුව වර්ග පහක් යටතේ හඳුනාගත හැකි ය.

4. 1 පොදු වාරික ප්‍රකාශන (General Serial Publication)

4. 2 වාර ප්‍රකාශනය (Serial Publication)

4. 3 වාර සඟරාව (Periodical)

4. 4 විද්වත් සඟරා (Scholarly Journal)

4. 5 ශාස්ත්‍රීය වාර සඟරා (Academic Periodicals)

පූර්වයෙන් සඳහන් කරන ලද එක් එක් සඟරා පිළිබඳ කෙටි විස්තරයක් පහත සඳහන් කෙරේ. පොදු පාඨක ප්‍රජාවට එවැනි තොරතුරු ප්‍රයෝජනවත් විය හැකි ය.

පොදු වාරික ප්‍රකාශන (General Serial Publication)

සාමාන්‍ය පාඨකයා ඉලක්ක කොට ගත් නව තොරතුරු හා විනෝදාත්මක කියවීම් සඳහා වූ නිර්මාණාත්මක ලිපි අන්තර්ගතව ප්‍රකාශිත ය. කාන්තා පිරිස ඉලක්ककර එවැනි ප්‍රකාශන රාශියක් විවිධ

රටවල මුද්‍රණය කෙරෙන අතර පොදු පාඨක ප්‍රජාව වෙනුවෙන් මනහර, මුතුහර, රීඩර්ස් ඩයිජස්ට් වැනි වාරික ප්‍රකාශන ඇත. රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන ද තම

සේවාවන් පිළිබඳ දැනුම්වත් කිරීමට මෙවැනි ප්‍රකාශන නිකුත් කෙරේ.

වාර ප්‍රකාශනය (Serial Publication)

වාර ප්‍රකාශනයක් හෝ වාරික ප්‍රකාශනයක් යනු නියමිත කාලාන්තරයක් සහිත ව හෝ කලාන්තරයක් ආවරණය කිරීම අරමුණු කර ගෙන කලාප වශයෙන් නිකුත් වන ප්‍රකාශනයකි. වාර ප්‍රකාශන යටතේ පුවත් සඟරා, විචාර වාර සඟරා, අනුක්‍රමණිකා හා සාර සංග්‍රහ වාර සඟරා වශයෙන් ස්වරූප කීපයක් යටතේ හඳුනාගත හැකි ය. වාරික ප්‍රකාශන බෙදාහැරීමේ ක්‍රමය මුද්‍රිත ග්‍රන්ථ (පොත්) බෙදාහැරීමේ ක්‍රමයට වඩා අතිශයින් ම වෙනස් වූ ක්‍රමයකි. වාරික ප්‍රකාශනය සඳහා වන දායක මුදල එම කලාපය ප්‍රකාශවීමට පෙර වර්ෂවල ගෙවිය යුතු ය. ඒ නිසා වාරික ප්‍රකාශනය නිකුත් වූ විගස ම එය නොපමාව පාඨකයා වෙත ලැබෙනු ඇත. වාරික ප්‍රකාශනවල ස්වරූප දෙකක් ඇත. පොදු වාරික ප්‍රකාශන හා ශාස්ත්‍රීය වාරික ප්‍රකාශන වශයෙනි.

වාර සඟරාව (Periodical)

විමර්ශන මූලාශ්‍රයක් වශයෙන් වාර සඟරාවට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. වාච්‍යාර්ථය වශයෙන් ගෙන විශ්ලේෂණය කිරීමේ දී වාර ප්‍රකාශනයක් හා වාර සඟරාවක් අතර පැහැදිලි වෙනසක් දක්නට නොලැබේ. වාරිකව ප්‍රකාශිත කුමන හෝ ප්‍රකාශනයක් ඒ නමින් හැඳින්වේ. නවතම පර්යේෂණ හා කාලීන තොරතුරු ලබා ගැනීමට වාර සඟරාවෙන් කෙරෙන ශාස්ත්‍රීය දායකත්වය කැපී පෙනෙයි. පර්යේෂණ හා අධ්‍යයන පුස්තකාලයවල වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීමේ දී වාර සඟරා සඳහා වැඩි ප්‍රතිපාදන වෙන් කරනු ලබයි.

ඩොනල්ඩ් ඩෙවින්සන් විසින් රචිත The Periodicals Collection නම් ග්‍රන්ථයෙහි වාර සඟරා යන වචනය නිර්වචනය කර ඇත්තේ "In European and especially British practice it is usual to find periodicals as the blanket term used to describe publications issued under the same title in parts produced at regular interval ina sequence with no foreseeable end" යනුවෙනි. වෙබ්ස්ටර් ශබ්දකෝෂය අනුව වසරකට කීපවරක් බැගින් වාර්ෂිකව ප්‍රකාශයට පත්වන්නක් ලෙස අර්ථ නිරූපණය කර ඇත.

වාර සඟරාවල ආරම්භය පිළිබඳ ඉතිහාසය 17 වන සියවස දක්වා ඇත අතීතය හා සම්බන්ධ වේ. ලෝව මුලින් ම බිහි වූ සඟරාව වශයෙන් වර්ෂ 1665 බ්‍රිතාන්‍යයේ Royal Society මගින් ප්‍රකාශිත "Philosophical Transaction of the Royal Society නම් සඟරාවයි. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සංවර්ධනයත් සමඟ සඟරා ප්‍රකාශනය ද වර්ධනය විය.

ශාස්ත්‍රීය වාර සඟරා (Academic Periodicals)

විවිධ වෘත්තිකයන් හෝ වෘත්තීය සංවිධාන විසින් පළකරනු ලබන ශාස්ත්‍රීය හෝ වෘත්තීය වැදගත්කමකින් යුතු ලිපි අන්තර්ගත ප්‍රකාශනයකි. ලංකා පුස්තකාලයය සංගමය 1962 ජනවාරි මස ලංකා පුස්තකාලයය සංගමයේ සඟරාව කාණ්ඩය 1 හා කලාපය 1 ප්‍රකාශයට පත් කර ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් ලිපි ප්‍රකාශයට පත්කිරීමට ආරම්භක අවධියේ කටයුතු කර තිබීම ප්‍රසංශනීය කරුණකි. වර්ෂ 1985 ආරම්භ වූ ශ්‍රී ලංකා පුස්තකාලය විමර්ශන සඟරාව විධිමත් ලෙස ප්‍රකාශ කෙරේ. වර්ෂ 1962 සිට 2026 වර්ෂය දක්වා සඟරා 52ක් ප්‍රකාශිත ය.

විද්වත් සඟරා (Scholarly Journal)

විද්‍යාව හා තාක්ෂණ සම්බන්ධ පර්යේෂණ ආයතන විසින් ප්‍රකාශිත සඟරා මේ යටතට අයත් වේ. උසස් අධ්‍යාපන ආයතන හෝ විද්වත් වෘත්තික හා වෘත්තීය සංගම් විසින් ද විද්වත් සඟරා ප්‍රකාශයට පත් කිරීම ඒ ආයතනවල අරමුණුවල සඳහන් වේ. එක් එක් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රාමාණික විද්වතුන්ගේ හෝ විමර්ශකයන්ගේ නිර්දේශානුකූලව මේ සඟරා සඳහා ලිපි තෝරාගනු ලැබේ. ශාස්ත්‍රීය, පර්යේෂණාත්මක, ප්‍රායෝගික හා න්‍යාත්මක පසුබිමක් අදාළ ලිපිවලින් පිළිබිඹු කෙරේ. ඒ අනුව න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් ද විද්වත් සඟරාවල ස්වරූප දෙකක් ඇති බව වියතුන්ගේ පිළිගැනීමකි.

විශ්වවිද්‍යාල පුස්තකාලයයක ග්‍රන්ථ ප්‍රතිග්‍රහණයට ඇති ප්‍රතිපාදනවලින් සැලකිය යුතු මුදලක් විද්වත් සඟරා ප්‍රතිග්‍රහණයට වැය කෙරේ. වර්තමානයේ බොහෝ පර්යේෂණ ආයතනවල විද්වත් සඟරා මුද්‍රිත මාධ්‍යයෙන් බැහැර අන්තර්ජාල පසුබිමක ප්‍රකාශයට පත්වන හෙයින් ඒ සඳහා දායකත්වය ලබා ගත යුතු ය. අන්තර්පුස්තකාලය සහයෝගිතා ක්‍රම යටතේ ද ඊට දායක විය හැකි ය. විමර්ශන මූලාශ්‍රය වර්ගයක් වශයෙන් වාරික ප්‍රකාශනවල ශාස්ත්‍රීය දායකත්වය ක්ෂේත්‍ර කීපයක් යටතේ අනුමාතෘකාව ශයෙන් ගෙන සාකච්ඡා කළ හැකි ය. ඒ අනුව වාරික ප්‍රකාශනවල ප්‍රධාන ශාස්ත්‍රීය දායකත්වයන් කීපයක් පහත දැක්වෙන පරිදි සඳහන් කෙරේ.

(අ) නව දැනුම නිර්මාණය කිරීම

පර්යේෂණ ලිපි මගින් නව සොයාගැනීම්, න්‍යායන් සහ සංකල්ප ඉදිරිපත් කිරීම.

(ආ) පර්යේෂණ ප්‍රතිඵල ප්‍රචාරය කිරීම

විශ්වවිද්‍යාල, පර්යේෂකයන් සහ විද්වතුන් අතර නව පර්යේෂණ දැනුම හුවමාරු කරගත හැකි වීම.

(ඇ) විද්‍යාත්මක සංවාදය වර්ධනය කිරීම

විවිධ පර්යේෂකයන්ගේ අදහස්, විවේචන සහ ප්‍රතිචාර සඳහා සමාජගත කිරීමට වේදිකාවක් නිර්මාණය වීම.

(ඈ) පෙර පර්යේෂණ පුළුල් කිරීම

පවතින සාහිත්‍යය සමාලෝචනය කර එහි හිඩැස් හඳුනාගෙන නව පර්යේෂණ සඳහා මඟ පෙන්වීමක් කරගත හැකි වීම.

(ඉ) විෂය ක්ෂේත්‍රයේ ප්‍රමිතිය ඉහළ නැංවීම

පූර්ව විමර්ශන වැනි ක්‍රියාවලියින් අනුගමනය කිරීමෙන් පර්යේෂණයේ ගුණාත්මකභාවය සහ විශ්වසනීයත්වය ආරක්ෂා කරගත හැකි වීම.

(ඊ) ශාස්ත්‍රීය මූලාශ්‍රයක් ලෙස භාවිත වීම

සිසුන්ට සහ පර්යේෂකයන්ට සාහිත්‍ය සමාලෝචන, උපුටා දැක්වීම් සහ නව පර්යේෂණ සඳහා විශ්වාසදායක මූලාශ්‍රයක් සම්පාදනය වීම.

(උ) ප්‍රායෝගික දැනුමට දායක වීම

ඇතැම් වාරික ප්‍රකාශන මගින් පර්යේෂණ සොයාගැනීම් අධ්‍යාපනය, සෞඛ්‍යය, ආර්ථිකය, තාක්ෂණය වැනි ක්ෂේත්‍රවල ප්‍රායෝගික භාවිතයට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු වීම.

වාරික ප්‍රකාශනයක ශාස්ත්‍රීය දායකත්වය ඇගයීමේ දී වාරික ප්‍රකාශනයක් ශාස්ත්‍රීය වටිනාකමක් දරන්නේ ද යන්න විමර්ශනයේ දී කර්තෘගේ සුදුසුකම්, පූර්ව විමර්ශන (peer-review) ක්‍රියාවලිය, කර්තෘ මණ්ඩලය හෝ සංස්කාරක මණ්ඩලයයේ ව්‍යුහය, උද්ධරණ හා උපුටා දැක්වීම්, ප්‍රකාශනයට අදාළ ආචාරධර්ම සහ දර්ශකගත වීම වැනි කරුණු සලකා බැලීම වැදගත් ය.

ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස

ගෞරව ශාස්ත්‍රවේදී, සමාජීය විද්‍යාපති, දර්ශන විශාරද (කැලණිය විශ්වවිද්‍යාලය)

ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

අධිසමාජික (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය

නාම යෝජනා ලැබූ පාලක මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය 2026/2027

බාහිර කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා ලේඛනාරක්ෂක විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

බාහිර කථිකාචාර්ය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

Constructive Alignment රොබට් සහ සූසන්ගේ කතාවෙන් ඉගෙන ගනිමු - ආර්.එම් නදීකා රත්නභාහු

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යන අංශය

සමාජීය විද්‍යා පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

හැඳින්වීම

උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීමේදී සිසුන් ඉගෙන ගන්නා ආකාරය පිළිබඳව හඳුන්වා දුන් Constructive Alignment සංකල්පය ලෝකයේ බොහෝ විශ්වවිද්‍යාලවල පාඨමාලා සැලසුම් කිරීමේ මූලික ප්‍රවේශයක් ලෙස භාවිත වේ. මෙම සංකල්පය පැහැදිලි කිරීම සඳහා මෙහි නිර්මාතෘ වන John Biggs විසින් "රොබට් සහ සුසන්" නම් සිසුන් දෙදෙනෙකුගේ උදාහරණය ඉදිරිපත් කරයි. ඒ අනුව මෙම ලිපියේ අරමුණ වන්නේ Constructive Alignment සංකල්පය ආශ්‍රයෙන් සර්ථක ඉගැනුම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳව "රොබට් සහ සූසන්" ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමයි.

සූසන් (Susan) සහ රොබට් (Robert) යනු කවුරුන්ද?

සූසන් යනු ඉගෙනීමට දැඩි උනන්දුවක් දක්වන, දේශන ශාලාවට යාමට පෙර සූදානම් වන, විෂය කරුණු ගැඹුරින් අවබෝධ කර ගැනීමට උත්සාහ කරන සිසුවියකි. ඇය නව දැනුම, පෙර දැනුම සමඟ සම්බන්ධ කරමින් ගැඹුරු ඉගෙනුම් (Deep Learning) ප්‍රවේශයක් අනුගමනය කරයි. ඒ අනුව සූසන් යනු "අවබෝධ කරගෙන ඉගෙන ගන්නා" ශිෂ්‍යාවකි.

නමුත්, රොබට් යනු විභාගය සමත් වීම පමණක් අරමුණු කරගෙන ඉගෙන ගන්නා සිසුවෙකි. ඔහු තොරතුරු මතක තබාගෙන විභාගයේදී නැවත ඉදිරිපත් කිරීමට උත්සාහ කරන අතර, ගැඹුරු අවබෝධයකට වඩා මතුපිට ඉගෙනුම (Surface Learning) භාවිත කරයි. ඒ අනුව රොබට් යනු "විභාගය සඳහා මතක තබාගෙන ඉගෙන ගන්නා" ශිෂ්‍යයෙකි.

Biggs විසින් ඉදිරිපත් කළ "රොබට් සහ සූසන්" උදාහරණය මඟින් මතුපිට ඉගෙනුම (Surface Learning) සහ ගැඹුරු ඉගෙනුම (Deep Learning) අතර වෙනස පහත 1 වගුවෙන් තුලනාත්මකව නිරූපණය වේ.

1 වගුව

Surface Learning සහ Deep Learning අතර වෙනස - රොබට් සහ සූසන් ආශ්‍රයෙන්

අංගය	සූසන් **(Susan)**	රොබට් **(Robert)**
ඉගෙනීම පිළිබඳ ආකල්පය	ඉගෙනීම පුද්ගලික වර්ධනයට සහ වෘත්තීය අනාගතයට වැදගත් ලෙස සලකයි.	උපාධිය සහ රැකියාව ලබාගැනීම ප්‍රධාන අරමුණ කර ගනී.
ඉගෙනුම් ප්‍රවේශය	ගැඹුරු ඉගෙනුම (Deep Approach) භාවිත කරයි.	මතුපිට ඉගෙනුම (Surface Approach) භාවිත කරයි.
දේශනය සඳහා සූදානම	කලින් කියවා පැමිණෙයි, ප්‍රශ්න සූදානම් කරයි.	අවම සූදානමකින් දේශනයට සහභාගි වේ.
දැනුම භාවිතය	නව දැනුම පෙර දැනුම සමඟ සම්බන්ධ කරයි.	තොරතුරු වෙන් වෙන්ව මතක තබා ගනී.
ඉගෙනීමේ අරමුණ	අවබෝධය සහ දැනුම ගොඩනැගීම.	විභාගය සමත් වීම.
පන්ති ක්‍රියාකාරකම්	සාකච්ඡාවලට ක්‍රියාශීලීව දායක වේ.	අවම සහභාගිත්වයක් පෙන්වයි.
ඇගයීම්වල ප්‍රතිචාර	විශ්ලේෂණය, සංශ්ලේෂණය සහ විවේචනාත්මක චින්තනය පෙන්වයි.	මතක තබාගත් තොරතුරු නැවත ඉදිරිපත් කරයි.
සාම්ප්‍රදායික ඉගැන්වීමේදී	සාමාන්‍යයෙන් සාර්ථක වේ.	බොහෝවිට අඩු කාර්ය සාධනයක් දක්වයි.
Constructive Alignment යටතේ	දැනටමත් ගැඹුරු ඉගෙනුම කරයි.	නිසි ලෙස සැලසුම් කළ ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ ඇගයීම් මඟින් ගැඹුරු ඉගෙනුමකට යොමු කළ හැකිය.

මේ අනුව සාර්ථක පාඨමාලා සැලසුමක් රොබට්ව සූසන් බවට පත් නොකරයි. නමුත් රොබට්ට සුසන් මෙන්ම සාර්ථකව ඉගෙන ගැනීමට අවස්ථාව සලසයි.

Constructive Alignment මඟින් වෙනසක් සිදුවන්නේ කෙසේද?


සාම්ප්‍රදායික ඉගැන්වීමේ දී සූසන් වැනි සිසුන් සාමාන්‍යයෙන් සාර්ථක වන අතර රොබට් වැනි සිසුන් පසුබසින බව දැකිය හැකිය. නමුත් Bigg පෙන්වා දෙන පරිදි ගැටලුව සිසුන් තුළ පමණක් නොව, පාඨමාලා සැලසුම් කරන ආකාරය තුළ ද පවතියි.

Constructive Alignment අනුව, ඉගෙනුම් ප්‍රතිඵල (Learning Outcome) පැහැදිලිව නිර්වචනය කළ යුතුය. ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාකාරකම් (Teaching and Learning Activities) එම ප්‍රතිඵල ලබාගැනීමට සහාය විය යුතුය. ඇගයීම් (Assessments) ඉගෙනුම් ප්‍රතිඵල සමඟ සෘජුවම ගැළපිය යුතුය.

මෙලෙස පාඨමාලාවේ සියලුම අංග එකම දිශාවකට යොමු වූ විට, සූසන් පමණක් නොව රොබට් ද ගැඹුරු ඉගෙනුමකට යොමු කළ හැකිය. පහත 1 රූප සටහන එක මගින් එය නිදර්ශනය කෙරේ.

1 රූප සටහන

Explaining Constructive Alignment



ඒ අනුව Constructive Alignment යටතේ පාඨමාලා ඉලක්ක, ඉගැන්වීමේ ක්‍රම සහ විභාග සම්බන්ධ කරන අතර එමඟින් සියල්ල එකම ඉලක්කයක් කරා එකට ක්‍රියා කරයි. මෙහි මූලික සංරචක තුනකි.

1.අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල (Intended Learning Outcomes-ILOs)

පාඨමාලාව අවසානයේදී සිසුන් දැන සිටිය යුතු හෝ ඔවුන්ට කළ හැකි විය යුතු දේ පිළිබඳව, පැහැදිලිව මැනිය හැකි ප්‍රකාශයන් මෙහිදී නිර්වචනය කරයි.

2.ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් (Teaching and Learning Activities – TLAs)

සිසුන්ට අවශ්‍ය කුසලතා ගොඩනඟා ගැනීමට ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන, ක්‍රියාකාරී ඉගෙනුම් කාර්යයන් (උදා: විද්‍යාගාර කටයුතු, විවාද, හෝ ගැටළු විසඳීමේ ක්‍රියාකාරකම්) මෙහිදී සැලසුම් කරයි.


3.ඇගයීම් කාර්යයන් (Assessment Tasks – ATs)

සිසුන් එම අපේක්ෂිත ප්‍රතිඵල සැබවින්ම ළඟා කරගෙන තිබේද යන්න සෘජුවම මැන බලන පරීක්ෂණ, ව්‍යාපෘති හෝ ලිඛිත කාර්යයන් මෙහිදී සකස් කරයි.

ගුරුවරුන් සඳහා පාඨමාලාවක ප්‍රධානතම අංගය එහි 'ඉගෙනුම් ප්‍රතිඵල' (learning outcomes) වන නමුත්, සිසුන්ගේ ප්‍රධාන අවධානය යොමුවන්නේ 'ඇගයීම් කාර්යයන්' (assessment tasks) වෙත ය. සිසුන් විසින් උත්සහ කරනු ලබන්නේ ඉහළ ශ්‍රේණි ලබා ගැනීම, පාඨමාලා සමත් වීම සහ අධ්‍යයන වාර (semesters) හරහා ඉදිරියට යාමයි. යම් පාඨමාලාවක් හෝ මාතෘකාවක් ඔවුන්ගේ වෘත්තීය අනාගතයට වැදගත් වන්නේ ද යන්න පිළිබඳව ඔවුන්ට යම් අවබෝධයක් තිබිය හැකි වුව ද, කෙටි කාලීනව ඔවුන්ගේ අවධානය යොමුවන්නේ එම පාඨමාලාව සමත් වීම කෙරෙහි පමණි. නමුත්, යම් කරුණක් ඇගයීමට ලක් කෙරේ නම්, සිසුන් එය ඉගෙන ගැනීමට උත්සාහ දරයි. නමුත් යම් විෂය කරුණක් ඇගයීමට ලක් නොකෙරේ නම්, සිසුන් ඒ කෙරෙහි අවධානය යොමු නොකරයි. ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලීන් කෙරෙහි ඇගයීම් ක්‍රමවලට බලපෑම් කළ හැකි ආකාරය (මෙය backwash බලපෑම ලෙස හැඳින්වේ) පිළිබඳව Bigg සහ පිරිස (2022 පිටුව 188) වැඩිදුර විස්තර කරති. මෙහි ඇති වැදගත්ම කරුණ නම්, "සිසුන් ඉගෙන ගත යුතු දේට අනුකූල වන පරිදි ඇගයීම් ක්‍රම සකසා ඇති විට, එමඟින් නිසි ඉගෙනුම් ක්‍රියාවලිය දිරිමත් කරමින් ධනාත්මක බලපෑමක් (backwashz) ඇති කළ හැකි බව ඔවුන් විසින් පෙන්වා දීමයි. ගුරුවරුන් සහ සිසුන් අතර පවතින මෙම දෘෂ්ටිකෝණවල වෙනස Bigg සහ පිරිස පහත 2 රූප සටහන පරිදි පෙන්වා දෙති.

2 රූප සටහන

ගුරුවරුන් සහ සිසුන් අතර පවතින දෘෂ්ටිකෝණවල වෙනස



Source – (Biggs et al., 2022; as cited in GLION library)

ගුරුවරයාගේ දෘෂ්ටිකෝණයෙන් බලන කල, ඇගයීම යනු ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන අදියර බව ඊසටටී සහ පිරිස පෙන්වා දෙයි. ඊට ප්‍රතිවිරුද්ධව, සිසුන්ගේ දෘෂ්ටිකෝණයෙන් බලන විට ඇගයීම පිහිටා ඇත්තේ ආරම්භයේදී ය; එනම්, ඔවුන් වැඩි අවධානයක් යොමු කරන පළමු අංගය එය වන අතර, ඔවුන් සිදු කරන ඕනෑම කාර්යයක අරමුණ වන්නේ එම ඇගයීම සමත් වීමයි. එබැවින්, ඉගෙනුම් ප්‍රතිඵල ඇගයීම් කාර්යයන් තුළ (ඉහළට සහ පහළට යොමු වූ ඊතල මගින් නිරූපණය කර ඇති පරිදි) අන්තර්ගත කර ඇත්නම්," ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාකාරකම් සහ සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාකාරකම් යන දෙකම එකම ඉලක්කයක් සපුරා ගැනීම සඳහා පෙළගැසෙයි. එබැවින්, ඇගයීම් සඳහා සූදානම් වීමේදී, සිසුන් අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල ඉගෙන ගනු ඇත" (පි.188-189). මෙහිදී, ඇගයීම් සමත් වීමට සිසුන් තුළ ඇති පෙළඹවීම, පාඨමාලාවේ ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ව යොමු කර ගැනීමට යොදා ගැනේ. Constructive Alignment ආශ්‍රයෙන් මෙම අභියෝග සාර්ථක කර ගැනීමේ හැකියාව පවතී.

පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනයට Constructive Alignment හි අදාළත්වය

පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපනය තුළද Constructive Alignment ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස, "තොරතුරු සාක්ෂරතාවය ඇගයීමට හැකි වීම" යන ඉගෙනුම් ප්‍රතිඵලයක් තිබේ නම්, දේශන පමණක් මේ සඳහා ප්‍රමාණවත් නොවේ. මේ සඳහා සිසුන්ට තොරතුරු සෙවීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රායෝගික ව්‍යාපෘති සිදු කිරීම සඳහා අවස්ථා සැලසිය යුතුය. ඇගයීම්ද එම කුසලතා මැන බලන ආකාරයෙන් සැලසුම් කළ යුතුය.

Constructive Alignment පාදක ඉගෙනුම් ප්‍රතිඵල (ILOs) සමඟ අනුකූල වූ පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාලා උදාහරණයෙන් එය තවදුරටත් පැහැදිලි වනු ඇත (2 වගුව).

2 වගුව

පුස්තකාල හා තොරතුරු විද්‍යා පාඨමාලා උදාහරණයක් ආශ්‍රයෙන් Constructive Alignment Approach පැහැදිලි කිරීම

පාඨමාලා නාමය:	තොරතුරු සාක්ෂරතාවය සහ තොරතුරු සමුද්ධරණය (Information Literacy and Information Retrieval)
සමස්ත පාඨමාලා ඉගෙනුම් ප්‍රතිඵල (ILOs)	පාඨමාලාව අවසානයේදී ශිෂ්‍යයාට: **1.** තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම. 2. සුදුසු තොරතුරු මූලාශ්‍ර තෝරා ගැනීම. 3. දත්ත සමුදා සහ සෙවුම් මෙවලම් කාර්යක්ෂමව භාවිතා කිරීම. 4. තොරතුරුවල විශ්වසනීයත්වය ඇගයීම. 5. සදාචාරාත්මක සහ නීතිමය ප්‍රමිතීන්ට අනුකූලව තොරතුරු භාවිතා කිරීම. 6. අධ්‍යයන හා වෘත්තීය ගැටළු විසඳීම සඳහා තොරතුරු සංශ්ලේෂණය කිරීමට හැකි විය යුතුය.
ILO 1 අනුව අන්තර්ගතය, ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ ඇගයීම	**ILO** 1: තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම
	අන්තර්ගතය 1. තොරතුරු අවශ්‍යතා සංකල්පය 2. පරිශීලක හැසිරීම් 3. තොරතුරු සෙවුම් ආකෘති

	ඉගෙනුම් ක්‍රියාකාරකම් 1. **සිද්ධි අධ්‍යයන** (Case & Studies) 2. **කණ්ඩායම් සාකච්ඡා** 3. **ගැටලු මත පදනම් වූ ඉගෙනුම**
	ඇගයීම 1. Reflective Journal 2. Case Analysis Report

වගුව 1 හි සඳහන් පරිදි තොරතුරු සාක්ෂරතාවය සහ තොරතුරු සමුද්ධරණය පාඨමාලා නාමය යටතේ පළමු අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵලය ඉදිරිපත් කරන්නේ කෙසේදැයි 2 වගුව විසින් නිරූපණය කෙරේ.

2 වගුව

අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵලයක් (ILO) වෙනුවෙන් Constructive Alignment යොදාගන්නා ආකාරය

ILO 1 - **තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම**		
අන්තර්ගතය	**ඉගෙනුම් ක්‍රියාකාරකම්**	**ඇගයීම**
1. **තොරතුරු අවශ්‍යතා සංකල්පය**	**සිද්ධි අධ්‍යයන**	1. Reflective Journal 2. Case Analysis Report
2. **පරිශීලක හැසිරීම්**	**කණ්ඩායම් සාකච්ඡා**	
3. **තොරතුරු සෙවුම් ආකෘති**	**ගැටලු මත පදනම් වූ ඉගෙනුම් ක්‍රමවේද**	

ඒ අනුව අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵලය වඩාත් සාර්ථකව ඉටුකර ගැනීමේ හැකියාව ගුරුවරයාට මෙන්ම ශිෂ්‍යයාටද පවතී. ගුරුවරුන් සහ සිසුන් විසින් පන්ති කාමරයට යෑමට පූර්වයෙන් සියල්ල සැලසුම් කිරීම සහ පාඩම පිළිබඳ වන අවබෝධය තුළින් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව පවතී. එමගින් අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ ඇගැයීම එකිනෙකට සම්බන්ධ ක්‍රියාවලියක් ලෙස පෙළගස්වා ගැනීම සිදුකළ හැකිය. ඒ අනුව රොබට්ට ද සූසන් මෙන් අධ්‍යයන ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

නිගමනය

අවසන් වශයෙන් රොබට් සහ සූසන්ගේ කතාව 'ඉගැන්වීම' පිළිබඳ වැදගත් පාඩමක් ලබා දෙයි. සියලුම සිසුන් සූසන් මෙන් ස්වයංක්‍රීයව ගැඹුරු ඉගෙනුමකට යොමු නොවූවත්, නිසි ලෙස සැලසුම් කළ පාඨමාලාවක් තුළ රොබට්වද සාර්ථක ඉගෙනුමකට යොමු කළ හැකිය. Constructive Alignment යනු එම අරමුණ ඉටු කරන ප්‍රබල අධ්‍යාපනික ප්‍රවේශයකි.

"හොඳ (good) **ඉගැන්වීම** යනු දක්ෂ සිසුන්ට පමණක් නොව, සෑම සිසුවෙකුටම සාර්ථකව ඉගෙන ගැනීමට අවස්ථාව සලසා දීමයි."

විමර්ශනය

Biggs, J., Tang, C., & Kennedy, G. (2022). Teaching for quality learning at university (5th ed.). McGraw Hill

වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය ගැටලු හා ඒවාට විසඳුම්:

ඩිජිටල් යුගයේ පුස්තකාල වෘත්තියේ අභියෝග සහ අවස්ථා

ප්‍රියානී බාලසූරිය

පුස්තකාලයාධිපති

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, කොළඹ 07.

priyani@slida.gov.lk

සාරාංශය

21 වන සියවසේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වේගවත් සංවර්ධනයත් සමඟ පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රය විශාල පරිවර්තනයකට භාජනය වී ඇත. සාම්ප්‍රදායික පුස්තකාල සේවාවන් ඩිජිටල් සේවා බවට පරිවර්තනය වීමත් සමඟ වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් නව අභියෝග රැසකට මුහුණ දී සිටිති. ඩිජිටල් සාක්ෂරතාව, තාක්ෂණික කුසලතා සංවර්ධනය, තොරතුරු සම්පත් කළමනාකරණය, විද්‍යාත්මක සන්නිවේදනය, පර්යේෂණ දත්ත කළමනාකරණය හා විවෘත ප්‍රවේශ ප්‍රකාශන යනාදිය වර්තමාන පුස්තකාල වෘත්තියේ නව මාර්ගෝපදේශක අංශ බවට පත්ව ඇත. එහෙත් මූල්‍ය සම්පත් හිඟය, වෘත්තීය පිළිගැනීමේ ගැටලු, පුහුණු වූ මානව සම්පත් හිඟය, තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම්වල සීමාකම් හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා අවම වීම වැනි කරුණු වෘත්තීය ප්‍රගතියට බාධා ඇති කරයි. මෙම ලිපිය මඟින් වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු විශ්ලේෂණය කර ඒවාට යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කරයි. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය, තාක්ෂණික නව්‍යකරණය, පර්යේෂණ සහ සාක්ෂි මත පදනම් වූ පුස්තකාල සේවාව, වෘත්තීය සංගම්වල ක්‍රියාකාරී මැදිහත් වීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව මෙම අභියෝගයන්ට සාර්ථක විසඳුම් ලෙස හඳුනාගත හැකිය.

මූල පද: පුස්තකාලයාධිපති, වෘත්තීය සංවර්ධනය, තොරතුරු තාක්ෂණය, ඩිජිටල් පුස්තකාල, තොරතුරු සාක්ෂරතාව, පර්යේෂණ සහාය

හැඳින්වීම

දැනුම මත පදනම් වූ සමාජයක සංවර්ධනය සඳහා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන අත්‍යවශ්‍ය යටිතල පහසුකමකි. ඉතිහාසය පුරාවටම පුස්තකාලය දැනුම සංරක්ෂණය, සංවිධානය සහ ප්‍රචාරණය කිරීමේ ප්‍රධාන ආයතනය ලෙස කටයුතු කර ඇත. පුස්තකාලයාධිපතිවරුන් එම ක්‍රියාවලියේ මූලික වෘත්තිකයන් වන අතර ඔවුන්ගේ කාර්යභාරය කාලයත් සමඟ සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත.

අතීතයේදී පුස්තකාලයාධිපතිවරයාගේ ප්‍රධාන වගකීම වූයේ පොත් හා වෙනත් මුද්‍රිත සම්පත් තෝරා ගැනීම, වර්ගීකරණය, නාමාවලිකරණය සහ සංරක්ෂණය කිරීමය. එහෙත් වර්තමානයේදී තොරතුරු සම්පත් බහුතරයක් ඩිජිටල් ආකාරයෙන් නිර්මාණය වන අතර පරිශීලකයන්ගේ අවශ්‍යතාවන් ද වෙනස් වී ඇත. ඒ අනුව පුස්තකාලයාධිපතිවරුන් දැනුම් කළමනාකරුවන්, තොරතුරු උපදේශකයන්, පර්යේෂණ

සහායකයන්, ඩිජිටල් අන්තර්ගත කළමනාකරුවන් සහ තොරතුරු සාක්ෂරතා උපදේශකයන් ලෙස නව භූමිකාවන් භාරගෙන තිබේ.

මෙම නව වෘත්තීය වාතාවරණය තුළ පුස්තකාලයාධිපතිවරුන්ට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුවේ. මෙම ලිපියේ අරමුණ වන්නේ එම ගැටලු හඳුනාගෙන, ඒවා විසඳීම සඳහා ප්‍රායෝගික ප්‍රවේශයන් ඉදිරිපත් කිරීමයි.

වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යභාරයේ පරිවර්තනය

ඩිජිටල් තාක්ෂණයේ වර්ධනය නිසා පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යභාරය පුළුල් වී ඇත. වර්තමානයේදී පුස්තකාල වෘත්තිකයන්:

- ඩිජිටල් මාධ්‍ය තොරතුර සම්පත් කළමනාකරණය කරයි.
- විද්‍යාත්මක දත්ත සමුදා භාවිතය පිළිබඳ උපදේශනය සපයයි.
- පර්යේෂකයන්ට උපුටා දැක්වීම් හා ප්‍රකාශන ආචාරධර්ම පිළිබඳ මගපෙන්වයි.
- විවෘත ප්‍රවේශ (Open Access) ප්‍රකාශන ප්‍රවර්ධනය කරයි.
- තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සංවිධානය කරයි.
- පර්යේෂණ දත්ත කළමනාකරණයට සහාය දක්වයි.

මෙම වගකීම් සාම්ප්‍රදායික පුස්තකාල සේවාවට වඩා බොහෝ දුරට පුළුල් වී ඇති අතර ඒ සඳහා විශේෂ දැනුම හා කුසලතා අවශ්‍ය වේ.

පුස්තකාල ක්ෂේත්‍රය් පවත්නා වෘත්තීය ගැටලු

ඩිජිටල් තාක්ෂණ හා කුසලතා හිඟය

පුස්තකාල වෘත්තියේ විශාලතම අභියෝගය වන්නේ තාක්ෂණයට අනුගත වීමයි. ඩිජිටල් පුස්තකාල පද්ධති, දත්ත සමුදා, වලාකුළු පරිගණකකරණය (Cloud computing), කෘත්‍රිම බුද්ධිය සහ විශාල දත්ත (Big Data) වැනි නව තාක්ෂණික සංකල්ප පුස්තකාල සේවාවන්ට එක්වීම නිසා වෘත්තිකයන්ට නිරන්තරයෙන් නව දැනුම ලබාගැනීමට සිදුවේ.

ශ්‍රී ලංකාවේ බොහෝ පුස්තකාලවල තාක්ෂණික පුහුණුව සඳහා වෙන්කර ඇති සම්පත් සීමිත බැවින් වෘත්තිකයන්ට නව කුසලතා ලබාගැනීම දුෂ්කර වී ඇත. මෙය ඩිජිටල් සේවා පුළුල් කිරීමේදී බාධාවක් බවට පත්වේ.

පුස්තකාලවලට මූල්‍ය සම්පත් හිඟය

පුස්තකාල කළමනාකරණයේ ප්‍රධාන ගැටලුවක් වන්නේ ප්‍රමාණවත් අයවැයක් නොමැති වීමයි. දත්ත සමුදා දායකත්ව ගාස්තු, ඩිජිටල් මෙවලම්, පරිගණක උපකරණ සහ මෘදුකාංග බලපත්‍ර සඳහා විශාල මුදලක් අවශ්‍ය වේ.

බොහෝ රාජ්‍ය ආයතන හා අධ්‍යාපනික ආයතන අයවැය සීමා හේතුවෙන්:

- නව සම්පත් මිලදී ගැනීම ප්‍රමාද කරයි.
- දත්ත සමුදා දායකත්ව අඩු කරයි.
- පුහුණු වැඩසටහන් සීමා කරයි.

මෙම තත්ත්වය පරිශීලක සේවාවන්ගේ ගුණාත්මකභාවයට සෘජුව බලපායි.

පුස්තකාල වෘත්තීය පිළිගැනීමේ ගැටලු

අදටත් බොහෝ සංවිධානවල පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය දායකත්වය නිසි පරිදි ඇගයීමට ලක් නොවේ. කළමනාකරණ මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී පුස්තකාල වෘත්තිකයන්ගේ සම්බන්ධතාව අවම වේ. එමෙන්ම වෙනත් වෘත්තීන් හා සසඳන විට වෘත්තීය උසස්වීමේ සහ නායකත්ව අවස්ථා ද සීමිත වේ.

මෙම තත්ත්වය නිසා වෘත්තීය අභිමානය හා රැකියා තෘප්තිය අඩුවීමක් දක්නට ලැබේ.

පුස්තකාලවල මානව සම්පත් හිඟය

බොහෝ පුස්තකාලවල සුදුසුකම් ලත් පුස්තකාල වෘත්තිකයන්ගේ හිඟයක් පවතී. එක් පුස්තකාලයාධිපතිවරයෙකුට පරිපාලන කටයුතු, තොරතුරු සේවා, ඩිජිටල් සම්පත් කළමනාකරණය, පරිශීලක පුහුණුව හා තාක්ෂණික සහාය යන සියලු කාර්යයන් ඉටු කිරීමට සිදු වීම සාමාන්‍ය තත්ත්වයකි.

මෙම තත්ත්වය වෘත්තීය ආතතිය වැඩි කිරීමට සහ සේවා ගුණාත්මකභාවය පහත වැටීමට හේතු වේ.

තොරතුරු සාක්ෂරතාව හා ව්‍යාජ තොරතුරු

අන්තර්ජාලය තුළ ඇති අසත්‍ය හා නොමඟ යවන තොරතුරු ප්‍රමාණය ඉහළ යාම නිසා පුස්තකාලයාධිපතිවරුන්ට තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනය ලබාදීමේ විශාල වගකීමක් පැවරී ඇත.

විශේෂයෙන්:

- ව්‍යාජ පුවත් හඳුනාගැනීම
- විද්‍යාත්මක තොරතුරු ඇගයීම
- AI භාවිතයේ ආචාරධර්ම
- විද්‍යාත්මක ලේඛනකරණය

පිළිබඳ දැනුම් ව්‍යාප්තිය අත්‍යවශ්‍ය වී ඇත.

වර්තමානයේ පුස්තකාලයාධිපතිවරුන් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා යෝජිත උපායමාර්ග

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් සඳහා ජීවිත කාලය පුරා ඉගෙනීමේ සංස්කෘතියක් ගොඩනැගිය යුතුය. ඒ සඳහා:

- අන්තර්ජාල පාඨමාලා
- ජාත්‍යන්තර වෙබිනාර්
- වෘත්තීය සහතික පාඨමාලා
- පර්යේෂණ වැඩමුළු
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

වැනි ක්‍රියාකාරකම්වලට සහභාගී වීම අත්‍යවශ්‍ය වේ.

පර්යේෂණවල නිරත වීම හා ප්‍රකාශන පළ කිරීම

පුස්තකාල වෘත්තියේ දෘශ්‍යතාව සහ පිළිගැනීම වැඩි කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරුන් පර්යේෂණවල නිරත විය යුතුය.

පර්යේෂණ මඟින්:

- පරිශීලක අවශ්‍යතා හඳුනාගත හැකිය.
- සේවාවන් ඇගයීමට ලක් කළ හැකිය.
- නව්‍ය සේවාවන් හඳුන්වා දිය හැකිය.

තාක්ෂණික නවෝත්පාදන භාවිතය

පහත ක්ෂේත්‍රවල නවෝත්පාදනය වැදගත් වේ:

- KOHA පුස්තකාල පද්ධති
- DSpace ආයතනික නිධාන
- AI උපකාරක සේවා
- ජංගම පුස්තකාල යෙදුම්
- දුරස්ථ තොරතුරු සේවා

වෘත්තීකයින්ගේ සංගම් ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, IFLA සහ CONSAL වැනි වෘත්තීය ආයතන සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීමෙන්:

- ජාත්‍යන්තර අත්දැකීම් හුවමාරු කරගත හැකිය.
- වෘත්තීය ජාලගත වීම වැඩි කරගත හැකිය.
- නව ප්‍රවණතා හඳුනාගත හැකිය.

ශ්‍රී ලාංකික සන්දර්භය තුළ පවත්නා වෘත්තීකයින්ගේ සංගම්

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු සේවා ක්ෂේත්‍රය සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත. විශ්වවිද්‍යාල පුස්තකාල, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ විශේෂ පුස්තකාල මෙම සංවර්ධනයේ ප්‍රධාන දායකයෝ වෙති.

එහෙත් තවදුරටත්:

- ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් පරතරය,
- පුහුණු වූ මානව සම්පත් හිඟය,
- අරමුදල් සීමා,
- තාක්ෂණික යටිතල පහසුකම්වල අසමානතා,

යන ගැටලු පවතී.
මෙම තත්ත්වයන් ජයගැනීම සඳහා ජාතික මට්ටමේ පුස්තකාල තොරතුරු ප්‍රතිපත්තියක් තවදුරටත් ශක්තිමත් කිරීම වැදගත් වේ.

නිගමනය

ඩිජිටල් යුගයේදී වෘත්තීය පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරය සම්ප්‍රදායික සීමාවන් ඉක්මවා ගොස් ඇත. ඔහු හෝ ඇය තොරතුරු කළමනාකරුවෙකු, දැනුම් උපදේශකයෙකු, පර්යේෂණ සහායකයෙකු, තොරතුරු අධ්‍යාපකයෙකු සහ ඩිජිටල් තාක්ෂණ නායකයෙකු ලෙස කටයුතු කළ යුතුය. කෙසේ වෙතත් තාක්ෂණික වෙනස්කම්, අරමුදල් සීමා, වෘත්තීය පිළිගැනීමේ ගැටලු සහ මානව සම්පත් හිඟය වැනි අභියෝග රාශක් වෘත්තියට බලපායි.
මෙම ගැටලු ජයගැනීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය, ජාත්‍යන්තර සහයෝගීතාව, පර්යේෂණ සංස්කෘතියක් ගොඩනැගීම සහ නව තාක්ෂණ භාවිතය අත්‍යවශ්‍ය වේ. දැනුම මත පදනම් වූ සමාජයක් නිර්මාණය කිරීමේදී වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ගේ දායකත්වය අනාගතයේ තවදුරටත් වැදගත් වනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

සිංහල මූලාශ්‍ර

අමරසිංහ, ඩී. එම්. (2019). *පුස්තකාල හා තොරතුරු සේවා කළමනාකරණය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

කරුණාරත්න, එන්. (2018). *විශ්වවිද්‍යාල පුස්තකාල කළමනාකරණය හා තොරතුරු සේවා*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය. (2023). *ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධන වාර්තාව*. කොළඹ.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය. (2022). *ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තියේ වත්මන් ප්‍රවණතා*. කොළඹ.

විජේසූරිය, එස්. (2020). *තොරතුරු සමාජය සහ පුස්තකාල සේවා*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අංගංපොර සටන් ශාස්ත්‍රයේ ශිල්පීය ප්‍රාගුණ්‍යන් පිළිබිඹු කිරීම අරභයා කලා නිර්මාණ වල භූමිකාව ශ්‍රී ලංකාවේ පෞරාණික කැටයම් ආශ්‍රයෙන්

ඒ. පී කුමාරසිංහ

(The Role of Artwork in Demonstrating the Techniques of Angangpora Martial arts: From the Ancient Carvings of Sri Lanka)

City School of Architecture Colombo (LTD),

104 Kitulwatte road, Colombo.08

Kumarasingha153@gmail.com

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුම දැනුම අන්තර්ගත විෂයය පථයන් අතරින් ප්‍රමුඛස්ථානයක් හිමිවන ක්ෂේත්‍රයක් වශයෙන් අංගංපොර සටන් කලාව හඳුන්වාදිය හැකි අතර අංගං ශාස්ත්‍රය මූලික කරගෙන නිර්මාණය කර ඇති කලා කෘති පවතින්නේ අතලොස්සකි. ඒ අතුරින් ප්‍රධාන තැනක් ගන්නා කැටයම් කලාව පිළිබඳ විමර්ශනය කිරීමේ දී ලාංකේය ජන විඥානයට ගෝචර වන පරිදි අතීතයේ පැවති විවිධ මාධ්‍යයේ කැටයම් සම්ප්‍රදායන් තුළින් තත්ත්කාලීන සමාජයේ විවිධ විෂයය ක්ෂේත්‍රයන් ආවරණය කර තිබේ. පැරණි ලක්දිව කැටයම් කලාව අධ්‍යයනයේ දී පැරණිතම කැටයම් හමුවන්නේ අනුරාධපුරයේ ඇති වාහල්කඩ යන ගෘහ නිර්මාණ අංගයෙන් බව පුරා විද්‍යාඥයන්ගේ නිගමනයයි. ශ්‍රී ලංකාවේ කැටයම් කලාවේ දී ගල් කැටයමින් අලංකාර වූ නිර්මාණයන් ලෙස වාහල්කඩ, මුරගල, සඳකඩ පහන මෙන් ම ඉසුරුමුණි පෙම් යුවල ආදී විශිෂ්ට නිර්මාණ උදාහරණ වශයෙන් ගෙනහැර දැක්විය හැක. පසුකාලීනව කැටයම් කලාව ගල් කැටයමින් ඔබ්බට ගොස් ලී කැටයම්, ඇත් දළ කැටයම්, ලාක්ෂා කැටයම් ආදිය දක්වා විකාශනය වූ අතර මෙම කැටයම් කලා නිර්මාණයන් තුළින් අංගංපොර ශාස්ත්‍රයේ එන පොර හරඹ, ගැට හරඹ, ශාරීරික අභ්‍යාස, ඉලංගං හරඹ, අංගං සටන් ශාස්ත්‍රයේ භාවිතවන අවි ආයුධ ආදිය සියුම්ව හා ප්‍රතිභාපූර්ණ ලෙස නිර්මාණය කර තිබීම විශේෂත්වයකි.

පර්යේෂණ අරමුණු

- අංගංපොර සටන් ශාස්ත්‍රයේ ශිල්පීය ප්‍රාගුණ්‍යන් පිළිබිඹු කිරීම අරභයා කලා නිර්මාණ වල භූමිකාව අධ්‍යයනය කිරීම
- අංගංපොර ශාස්ත්‍රයේ ශිල්පීය ක්‍රම විද්‍යාමාන වන කැටයම් වල සුවිශේෂී ලක්ෂණ හඳුනාගැනීම
- යථෝක්ත කැටයම් වලින් නිරූපනය වන අංගං ශිල්ප ක්‍රම වාර්තා කර තැබීම

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් වන අතර ඒ අනුව ඓතිහාසික අධ්‍යයන ක්‍රමවේදය පදනම් කොට ගෙන පර්යේෂණයට පාදක වන ශ්‍රී ලංකාවේ අංගංපොර සටන් කලාව නිරූපනය කරන විවිධ කැටයම් වර්ග අධ්‍යයනය කරන ලදි. එහි දී කොළඹ ජාතික කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, ශ්‍රී දළදා මාළිගාව, ඇම්බැක්කේ දේවාලය, රිදී විහාරය හා ලිඛිත මූලාශයන්හි තිබෙන ගල් කැටයම්, ලී කැටයම් හා ඇත්දත් කැටයම් ආදිය අධ්‍යයන නියැදිය වශයෙන් යොදාගෙන තිබේ. මෙම

නියැදිය තෝරා ගැනීම කෙරෙහි පදනම් වූයේ අංගංපොර සටන් කලාවේ විවිධ ශිල්පීය ක්‍රම පමණක් නිරූපිත විවිධ කැටයම් නිර්මාණ යන සීමාවට යටත්වයි.

එමෙන් ම මෙම පර්යේෂණයට අදාළ ව දත්ත රැස්කිරීම සඳහා කෞතුකාගාර අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, ස්ථානීය නිරීක්ෂණය, ඡායාරූපකරණය, පුස්තකාල අධ්‍යයනය සහ සාහිත්‍ය අධ්‍යයනය යන විධික්‍රම ද භාවිත කරනු ලැබූහ.

ලී කැටයම්

ලී කැටයම් කලාව මගින් පෞරාණික කලාකරුවා ස්වකීය ප්‍රතිභාව මැනවින් විද්‍යාමාන කර තිබෙන අතර ඒ පිළිබඳව විවිධ මූලාශ්‍රයන් හි තොරතුරු අන්තර්ගත වේ. ලී කැටයම් පිළිබඳ ව නිර්වචනය කරන **" ආනන්ද කුමාරස්වාමි "** මහතා දක්වන අන්දමට

> " **හෙතෙම ගැට සහිත වකුටු ලී කැබැල්ලක් ගෙන, එය තම මැලි බවේ අනලස් බැවින් කැටයම් කොට,ඩතම උදාසීනත්වයේ දක්ෂතාවෙන් හැඩ ගස්වයි "** (කුමාරස්වාමි, 2011).

පැරණි ලක්දිව කලාකරුවා ලී කැටයම් සම්බන්ධයෙන් ද දක්ෂතාවක් දක්වා ඇත. දැනට ලැබී ඇති පැරණිතම ලී කැටයම් අපට හමුවන්නේ මහනුවරට නුදුරු ඇම්බැක්කේ දේවාලයෙන් බව විද්වත් මයය යි. ගම්පොල රාජ්‍ය කළ **" තුන්වන වික්‍රමබාහු "** රජුගේ කාලයේ **" දෙල්මඩ මූලාචාරියා "** නම් ශිල්පියාගේ ප්‍රමුඛත්වයෙන් මෙම කැටයම් සිදුකර ඇත. විශේෂයෙන් ම මුල් යුගයේ දී ලී ආශ්‍රය කොටගෙන නිර්මාණය කරන ලද දැව කැටයම් වර්තමානය දක්වා නොනැසී පවතින ආකාරයෙන් නිර්මාණය කිරීම ම අප රටේ කැටයම් ශිල්පීන්ගේ දක්ෂතාවය මනාව පිළිබිඹු කරනු ලැබේ. මෙරට විවිධ ප්‍රදේශ ආශ්‍රයෙන් දක්නට ලැබෙන ලී කැටයම් අතරින් අංගංපොර සටන් ශිල්පය නිරූපනය වන කැටයම් පිහිටි ස්ථාන වශයෙන් සිංහ පොකුණු, ඇම්බැක්ක දේවාලයේ කැටයම්, රිදී විහාරයේ කැටයම්, හඟුරන්කෙත විහාරයේ කැටයම්, ගඩලාදෙණිය විහාරයේ කැටයම් ආදිය පෙන්වාදිය හැකි අතර මේවායින් කියාපාන්නේ අතීතයේ මෙරට පැවති අංගම්පොර ශිල්ප ක්‍රමයේ විවිධ ශිල්පීය ක්‍රමයන් පිළිබඳවයි.

ඇම්බැක්කේ ලී කැටයම්

ගම්පොළ යුගයට අයත් යැයි සැළකෙන උඩුනුවර පිහිටි **" ඇම්බැක්ක ශ්‍රී කතරගම දේවාලය "** තුන්වන වික්‍රමබාහු රජු විසින් ඉදිකොට ඇති බව මූලාශ්‍රයන් හි සඳහන් වේ. ශ්‍රී ලංකාවේ දැනට පවතින ලී කැටයම් අතුරින් ඉමහත් ප්‍රසිද්ධියක් උසුලන ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් අතර මව සහ දරුවා, අංගංපොර, අශ්වාරෝහකයා, ලී කෙලි, නළඟන, යෝගියා ආදී ලී කැටයම් වර්ග හඳුනාගන්නා ලදි. එමෙන් ම මෙම ලී කැටයම් අතුරින් අංගංපොර සටන් ශිල්පය විදහා දැක්වෙන කැටයමක් අධ්‍යයනය මගින් හඳුනාගන්නා ලදි. මෙම කැටයම තුළින් නිරූපනය කරනු ලබන්නේ සාම්ප්‍රදායික අංගං ශිල්පීන් දෙදෙනෙකු අංගං ශාස්ත්‍රයේ එන ගැටයක සිරවී සිටින ආකාරයයි. අංගං සටන් ශිල්පයේ එන කතිර ගැටය ලෙස ඇතැමුන් මෙය අර්ථ දක්වන අතර තවත් අය පවසන්නේ මෙම කැටයමින් නිරූපනය වන්නේ හස්ති ගැටය බවයි. කෙස් වුව ද මෙම කැටයමින් විද්‍යාමාන වන්නේ අතීතයේ අංගං ශිල්පීන් දෙදෙනෙකු පොර හරඹයක් සිදු කිරීමේ දී ගැටයක සිරවී සිටින ආකාරය යි.

රූපය 01. ඇම්බැක්කේ ලී කැටයම් - සාම්ප්‍රදායික අංගං ශිල්පීන් දෙදෙනෙකු අංගං ශාස්ත්‍රයේ එන ගැටයක සිරවී සිටින ආකාරය



(සහභාගීත්ව නිරීක්ෂණ, 2021).

විශේෂ ලක්ෂණ

- ඇම්බැක්ක දේවාලයේ කණුවක මධ්‍යයට වන්නට පිහිටි හතරැස් කොටුවක නිරූපිතය
- පොලොන්නරු යුගයේ ගල් කැටයම් වලට යම් සමාන කමක් දක්නට ලැබේ.
- කැටයම අළංකාර මෝස්තර රාමු කිහිපයකින් රාමුකර තිබීම
- සියුම් බව හා පැහැදිලි ස්වරූපය
- ලියකම් වලින් අලංකාර කර තිබීම

ඇත් දළ කැටයම්

අංගංපොර සටන් ශිල්පීය ක්‍රමවේද නිරූපිත ප්‍රතිභාපූර්ණ කැටයම් කලාවක් ලෙස ඇත් දළ කැටයම් කලාව හැඳින්විය හැක. අතීතයේ ඇත් දළින් නිර්මාණය කරන ලද කලා කෘතීන් කෞතුකාගාර හා විහාරස්ථාන ආශ්‍රිතව වර්තමානයේ ද දැකිය හැක. විශේෂයෙන් ම ප්‍රභූත්වය පෙන්වීම හා සෞභාග්‍යත්වය දැක්වීමට ඇත් දළ භාවිත කර ඇත. ඇත් දළ උපයෝගී කරගත් කැටයම් නිර්මාණ දේශීය මෙන් ම විදේශීය වශයෙන් ද සුවිශේෂී තැනක් ගත්හ. මෙම කැටයම් කලාවේ දී මොස්තර බහුලව යොදාගෙන ඇත. ඇත් දළ කැටයම් කලාව මහනුවර හා දකුණු පළාත් ආශ්‍රිතව ඉතා ප්‍රසිද්ධ ය. පලාපෙති, ලියවැල්, නාරිලතා මල, සැරපෙන්දියා, හංස රූප, හේරුණ්ඩ, ලියපත් සහ අරිම්බුව වැනි සැරසිලි ක්‍රම භාවිත කිරීම දැකිය හැක. එහි දී වටාපත්, පුස්කොළ පොත් කම්බා, ආභරණ පෙට්ටි හා පනා ආදී භාණ්ඩ ඇත් දළ උපයෝගී කරගෙන නිර්මාණය කර ඇති කැටයමින් අලංකෘත නිර්මාණ කිහිපයකි. ශ්‍රී ලංකාවේ ඇත් දත් කැටයම් කලාවට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර **" ජෙට්ඨතිස්ස රජු "** විසින් ඇත් දත් කැටයම් කලාවේ විශිෂ්ට නිර්මාණයන් කළ බව ඓතිහාසික මූලාශ්‍රයන් හි දැක්වේ.

(මහාවංශය, 2004).

පුරාණයේ සිට පැවත එන කලා නිර්මාණ අතර ඇත්දළ කැටයම් කලාව තත්කාලීන සමාජයේ විවිධ පැතිකඩයන් නිරූපණය කරන බව හඳුනාගත හැක. රුවන්වැලි සෑයේ වාහල්කඩ කැණීමේ දී හමු වූ කුඩා ප්‍රමාණයේ ස්ත්‍රී රූපයෙහි ඉනේ මුතු වැලක් පළන්දා ඇත. වටිනා ද්‍රව්‍ය පැළඳ සිටින්නේ ප්‍රභූ ස්ත්‍රීන් ය. විශේෂයෙන් තම සමාජ තත්ත්වය ප්‍රදර්ශනය සඳහා ඇත්දළ නිර්මාණ පරිහරණය සිදු කර ඇත. ඇඳුම් හා ආභරණ පිළිබඳ පැහැදිලි ව සඳහන් වන්නේ 10 වන සියවසින් පසුව ලියැවුණු සාහිත්‍යය මූලාශ්‍රයවල ය. ඇත්දළ කැටයම්වල මිනිස් රූප මඟින් නිරූපණය වන ඇඳුම් ආයිත්තම් ද, ආභරණ ලෙස මාල, වළලු මෙන් ම පනා, කොණ්ඩ කටු, මංජුසා ආදිය ද කලාත්මක නිර්මාණ අතර වැදගත් වේ. කෝට්ටේ හා මහනුවර යුගයන්ට අයත් ඇත්දළ කැටයම් අතර බොහෝ පනා නිර්මාණය සඳහා කැටයම් යෙදූ ඇත්දළ භාවිතා කර තිබේ. ඇත්දළ කැටයම් කලාවේ දී යොදාගෙන ඇත්තේ ඉතාමත් සියුම් කලාත්මක මෝස්තර රටා ය. ඝනත්වය හා වර්ණය එහි කලාත්මක බව තීව්‍ර කිරීමට සමත් ය. දළකඩ කැටයම් නිර්මාණ, කලාත්මකභාවය, නිර්මාණාත්මක තාක්ෂණය, සමකාලීන සමාජයේ පැවති දේශපාලනික, ආර්ථික, සමාජීය පසුබිම මනා ව හෙළිදරව් කරන්නකි. ඇත් දළ කැටයම් කලාවෙන් අංගංපොර සටන් ශිල්ප විද්‍යාමාන වන ආකාරය පිළිබඳව පර්යේෂණ කාර්යය තුළ දී අධ්‍යයනයට බඳුන් කරනු ලැබූ අතර එහි දී කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති ඇත් දත් පනාවක් මත අංගං සටන් හරඹකරුවකුගේ රූපය කැටයම් කොට ඇති ආකාරය හඳුනාගන්නා ලදි.

රූපය 02. ඇත් දළ කැටයම්- කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ඇත් දළ පනාව



(සහභාගීත්ව නිරීක්ෂණ, 2021)

විශේෂ ලක්ෂණ

- ඇත් දළ සම කර නිර්මාණය කර තිබීම
- සියුම්ව කැටයම් කර තිබීම
- කැටයම අළංකාර මෝස්තර රාමු කිහිපයකින් රාමුකර තිබීම
- ලියවැල් මෝස්තර
- පසාරු කැටයමක ආකෘතිය
- රෞද්‍ර මිනිස් රූපයක් දක්නට ලැබීම
- ආයුධ සහිත නිසාවෙන් ඉලංගං සටන් ශිල්පියෙකුගේ යැයි උපකල්පනය කල හැක

ගල් කැටයම්

ගල් කැටයම් යනු පාෂාණයක මතු පිට කොටස කෙටීමෙන්, සීරීමෙන් හෝ කැටයම් කැපීමෙන් ඉවත් කර නිර්මාණය කරන ලද රූප සටහන්ය. ව්‍යවහාරයේ දී මේ සඳහා කැටයම් කැපීම, අකුරු කෙටීම වැනි වදනක් භාවිතා කරති. ගල් කැටයම් ලෝකය පුරා ව්‍යාප්තව ඇති අතර බොහෝ විට ප්‍රාග් ඓතිහාසික මානවයා මේවා හා සම්බන්ධය. ග්‍රීක වදන් වන " **පෙට්‍රෝස්** " ගල සහ ගිල්පීන් (කැටයම් කැපීම) යන වචන වලින් මෙම " **පෙට්‍රෝගිල්ප්** " යන වචනය සෑදී ඇත.

(Wikipedia, 2022).

රූපය 03. ගල් කැටයම් - කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති ගල් කැටයමකි



(සහභාගීත්ව නිරීක්ෂණ, 2021)

කොළඹ ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති මෙම ගල් කැටයමින් නිරූපනය කරනු ලබන්නේ අංගංපොර සටන් සම්ප්‍රදායේ එන ඉලංගං ශිල්පියෙකි. එක් අතකින් කඩුවක් හා අනිත් අතින් තෝමරයක් දරා සිටින මෙම ඉලංගං ශිල්පියාගේ කැටයම ආසන්න වශයෙන් පොළොන්නරු යුගයට පමණ අයත් වනු ඇති බවට උපකල්පනය කල හැක.


විශේෂ ලක්ෂණ

- කලුගල් කුට්ටියක් මත සියුම්ව නිර්මාණය කර තිබේ.
- ගලේ ගැඹුරට පසාරු කිරීමකින් තොරව මතුපිටින් කැටයම් කර තිබේ.
- කැටයම වටේ ලියවැල් වලින් අලංකාර කර තිබේ
- වස්ත්‍ර සහ ආභරණ රාශියක් නිරූපිත නිසාවෙන් ප්‍රභූ ඉලංගං ශිල්පියෙකු ලෙස හැඳින්විය හැක
- කැටයමේ දිස්වන මිනිස් රූපයේ මුහුණ දේව ප්‍රතිමාවක ස්වරූපයකට සමාන කම් දක්වන නිසාවෙන් පොළොන්නරු යුගයට අයත් එකක් යැයි උපකල්පනය කල හැකි අතර හින්දු ආභාෂය ගැබ්ව ඇත

ලාක්ෂා කැටයම්

ලාක්ෂා යනු අප රටෙහි පාරම්පරික ජන කලාවක් සේම කැටයම් කලාවකි. මහනුවර යුගයේදී ලාක්ෂා කර්මාන්තය වඩාත් ප්‍රචලිතව පැවති බවට සාධක පවතින අතර මෙම කාර්මිකයන් **" ඊවඩුවන් "** ලෙස හැඳින්වේ. එකළ **" කොට්ටල් බද්ද "** නමැති රාජකීය කාර්යාංශයේ පවා ඔවුන් සේවය කර ඇත. එහි දී ඔවුන් හඳුන්වා ඇත්තේ **" හංගිඩි වසම "** යනුවෙනි. ලාක්ෂා කර්මාන්තයේ යෙදී සිටි ශිල්පීන් හඳුන්වා ඇත්තේ හංගිඩියන් යන නාමයෙනි. ලාක්ෂා කැටයම් දෙයාකාරයකින් සිදු කරන අතර එනම්, නියපොතු වැඩ හා පට්ටල් වැඩ යනුවෙනි. නියපොතු වැඩ සඳහා ලාක්ෂා කෙඳි භාවිත කරයි, රත් කළ ලාක්ෂා කැබැල්ල ඇඟිලිවලින් ඇද කෙඳි සකස් කර ගනියි. එක් පැහැයක කෙඳි භාණ්ඩය මත ඇලවීමෙන් පසු අනෙක් වර්ණ වල කෙඳි මගින් මෝස්තර යොදනු ලැබේ. පට්ටල් වැඩ යනු පට්ටලයට අල්ලන ලද භාණ්ඩය හොඳින් කරකැවෙන විට රත් කරගත් ලාක්ෂා කැබැල්ල එයට අල්ලා හොඳින් තවරයි. එහි දී භාණ්ඩයේ ලාක්ෂා ඒකාකාරව හොඳින් තැවරේ. විශාල භාණ්ඩ නිර්මාණයේ දී මෙම ක්‍රමය බහුලව භාවිත කරයි.

රූපය 04. ලාක්ෂා කැටයමක ආකෘතියක් - මහනුවර කෞතුකාගාරයේ ඇති දුනු මිටක ලාකඩින් වැඩ දැමූ අත් පා අමුණා සිටින ගැට හරඹයකි. 19 වන සියවසට අයත් වේ.



නිගමනය

ශ්‍රී ලංකාවේ අස්පර්ශ්‍ය සංස්කෘතික උරුම දැනුම් සම්භාරයක් අන්තර්ගත අංගංපොර සටන් කලාව තුළ විවිධ විෂයය ක්ෂේත්‍රයන් ගණනාවක් දක්නට ලැබෙන අතර සාම්ප්‍රදායික අංගං සටන් කලාවේ රන විවිධ හරඹ ක්‍රම හා ශිල්පීය ක්‍රමවේද අතීතයේ පටන් මුඛ පරම්පරාවෙන් පරම්පරාවට පැවත එනු ලබයි. එහෙත් දේශීය කලාකරුවාගේ අනභිබවනීය කලා කුසලතාවයන් විදහා දැක්වෙන පෞරාණික කලා කෘතීන් කොතෙකුත් හමුව ඇත. ඒ අතුරින් අප රටේ කැටයම් කලාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. විවිධ අමුද්‍රව්‍ය හා සන්නිවේදන මාධ්‍යන් උපයෝගී කොට ගෙන පුරාණ ශිල්පීන් විසින් කැටයම් කරණයේ නියැලීමේ දී තත්කාලීන සමාජ, සංස්කෘතික, ආගමික, දේශපාලනික ආදී බොහෝ විෂයය පථයන්ට ගෝචර වන පරිදි සිය කලා කෘතීන් නිර්මාණය කිරීම සිදු කර තිබේ. විශේෂයෙන් ම අතීත කලාකරුවා දැසින් දුටු අංගංපොර සටන් කලාවේ එන විවිධ හරඹ ක්‍රම, ගැට හරඹ, පොර හරඹ, ශාරීරික අභ්‍යාස, ඉලංගං හරඹ, අංගං ශිල්පියාගේ ස්වරූපය ආදී විවිධ ශිල්පීය ක්‍රමවේද සිය කැටයම් කලාව හරහා සන්නිවේදනය කිරීමට

සමත්ව තිබේ. මෙම කැටයම් නිර්මාණ අධ්‍යයනය කිරීමේ දී අතීත කැටයම් කරුවා විවිධ තාක්ෂණික ක්‍රමෝපායන් හා විවිධ ශෛලීන් භාවිතා කිරීම ද කැපී පෙනෙන ලක්ෂණයකි. සමස්ථයක් වශයෙන් මෙම පර්යේෂණය මගින් අංගංපොර සටන් ශාස්ත්‍රයේ ශිල්පීය ප්‍රාගුණ්‍යන් පිළිබිඹු කිරීම අරභයා කලා නිර්මාණ වළ කාර්යය භාරය අධ්‍යයනය කරනු ලැබූ අතර එමෙන් ම අංගංපොර ශාස්ත්‍රයේ ශිල්පීය ක්‍රම විද්‍යාමාන වන කැටයම් වල සුවිශේෂී ලක්ෂණ හඳුනාගන්නා ලදි. තව ද යථෝක්ත කැටයම් වලින් නිරූපනය වන අංගං ශිල්ප ක්‍රම වාර්තා කර තැබීම ද සිදු කරනු ලබන අතර අනාගත පර්යේෂකයන් උදෙසා මෙම කලා කෘතීන් සංරක්ෂණය කිරීම වැදගත් කාර්යය භාරයක් ලෙස සඳහන් කරමි.

විමර්ශන

කුමාරස්වාමි, ආනනද, (2011). මධ්‍යකාලීන සිංහල කලා. එච්. එම්. සෝමරත්න (පරි:). තිසර

ප්‍රකාශකයෝ. 129, දුටුගැමුණු වීදිය. දෙහිවල.

ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, ඤ 2006 ඃපරි* %. මහාවංශය, කොළඹ, ශ්‍රී ලංකාවඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විකිපීඩියා. (2022, මාර්තු 1). ගල් කැටයම් https://si.wikipedia.org/wiki/

ශ්‍රී ලාංකේය පුස්කොළ ලේඛන කලාව

ඒ. පී. එම්.එම්. ඩී. බී දයානන්ද,

සහකාර පුස්තකාලයාධිපති,

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය.

සාරාංශය:

මිනිස් සංහතිය මෙලොව නිමග්න වූ දා පටන් ඔවුන්ගේ වාගාලාපය, ස්මරණය මිහිමත ශේෂ කරනු වස් ලේඛන මාධ්‍යයන් උපයෝගී කරගනු ලැබීය. මිනිසා ගල් යුගය, එඬේර යුගය හා කෘෂි යුගය ආදි යුග ගණනක් පසු කරමින් වර්තමානයේ කාර්මික යුගය වෙත පියමං කොට ඇත. කාර්මික යුගයේ කේන්ද්‍රීය මෙවලම වනුයේ තොරතුරුය. මිනිසා එකී විවිධ යුගයන්හි දී තමා සතු දැනුම, ඥානය හා අත්දැකීම් තම නූපන් අනාගත පරපුර උදෙසා ඥානනය කරනු වස් විවිධ ලේඛන මාධ්‍යයන් උපයෝගිකරගනු ලැබීය. ඒ අතර ශාකවල කොටස්, සත්ව ඇටකටු උපයෝගී කරගනිමින් ගල්ගුහාවල යම් යම් සිත්තම් නිර්මාණය කරන්නට විය. එකී ගමන් මඟ සමඟ ඔවුන්ගේ ලේඛන කලාව ද විකාශනය විය. එහි දී ශිලා, පාච්මන්ට්, වෙලම්, පැපිරස්, තල්කොළ, තලකොළ දක්වා විකාශනය වූ ලේඛන මාධ්‍යයේ හැරවුම් ලක්ෂ්‍ය වූයේ සායිලූං ගේ කඩදාසියයි. බහු පිටපත්කරණයට අවකාශයක් නොතිබුණු එම යුගයේ ඒ සඳහා අවස්ථාව විවර වූයේ ගුටෙන්බර්ග්ගේ මුද්‍රණ යන්ත්‍රයෙන්ය.

මිනිසුන් මතු පරපුර උදෙසා තමා දන්නා වූ දේශීය දැනුම යම් යම් ලේඛන මාධ්‍යයන්හි තැන්පත් කළ අතර ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම පුස්කොළ හා තල්කොළ උපයෝගීකොටගෙන මේවා ලේඛන ගත කරනු ලැබීය. මෙහි දී විශේෂයෙන්ම ආගමික හා දේශීය වෛද්‍ය විද්‍යාවට අදාල දෑ ග්‍රන්ථා රූඪ කළහ. ඒවා වර්තමානය වන තෙක් ද නොනැසී පවතින්නේ ඔවුන්ගේ නිර්මාණශීලිත්වයෙහි හා තාක්ෂණයෙහි පැවති සුවිශේෂත්වය නිසාය. මෙකී ලේඛන මාධ්‍යයන් හා ද්‍රව්‍යයන් බිහිවීමත් සමඟ ඒවා ආරක්ෂණය හා සංරක්ෂණය කිරීමට කටීකාවත් නිර්මාණය වූ අතර ඒවා තැන්පත් කිරීම උදෙසා ගෘහයන් නිර්මාණය වූ අතර, එකී නිර්මාණය වූ සුවිශේෂී ගෘහයන් පුස්තකාල ලෙස නින්නාද විය.

මෙරට ලේඛන මාධ්‍යයේ හැරවුම් ලක්ෂය වූයේ පුස්කොළ පොත්ය. එකී සම්පත් ආගමික, සාහිත්‍යමය හා දේශීය වෛද්‍ය විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්හි සුවිශේෂී වූ තොරතුරු මතු පරපුර වෙත නොනැසී දායාද කරනු වස් ශේෂ කර තැබීම සඳහා භාවිත කරනු ලැබීය.

මූලිකපද : ශ්‍රී ලංකාවේ ලේඛන කලාව, ඓතිහාසික ලේඛන මාධ්‍යයන්, පුස්කොළ පොත්, දේශීය දැනුම, පුස්තකාල සම්පත්

හැඳින්වීම :

ශ්‍රී ලංකාව යනු දේශීය ඥානය උකහා ගනිමින් අතීත මුතුන් මිත්තන් සතු හැකියාවන් මනාව ස්ඵුට කරන ලද ද්වීපයකි. එකී ලංකාද්වීපය සතු පුස්කොළ පොත් ලේඛන කලාවේ ආරම්භය ඉතා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන්නකි. ඒ නිසා එය කවදා කෙදිනක ආරම්භ වුවාදැයි සාක්ෂි සහිතව තොරතුරු අනාවරණය කිරීමට තවමත් ඉතිහාසඥයින් අසමත්ව ඇත. එසේ දින වකවානු සහිතව තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ අප කුඩා දිවයින නිරන්තරයෙන් සතුරු ආක්‍රමණවලට ගොදුරු වූ නිසාවෙනි.

ලේඛන කලාවේ ආරම්භය

අප සතුව පවත්නා සාහිත්‍යමය හා ඓතිහාසිකමය තොරතුරු අනුව ක්‍රි.පූ. තුන්වන සියවසේ දී මහින්දාගමනයත් සමඟ ලක්දිව අක්ෂර කලාව හා ලේඛන කලාවේ ආරම්භය සිදු වුවායැයි සිතිය හැකිය. එනමුත් මහින්දාගමනයට පෙරද මෙරට ලේඛන කලාවක් තිබූ බවට සාක්ෂි හමු වී ඇත.

එයට උදාහරණ ලෙස,

■ ක්‍රි.පූ හයවන සියවසේ පුස්කොළ ලිපි පැවති බව මහාවග්ග පාලියේ සඳහන් වේ. එය උපාලි නම් දරුවාට අක්ෂර ඉගැන්වීම පිළිබඳ විස්තරයෙන් හෙළි වෙයි.

■ ක්‍රි.පූ තුන්වන සියවසේ දී උත්තිය කුමරු කැලණියේ විසු රජුගේ බිසවට රහස් ලිපියක් යවන ලද බවත් එය බිම වැටීමෙන් ශබ්දයක් ඇති වූ බවත් මහාවංශයේ විස්තර කරයි.

මේ අනුව පෙනී යන්නේ එකල සාමාන්‍ය ජනයා මෙන්ම රාජකීයන් ද පණිවිඩ හුවමාරුව සඳහා පුස්කොළ භාවිතයට ගෙන ඇති බවයි.

පුස්කොළ පොත් නිර්මාණය

ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් නිර්මාණය වීම සිදුවූයේ තලගස ආශ්‍රයෙනි. එදා තල ගස ඉතා පූජනීයත්වයෙන් සලකන ලදී. අප ඉතිහාසය සාක්ෂි දරන ආකාරයට එකල රජවරුන් පවා විවිධ නීති පනවමින් තල ගස ආරක්ෂා කිරීමට විවිධ පියවරවල් යොදන ලදී. එනිසා මෙම පූජනීය සත්කාරය ඉටු කිරීම උදෙසා අප සංඝයා වහන්සේලා මෙන්ම ගිහි පිරිස ද ඉතා භක්තියෙන් යුතුව සැදී පැහැදී සිටියහ. එහි දී තල කොළ මගින් පුස්කොළ පොත් නිර්මාණය වූ ආකාරය මෙසේ සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

ඉහිරෙන්නට ආසන්න හොඳින් මේරූ තල ගොබයක් වත්පිළිවෙත් රැසක් සිදුකර ගසෙන් ඉවත් කර ගැනීම සිදු කරයි. මෙම සත්කාරය දින ගණනක් පේවී ඉතා ඕනෑ කමින් කරනු ලබයි. ඉන් අනතුරුව තල ගොබය සුදු රෙද්දකින් වසා ධර්ම ශාලාව වෙත රැගෙන ගොස් තල පත්‍ර ඉවත් කර එහි ඉරටු ද ඉවත් කර වට්ටු ලෙස සකස් කර ගනී. ඉන් අනතුරුව ගස්ලබු කොළ, ගස්ලබු ඇට, අමු කහ, අන්නාසි ගැට යෙදූ වතුරෙන් රන්වන් පැහැවන තුරු තලගොබ තම්බා ගෙන පසුව මද අව්වේ ද මද පින්නේ ද තබා වේලාගෙන පුවක් කඳක ආධාරයෙන් එම පත්‍ර සුමට වන ලෙස හොඳින් පිරිමැද ඉතා මුවහත් පිහියක් රැගෙන අවශ්‍ය ප්‍රමාණයට තල පත්‍ර වියත, වියත් දෙක ලෙස කපා වෙන් කරනු ලබයි. ඉන් අනතුරුව ඒවා රැගෙන රත් වූ යකඩයක් ආධාරයෙන් කපා ගත් පත්‍රවල හතර කොණ සියුම් පිළිස්සීමකට ලක් කරයි. එසේ කරන්නේ එහි ආරක්ෂාව හා දිර්ඝකාලීන පැවැත්ම සඳහාය. ඉන් අනතුරුව පුස්කොළයක් දෙකට නවා නවන ලද කොටස නැවත නැමීමකට ලක් කර පත්‍ර එකතු කිරීම කර, වමේ සිට දකුණට ලිවීම සිදු කරයි. අක්ෂර ලියා අවසන් වූ පසු ඒවා කියවීම සඳහා කළු මැදීමක් කරනු ලබයි. ගඩුම ශාකයෙන් ලබා ගත් අඟුරු අලුතින් ලියූ පුස්කොළ මත ආලේප කිරීමෙන් අකුරු ඉතා පැහැදිලිව දිස්වේ. අනතුරුව වටිනා දැවයෙන් සකස් කරන ලද පොත් කම්බාවක් යොදා පුස්කොළ පොත එකට එක් කිරීම කරනු ලබයි.

පුස්කොළයේ ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

පුස්කොළයේ ලිවීමේ කලාව සිදුවූයේ සම්මතයන් අනුව වේ. මෙහිදි විවිධ නීති රීති දක්නට ලැබේ. ඒවා පහත අයුරින් පෙළ ගැස්විය හැකිය. එනම්,

1.ලියන්නා සෑමවිටම දකුණතින් ලිවිය යුතුය.

2. ලියනවිට සෑමවිටම මාපට ඇඟිල්ල පන්හිඳ ලේඛණිය වෙත රැඳිය යුතුය.

3. ලියන පත් ඉරුව දෙපසින් අගල් 1ත් 1/2 හා හිල් වටාද ඉඩ හැරිය යුතුය.

4. පේළි ඇද නැති විය යුතු අතර පේළි 8 කට වඩා නොලිවිය යුතුය.

ඉහත සඳහන් කළ ආකාරයට සකස් කර ගන්නා ලද පුස්කොළ පොත් එකල ජනප්‍රියම ලේඛන කලාව බවට පත්ව තිබුණි. ඒ නිසාම තල් ගස් වලට සොරුන් ඒම වැළැක්වීමට ගසවටා කටු වර්ග යොදා ගස් කැපීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති බව ‘‘විසුද්ධිමග්ගයේ’’ සඳහන් වේ. ඒ අනුව තල ගස පිළිබඳව එකල සමාජයේ විශිෂ්ට පිළිගැනීමක් පැවති බව සිතිය හැකිය.

ක්‍රි. පූ. 3 දී හෙළ අටුවා රචනා වීම, ක්‍රි.පූ 5 දී බුද්ධඝෝෂ හිමි විසින් පාලි අට්ඨකතා රචනා කිරීම සිදු වන්නට ඇත්තේ පුස්කොළ පොත්වල බව උපකල්පනය කළ හැකිය. වළගම්බා රජ දවස මාතලේ අලු විහාරයේ දී එතෙක් මුඛපරම්පරාගතව ආ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීම ලක්දිව මෙතෙක් සිදු වූ පැරණිම හා විශාලතම ලේඛන ප්‍රතිඋත්පාදන ව්‍යාපාරය විය. අනුරාධපුර යුගයේ දී ද මහා විහාරය, තුළාධාර පබ්බත විහාරය, අලාහන පිරිවෙන වැනි සංඝාරාම විශාල ප්‍රමාණයක විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපන ආයතන පැවති අතර ඒ සෑම විහාරයකම පුස්තකාල පැවති බවට සාධක හමුවේ. ඒ අතරින් පැරණිම පුස්තකාලය මහාවිහාරයේ ගන්ථාකර විහාරයයි. ‘‘බුද්ධෝත්පත්ති’’ නම් ග්‍රන්ථයේ සඳහන් වන ආකාරයට සිංහලෙන් ලියාතැබූ අටුවා පාලියට නැඟීමෙන් අනතුරුව සිංහල පොත් ගොඩ ගැසූවිට මධ්‍යම ප්‍රමාණයේ ඇතුන් හත් දෙනෙකුගේ උසැති උස පොත් ගොඩක් මහා සෑය අසල දී ගිනිබත් කර ඇත. මෙසේ ඓතිහාසික වූත් විශිෂ්ට වූත් පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් රජවරුන්ගේ ක්‍රියාකලාප නිසා ද, විදේශ ආක්‍රමණ නිසා ද විවිධ යුග වල දී විනාශ වූ අතර ඇතැම් ඒවා විදේශ රට වලට ගෙන යන ලදී.

වර්තමානයේ දී ද සෑම විහාරස්ථානයකම අවම වශයෙන් පිරුවානා පොත් වහන්සේ වැනි එකම පුස්කොළ පොතක් හෝ තිබීමෙන් පැහැදිලි වන්නේ අද සමාජය තුළද පුස්කොළ පොත් කෙරෙහි ඇති ගෞරවය හා භක්තියයි.

පුස්කොළ ග්‍රන්ථ ප්‍රධාන තේමා තුනක් ඔස්සේ රචනා වී තිබුණි. ඒවා නම්,

ආගමික

සාහිත්‍යය

ප්‍රායෝගික

ශ්‍රී ලංකාවේ විශාලතම පුස්කොළ පොත් එකතුව කෞතුකාගාර පුස්තකාලයේ පුස්කොළ පොත් එකතුව වන අතර මෙහි ඩබ්ලිව්. ඒ. සිල්වා එකතුව (2000), එච්. සී. පී බෙල් එකතුව (261) ඇතුළු අත් පිටපත් 5000 කට අධික ප්‍රමාණයක් ඇත. දෙවන විශාලතම පොත් එකතුවට හිමිකම් කියන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. එසේම සැළකිය යුතු එකතූන් ප්‍රමාණයක් ජාතික පුස්තකාලය ආදී ස්ථානවල ද දැකගත හැකිය. මීට අමතරව තවත් විශාල ප්‍රමාණයක් විදේශ රටවලට ගෙනගොස් ඇත. ඒ අනුව බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ද (2469), ඩෙන්මාර්කයේ කොපර්හේගන් රාජකීය පුස්තකාලයේ ද (1000) නෙදර්ලන්තය, පැරීසිය වැනි රටවල ද ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් පවතී.

සමාලෝචනය

ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ මහින්ද හිමියන් හෙළඅටුවා රචනා කිරීමත් සමඟම ලේඛන කටයුතු වලට පුස්කොළ භාවිතයට ගත් බවයි. ක්‍රි. පූ. හයවන සියවසේ සිට 19 වන සියවස දක්වාම පුස්කොළ පොත් ලේඛන කලාව අඛණ්ඩව පවත්වාගෙන පැමිණ ඇතත් ක්‍රි.ව 1640 දී ලන්දේසීන්ගේ පැමිණීමත්, ක්‍රි. ව 1737 දී ඔවුන් මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීමත් සමඟම ලංකාවේ මුද්‍රණ කර්මාන්තය ව්‍යාප්ත වීම ආරම්භ වූ අතර එතැන් පටන් ලංකාවේ ජනප්‍රියම ලේඛන මාධ්‍ය වූ පුස්කොළ පොත් අභාවයට පත් විය. එනිසා බොහෝ වටිනා හා දුර්ලභ පුස්කොළ පොත් බොහොමයක් අද වන විට කෞතුක භාණ්ඩ හා ප්‍රදර්ශන භාණ්ඩ බවට

පත්ව ඇත. එසේ වුව ද වර්තමානයේ සුළු වශයෙන් හෝ පුස්කොළ ලේඛන කලාව ඇතැම් ස්ථානවල පවත්වාගෙන යාම සතුටට කරුණකි.

ආශ්‍රිත විමර්ශන.

1. අමරසිරි, එම්. එස්. යූ.(1999), තොරතුරු තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාව, පුස්තකාල ප්‍රවෘත්ති : ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය, පි 07.
2. ඇතුගල, ආරියරත්න (1995), සන්නිවේදකයා, කොළඹ : ගොඩගේ, පි 53.
3. ඇඳගම, මාලනී (1994), ශ්‍රී ලංකාවේ පුස්තකාල ආරම්භය සහ වර්ධනය, පුස්තකාල විද්‍යාව : සද්ධර්මාකාර ශාස්ත්‍රීය ලිපි සරණය, සංස්කරණය අමුගොඩ සෝමානන්ද හිමි සහ නෙළුම්දණ්ඩේ වීමසෝර හිමි. පානදුර : සද්ධර්මාකාර විද්‍යායතන පිරිවෙන, පි 17 - 18
4. කොරයා, ඊස්වරී.(1969), පුස්තකාල අධ්‍යාපන සියවස : ලංකාවේ අධ්‍යාපනය - ක්‍රි. පූ. 3 වැනි සියවසේ සිට අද දක්වා, කොළඹ : අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය, පි 1181
5. ගුණරත්න, එල්. (1985), පුස්තකාලය යනු ජාතික උරුමයයි. ඥාන නිධි, සංස්කරණය ඊස්වරි කොරයා, කොළඹ : මහජන පුස්තකාලය, පි 153
6. ගුණසේකර, ධනපාල (1998), පුස්තකාල සේවාවේ මූලිකාංග, කොළඹ : ගොඩගේ, පි 14
7. ජයතිස්ස, එල්. ඒ.(1999), පුස්තකාල කළමනාකරණය, කැලණිය : කර්තෘ, පි 110
8. තොම්සන්, හේම්ස් (1987), පුස්තකාල බලය, කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, පි 58
9. වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2001), පුස්තකාල ඉතිහාසය, කර්තෘ, දළුගම.

Beyond Copy and Paste: The Librarian's Role in Preventing Plagiarism

Sakunthala Senevirathna
Senior Assistant Librarian
University of Ruhuna

Introduction

In today's information-rich society, access to knowledge has become easier than ever before. Digital resources, online databases, institutional repositories, and open web platforms provide students and researchers with unlimited opportunities to discover, share, and use information. However, the rapid growth of digital information has also created new challenges, particularly regarding the ethical use of information. Among these challenges, plagiarism remains one of the most significant concerns in educational institutions and research communities.

Plagiarism is often understood simply as copying and pasting information from another source without acknowledgement. However, the concept extends far beyond direct copying. It involves the use of another person's words, ideas, arguments, data, images, or creative works without giving appropriate credit. Plagiarism affects not only academic performance but also research credibility, professional ethics, and the reputation of educational institutions.

In addressing this issue, libraries play a vital role. Traditionally, librarians were recognized as custodians of information resources. However, the role of modern librarians has evolved significantly. Today, librarians act as educators, research partners, information consultants, and advocates for ethical information practices. Through information literacy programmes, research support services, and academic integrity initiatives, librarians contribute significantly to preventing plagiarism and developing responsible users of information.

Understanding Plagiarism

Plagiarism is an act of presenting someone else's intellectual work as one's own without proper acknowledgement. It is considered a violation of academic integrity because scholarly communication depends on honesty, transparency, and respect for intellectual contributions.

There are several forms of plagiarism that students, researchers, and information users should understand. Direct plagiarism occurs when a person copies words, sentences, or paragraphs from a source without citation. Mosaic plagiarism, also known as patchwork plagiarism, happens when phrases or ideas from different sources are combined without proper acknowledgement. Although the wording may be changed slightly, the original ideas still belong to other authors.

Another common form is improper paraphrasing, where an individual changes only a few words or sentence structures while retaining the original meaning without acknowledging the source. Effective paraphrasing requires understanding the original idea, expressing it in one's own words, and providing appropriate references.

Self-plagiarism is another important issue, particularly among researchers. It occurs when authors reuse substantial portions of their own previously published work without proper disclosure. Similarly, using another person's photographs, tables, figures, research data, or other creative materials without permission or acknowledgement can also be considered plagiarism.

Some cases of plagiarism are intentional, while others occur accidentally due to inadequate knowledge of citation practices, poor academic writing skills, or misunderstanding of ethical information use. Therefore, plagiarism prevention should focus not only on identifying misconduct but also on educating users about responsible scholarly practices.

Why Does Plagiarism Occur?

Understanding the reasons behind plagiarism is essential for developing effective prevention strategies. Many students and researchers do not engage in plagiarism intentionally. Instead, they may lack the necessary knowledge and skills required for academic writing and ethical information use.

One major cause is the lack of awareness about plagiarism and citation requirements. New students, particularly those entering higher education, may not fully understand the importance of acknowledging sources or the difference between common knowledge and information that requires citation.

Limited academic writing skills can also contribute to plagiarism. Students who struggle with summarizing, paraphrasing, and integrating information from multiple sources may depend heavily on copying existing materials. Language barriers and lack of confidence in expressing ideas independently may further increase this tendency.

Other factors include time limitations, heavy academic workloads, pressure to achieve high grades, and the expectation to publish research findings. The availability of large amounts of online information has also made copying easier. Therefore, preventing plagiarism requires a supportive educational approach that develops users' confidence, skills, and awareness.

The Librarian's Role in Preventing Plagiarism

The role of librarians as presented by Giannakouli et al. (2023) indicates that librarians have a role in preventing plagiarism, such as:

1. Librarians as plagiarism informants

    Librarians play an active role in raising awareness among the academic community about the issue of plagiarism by providing comprehensive and relevant information so that they can better understand the dangers of plagiarism.

2. Librarians as plagiarism counselors

    As counselors, librarians provide continued guidance to the academic community, support them in resolving issues related to plagiarism, and provide counseling to the academic community to avoid plagiarism.

3. Librarians as plagiarism educators

Librarians act as educators by teaching the academic community about the concept of plagiarism, research ethics, and helping to develop information literacy skills that can assist the academic community in accessing, evaluating, and using information properly and responsibly.

4. Librarians as plagiarism detectors

Librarians provide plagiarism detection services using software or tools that can detect similarities between written works and existing sources.

5. Librarians as professional policy advisors

Librarians contribute to or participate in developing plagiarism policies at universities. They collaborate with academic stakeholders to develop regulations that are clear and effective in preventing and addressing cases of plagiarism, thereby creating an academic community that upholds integrity

The prevention of plagiarism is a shared responsibility among students, educators, researchers, and institutions. However, librarians occupy a unique position because of their expertise in information organization, access, evaluation, and ethical use. Through various library services, librarians can actively promote academic integrity.

✓ **Promoting Information Literacy**



Figure 1. Promoting Information Literacy
Image credit: OpenAI ChatGPT (2026)

One of the most important contributions librarians make is through information literacy education. Information literacy enables individuals to identify their information needs, locate appropriate resources, evaluate information quality, and use information responsibly.

Through information literacy programmes, librarians teach students how to find reliable academic sources, distinguish scholarly information from unreliable content, and understand the importance of acknowledging information creators. These skills help users move beyond simply collecting information and encourage them to become ethical users and creators of knowledge.

Information literacy also develops critical thinking skills. When students understand how information is produced, evaluated, and communicated, they become more capable of analyzing sources and creating original academic work.

✓ **Teaching Citation and Referencing Skills**




Figure 2. Teaching Citation and Referencing Skills
Image credit: OpenAI ChatGPT (2026)

Proper citation is one of the most effective ways to prevent plagiarism. Librarians play a major role in teaching students and researchers how to acknowledge sources correctly.

Libraries frequently conduct workshops and training sessions on citation styles such as APA, Harvard, MLA, and Chicago. These programmes help users understand when citations are required, how to prepare reference lists, and how to integrate sources into academic writing.

Citation education is not merely a technical skill. It represents respect for intellectual ownership and supports the development of ethical research practices.

✓ **Supporting Academic Writing and Research Skills**



Figure 3. Supporting Academic Writing and Research Skills
Image credit: OpenAI ChatGPT (2026)

Many libraries have expanded their services beyond providing access to resources. They now support users throughout the research process. Librarians assist students and researchers in developing effective search strategies, identifying relevant literature, and managing information sources.

Workshops on academic writing, paraphrasing, summarizing, and note-taking can significantly reduce unintentional plagiarism. When users learn how to transform information into their own academic arguments, they become more confident writers.

✓ **Providing Support for Reference Management Tools**



Figure 4. Providing Support for Reference Management Tools
Image credit: OpenAI ChatGPT (2026)

Reference management software has become an important resource for researchers and students. Librarians can provide training on tools such as Zotero, Mendeley, and EndNote, which help users organize references, insert citations, and prepare bibliographies efficiently.

These tools reduce citation errors and encourage systematic management of information sources. By promoting their effective use, librarians support researchers in maintaining ethical writing practices.

✓ **Conducting Awareness Programmes**



Figure 5. Conducting Awareness Programmes
Image credit: OpenAI ChatGPT (2026)

Regular awareness programmes are essential for developing a culture of academic integrity. Libraries can organize orientation sessions, seminars, exhibitions, online tutorials, and awareness campaigns on plagiarism prevention.

Such programmes should not be limited to students alone. Faculty members, researchers, and library staff also benefit from continuous awareness because expectations and practices related to scholarly communication continue to change.

✓ **Promoting Copyright and Ethical Use of Information**



Figure 6. Promoting Copyright and Ethical Use of Information

Image credit: OpenAI ChatGPT (2026)

Plagiarism is closely connected with copyright and intellectual property rights. Librarians, as information professionals, are well positioned to educate users about copyright, licensing, fair use or fair dealing principles, and ethical sharing of information.

Understanding copyright encourages users to respect the ownership of information resources and use materials responsibly.

✓ **Supporting the Responsible Use of Similarity Checking Tools**



Figure 7. Supporting the Responsible Use of Similarity Checking Tools
Image credit: OpenAI ChatGPT (2026)

Many academic institutions use plagiarism detection and similarity checking tools to support academic integrity. Librarians often provide guidance on the use of these tools and help users understand similarity reports.

However, it is important to recognize that similarity checking tools do not determine plagiarism automatically. A similarity score only indicates matching text; interpretation requires human judgement. Librarians can help users understand these reports as learning opportunities rather than simply as mechanisms for punishment.

Information Literacy as the Foundation of Academic Integrity

Academic integrity begins with responsible information behaviour. Information literacy provides the foundation for ethical scholarship by helping individuals understand how knowledge is created, shared, and used.

An information-literate student or researcher understands the importance of evaluating sources, acknowledging contributions, avoiding misinformation, and communicating ideas honestly. These skills are essential not only for academic success but also for lifelong learning.

By integrating information literacy into educational programmes, libraries contribute to creating a generation of responsible information users who value originality and ethical knowledge creation.

Collaboration for Building a Culture of Academic Integrity

Although librarians play a significant role in plagiarism prevention, effective results require collaboration with the entire academic community. Libraries should work closely with academic departments, quality assurance units, research offices, and institutional administrators.

Collaboration can include developing plagiarism policies, designing training programmes, creating online learning materials, and integrating information literacy into academic curricula.

When librarians, academics, and institutional leaders work together, plagiarism prevention becomes an educational process rather than only a disciplinary action.

Challenges and Future Directions

Despite their important contributions, librarians face several challenges in promoting academic integrity. These include limited awareness among users, insufficient resources, rapid technological changes, and the need for continuous professional development.

The increasing complexity of digital information environments requires librarians to update their knowledge continuously. Future library services will need to focus on digital literacy, ethical use of emerging technologies, research support, and responsible scholarly communication.

The role of librarians will continue to expand from information providers to educators who guide users in navigating complex information environments.

Conclusion

Preventing plagiarism requires more than detecting copied content. It requires developing knowledge, skills, and ethical values that encourage responsible use of information. Libraries, through their educational and research support functions, have a central role in creating a culture of academic integrity.

By teaching information literacy, promoting proper citation practices, supporting research activities, and collaborating with academic communities, librarians empower students and researchers to become ethical creators and users of knowledge.

Plagiarism prevention begins not with punishment but with education. Moving beyond "copy and paste" requires libraries to continue leading efforts toward responsible scholarship, intellectual honesty, and academic excellence.

References

Ashikuzzaman, MD, (2024), How Libraries Help Students Avoid Plagiarism, LIS Education Network, https://www.lisedunetwork.com/how-libraries-help-students-avoid-plagiarism/

Giannakouli, V., Vraimaki, E., Koulouris, A., Kokkinos, D., Kouis, D., Kyprianos, K., & Triantafyllou, I. (2023). How academic librarians combat student plagiarism. The Journal of Academic Librarianship, 49(6), 102785. https://doi.org/10.1016/j.acalib.2023.102785

Idiegbeyan-ose, Jerome Dr; Ifijeh, Goodluck Mr; Segun-Adeniran, Chidi Deborah; Esse, Ugwunwa; Owolabi, Sola; and Aregbesola, Ayooluwa, (2018). Towards Curbing Plagiarism in Higher Institutions of Learning: The Strategic Role of the Library. Library Philosophy and Practice (e-journal).2114. http://digitalcommons.unl.edu/libphilprac/2114

Tarmiasih, T., & Azizah, I. N. (2025). The Role of Librarians in Preventing Plagiarism in Higher Education: Case Studies at Diponegoro University, State University of Semarang, and Dian Nuswantoro University. Lentera Pustaka: Jurnal Kajian Ilmu Perpustakaan, Informasi dan Kearsipan, 11(2), 13-28. https://doi.org/10.14710/lenpust.v11i2.75283

A study on reading habits among Ordinary level students of B/Bandanayaka National School, Mahiyangana

KPGI Karunanayaka, SAAN Weerasinghe

Abstract

Looking ahead , the role of the school librarian will continue to expand in response to emerging technologies such as artificial intelligence, virtual reality and adaptive learning systems. Librarians who embrace innovation, collaborate with educators and advocate for equitable access will be key drivers of educational transformation. Their contribution will extend beyond information management to shaping how students to learn, think and engage with the world.

The future of school Librarianship lies at the intersection of education, technology & information literacy. As digital tools become more central to learning, school Librarians will play a pivotal role in preparing students for an information – rich and complex world. By embracing new competencies and redefining their professional identity, Librarians will continue to be vital contributors to student success in the digital era.

References

Bogiannidis,N.,Southcott,J.and Gindidis,M.(2023) Educational Opportunities and challenges in digital environments',smart learning Environments,10(26)

Chavan,S.and Hase,V.(2025) Opportunities & challenges in implementing web-based Library services.IJAAR,6(39).

Herring,J.(2007) school Libraries. In: Libraries in the Twenty-First century

Koimett,E.(2021) Impact of School Libraries on students' life skills. IASL conference proceedings

Library and Information science Education Net work(n.d) impact on internet resources on library. Available at: https://www.lisedunetwork.com

(Accessed : 30 Aprill 2026)

National Library of New Zealand (n.d) Importance of the school library in learning-the research Available at: https://natlib.govt.nz

(Accessed : 29 Aprill 2026)

Symons,A.K.(2022)`Internet safety issues: Challenges and Opportunities' College & Research Libraries News

මාධ්‍ය පුස්තකාලයක් භාවිතා කරන විකාශන මාධ්‍යන් හා ඒවා ගබඩා කිරීම


ප්‍රියන්ත ගොඩකන්ද

පුස්තකාලයාධිපති

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

විකාශන මාධ්‍යන් | Broadcast Media

මුල්කාලීන විකාශන ක්ෂේත්‍රයේ ප්‍රධාන සන්ධිස්ථාන



Morce code

• **රැහැන් රහිත විදුලි පණිවුඩ (මෝසර් කේතය):** ගුග්ලියෙල්මෝ මාකෝනි 1895 දී ප්‍රථම රැහැන් රහිත ගුවන් විදුලි සංඥාව සම්ප්‍රේෂණය කළේ හඬට වඩා තිත්-ඇන්ඩ්-ඩෑෂ් මෝර්ස් කේතය භාවිතා කරමිනි.

• **පළමු හඬ සහ සංගීත විකාශනය:** කැනේඩියානු නව නිපැයුම්කරු රෙජිනෝල්ඩ් ෆෙසෙන්ඩන් 1906 දී නත්තල් සැන්දෑවේ මිනිස් කථනය (බයිබලයෙන් කියවීම) සහ වයලීන ඒකල වාදනයක් ("ඕ හෝලි නයිට්" වාදනය කිරීම) ඇතුළත් පළමු ශ්‍රව්‍ය වැඩසටහන විකාශනය කළේය.

• **පළමු වාණිජ ගුවන් විදුලි විකාශනය:** පෙන්සිල්වේනියාවේ පිට්ස්බර්ග් හි පිහිටි KDKA ස්ථානය, 1920 නොවැම්බර් 2 වන දින හාඩින්-කොක්ස් ජනාධිපතිවරණ ප්‍රතිලාභ විකාශනය කිරීමෙන් වාණිජ විකාශන ඉතිහාසයක් ඇති කළේය.

• **මුල් දුරකථන මාගර් පූවර්ගාමීන්:** මහජන විනෝදාස්වාදය සඳහා ගුවන් විදුලි තරංග බහුලව භාවිතා වීමට පෙර, හංගේරියාවේ ටෙලිෆොන් හර්මන්ඩෝ (1893), ප්‍රංශයේ තෙට්‍රොෆෝන් සහ එක්සත් රාජධානියේ ඉලෙක්ට්‍රොෆෝන් වැනි පද්ධති දුරකථන මාර්ග හරහා ප්‍රවෘත්ති සහ සජීවී රඟහල බෙදා හැරියේය.

• **මුල් රූපවාහිනී විකාශන ද්‍රව්‍ය:** මුල් පර්යේෂණාත්මක රූපවාහිනී විකාශනවල පරීක්ෂණ රූප සහ කෙටි වැඩසටහන් ඇතුළත් විය, ඒවා අතර ජෝන් ලොගී බෙයාර්ඩ් විසින් 1925 දී වෙන්ට්‍රිලොක්විස්ට්ගේ ව්‍යාජ රූපයක්, 1928 W2XBS හි ෆිලික්ස් ද කැට් බෝනික්කෙකුගේ පරීක්ෂණ විකාශනයක් සහ 1928 දී නිව් යෝර්ක්හි ෂෙනෙක්ටඩි හි WGY විසින් විකාශනය කරන ලද The Queen's Messenger නාට්‍යය ඇතුළත් විය.

මුල් කාලීන රූපවාහිනී පටිගත කිරීමේ ක්‍රම සහ ද්‍රව්‍ය

• ෆොනොවිෂන් (1927): ජෝන් ලොගී බෙයාර්ඩ් සාමාන්‍ය ෂෙලැක් ග්‍රැමෆෝන්/ෆොනෝග්‍රැෆ් තැටි මත මුල් කාලීන යාන්ත්‍රික රූපවාහිනී සංඥා පටිගත කළේය.

• ටෙලිරෙකෝඩින් (1947): සජීවී රූපවාහිනී මොනිටර වෙනුවෙන් ඡායාරූප ගැනීම සඳහා බීබීසී සහ ජාල සම්මත වලන රූප චිත්‍රපට තොගය (ප්‍රකාශ රසායනික පටල) භාවිතා කළේය.


• කල්පවත්නා පද්ධති (1951–1953): විකාශනය සඳහා තවමත් ප්‍රායෝගික නොවූවත්, බිං ක්‍රොස්බි එන්ටර්ප්‍රයිසස් සහ ආර්සීඒ මුල් කාලීන චුම්භක පටි පද්ධති සමඟ අත්හදා බැලීම් කළහ.

• ක්වාඩ්රුප්ලෙක්ස් වීඩියෝ ටේප් (1956): ඇම්පෙක්ස් අහල් 2 ක චුම්භක රීල්-ටු-රීල් ටේප් ආකෘතිය (භ්‍රමණය වන හිස් හතරක් භාවිතා කරමින්) දියත් කළ අතර එය චිත්‍රපටය ප්‍රතිස්ථාපනය කර රූපවාහිනී ජාල සඳහා ක්ෂණික නැවත ධාවනය සහ කාල කලාප ප්‍රමාදයන් සක්‍රීය කළේය.

• වීරා (1958): බීබීසී විසින් වීරා (විෂන් ඉලෙක්ට්‍රොනික පටිගත කිරීමේ උපකරණය) හඳුන්වා දෙන ලදී, එය ඇම්පෙක්ස් පද්ධති මගින් ඉක්මනින් අභිබවා යන ලද නමුත්, එය අහල් භාගයක චුම්භක පටි භාවිතා කරන ලදී.




Phonovision



Telerecording



Quadruplex Videotape



VERA



"VTR" භාවිතය.

1950 දශකයේ අගභාගයේදී වාණිජමය වශයෙන් නිකුත් කරන ලද පළමු වීඩියෝ ටේප් රෙකෝඩරය (VTR) වන 'AMPEX quadruplex VR-1000A'; මෙහි භාවිතා වන 'quadruplex' වර්ගයේ විවෘත රීල් (open-reel) පටිය අහල් 2ක් පළල වේ.

1967 දී හඳුන්වා දුන්, ගමන් මල්ලක ප්‍රමාණයෙන් යුත් පළමු අතේ ගෙන යා හැකි (portable) VTR යන්ත්‍රය වන 'AMPEX quadruplex VR-3000'.

1976 Hitachi අතේ ගෙන යා හැකි VTR යන්ත්‍රය (Sony 1" Type C ප්‍රමිතිය සඳහා); මෙහි ඉඩ ඉතිරි කර ගැනීම සඳහා පටි රීල් දෙක (සැපයුම් රීල සහ ලබා ගන්නා රීල) එකක් මත එකක් පිහිටන සේ සකසා ඇත. කෙසේ වෙතත්, මෙහි දැක්වෙන්නේ එක් රීලයක් පමණි.

වීඩියෝ ටේප් රෙකෝඩරයක් (VTR) යනු චුම්බක පටියක් (magnetic tape) මත වීඩියෝ සහ ශ්‍රව්‍ය දත්ත පටිගත කිරීමටත්, ඒවා නැවත ධාවනය කිරීමටත් (play back) නිර්මාණය කර ඇති උපකරණයකි. මුල් කාලීන VTR යන්ත්‍ර, අහල් 2ක් (සෙන්ටිමීටර 5.08) පළල වීඩියෝ පටි සහිත විවෘත රීල් (open-reel) ක්‍රමයේ

උපාංග විය. මේවා රූපවාහිනී මැදිරිවල (television studios) භාවිතා වූ අතර, චිත්‍රපට පට (motion picture film stock) වෙනුවට ආදේශකයක් ලෙස ක්‍රියා කළේය. එමගින් රූපවාහිනී කටයුතු සඳහා පටිගත කිරීම් සිදු කිරීම වඩාත් ලාභදායී සහ වේගවත් විය. 1963 වසරේ සිට, මෙම වීඩියෝ පටිගත කිරීමේ යන්ත්‍ර මගින් රූපවාහිනියෙන් විකාශය වන ක්‍රීඩා ඉසව් අතරතුර 'ක්ෂණික නැවත විකාශය' (instant replay) සිදු කිරීමට හැකි විය. 1969 වසර පමණ වන විට, වීඩියෝ කැසට් පටයක් (videocassette) තුළ පටිය අසුරා තැබිය හැකි වඩාත් දියුණු ආකෘති හඳුන්වා දෙන ලදී; මෙවැනි කැසට් පට ධාවනය කරන යන්ත්‍ර 'වීඩියෝ කැසට් රෙකෝඩර' (videocassette recorders) ලෙස හැඳින්වේ.

ජපන් නිෂ්පාදකයින් අතර පොදු පටිගත කිරීමේ ප්‍රමිතියක් පිළිබඳව ඇති කරගත් එකඟතාවය හේතුවෙන්, එක් නිෂ්පාදකයෙකුගේ යන්ත්‍රයක පටිගත කරන ලද කැසට් පටයක් තවත් නිෂ්පාදකයෙකුගේ යන්ත්‍රයක ධාවනය කිරීමට හැකි විය. මෙය සාමාන්‍ය පාරිභෝගික වෙළඳපොළක් (consumer market) බිහි වීමට මග පෑදුවේය. 'U-matic' ආකෘතිය භාවිතා කළ, පාරිභෝගිකයින් සඳහා වූ පළමු වීඩියෝ කැසට් රෙකෝඩරය 1971 දී Sony සමාගම විසින් හඳුන්වා දෙන ලදී.

VHS භාවිතය.



VHS (Video Home System) යනු ටේප් කැසට් මත ඇනලොග් වීඩියෝ පටිගත කිරීම සඳහා වූ, වර්තමානයේ භාවිතයෙන් ඉවත් වී ඇති ප්‍රමිතියකි. මෙය 1976 සැප්තැම්බර් 9 වන දින ජපානයේ 'Victor Company of Japan' (Matsushita සමාගමේ අනුබද්ධිත ආයතනයක් වන JVC) විසින් හඳුන්වා දෙන ලදී. 1980 සහ 1990 දශකවල, එනම් ටේප් මාධ්‍ය බහුලව භාවිත වූ කාලසීමාව පුරාම, නිවාස භාවිතය සඳහා වූ ප්‍රමුඛතම වීඩියෝ ආකෘතිය වූයේ මෙයයි.



මූලික තාක්ෂණික පිරිවිතර

• පටියේ පළල: ප්ලාස්ටික් ආවරණයක් තුළ අඩංගු අඟල් ½ (මි.මී. 12.7) පළලැති චුම්බක පටිය.

• කැසට් පටයේ මානයන්: සම්මත කැසට් පට සඳහා මි.මී. 187 × 103 × 25.

• විභේදනය (Resolution): තිරස් විස්තර රේඛා ආසන්න වශයෙන් 240ක් (PAL පද්ධතියේ රේඛා 625 / තත්පරයට රාමු 25ක් - NTSC පද්ධතියට සමාන අගයක්).

• පටිගත කිරීමේ වේගයන්:

• SP (Standard Play - සම්මත ධාවන වේගය): සාමාන්‍ය කැසට් පටයක පැය 2ක් පමණ පටිගත කළ හැක.

• LP / EP / SLP (Long/Extended Play - දීර්ඝ ධාවන වේගයන්): පටියේ චලන වේගය අඩු කිරීම මගින් පැය 4 සිට 8ක් හෝ ඊට වැඩි කාලයක් දක්වා පටිගත කළ හැක.

U-matic භාවිතය.

වීඩියෝ ආකෘති (video formats) අතරින්, U-matic පටි (tapes) යනු පැරණිතම සහ ඉතා සීමිත භාවිතයක් සහිත ආකෘතියකි. මේවා Betamax ආකෘතියටත් පෙර පැවති අතර, සාමාන්‍ය පාරිභෝගිකයින්ට වඩා රූපවාහිනී ක්ෂේත්‍රයේ වෘත්තිකයන් විසින් බහුලව භාවිතා කරන ලදී.

ඒවා පැරණි පමණින්ම, අදටත් වැදගත්කමක් නැති දේවල් යැයි අදහස් නොවේ. අදටත් බොහෝ දෙනෙකුගේ නිවෙස්වල/ රූපවාහිනී ආයතනවල හොඳින් ක්‍රියාත්මක වන U-matic පටි තිබිය හැක.



U-matic player

U-matic පටි (U-matic tapes) යනු මොනවාද?

U-matic පටි මුලින්ම 1969 දී Sony සමාගම විසින් මූලාකෘතියක් ලෙස නිපදවන ලද අතර, 1971 දී වෙළඳපොළට නිකුත් කරන ලදී. විශාල රීල් (reel-to-reel) පද්ධති වෙනුවට, සංයුක්ත කැසට් පටයක් (compact cassette) තුළ වීඩියෝ පටය අසුරා තිබූ මුල්ම ආකෘතිවලින් එකක් ලෙස මෙය හැඳින්විය හැකිය. "U-matic" යන නම ලැබී ඇත්තේ, වීඩියෝ පටය එහි ඇති 'හෙඩ් ඩ්‍රම්' (head drum) එක වටා "U" හැඩයකට සකසා තිබූ ආකාරය පදනම් කරගෙනයි.

මෙම පටි සංයුක්ත (compact) ස්වභාවයක් ගත් බැවින්, Sony සමාගම මුලින් බලාපොරොත්තු වූයේ මේවා සාමාන්‍ය පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වනු ඇති බවයි. නමුත්, ඇත්ත වශයෙන්ම මේවා වඩාත් ප්‍රයෝජනවත් වූයේ ව්‍යාපාරික සන්නිවේදන කටයුතු සහ අඩු වියදම් රූපවාහිනී නිෂ්පාදන සඳහා ය. සාමාන්‍ය පාරිභෝගිකයන්ට මේවා මිලදී ගැනීම ඉතා අධික වියදම් සහිත කටයුත්තක් විය. තවද, මෙම පටි මගින් පූර්ණ වර්ණ (full color) වීඩියෝ දර්ශන ලබා දුන්නද, එකල වර්ණ රූපවාහිනී යන්ත්‍ර තිබුණේ ජනගහනයෙන් 40% කටත් අඩු පිරිසක් සතුව පමණි.

Betacam භාවිතය.

20 වැනි සියවසේ අවසාන කාර් තුවේදී වීඩියෝ ආකෘති (video formats) විශාල ප්‍රමාණයක් සංවර්ධනය කර වෙළඳපොළට නිකුත් කෙරුණු අතර, එකම සමාගම් විසින් සමාන නම් සහිත විවිධ නිෂ්පාදන රැසක් ද එළිදක්වන ලදී. මේ හේතුවෙන් එක් ආකෘතියක් තවත් ආකෘතියක් ලෙස වරදවා වටහා ගැනීම පහසුවෙන් සිදුවිය හැකිය. 'Betamax' සහ 'Betacam' යනු ඊට කදිම උදාහරණ වේ. එහෙත්, මෙම ආකෘති නිවැරදිව භාවිතා කිරීමට, ධාවනය කිරීමට, ගබඩා කිරීමට සහ ඩිජිටල්කරණය (digitize) කිරීමට නම්, ඒවා එකිනෙකින් වෙන් කර හඳුනා ගන්නේ කෙසේදැයි දැන සිටීම වැදගත් වේ.



මෙම ලිපිය තුළින්, 'Betacam' යනු කුමක්ද, එය 'Betamax' වෙතින් වෙනස් වන්නේ කෙසේද, සහ ඔබේ 'Betacam' පටි (tapes) නරඹන්නේ සහ ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව පැහැදිලි කරන්නෙමු.

Betacam යනු කුමක්ද?

Betacam යනු Sony සමාගමේ උසස් තත්ත්වයේ වීඩියෝ පටි (videotape) තාක්ෂණයන්ගෙන් එකකි. 1982 වසරේ හඳුන්වා දුන් මුල්ම පටිවල සිට 2003 වසරේ පැමිණි ඩිජිටල් HDCAM SR දක්වා, Betacam යන නාමය යටතේ නිෂ්පාදන රැසක් වෙළඳපොළට නිකුත් කෙරිණි.


Beta cam editing machine

"Betacam" යනුවෙන් යමෙකු සඳහන් කරන විට, එයින් Betacam පටි (tapes), Betacam කැමකෝඩර (camcorders) හෝ Betacam වීඩියෝ රෙකෝඩර (video recorders) වැනි විවිධ නිෂ්පාදන වර්ග අදහස් විය හැකිය. Betacam ආකෘතිය සාමාන්‍ය පාරිභෝගිකයින්ට මෙන්ම වෘත්තිකයන්ට ද ලබා ගත හැකිව තිබුණද, එය වෘත්තීය ක්ෂේත්‍රය තුළ වඩාත් සාර්ථක විය. 2006 වසර පමණ වන තෙක් ජනප්‍රියව පැවති මෙම තාක්ෂණය, පටි (tapes) භාවිතය අවශ්‍ය නොවන ඩිජිටල් පටිගත කිරීමේ නිෂ්පාදන පැමිණීමත් සමඟ ක්‍රමයෙන් භාවිතයෙන් ඉවත් විය.

BETACAM හි පරිවර්තනයන්

Betacam දිගු කාලයක් පුරා පැවති බැවින්, විවිධ නිෂ්පාදන ජනප්‍රිය වූ කාල වකවානු පෙන්වන පරිවර්තනයන් පහත දැක්වේ.

1982 – Betacam හඳුන්වා දීම: 1982 දී නිකුත් කරන ලද පළමු Sony Betacam නිෂ්පාදන, Betamax ආකෘතිය (format) මත පදනම්ව නිර්මාණය වූවකි. එහෙත්, රූපවාහිනී කටයුතු සහ වෙනත් වෘත්තීය භාවිතයන් සඳහා දිගු කලක් ජනප්‍රියව පැවති U-matic ආකෘතිය ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණින් මේවා සකස් කර තිබුණි.

1986 – Betacam SP හඳුන්වා දීම: ඉන් වසර හතරකට පසු, එනම් 1986 දී, සමාගම විසින් Betacam SP (Superior Performance) හඳුන්වා දෙන ලදී. මෙහිදී රූපයේ විභේදනය (resolution) රේඛා 300 සිට 340 දක්වා වැඩි දියුණු කළ අතර, පටිගත කළ හැකි කාලසීමාව මිනිත්තු 30 සිට 90 දක්වා දීර්ඝ කරන ලදී.

1994 – Digital Betacam හඳුන්වා දීම: 1994 දී පළමු Digital Betacam පද්ධතිය එළිදක්වන තෙක්, Betacam SP පටි (tapes) වසර කිහිපයක් පුරා ජනප්‍රියව පැවතුණි. නමට අනුවම, මෙම නිෂ්පාදනය ඇනලොග් (analog) තාක්ෂණයේ සිට ඩිජිටල් (digital) තාක්ෂණය වෙත මාරුවීමක් සනිටුහන් කළේය. මෙහිදී 10-bit DCT සම්පීඩන (compression) ක්‍රමවේදය සහ 4:2:2 සාම්ප්ලින් (sampling) තාක්ෂණය භාවිතා කරන ලදී. මෙහි කැසට් වර්ග දෙකක් තිබූ අතර, ඉන් එකක මිනිත්තු 124ක දර්ශන ද, අනෙකෙහි මිනිත්තු 40ක දර්ශන ද ගබඩා කළ හැකි විය.

1996 – Betacam SX හඳුන්වා දීම: 1996 දී, Sony සමාගම Digital Betacam සඳහා වඩාත් ලාභදායී විකල්පයක් ලෙස Betacam SX හඳුන්වා දුන්නේය. මෙය Betacam SP හි ඩිජිටල් අනුවාදයක් වූ අතර, පැරණි SP උපකරණ සමඟ ක්‍රියා කළ හැකි වන පරිදි නිර්මාණය කර තිබුණි. රූපවාහිනී මධ්‍යස්ථාන සහ වෙනත් පාරිභෝගිකයින්ට ඩිජිටල් තාක්ෂණය වෙත මාරුවීම පහසු කිරීම මෙහි අරමුණ විය.

1996 – MPEG IMX හඳුන්වා දීම: මෙම යාවත්කාලීන කිරීම මගින් Digital Betacam ආකෘතිය තවදුරටත් දියුණු කරන ලදී. මෙහිදී ඉහළ බිට් අනුපාතයකින් (bitrate) දත්ත කේතනය (encoding) කළ අතර, IMX 'intraframe' සම්පීඩන ක්‍රමවේදය භාවිතා කරන ලදී.

1997 – HDCAM හඳුන්වා දීම: 1997 දී, Sony සමාගම Betacam සඳහා පළමු HD (High Definition) ආකෘතිය වන HDCAM හඳුන්වා දුන්නේය. HDCAM මගින් පටිගත කරන ලද දර්ශන 1920×1080 විභේදනයකින් (resolution) නැරඹිය හැකි විය. Sony සමාගම මෙය සිනමා කර්මාන්තය ඉලක්ක කර ගනිමින් හඳුන්වා දෙන ලදී. 2003 – HDCAM SR හඳුන්වා දීම: අවසානයේදී, 2003 වසරේදී HDCAM හි “Superior Resolution” (ඉහළම විභේදනයක් සහිත) අනුවාදය හඳුන්වා දෙන ලදී. මෙය ප්‍රධාන වශයෙන් HDTV වැඩසටහන් නිෂ්පාදනය සඳහා භාවිතා විය. ටේප් (පටි) භාවිතය අවශ්‍ය නොවන විකල්ප තාක්ෂණයන් මගින් ක්‍රමයෙන් එය ප්‍රතිස්ථාපනය වීමට පෙර, වසර කිහිපයක් පුරා මෙය බෙහෙවින් ජනප්‍රියව පැවතුණි. කෙසේ වෙතත්, දෘශ්‍ය දත්ත (footage) සංරක්ෂණය කිරීම සඳහා HDCAM SR ටේප් තවමත් බහුලව භාවිතා වේ.

Betacam ආකෘතියේ පරිණාමය

• Betacam (1982): තිරස් විභේදනය (horizontal resolution) රේඛා 300කින් යුත්, ෆෙරික්-ඔක්සයිඩ් (ferric-oxide) අඩංගු මුල්ම ඇනලොග් ආකෘතියයි.

• Betacam SP (1986): මෙහිදී ලෝහමය සංයුතියකින් (metal-formulated) යුත් පටියක් භාවිතා කිරීමෙන් විභේදනය රේඛා 340 දක්වා වැඩි කරන ලදී. තවද, ශ්‍රව්‍ය නාලිකා (audio channels) වැඩිදියුණු කළ අතර, විශාල කැසට් පටවල ධාවන කාලය මිනිත්තු 90ක් දක්වා දීර්ඝ කරන ලදී.

• Digital Betacam / DigiBeta (1993): මෙය 10-bit DCT-සම්පීඩිත ඩිජිටල් සංරවක වීඩියෝ (4:2:2) ආකෘතියකට මාරු වූ අතර, මෙහි ශ්‍රව්‍ය දත්ත සම්පීඩනය නොකළ PCM ආකෘතියෙන් යුක්ත විය.

• පසුකාලීන ප්‍රභේද: මෙයට Betacam SX (1996), MPEG IMX (2001), HDCAM (1997) සහ HDCAM SR (2003) ඇතුළත් වේ.

DVcam භාවිතය.



වෘත්තීය සහ ආධුනික වෙළඳපල දෙකෙහිම ඇනලොග් විකල්ප සැබවින්ම ප්‍රතිස්ථාපනය කිරීමට පටන් ගත් 1990 ගණන්වලදී ඩිජිටල් වීඩියෝ ඉතා ජනප්‍රිය විය. මෙම ආකෘතිය ප්‍රමිතිගත කර නිෂ්පාදනය කරන ලද සෝනි සහ පැනසොනික් විශාලතම නිෂ්පාදකයින් දෙදෙනෙකු විය.

සෝනි හි DVCam 1996 දී එහි මුල් DV උපකරණවල නව සහ වැඩිදියුණු කළ අනුවාදයක් ලෙස නිකුත් කරන ලදී. මෙම ලිපියෙන්, DVCam යනු කුමක්ද සහ එය එහි පූර්වගාමීන් සහ තරඟකරුවන්ගෙන් වෙනස් වූයේ කෙසේද යන්න අපි හරියටම බලමු.

DVCAM යනු කුමක්ද?



DVCam යනු 1990 ගණන්වලදී Sony සහ Panasonic වැනි සමාගම් විසින් නිෂ්පාදනය කරන ලද DV (Digital Video - ඩිජිටල් වීඩියෝ) ආකෘතිවලින් එකකි. එම කාලයේම හඳුන්වා දුන් වෙනත් ආකෘති කිහිපයක් පහත දැක්වේ:

DV

MiniDV

Digital8

HDV

DVCPRO

DVCPRO50

DVCPRO HD

DV සහ MiniDV ආකෘති පවුල් සහ ආධුනිකයන් ඉලක්ක කරගත් ගෘහස්ථ වීඩියෝ වෙළඳපොළ සඳහා නිර්මාණය කර තිබූ අතර, DVCPRO නිර්මාණය කර තිබුණේ රූපවාහිනී කර්මාන්තයේ වෘත්තිකයන් සඳහාය.

DVCam පිහිටියේ මෙම කාණ්ඩ දෙක අතර මැද තැනකය. එය අර්ධ-වෘත්තීය (semi-professional) මට්ටමේ සහ මූලික මට්ටමේ වෘත්තීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් නිර්මාණය කරන ලද්දකි. මෙය DV සහ MiniDV වලට බෙහෙවින් සමාන වූ අතර, එම ආකෘතිවලම භාවිතා වන ආකාරයේ පටි (tapes) සහ සම්පීඩන (compression) ක්‍රමවේදයන්ම භාවිතා කළේය. කෙසේ වෙතත්, DVCam හි පටි ධාවන වේගය (tape speed) සාමාන්‍ය DV වලට වඩා 50% කින් පමණ වේගවත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, DV හා සසඳන විට DVCam හි පටිගත කළ හැකි කාලය (recording time) 33% කින් පමණ අඩු විය.

නිෂ්පාදන වශයෙන් ගත් කල, අර්ධ-වෘත්තීය පද්ධතියක් සැකසීමට අවශ්‍ය සියලුම උපකරණ DVCam පරාසය තුළ අඩංගු විය. මෙයට DVCam පටි මත දත්ත පටිගත කරන ඩිජිටල් වීඩියෝ කැමරා (camcorders) මෙන්ම, එම පටි ධාවනය කර පෙන්විය හැකි DVCam ඩිජිටල් VTR (වීඩියෝ පටි ධාවක) ද ඇතුළත් විය.

ප්‍රධාන තාක්ෂණික පිරිවිතර

• පටියේ පළල: අඟල් 1/4 (මි.මී. 6.35) ප්‍රමාණයේ, ලෝහ වාෂ්පීකරණ (Metal-Evaporated - ME) ක්‍රමයට සැකසූ චුම්බක පටියකි.

• පථ පරතරය (Track Pitch) සහ වේගය: මෙහිදී 15 µm ක පුළුල් පථ පරතරයක් (සාමාන්‍ය පාරිභෝගික DV පටිවල ඇති 10 µm පරතරයට සාපේක්ෂව) භාවිතා වන අතර, පටිය 50% ක පමණ වැඩි වේගයකින් ධාවනය වේ. මෙය පටියේ ගෙවී යාමට ඇති ප්‍රතිරෝධය වැඩි කරන අතර, දත්ත අහිමි වීම් (dropouts) අවම කරයි.

• පටිගත කළ හැකි කාලය: වැඩි වේගයකින් ධාවනය වන බැවින්, සාමාන්‍ය DV පටිවලට සාපේක්ෂව මෙහි පටිගත කළ හැකි කාලය තුනෙන් එකකින් අඩු වේ:

- Mini / S-ප්‍රමාණය (MiniDV ආකාරයේ): මිනිත්තු 40ක් දක්වා.
- Standard / L-ප්‍රමාණය: මිනිත්තු 184ක් දක්වා.

Professional Disc [XDCam]



Sony සමාගම විසින් වෘත්තීය මට්ටමේ 'නොන්-ලීනියර්' (non-linear) වීඩියෝ පටිගත කිරීමේ මාධ්‍යයක් ලෙස Professional Disc තෝරා ගන්නා ලදී. මෙම තැටිය Blu-ray තැටියට සමාන වන අතර, ධාරිතාව අනුව වර්ග කිහිපයකින් සමන්විත වේ: 23 GB (PFD23 - තනි ස්ථර, නැවත ලිවිය හැකි), 50 GB (PFD50 - ද්විත්ව ස්ථර, නැවත ලිවිය හැකි), 100 GB (PFD100TLA - ත්‍රිත්ව ස්ථර, නැවත ලිවිය හැකි) සහ 128 GB (PFD128QLW - සිව් ස්ථර, එක් වරක් පමණක් ලිවිය හැකි).



මූලික වශයෙන්, Professional Disc ආකෘතිය (format) යනු වඩාත් සුදුසු, පිරිවැය අතින් ලාභදායී සහ ඉදිරි පියවරක් ලෙස පහසුවෙන් අනුගමනය කළ හැකි තාක්ෂණයක් ලෙස සැලකේ. මෙම තැටි ඉතා විශ්වාසවන්ත මෙන්ම ශක්තිමත් බැවින්, ක්ෂේත්‍ර කටයුතු (field work) සඳහා ඉතා යෝග්‍ය වේ (මීට පෙර තැටි මත පදනම් වූ බොහෝ පද්ධති සම්බන්ධයෙන් මෙය ගැටලුවක්ව පැවතුණි). මීට අමතරව, මෙම මාධ්‍ය සඳහා වැය වන මුදල දැනට භාවිතයේ පවතින අනෙකුත් වෘත්තීය ආකෘතිවල පිරිවැයට සමාන මට්ටමක පවතී.

SxS මතක කාඩ්පත (Memory Card)



2008 වසරේදී, Sony සමාගම තම XDCAM නිෂ්පාදන පෙළ සඳහා 'SxS Pro' (මෙය "S-by-S" ලෙස උච්චාරණය කෙරේ) නම් නව දත්ත ගබඩා මාධ්‍යයක් හඳුන්වා දෙන ලදී. මෙය ExpressCard මොඩියුලයක් ලෙස සකස් කරන ලද, ඝන-තත්ව (solid-state) තාක්ෂණයෙන් යුත් මතක කාඩ්පතකි. මෙම මාධ්‍යය භාවිතා කළ පළමු කැමරාව වන්නේ Sony PMW-EX1 වෘත්තීය වීඩියෝ කැමරාවයි.

2009 දෙසැම්බරයේදී, Sony සමාගම වඩාත් මිල අඩු 'SxS-1' කාඩ්පත හඳුන්වා දුන්නේය. මෙය SxS Pro කාඩ්පතට සමාන කාර්ය සාධනයක් ලබා දෙන ලෙස නිර්මාණය කර ඇතත්, එහි ආයු කාලය තරමක් අඩුය; එනම්, දිනපතා කාඩ්පතේ සම්පූර්ණ ධාරිතාව දක්වාම භාවිතා කරන්නේ නම්, එහි ඇස්තමේන්තුගත ආයු කාලය වසර 5ක් පමණ වේ.

2013 වසරේ මුල් භාගයේදී, Sony සමාගම 'SxS Pro+' කාඩ්පත් හඳුන්වා දෙන ලදී. PMW-F55 කැමරාව මගින් 4K 60p ආකෘතියෙන් දත්ත පටිගත කිරීමේදී (acquisition) ඊට සහාය වීම සඳහා, මෙම කාඩ්පත්වල තත්පරයට ගිගාබිට් 1.2ක (1.2 Gbit/s) දත්ත කියවීමේ සහ ලිවීමේ වේගයක් පවතී.

ගොනු සේවාදායකය | File Server



ගොනු සේවාදායකයක් යනු විශේෂිත දෘඩාංග හෝ මෘදුකාංගයක් වන අතර එය ගොනු සහ දත්ත ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මධ්‍යගත ස්ථානයක් සපයන අතර එමඟින් ඒවා බලයලත් පරිශීලකයින්ට ප්‍රවේශ විය හැකිය. කාර්යක්ෂම ගොනු බෙදාගැනීම, ආරක්ෂාව සහ ප්‍රවේශ්‍යතාව සොයන පුද්ගලයින් සඳහා එය අත්‍යවශ්‍ය වේ. ගොනු සේවාදායකයන් මධ්‍යගත දත්ත ගබඩා කිරීම, සහයෝගීතාවය, දත්ත ආරක්ෂාව, පරිමාණය කිරීමේ හැකියාව සහ ආරක්ෂිත ප්‍රවේශ පාලනය වැනි ප්‍රතිලාභ ලබා දෙයි.

ගොනු සේවාදායකයක් තෝරා ගැනීම ප්‍රවේශයේ පහසුව, පිරිවැය සහ ආරක්ෂාව වැනි සාධක මත රඳා පවතී. Windows ගොනු සේවාදායකයන් බොහෝ විට තෝරා ගනු ලබන්නේ භාවිතයේ පහසුව සහ Windows නිෂ්පාදන සමඟ හුරුපුරුදුකම සඳහා වන අතර Linux ගොනු සේවාදායකයන් වැඩි නම්‍යශීලී බවක් සහ පිරිවැය ඉතිරිකිරීමක් ලබා දෙයි. පරිශ්‍රයේ ඇති ගොනු සේවාදායකයන් දත්ත ගබඩා කිරීම සහ ආරක්ෂාව පිළිබඳ පූර්ණ පාලනය ලබා දෙන අතර, වලාකුළු ගොනු සේවාදායකයන් පරිමාණය, දුරස්ථ ප්‍රවේශය සහ ස්වයංක්‍රීය උපස්ථ ලබා දෙයි. ගොනු සේවාදායකයන් සහ වෙබ් සේවාදායකයන් ගොනු ප්‍රවේශය වෙනස් ලෙස හසුරුවන අතර, ගොනු සේවාදායකයන් අභ්‍යන්තර ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සහ වෙබ් සේවාදායකයන් වෙබ් අඩවි සත්කාරකත්වය සපයයි.

ගොනු සේවාදායකයක් (File Server) යනු කුමක්ද?

ගොනු සේවාදායකයක් යනු දේශීය ජාලයක් (LAN) හෝ පුළුල් ජාලයක් (WAN) හරහා ඩිජිටල් ගොනු ගබඩා කිරීම, කළමනාකරණය කිරීම සහ ඒවා වෙත ප්‍රවේශය ලබා දීම ප්‍රධාන වශයෙන් සිදු කරන පද්ධතියකි. මෙමගින් පරිශීලකයින් කිහිප දෙනෙකුට පුද්ගලික හෝ ආයතනික ගොනු වෙත ප්‍රවේශ වීමට, ඒවා සුරැකීමට සහ බෙදා ගැනීමට ඵලදායී ලෙස ඉඩ සලසයි. මෙවැනි සේවාදායකයක් මගින් දත්ත අනුපිටපත් වීම (data duplication) අවම කරන අතර, දත්ත බෙදා හැරීම පාලනය කිරීමට සහ සහයෝගිතාව (collaboration) වැඩි දියුණු කිරීමට උපකාරී වේ.



Windows ගොනු සේවාදායකයන්: ව්‍යාපාරික පරිසරයන් තුළ බහුලව භාවිතා වන වර්ගයකි. 'Active Directory' සමඟ ඒකාබද්ධ වීමේ හැකියාව මෙහි ඇති එක් වාසියකි.

Linux ගොනු සේවාදායකයන්: Samba සහ NFS වැනි Linux පදනම් කරගත් සේවාදායකයන් 'open-source' (විවෘත මූලාශ්‍ර) විසඳුම් වන අතර, ඒවායේ ඇති නම්‍යශීලීභාවය සහ ආරක්ෂාව හේතුවෙන් බොහෝ දෙනා විසින් තෝරා ගනු ලැබේ.

Cloud (වලාකුළු) ගොනු සේවාදායකයන්: Google Drive, Dropbox සහ OneDrive වැනි සේවාවන් මගින් දුරස්ථව ගබඩා පහසුකම් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන අතර, අවශ්‍යතාවය අනුව ඒවායේ ධාරිතාව පහසුවෙන් පුළුල් (scalable) කර ගත හැකිය.

Network-Attached Storage (NAS): මෙය දේශීය ජාලයක් තුළ ගොනු හවුලේ භාවිතා කිරීම සඳහාම වෙන් වූ දෘඩාංග පද්ධතියකි.

පටි ගබඩා කිරීමේ හොඳම පිළිවෙල | Tape Store



• කෙළින් ගබඩා කරන්න: අභ්‍යන්තර පටි රීලය එල්ලා වැටීම වැළැක්වීම සඳහා කැසට් පට සිරස් අතට පොත් මෙන් තබන්න, ඒවා පැතලි ලෙස ගොඩගැසීම නොකළ යුතුය.

• දේශගුණය පාලනය කරන්න: සෘජු හිරු එළිය, හීටර් හෝ තෙත් බිම් මහල/අට්ටාල වලින් ඈත්ව ස්ථාවර, අඩු උෂ්ණත්වයක් සහ අඩු ආර්ද්‍රතාවයක් ඇති කාමරයක පටි තබා ගන්න.

• චුම්භක ක්ෂේත්‍ර වළක්වා ගන්න: පටිගත කරන ලද චුම්භක සංඥා පොරබැදීමට හෝ මකා දැමීමට හැකි ස්පීකර්, රූපවාහිනී, විදුලි මෝටර සහ අනෙකුත් ශක්තිමත් චුම්බක වලින් කැසට් පට බොහෝ දුරින් තබා ගන්න.



• නිසි බහාලුම් භාවිතා කරන්න: පටි ඒවායේ මුල් ආරක්ෂිත ප්ලාස්ටික් ආවරණ තුළ ගබඩා කර දුවිලි හා තෙතමනය අවහිර කිරීම සඳහා කාඩ්බෝඩ් පෙට්ටි වෙනුවට වාතය රහිත ප්ලාස්ටික් ගබඩා වල තබන්න.

• ගබඩා කිරීමට පෙර ආපසු කරකවන්න (rewind): චුම්භක පීත්ත පටියේ අසමාන ආතතිය අඩු කිරීම සඳහා වාදනය කිරීමෙන් පසු ඔබේ පටි සෑම විටම සම්පූර්ණයෙන්ම ආපසු කරකවන්න.

• සංරක්ෂණය සඳහා ඩිජිටල්කරණය කරන්න: කාලයත් සමඟ භෞතික හායනය වැළැක්වීම සඳහා ග්‍රහණ උපාංගයක් හෝ මාරු කිරීමේ සේවාවක් භාවිතයෙන් වයස්ගත චුම්භක පටි ඩිජිටල් ගොනු හෝ DVD/XDCAM බවට පරිවර්තනය කරන්න.

*තැටිවල ඇලවුම් ලේබල් හෝ ද්‍රාවක මත පදනම් වූ ස්ථිර සලකුණු භාවිතා නොකරන්න (දෘශ්‍ය තැටි සංරක්ෂණය කිරීම සඳහා විශේෂයෙන් සාදන ලද සලකුණු තිබේ).

නිදෙර්ශිත ගබඩා උෂ්ණත්වයන්

U-matic, Betacam සහ DVcam වීඩියෝ කැසට් සඳහා චුම්භක හායනය, විකෘති වීම සහ බන්ධක බිඳවැටීම වැළැක්වීම සඳහා සිසිල්, ස්ථාවර සහ වියළි පරිසරයන් අවශ්‍ය වේ.

• දිනපතා / ප්‍රවේශ ගබඩාව: 59°F සිට 77°F (15°C සිට 25°C දක්වා) (කාමර පරිසර තත්වයන්).

• දිගු කාලීන සංරක්ෂණය: දිගු ආයු කාලයක් සඳහා අඩු සාපේක්ෂ ආර්ද්‍රතාවය සමඟ 40°F සිට 54°F (4°C සිට 12°C දක්වා).

• සාපේක්ෂ ආර්ද්‍රතාවය (RH): ස්ථාවර 30% සිට 50% දක්වා RH පවත්වා ගන්න.

*සීතල ලේඛනාගාර ගබඩාවේ සිට උණුසුම් කාමරයකට ගෙන ගියහොත්, ඝනීභවනය වන හානිය වළක්වා ගැනීම සඳහා වාදනය කිරීමට පෙර කාමර උෂ්ණත්වයට හුරු වීමට ටේප් එක පැය 1 සිට 16 දක්වා ඉඩ දිය යුතුවේ

• අධික තාපය හා ආර්ද්‍රතාවය වෙනස්වීම ප්ලාස්ටික් බහාලුම විකෘති කරන සහ චුම්භක ආලේපනය පිරිහීමට ලක් කරන අට්ටාල, ගරාජ, බිම් මහල හෝ මෝටර් රථ තුල තැබීමෙන් වැළකිය යුතුය. ඒවා සෘජු හිරු එළියෙන් සහ ශක්තිමත් චුම්භක ක්ෂේත්‍රවලින් ඈත් කර තබන්න.

ළමා සාහිත්‍යය හා ලාංකේය ළමා සාහිත්‍යය

ආර්. ඒ. ඒ. නෙලුන් රණසිංහ

ගුරු පුස්තකාලයාධිපති

හිත්‍යය යනු මිනිස් ජීවිතයෙන් දුටු දේ ගැබ් වූ වැදගත් වාර්තාවකි. ඔවුන් ජීවිතයෙන් අත් දුටු දේ පිළිබඳව ඔවුන් සිතූ දේ සහ එහි නොයෙක් අංගයන්ගෙන් හදිසි හා චිරස්ථායි අවශ්‍යතාවයක් ඇති කරයි. සා සාහිත්‍යය මූලික වශයෙන් භාෂාව මාධ්‍ය කර ගෙන ජීවිතය ගැන කෙරෙන ප්‍රකාශනයක් බව ඩබ්ලියු.එම් හඩ්සන් නම් ලේඛකයාගේ අදහසයි.මහා සාහිත්‍යයෙහි කොටසක් වශයෙන් ළමා සාහිත්‍යය හඳුනා ගත හැකිය.ළමා සාහිත්‍යය යනු නාම සමාස පදයකි. ඉන් කරුණු දෙකක් අදහස් කරන්නකි.ඉන් පළමු වැන්න වැඩිහිටියන් විසින් ළමයින් සඳහා රචනා කරන ලද සාහිත්‍යය යන්නයි.ඉන් දෙවැන්න ළමයින් විසින් ළමයින් සඳහා ම රචනා කරනු ලබන සාහිත්‍යයයි. ඩබ්ලියු.ඒ.අබේසිංහගේ අදහසට අනුව ළමා සාහිත්‍යකරණය වනාහි අතිශයින් ම දුෂ්කර වුත් අසීරු වූත් ඒ නිසා ම සීරුවෙන් කළයුතු විශේෂමය සාහිත්‍යමය වූත් අධ්‍යාපනික වූත් කාර්යයක් බවයි. "ළමයින්ට ඉගැන්වීමට හෝ රසාස්වාදයක් ලබා දීම සඳහා නිෂ්පාදනය කර ඇති රූප සටහන් ආශ්‍රිතව ඉදිරිපත් කෙරෙන පද සමුදාය" ළමා සාහිත්‍යය බව බ්‍රිටනිකා විශ්ව කෝෂයෙහි සඳහන් වේ.ළමා සාහිත්‍යය පිළිබඳ අවධානය යොමු කිරීමේදී මුනිදාස කුමාරතුංග ශූරීන් අමතක කළ නොහැකිය. එතුමාගේ කවි රසයෙහි ළමා සාහිත්‍යය පිළිබඳ මෙලෙස සඳහන් වේ.

"දරුවන් හට මහත් තැනක් නැතිවම වැටහෙන ඔවුන්ගේ සිත් පුබුදුවන ඇඟ පත නිකම් නටවන යහළුවන් සමඟින් සසඳන්ට පොළඹවන උන් කියවනු ඇසූ වැඩිහිටියනුත් පහදවන විසිතුරු පබැඳුමකි එවයසට කිවියක් නම්"

ඉන් කියවෙන්නේ දරුවන්ට වැඩි උත්සාහයක් නොමැතිව වැටහෙන,ඒ අයගේ සිත් ප්‍රබෝධමත් කරන , ඉබේට අත් පා චලනයක් ඇති කරන,තමා කියවන ලද දෑ යහළුවන් සමඟින් සාකච්ඡා කිරීමට ඉබේටම පොළඹවන, ළමයින් කියවනු අසා දෙමාපියන්ට ද රසාස්වාදයක් ලබා දෙන විසිතුරු ප්‍රබන්ධයක් ළමා සාහිත්‍යය බව වශයෙනි.

1989 නොවැම්බර් මස 20වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තියෙහි "අදාළ නීති මගින් වැඩිහිටි බවට ගණන් ගැනීමේ වයස අඩු කර ඇති රටවල් හැර සෙසු රටවල වයස අවුරුදු 18 දක්වා වන සියලු ම පුද්ගලයන් ළමයා ලෙස නිර්වචනය කර ඇත."

මනෝ විද්‍යාඥයන් ළමයාගේ වර්ධනය අනුව මෙලෙස වයස් ප්‍රමාණයන් දක්වා ඇත.

අවුරුදු 02 සිට 05 දක්වා - ළඳරු සමය

අවුරුදු 03 සිට 07 දක්වා - මූලික පාසල් සමය

අවුරුදු 07 සිට 11 දක්වා - තර්ක හා තාත්වික වයස

අවුරුදු 11 සිට 15 දක්වා - ළමා අවධියේ ප්‍රබුද්ධ අවස්ථාව

අවුරුදු 15 සිට 18 දක්වා - නව යොවුන් වයස

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තියෙහි 28වන වගන්තියෙහි ළමුන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය ගැන සඳහන් වන්නේ මෙසේය."ළමයාගේ අධ්‍යාපනය යොමු කළ යුත්තේ ඔහුගේ හෝ ඇයගේ පෞරුෂ,දක්ෂතා,මානසික සහ ශාරීරික හැකියාවන් හැකි තරම් උපරිම මට්ටමට සංවර්ධනය කිරීම සඳහා බව පාර්ශවකරුවන් වන රාජ්‍යයන් එකඟ වේ වශයෙනි." මේ සියල්ල තුළින් ද ගම්‍ය වන්නේ ළමා සාහිත්‍යය සඳහා ළමයා යොමු කරවීමේ අවශ්‍යතාවයයි.

ළමා සාහිත්‍යය කෘති නිර්මාණය කිරීමේ අරමුණු කීපයකි. එනම් රස විඳීනය, භාෂා ඥානය ලැබීම, සෞන්දර්යය පිළිබඳ අවබෝධය හා සංවේදී බව, ජීවිතය හා ලෝකය පිළිබඳ කරුණු අවබෝධ කිරීම, බුද්ධි විකාශනය, චරිත සංවර්ධනය, පෞරුෂ වර්ධනය, යහපත් පුරවැසියෙකු වීමට මඟ පෙන්වීම සහ ළමයා නව නිර්මාණයන්හි පෙළඹවීම වශයෙනි. තවද රටක දේශීය සංස්කෘතිය හා සම්ප්‍රදායන් පරම්පරාවෙන් පරම්පරාවට පැවරීමට ද ළමා සාහිතයය උපකාරී වෙයි. ළමයාගේ පෞරුෂ වර්ධනයට අදාළ බුද්ධිමය,කායික,චිත්තවේගීය සමාජීය හා භාෂමය වර්ධනයට ළමා සාහිත්‍යය සෘජුව ම බලපායි.ළමා මනසට ගැළපෙන අන්දමින් සාහිත්‍යය නිර්මාණකරණයෙහි යෙදීමේදී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. එනම් ළමා කාලයේ වැදගත්කම,ළමයාගේ සිතීම් ඇති වන ආකාරයත් එහි ස්වභාවයත්,ළමයාගේ සිතීම හා භාෂාව අතර ඇති සම්බන්ධතාවය,ළමා සමාජීය ජීවිතය ඇති වන ආකාරයත් හා ළමා මනස සංවර්ධනය වන ආකාරය සහ අවධි පිළිබඳවත්ය. ළමා කෘති නිර්මාණකරණයේදී ළමයාට මුල් තැන දෙමින් එම නිර්මාණ සිදු කළ යුතු අතර ඔවුන් රුචිකත්වයක් දක්වන තේමාවන් ඔස්සේ එම නිර්මාණ සිදු කිරීමෙන් ඔවුන් ඒවා ඉක්මනින් වැළඳ ගනු ඇත.ඊට අමතරව ළමා කෘති නිර්මාණකරණයේදී ප්‍රමාණයෙන් විශාල අක්ෂර, සිත් ඇඳ ගන්නා හා උචිත පහසුවෙන් වටහා ගත හැකි චිත්‍ර, කනට මිහිරි සරල බස, පොතෙහි මනා නිමාව හා විනෝද රසය ජනිත වන ආකාරය ගැන ද අවධානය යොමු කිරීම වඩාත් උචිතය. තවද ළමා සාහිත්‍යයකරණයේදී ළමා මනස හඳුනා ගැනීම මෙන් ම ඒ ඒ වයස්වල ළමයින්ගේ මූලික ළැදිකම් වෙනස් වන අයුරු ගැන ද අවධානය යොමු කළ යුතු ය.මැක්ඩුගල් නම් මනෝ විද්‍යාඥයා සඳහන් කරන පරිදි වයස්වල මූලික ළැදිකම් අතර ආහාර ළැදිකම,භය ළැදිකම,මව්පිය ළැදිකම, සිනා ළැදිකම,කුතුහලය,ආයාචනය,ඉදිරිපත් වීම හා පසු බෑම,විවේකය හා රංචු ළැදිකම ඉන් කිහිපයකි.

ළමා සාහිත්‍යය ප්‍රභේද ගැන විමසා බැලීමේදී වැඩිහිටි ලේඛකයන් නොයෙක් ආකාරයේ පොත් රචනා කර ඇත. ළමයින් සඳහා රචනා වූ සමහර ගීත හා කවි අන්තර්ගත වන්නේ වැඩිහිටියන් සඳහා ලියවී ඇති පොත්වලය. ළමයින් සඳහා රචනා කර ඇති නිර්මාණ සියල්ල මූලික වශයෙන් කොටස් හතරකි. එනම් කතන්දර හෝ කතා පොත්, කවි හා ගීත පොත්, නාට්‍ය පොත් හා හෝඩි පොත් වශයෙනි. සිංහල ළමා සාහිත්‍යය මුලින් ම බිහි වන්නට පටන් ගත්තේ විසි වන සියවසේ ආරම්භයේදීය. එදා සිට මෑත කාලය

දක්වා ම සිංහල සාහිත්‍යය පෝෂණය කිරීමට වෙර දැරූ පූරෝගාමීන් හා ඔවුන්ගේ නිර්මාණ කිහිපයක් මෙලෙස සඳහන් කළ හැකිය

කුමාරතුංග මුනිදාස මහතා

මඟුල් කෑම

හත්පණ

හීන්සැරය

කුමාර ගී

ඇස් මහින්ද හිමි

ළමා කවි කළඹ

රාත්‍රිය

මගේ පොතේ අගේ

රෝස මල හා ළමයා

චන්ද්‍රරත්න මානවසිංහ මහතා

කෝමල රේඛා

ආනන්ද රාජකරුණා මහතා

ළමා කවි

වී.ඩී.ද ලැනරෝල් මහතා

පියසිරිගේ පාසැල් සමය

ළමා කවි මල් දම

මාර්ටින් වික්‍රමසිංහ මහතා

මඩොල් දූව

පී.බි.සේනානායක මහතා

මල් කුමාරි

අඹ කතාව

හාල් මැස්සා

හීනය

මහ ලෝභයා

රත් හඳුන් රූපය

ටී.බී.ඉලංගරත්න මහතා

අඹ යහළුවෝ

ශිෂ්‍යත්වය

අලුත් මල්ලී

පිස්සු ලුසී

නිමලාගේ උපන් දිනය

ටිකිරි සහ කුඩා

තාත්තා

ආචාර්ය දොන් පීටර් පියතුමා

ඩිංකි

වන ගත විත්ති

ගැට කපන කොල්ලා

විදුහලේ විත්ති

හොල්මන් දූපත

ටී.එස් ධර්ම බන්ධු

සතුටු ගී

පියදාස සිරිසේන මහතා

කුමාර කවි මල් දම

කේ.ජයතිලක මහතා

අයියයි නංගියි

පුංචි වලාකුළ සහ පුංචි පුතා

ඩුං ඩුං ඩුඩුං ඩුං

මොනිකා රුවන් පතිරණ

අතුරු මිතුරු

සිබිල් වෙත්තසිංහ මිය

කුඩ හොරා

වැනියං කළු වැනියං

සූත්තර පුංචා

එස්.මහින්ද හිමියන්ගේ "හොඳ ළමයා" පද්‍ය පන්තියෙන් උපුටා ගත් පහත පද්‍ය පන්තිය රස විඳ බලමු

සුපිපි මල් ගොමුවේ
මල් බඹරුන්ට පිය වේ
හොඳ ළමයා ලොවේ
හැමෝට ම ඒ වගේ පිය වේ

පොත පතට හිත දෙන
දෙගුරුන් බසට හික්මෙන
හොඳ ළමයා වසන
ගෙදර සුර විමනක්ය බබළන

මුනිදාස කුමාරතුංගයන් රචිත "සිරිමත්" පද්‍ය පන්තියෙන් උපුටා ගත් පහත කවි පන්තිය රස විඳ බලමු

උදය ම පුබුදී
මුහුණට දියදී
කුල දෙවි නමදී
ගේ දොර අමදී

පාඩම් කරනට
පත පොත ගෙන සිට
සිත වෙන දෙයකට
නොහරී කිසි විට



ජාතක කතා සාහිත්‍යය ද ළමා සාහිත්‍යය සුපෝෂණය කිරීම සඳහා බෙහෙවින් සමත් වී ඇත. පුද්ගලයෙකුගේ අධ්‍යාත්මික ගුණ වගාව ඇති කිරීමේ අරමුණින් රචිත ජාතක කතා සිංහල ළමා කෘති බිහි වීමත් සමඟ ම ටී.එස් ධර්ම බන්ධු හා වී.ඩී.ද ලැනරෝල් ආදීන් ජාතක කතා ළමා සාහිත්‍යය කෘති සඳහා ඇතුළත් කිරීමට පුරෝගාමී විය.ළමයා තුළ පරිත්‍යාගය,කරුණාව, අවංකවම,මානව දයාව, මෛත්‍රිය යනාදී ගුණ ධර්ම ජාතක කතාවල සමන්විත වන හෙයින් ඒවා ළමා සාහිත්‍යයට අන්තර්ගත කිරීම තුළින් ළමයා තුළ කායික හා මානසික පෙරළියක් ජනිත කළ හැකිය.

වර්තමානය වන විට ළමා සාහිත්‍යය විවිධ සමාජීය, තාක්ෂණික හා ආර්ථික බලපෑම් හේතුවෙන් අභියෝග රැසකට මුහුණ දෙයි. ස්මාර්ට් ෆෝන්,පරිගණක යන උපාංගයන්හි භාවිතය හේතුවෙන් ඒවායෙහි ක්‍රීඩා හා වීඩියෝවලට අධික ව යොමු වීම නිසා ළමයින් තුළ කියවීමේ රුචිකත්වය අඩු වෙමින් පවතියි. ගුණාත්මක ළමා සාහිත්‍යය කෘති හිඟ වීමත් පොත් මුද්‍රණ වියදම් සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ළමා පොත්වල මිල ඉහළ අගයක් ගැනීම ළමා සාහිත්‍යයට එල්ල වී ඇති අභියෝගයන් ය.

ළමා සාහිත්‍යය වනාහි ළමයින්ගේ බුද්ධිමය, මනෝවිකාසික හා සමාජීය සංවර්ධනය සඳහා වැදගත් වන විශේෂිත අංගයකි.ළමා සාහිත්‍යයට එල්ල වී ඇති අභියෝග සාර්ථක ව කළමනාකරණය කිරීම ඉතා වැදගත්ය.ඩිජිටල් තාක්ෂණය සමඟ සමබරව සාහිත්‍යය භාවිතා කිරීම,ගුණාත්මක කෘති නිර්මාණය කිරීම සහ ළමුන් තුළ කුඩා අවධියේදී ම කියවීමේ පුරුද්ද ඇති කිරීමෙන් එම අභියෝග ජය ගත හැකිය.

සමස්තයක් වශයෙන් ගත් කල්හි ළමා සාහිත්‍යය වනාහි ළමයින්ගේ සම්පූර්ණ සංවර්ධනයට අත්‍යවශ්‍ය හා අගනා සාහිත්‍යය ක්ෂේත්‍රයකි.

ආශ්‍රිත ග්‍රන්ථ

අබේසිංහ,ඩබ්ලියු.ඒ.(2003) ළමා සාහිත්‍යයට පෙරවදනක් .කොළඹ: ගොඩගේ

අත්තනායක,මුතු බණ්ඩා .(2017) සාහිත්‍යය හා ළමා සාහිත්‍යය.කොළඹ: ගොඩගේ

අතුකෝරාළ,දයාරෝහණ.(2018) 'ධනාත්මක ළමා පරපුරක් බිහි කිරීම උදෙසා ළමා සාහිත්‍යය සතු භූමිකාව',ප්‍රලේඛා,8(4),08-13

දිසානායක,ජේ.බී.(2018) 'සිංහල ළමා සාහිත්‍යය හා එහි පුරෝගාමියෝ',ප්‍රලේඛා,8(4),03-08

කාරියවසම්, තිලෝක සුන්දරී.(2011) ළමා සාහිත්‍යය.කොළඹ: විජේසූරිය

යුනිසෙෆ් ආයතනය, (1989 නොවැම්බර් 20) : ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තිය

වික්‍රමසිංහ,මාර්ටින්.(2015) අපේ ළමා සාහිත්‍යය.රාජගිරිය : සරස

සජීවනී,කුසලා.(2018) 'ලෝක ළමා සාහිත්‍යය හා ලාංකේය ළමා සාහිත්‍යය',ප්‍රලේඛා,8(4),30-41

පුස්තකාලය සහ තරුණ පරපුර

ඩී. එල්. ඒ. නදීකා

වරලත් පුස්තකාලයාධිපති

හෙද විදුහල - ගාල්ල

පුස්තකාලයක් යනු විවිධ වූ දැනුම් මාධ්‍ය ආනාගත සමාජයේ තොරතුරු අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා සංරක්ෂණය කර තබා ගන්නා ස්ථානයකි. සරල ලෙස දක්වතොත්, පුස්තකාලය යනු පොත්පත්, සඟරා, අණ පනත්, ගැසට්, ඩිජිටල් මාධ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය දෑ සහ වෙනත් තොරතුරු මූලාශ්‍ර ක්‍රමානුකූලව එකතු කර, නිසිලෙස ගබඩාකර, ආරක්ෂාකර තබා ගනිමින් පාඨකයාට අවශ්‍ය අවස්ථාවේ කියවීමට සහ අධ්‍යයනය කිරීමට ලබා දෙනු ලබන ආයතනයකි.

පුස්තාලය පිළිබඳ විවිධ නිර්වචන සහ අර්ථ කථන

මළලසේකර ශබ්දකෝෂය - එක් රැස් කර තබා ඇති පොත් කියවනු ලබන ස්ථානය / ගොඩනැගිල්ල පුස්තකාලය නම් වේ. නැතහොත් පොත් සහ ලේඛන ගබඩා කර ඇති ස්ථානය / ගොඩනැගිල්ල පොත්ගුල නම් වේ.

Oxford Dictionary - පුස්තකාලයක් යනු මිනිසුන්ට කියවීමට, අධ්‍යයනය කිරීමට, හෝ ණයට ගැනීමට හැකිවන පරිදි පොත්, පුවත්පත්, චිත්‍රපට සහ පටිගත කළ සංගීතය වැනි දේවල එකතුවක් තබා ගන්නා ගොඩනැගිල්ල හෝ කාමරයකි.

මෙලෙස බලන විට පුස්තකාලයක් යන්න ශබ්දකෝෂ අර්ථය ලෙස ‘‘ පොත් සහ වෙනත් ලේඛන එකතු කර තබා ඇති ස්ථානය’’ ලෙස දැක්විය හැකිය.

පුස්තකාලය පිළිබඳව විද්වත් වෘත්තිකයන් දැක් වූ නිර්වචන

‘‘සමාන ශිෂ්ටාචාරයේ ජීව රුධිරය නම් විශ්ව ඥානයයි. එම රුධිරය ජනතාව කරා අඛන්ඩව ලබා දෙන ප්‍රධානම ආයතනය වනනේ පුස්තකාලයයි" - ජී. එච්. පේරා

"ස්වයං අධ්‍යාපනය සඳහා තිබෙන ක්ෂේම භූමිය පුස්තකාලයයි" - එස්. ආර්. රංගනාදන්

" පුස්තකාල වැඩියෙන් ආරම්භ කිරීම බන්ධනාගාර, පොලිස් ස්ථාන උපාධි ක්‍රමිකව වසා දැමීමකි." - ආචාර්ය එස්. කේ. ෂර්මා

පුස්තකාලය යන්න පුස්තකාල විද්‍යාත්මක අර්ථකථනය අනුව හැඳින්වුව හොත් ‘‘ පුස්තකාලය යනු නිරන්තරයෙන් වැඩෙන සහ වෙනස් වන සජීවී ආයතනයක්’’ ලෙස පුස්තකාලය හඳුන්වා දිය හැකිය.

පුස්තකාලය යන්න සාමාන්‍ය අර්ථ කථනය අනුව හැඳින්වුව හොත් "මානව දැනුම ගබඩා කර තිබෙන මහා ධාන්‍යාගාරය’’ ලෙස හඳුන්වාදිය හැකිය. එය ජාතික පුස්තකාලයට ආදේශ කළහොත් දැයේ ඥාන කෝෂ්ඨාගාරය ලෙසද හඳුන්වා දිය හැකිය. එනම් රටක ප්‍රකාශිත සියලු ප්‍රකාශන සහ එම රටේ විදේශගත විද්වතුන් විසින් තම උපන් රට මූලික කර ගෙන කරනු ලබන ප්‍රකාශන සියල්ලෙහිම එකතුව යනු ජාතියට සම්පතකි. එම සම්පත සුරකින ස්ථානය ජාතික පුස්තකාලය වේ.

පුස්තකාලය යනු '' දැනුම පමණක් නොව සංවේදනය ද පෝෂණය කරන ස්ථානයක්, පොත් මැදින් හදවත් හැදෙන තැනක්'' ලෙස හඳුන්වා දිය හැකිය. සන්නිවේදනයේ රසාස්වාදයේ තෝතැන්නක් ලෙස පුස්තකාලය ඇසුරෙන් ජීවිතය ගොඩ නංවාගත් ස්වයං චරිත ගවේෂණය කිරීම තුල වටහා ගත හැකි වේ.

පුස්තකාලයක පුධාන අරමුණු

- දැනුම රැස් කිරීම සහ සංරක්ෂණය කිරීම
- තොරතුරු පහසුවෙන් සොයා ගැනීමට මඟ පෙන්වීම
- කියවීමේ පුරුද්ද වර්ධනය කිරීම
- අධ්‍යාපනයට සහ පර්යේෂණවලට සහාය වීම

ඉහත සඳහන් අරමුණු ප්‍රධාන කර ගනිමින් ඇරඹී පුස්තකාලය නම් ආයතනය ක්‍රම ක්‍රමයෙන් දැනුම බෙදා හැරීමේ ප්‍රමුඛස්ථානය බවට පත් විය. විශ්වයේ ඥාන කෝෂ්ඨාගාරය වන පුස්තකාලය වර්තමාන මිනිසා ගල් යුගයේ සිට පරිගණක යුගය දක්වා පැමිණීමේ දී මිනිසුන් පිරිපුන් මිනිසුන් බවට පත් කර ලීමට පුස්තකාලය විශේෂ මූලිකත්වයක් ගෙන ක්‍රියා කර ඇත. එහි දී තොරතුරු ජනතාව කරා ගෙන යාමේ මූලික කාර්යභාරය ඉටු කරලීම සඳහා වගකීම පැවරී ඇත්තේ පුස්තකාල සේවාවටය. දැනුම ප්‍රතිග්‍රහණය, සංවිධානය සහ බෙදා හැරීමේ මුඛ්‍ය පරමාර්ථය පෙර දැරිව පිරිපුන් මිනිසුන් බිහිකරලීම සඳහා රටට දැයට විශාල මොහවර දායකත්වයක් පුස්තකාලයක් මඟින් ලබා දේ.

මිනිසාගේ පස්වන (5) මූලික මිනිස් අවශ්‍යතාවය තොරතුරු බවට පත්ව ඇති වර්තමාන යුගය තුල මානවයාගේ විවිධ වූ අවශ්‍යතා සංතර්පණය කිරීම සඳහා දැනුම් කෝෂ්ඨාගාරය හෙවත් පුස්තකාලය විවිධ වූ වර්ග වලට බෙදා වෙන් කර අවශ්‍යතාවයට සරිලන පරිදි සේවා සපයා ගැනීමට පහසුකම් සලසා ඇත.

එනම්,

* ජාතික පුස්තකාල
* විශේෂ පුස්තකාල
* මහජන පුස්තකාල
* පෞද්ගලික පුස්තකාල
* අධ්‍යාපනික පුස්තකාල (පාසැල් / විශ්වවිද්‍යාල)
* අතථ්‍ය පුස්තකාල , ලෙස වර්ග කර දැක්විය හැකිය.

එක් එක් යුගයන් තුල එනම්, ළමා වයසේ සිට මහළුවිය දක්වාම මිනිසාට භාවිතා කළ හැකි ලෙස පුස්තකාල ඉහත ලෙස වර්ගීකරණය වුව ද සැමට කිසිදු වයස් සීමාවකින් හෝ ඉගෙනුම් සීමාවකින් තොරව භාවිතා කළ හැකි පුස්තකාල ලෙස ජාතික පුස්තකාල, මහජන පුස්තකාල, අතථ්‍ය පුස්තකාල හඳුන්වා දිය හැකිය.

අධ්‍යාපනික පුස්තකාල ඒ ඒ වයස් සීමාවන් තුල පාසැල් සහ විශ්වවිද්‍යාල පුස්තකාල ලෙස ද විෂය විශේෂඥ ඥානය සහිත විද්වතුන්, වෘත්තිකයන් සහ අදාල ආයතන විශේෂිත කොට පර්යේෂකයන් සඳහා විෂයට අදාල විශේෂ පුස්තකාල ද, තම පෞද්ගලික එකතූන් රැගත් පුස්තකාල පුද්ගලික පුස්තකාල ලෙස ද තමන්ට භාවිතයේ කාල පරාසය අනුව පුස්තකාල වර්ග කර දැක්විය හැකිය.

තාක්ෂණය හා මාධ්‍ය අනුව විශේෂිත පුස්තකාල වර්ග

වර්තමාන තාක්ෂණික දියුණුවත් සමඟ පුස්තකාල පොත් වලට පමණක් සීමා නොවේ. පුස්තකාල විවිධ අයුරින් වර්ගීකරණය වේ.

- සංඛ්‍යාංක පුස්තකාල (Digital / Electronic libraries)

භෞතිකව පොත් නොමැතිව, අන්තර්ජාලය හරහා පරිගණක හෝ ස්මාර්ට් ජංගම දුරකතන භාවිතයෙන් කියවිය හැකි ඊ -පොත් (E –books) සහ දත්ත සමුදායන්ගෙන් සමන්විත පුස්තකාලයි.

- දෙමුහුන් පුස්තකාල (Hybrid Libraries)

සාමාන්‍ය මුද්‍රිත පොත්පත් මෙන්ම ඩිජිටල් තොරතුරු මූලාශ්‍ර (E – resources) යන දෙකම එක හා සමානව පරිශීලනය කළ හැකි නවීන පුස්තකාල වේ.

- ජංගම පුස්තකාල (Mobile libraries)

පුස්තකාල පහසුකම් නොමැති දුර බැහැර ගම්මාන හෝ පාසැල් වාහනයක් ආධාරයෙන් පොත් රැගෙන ගොස් කියවීමේ අවස්ථා සලසන ක්‍රමයකි.

- බ්‍රේල් සහ ශ්‍රව්‍ය පුස්තකාල (Audio & Braille Libraries)

පෙනීම ආබාධිත තැනැත්තන් වෙනුවෙන් විශේෂයෙන් සකසන ලද බ්‍රේල් පොත් සහ ශ්‍රව්‍ය (අසන්නට ලැබෙන) පොත් අඩංගු පුස්තකාලයයි.

පුස්තකාලය පුද්ගල සංවර්ධනය හා පෞරුෂ වර්ධනය උදෙසා විශාල මෙහෙවරකට දායක වේ. එනම්, රස වින්දනය සහ නිර්මාණාත්මක කුසලතා නැංවීම, දැනුම හා තොරතුරු ප්‍රචාරණය තුළින් නව දැනුම හා තිබෙන්නා වූ දැනුම යාවත්කාලීන කිරීම සිදු කරයි.

මෙහි දී මා විශේෂයෙන් අවධානය යොමු කරන කොටස වන තරුණ පරපුර ඉහත සියලු පුස්තකාල වර්ගවල කොටස්කරුවන් ලෙස දැකගත හැකි වේ.

තරුණ පරපුර

එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) මඟින් තරුණ පරපුර යන්න මෙලෙස නිර්වචනය කර ඇත. වයස අවු. 15ත් - අවු. 24ත් අතර පසුවන්නන් ‘‘තරුණයින්’’ ලෙස අර්ථ දක්වන අතර, විවිධ රටවල සංස්කෘතික සහ නීතිමය රාමු අනුව මෙම වයස් සීමාවන් වෙනස් විය හැකිය.

තරුණ පරපුර යනු ළමා විය සහ වැඩිහිටි විය අතර පසුවන, රටක හෝ සමාජයක වඩාත්ම ක්‍රියාශීලී, ජවසම්පන්න සහ නිර්මාණශීලී මානව සම්පතයි.

තරුණ පරපුරේ ප්‍රධාන ලක්ෂණ

* තාක්ෂණික දැනුම:- නවීන තාක්ෂණය, අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය පිළිබඳව ඉහළ උනන්දුවක් සහ කුසලතාවක් දැක්වීම.

* නවෝත්පාදනය හා නිර්මාණශීලීත්වය:- සාම්ප්‍රදායික රාමුවෙන් මිදී අලුත් දේ සිතීමට සහ අභියෝග භාර ගැනීමට ඇති කැමැත්ත.

* සමාජීය පරිවර්තනය:- සමාජ සාධාරණත්වය, දේශගුණික විපර්යාස සහ මානව හිමිකම් වැනි ගෝලීය කරුණු සම්බන්ධයෙන් හඬක් නැඟීම.

* ගතික බව සහ ජවය:- ඕනෑම කාර්යයකදී වේගයෙන් ප්‍රතිචාර දැක්වීමට සහ කායික මෙන්ම මානසික ශ්‍රමය උපරිමයෙන් යෙදවීමට ඇති හැකියාව.

තරුණ පරපුරට පුස්තකාලයක ඇති වැදගත්කම

* නිදහස් ඉගෙනුම් අවකාශය:- විභාග කටයුතුවලට සහ පර්යේෂණවලට අවශ්‍ය නිස්කලංක පරිසරයක් ලැබීම.

* ඩිජිටල් පහසුකම්:- අන්තර්ජාලය සහ ඊ-පොත් (E-books) හරහා නව දැනුම සොයා යාමට හැකිවීම.

* ස්වයං සංවර්ධනය:- නායකත්ව පුහුණු, සාකච්ඡා සහ විවිධ පොත් සංවාද හරහා කුසලතා වර්ධනය කරගැනීම.

* මනස සුවපත් කිරීම:- අතිරික්ත තිර කාලයෙන් (Screen time) මිදී සන්සුන්ව කියැවීමට හුරුවීම.

වර්තමාන වේගවත් සහ තාක්ෂණික ලෝකය තුළ තරුණ පරපුර පුස්තකාලවලින් ඈත්වීමට පහත සඳහන් හේතු බලපා ඇත.

තරුණ පරපුර පුස්තකාලයෙන් ඈත් වීමට බලපා ඇති හේතු

නවීන තරුණයා පුස්තකාලයෙන් ඈත් වීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ ඩිජිටල් තාක්ෂණයේ සහ අන්තර්ජාලයේ වේගවත් වර්ධනයයි. අද වන විට ගූගල් (Google) වැනි සෙවුම් යන්ත්‍ර සහ සමාජ මාධ්‍ය (TikTok, Instagram) හරහා ඕනෑම තොරතුරක් ක්ෂණිකව ස්මාර්ට් ජංගම දුරකථනයට ලබා ගැනීමේ පහසුකම පවතී. මීට අමතරව, බොහෝ සාම්ප්‍රදායික පුස්තකාලවල පවතින යල් පැන ගිය පොත් එකතුව, අන්තර්ජාල (Wi-Fi) පහසුකම් නොමැතිකම, සහ දැඩි නීතිරීති සහිත අඳුරු, නිශ්ශබ්ද වටපිටාව නව පරපුරේ රුචිකත්වයට ගැළපෙන්නේ නැත. එසේම, වර්තමාන තරහකාරී අධ්‍යාපන රටාව සහ උපකාරක පන්ති සංස්කෘතිය නිසා තරුණයින්ට විවේකීව පොතක් කියවීමට ඇති කාලය ද සීමා වී ඇත. මේ හේතු නිසාවෙන් වර්තමාන තරුණ පරපුර පුස්තකාලයෙන් ඈත් වී ඇත.

පුස්තකාලය සහ තරුණ පරපුර අතර බැඳියාව රෝපණය කිරීම

පුස්තකාලයක් යනු හුදෙක් පොත්පත් තැන්පත් කර ඇති නිශ්ශබ්ද ගොඩනැඟිල්ලක් පමණක් නොවේ. එය මානව ශිෂ්ටාචාරයේ දැනුම, සංස්කෘතිය සහ ඉතිහාසය අනාගත පරපුර උදෙසා සුරක්ෂිත කර තබන ජීවමාන කේන්ද්‍රස්ථානයකි. ඕනෑම රටක ප්‍රධානතම සහ ජවසම්පන්න මානව සම්පත වන්නේ තරුණ පරපුරයි. රටක අනාගත නායකත්වය, නවෝත්පාදනය සහ ආර්ථික ස්ථාවරත්වය තීරණය වන්නේ තරුණ ප්‍රජාව සතු බුද්ධිමය මට්ටම මතය. කෙසේ වුවද, වර්තමාන වේගවත් සමාජ වටපිටාව තුළ තරුණ පරපුර

සහ සාම්ප්‍රදායික පුස්තකාලය අතර යම් දුරස්ථභාවයක් නිර්මාණය වී ඇති බව පෙනෙන්නට තිබේ. මෙම හිඩැස පියවා, තරුණයා සහ පුස්තකාලය අතර නව බැඳියාවක් රෝපණය කිරීම වර්තමානයේ අත්‍යවශ්‍යය සමාජීය අවශ්‍යතාවයකි.

පුස්තකාලය සහ තරුණ පරපුර අතර බැඳියාව රෝපණය කිරීමේ ප්‍රායෝගික උපායමාර්ග

තරුණ පරපුර නැවත පුස්තකාලය වෙත ළං කර ගැනීමට නම්, පුස්තකාලය යනු "පොත් ගබඩාවක්" නොව "සජීවී ප්‍රජා මධ්‍යස්ථානයක්" (Living Community Hub) බවට පරිවර්තනය කළ යුතුය. ඒ සඳහා පහත පියවර ගත හැකිය:

1. අවකාශීය සහ සංස්කෘතික වෙනස්කම්

පුස්තකාල තුළ පවතින දැඩි නිශ්ශබ්ද නීති ලිහිල් කර, මිතුරන් සමඟ එකතු වී අදහස් හුවමාරු කරගත හැකි සම-අධ්‍යයන අවකාශ (Co-working/Group Study Spaces) නිර්මාණය කළ යුතුය. සුවපහසු අසුන් සහ කෝපි කෝප්පයක් රසවිඳිමින් පාඩම් කළ හැකි "පුස්තකාල කැෆේ" (Library Cafe) සංකල්පය හඳුන්වා දීමෙන් තරුණයින්ට එය ආකර්ෂණීය ස්ථානයක් වනු ඇත.

2. තාක්ෂණය සමඟ මුසු කිරීම

සාම්ප්‍රදායික මුද්‍රිත පොත්වලට අමතරව ඊ-පොත් (E-books), විද්‍යුත් සඟරා සහ ශ්‍රව්‍ය පොත් (Audiobooks) පරිශීලනයට අවස්ථාව දිය යුතුය. පුස්තකාල සාමාජිකත්වය සහ පොත් වෙන්කිරීම් ජංගම යෙදවුමක් (Mobile App) හරහා සිදු කිරීමට සැලැස්වීමෙන් තරුණයින්ට පුස්තකාලය වඩාත් සමීප වේ.

3. තරුණයින් "කොටස්කරුවන්" කිරීම

තරුණයින් පුස්තකාලයේ පාරිභෝගිකයින් පමණක් නොකර, පුස්තකාල කටයුතු තීරණය කරන "තරුණ උපදේශක කමිටු" පත් කළ යුතුය. පුස්තකාලයේ ඩිජිටල්කරණ කටයුතු සහ සමාජ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා තරුණ ස්වේච්ඡා බලකායන් (Youth Volunteers) සම්බන්ධ කර ගැනීමෙන් ඔවුන් තුළ පුස්තකාලය පිළිබඳව ලෙන්ගතුකමක් සහ අයිතිවාසිකමක් ගොඩනැඟිය හැකිය.

4. ජීවන කුසලතා සහ ව්‍යවසායකත්ව කේන්ද්‍රස්ථානයක් කිරීම

විෂය කරුණුවලට පමණක් සීමා නොවී, රැකියා වෙළඳපොළ ජය ගැනීමට අවශ්‍ය CV එකක් සකසන ආකාරය, කෘත්‍රිම බුද්ධිය (AI Tools) භාවිතය, හෝ නව ව්‍යාපාර ඇරඹීම (Entrepreneurship) වැනි ප්‍රායෝගික වැඩමුළු පුස්තකාලය තුළ නොමිලේ පැවැත්විය යුතුය.

5. පොත් කියවීම ජනප්‍රිය රැල්ලක් (Trend)කිරීම

තරුණයින් ප්‍රිය කරන චිත්‍රකතා (Manga/Comics) සහ ජනප්‍රිය විදේශීය නවකතා පුස්කාලයට එක් කළ යුතුය. සමාජ මාධ්‍ය භාවිත කරමින් "කියවීමේ අභියෝග" (Reading Challenges) සංවිධානය කිරීම සහ තරුණ ලේඛකයින්/කලාකරුවන් සමඟ සජීවී කථාබහ පැවැත්වීම මඟින් කියවීම යනු ආඩම්බරකාරී රැල්ලක් බවට පත් කළ හැකිය.

පුස්තාලය හා තරුණයා අතර බැඳියාව රෝපණය කිරීම සඳහා ලෝකයේ පුස්තකාල ඉහත පියවර අනුගමනය කරමින් සාර්ථක වී ඇත.

ගෝලීය ආදර්ශ

ලෝකයේ දියුණු රටවල් මේ වන විටත් මෙම වෙනස සිදු කර ඇත. ෆින්ලන්තයේ 'Oodi' මධ්‍යම පුස්තකාලය තුළ තරුණයින්ට පොත්වලට අමතරව 3D ප්‍රින්ටර්ස්, සංගීත පටිගත කිරීමේ ස්ටූඩියෝ සහ සිනමා ශාලා නොමිලේ ලබා දී ඇත. සිංගප්පූරුවේ 'Library@Orchard' පුස්කාලය සාප්පු සංකීර්ණයක් ඇතුළත තරුණ විලාසිතා සහ සැලසුම්කරණය ඉලක්ක කර ඉතාමත් ආකර්ෂණීය ලෙස නිර්මාණය කර ඇත. ලංකාව වැනි රටක ද පවතින මහජන පුස්තකාල පෞද්ගලික අංශයේ දායකත්වය (CSR ව්‍යාපෘති) මත මෙලෙස නවීකරණය කළ හැකිය.

නිගමනය

ඩිජිටල් යුගයේ පුස්තකාලය සහ තරුණ පරපුර අතර පවතින දුරස්ථභාවය පියවා ගැනීම සඳහා, සාම්ප්‍රදායික පුස්තකාල නිහඬ පොත් ගබඩාවලින් මිදී ස්මාර්ට් තාක්ෂණයෙන් සන්නද්ධ "සජීවී ප්‍රජා මධ්‍යස්ථාන" (Living Community Hubs) ලෙස පරිවර්තනය විය යුතුය. තරුණයින් සඳහා Co-working අවකාශ, ඊ-පුස්තකාල සේවා, කුසලතා සංවර්ධන වැඩමුළු සහ සමාජ මාධ්‍ය හරහා පොත් කියවීම ජනප්‍රිය කිරීම මඟින් මෙම සජීවී බැඳීම ඇති කළ හැකිය.

පුස්තකාලය සහ තරුණ පරපුර අතර බැඳියාව රෝපණය කිරීම යනු හුදෙක් අකුරු කියවීමට සැලැස්වීමක් නොව, හෙට දවසේ බුද්ධිමත්, නිර්මාණශීලී සහ ගුණගරුක මානව සමාජයක් නිර්මාණය කිරීමේ මූලික පියවරයි. තාක්ෂණය දෙසට පමණක් දැස් යොමා සිටින තරුණයාගේ හදවතට සහ බුද්ධියට ආමන්ත්‍රණය කළ හැකි පරිදි පුස්තකාල පද්ධතිය වෙනස් කළ හොත්, එය රටේ නොමියෙන ඥාන ප්‍රදීපය බවට පත්වනු නොඅනුමානය.



සේයාරුව AI නිර්මාණයකි.

උගුරේ කෙසෙල් ගෙඩි කැල්ලක් හිර වී හුස්ම හිරවීම

Dr. Asela K. Dissanayake,
Consultant and Regional Director of Health Services (RDHS) Kilinochchi.
Dr W.A. Deepthi Kumari Jayawardane (Wijayanayake),
GP Specialty Trainee, Pembrokeshire, Wales, UK.
Mrs. Dilhani Munasinghe
Senior Assistant Librarian, Postgraduate Institute of Medicine, UoC

එදා ඉරිදාවක්. හොඳින් ඉර පායලා තිබුණා. දහම් පාසලේ විවේකයේ දී, පුංචි සුමුදුත් එයාගේ පන්තියේ ළමයි එක්ක ඉඳගත්තේ යාලුවෝ එක්ක එකතු වෙලා කෑම බෙදාගෙන කන්න. හැමෝම හිනාවෙලා කෑම කනවා. එක පාරටම සුමුදුගෙ මුහුණ රතු වුණා. ඇය බියෙන් දෑස් විසල් කරගෙන උගුර අල්ලා ගත්තා. ඇයට කතා කිරීමට හෝ හුස්ම ගැනීමට නොහැකි වුණා.

උගුර පෙන්වමින් මුහුණ රතු ව බිරාන්ත වී දහලන සුමුදුව දුටු මාධවී ගුරුතුමිය දරුවාගේ අසාමාන්‍ය හැසිරීම දැක කඩිනමින් ඇය ළඟට දිව ගියා. ඇයට අතීතයේ හිතේ තැන්පත්ව තිබූ තමන් කිළිපොලා ගිය ඉතා වැදගත් සිදුවීමක් සිහිපත් වුණා. එනම් ඇයට සිය ළමා කාලයේ ලබාගත් ප්‍රථමාධාර පාඩම පිළිබඳව ක්ෂණිකව ආවර්ජණය කිරීමයි.

ඇගේ අත්තම්මා එක දවසක් කෑම උගුරේ හිර වී දහලමින් සිටිය දී මාමා ඉක්මනින් ක්‍රියාත්මක වී අත්තම්මාව බේරා ගත් ආකාරය ඇගේ මතකයට ආවා.

තම මාමා ඉතා සන්සුන්ව අත්තම්මා මාමාගේ ඉදිරියට හේත්තු කර ගනිමින් ඇගේ පිටට තදින් තට්ටු කළ අයුරු ඇයට සිහිපත් විය. එය සාර්ථක නොවූ විට, මාමා අත්තම්මාගේ ඉණ වටා දැත් ඔතා අත් මිටි මොලවමින් වේගවත්, ශක්තිමත් චලනයකින් අත්තම්මාගේ උදරය තෙරපීමයි. අන්තිමේ දී අත්තම්මාගේ උගුරේ හිර වී තිබූ කෑම එළියට ආවා. අත්තම්මාට නැවත හුස්ම ගන්න පුළුවන් වුණා.

මේ මතකය ගැන සිතමින් මාධවී ගුරුතුමිය ඇය තම මාමා මෙන් ම කලබල නොවී සුමුදු වෙත දිව ගොස් ඇයව මදක් ඉදිරියට නමා ඇගේ පිටට තදින් තට්ටු කළා. සුමුදුට තවමත් හුස්ම ගැනීමට නොහැකි බව අවබෝධ කර ගත්, මාධවී ගුරුතුමිය ඇය පිටුපස දණ ගසා, සුමුදුගේ ඉන වටා දැත් ඔතා, වසර ගණනාවකට පෙර ඇගේ මාමා කළාක් මෙන් ම, **හයිම්ලිච් ක්‍රමය** සිදු කළා. එසේ කරද්දීම එක පාරටම සුමුදුගෙ කටින් කෙසෙල් ගෙඩියක කැල්ලක් බිමට වැටුණි. ඇය මදක් කහිමින් හුස්ම ගන්නට පටන් ගත් අතර නැවතත් කහිමින් හොඳින් හුස්ම ගනිමින් සන්සුන් වුණා. මාධවී ගුරුතුමිය දෙස බලා සිටි සුමුදුගේ දෙනෙතින් සැනසුම් කඳුළු බේරුණා. මෙතෙක් වේලා බිරාන්තව සිටි පන්තියේ යාළුවෝ සතුටින් අත්පුඩි ගැසූ අතර මාධවී ගුරුතුමිය සුමුදුට නැවත පිටට සෙමෙන් තට්ටුවක් දැම්මේ දැන් ඔක්කොම හරි කියන්නාක් මෙනි.

සියලු දරුවන් සන්සුන් වූ පසු මාධවී ගුරුතුමිය සිදු වූ දේ දරුවන්ට හා වට වී බිරාන්ත වී බලා සිටින අයට කිව්වේ "මම ඔයාලගේ වයසේ දී, මගේ අත්තම්මා කෑම උගුරේ හිරවෙලා දහලනකොට මගේ මාමා අත්තම්මාව හුස්ම හිරවීමෙන් බේරා ගන්නවා දැක්කා. එදා මාමා කරපු දේ මට කවදාවත් අමතක වුණේ නැහැ, මම ප්‍රථමාධාර ඉගෙන ගත්ත නිසා මටත් අනිත් අයට උදව් කරන්න පුළුවන් වුණා. අද ඒක නිසා මට සුමුදුවත් බේරගන්න හැකි වුණා."

හදිසි අවස්ථාවක දී "ප්‍රථමාධාර ඉතා වැදගත් වන බවත්, හදිසි අවස්ථා අපට ඕනෑම වේලාවක සිදුවිය හැකි බවත් කළ යුතු දේ නිවැරදිව දැන සිටියොත් ජීවිත බේරා ගත හැකි වන බවත් ගුරුතුමී දරුවන්ට පැහැදිලි කළාය. සමහරවිට දවසක ඔබත් ප්‍රථමාධාර ඉගෙන ගනීවි, මම ජීවිත බේර ගන්නට ප්‍රථමාධාර ඉගෙන

ගත්තා වගේ ඔබත් ප්‍රථමාධාර ඉගෙන ගත්තොත් ඔබේ ජීවිතය සුරක්ෂිත කර ගන්නා සේම,ඔබට තවත් කෙනෙකුට උදව් කරන්න පුළුවන් වේවි.” ඇය තව දුරටත් කියා සිටියා.

එදා ඉඳන් ළමයි බොහෝ දෙනෙක් තම දෙමාපියන්ගෙන් ඉල්ලා සිටියේ ඔවුන්ට මූලික ප්‍රථමාධාර උගන්වන ලෙස හෝ එය ඉගෙන ගැනීමට පන්තිවලට සම්බන්ධ කරන ලෙසයි. මූලික ප්‍රථමාධාර අධ්‍යාපනය, සූදානම් වීම සහ අවශ්‍යතා ඇති අන් අයට උපකාර කිරීම කොතරම් වැදගත්ද යන්න ඔවුහු තේරුම් ගත්හ.

<u>වැඩිහිටියෙකුගේ උගුරේ යමක් සම්පූර්ණයෙන් සිරවීමක දී ප්‍රථමාධාර:</u>

01. <u>Coughing (කැස්ස)- රෝගියට කතින ලෙස උපදෙස් දෙන්න.</u>
පිටතට පෙනෙන පරිදි යමක් උගුරේ සිර වී ඇත්නම් එය ඉවත් කරන්න.

02. <u>Back Blows - පිට අත් පහර 05ක් දෙන්න.</u>
රෝගියා සිට ගැනීමට සලස්වා උරහිස් පෙදෙස ඉදිරියට නමා එක් අතකින් රෝගියා ඉදිරියට තල්ලුවීම වැලකෙන සේ රඳවාගෙන අනිත් අතින් උරපතු අතර මැදට සාමාන්‍ය පරිදි 05 වරක් තට්ටු කරන්න - **<u>1 රූපය බලන්න</u>**

03. <u>Abdominal thrusts-උදර තෙරපුම් වාර පහක් දෙන්න</u>
පිට අත් පහරින් ඉවත් නොවූයේ නම් රෝගියාගේ පිටුපසින් සිට ඔබගේ දෑත් රෝගියාගේ නාභියත් පපු අස්ථියත් අතරට තබා උදරය ඉහළට පස්වරක් තෙරපන්න. **<u>2 රූපය බලන්න</u>**

04. <u>Repeat- නැවත පෙර පරිදි කරන්න</u>
ඉහත පරිදි ඉවත් නොවූයේ නම් පිට අත් පහර හා උදර තෙරපුම් වාර සාමාන්‍ය පරිදි නැවත ලබා දෙන්න. 3 හා 4 රූප බලන්න

අසිහි තත්ත්වයට පත්වී ඇත්නම් ස්වසන මාර්ගය විවෘත කොට ස්වසනය හා රුධිර සංසරණය පිරික්සන්න. ස්වසනය කරයි නම් ආරක්ෂිත ඉරියව්වේ තබා රෝහල්ගත කරන්න. ස්වසනය නොකරයි නම් Cadio Pulmonary Resuscitation (CPR) අරඹන්න.

<u>A Health Message- සෞඛ්‍ය පණිවිඩයක්</u>

හදිසි අවස්ථා ඕනෑම කෙනෙකුට ඕනෑම වේලාවක සිදුවිය හැකි බැවින් ප්‍රථමාධාර සෑම කෙනෙකුම ඉගෙන ගත යුතු කුසලතාවකි.

හුස්ම හිරවීම ඕනෑම කෙනෙකුට ඕනෑම වේලාවක සිදුවිය හැකිය. දිරිගන්වන කැස්ස සඳහා ප්‍රතිචාර දැක්වීමේ පියවර දැන ගැනීම, පිටට ආපසු පහර දීම සහ උදරයේ තෙරපුම සිදු කිරීම ජීවිතය සහ මරණය අතර වෙනස ඇති කළ හැකිය. පුද්ගලයා සිහිසුන් වුවහොත්, සෑම විටම ශ්වසන මාර්ගය විවෘතව ඇති බව සහතික කර හුස්ම ගැනීම සහ ස්පන්දනය පරීක්ෂා කරන්න. ඔවුන් හුස්ම නොගන්නේ නම් වහාම CPR කරන්න. මෙම සිදුවීම ප්‍රබල සිහිගැන්වීමකි: මූලික ප්‍රථමාධාර දැනුම හදිසි අවස්ථාවල දී තීරණාත්මක ලෙස ක්‍රියා කිරීමට අපට බලය ලබා දෙයි. මෙම ප්‍රථමාධාර කුසලතා ඔබේ පවුල සහ ප්‍රජාව සමඟ බෙදා ගන්න.


Choking can happen to anyone, anytime. Knowing the steps to respond encouraging coughing, delivering back blows, and performing abdominal thrusts can make the difference between life and death. If the person becomes unconscious, always ensure the airway is open and check for breathing and a pulse. Perform CPR immediately if they are not breathing. This incident is a powerful reminder: basic first-aid knowledge empowers us to act decisively in emergencies. Share these First aid skills with your family and community.


Choking

Recognition – Foreign bodies may cause either mild or severe airway obstruction. The signs and symptoms enabling differentiation between mild and severe airway obstruction are summarised in the following table.

Signs of choking

General signs	
Usually the incident occurs while eating	
Patient may clench their neck	
Severe airway obstruction	
Assess the ability to respond 'Are you choking?'	Patient is unable to speak and tries to respond by gestures; by nodding.
Other signs	Difficulty in breathing
	Noisy breathing – wheeze
	Coughing attempts are silent
	Patient may be unconscious
Signs observed in mild airway obstruction	
Assess the ability to respond 'Are you choking?'	Patient can answer, 'YES'
Other signs	Patient is usually able to speak, cough and breathe







Repeat until the object is out

Authors

Dr. Asela K. Dissanayake, Consultant and Regional Director of Health Services (RDHS) Kilinochchi.

Dr W.A. Deepthi Kumari Jayawardane (Wijayanayake), GP Specialty Trainee, Pembrokeshire, Wales, UK.

Mrs. Dilhani Munasinghe, Senior Assistant Librarian, Postgraduate Institute of Medicine, UoC

இந்திய வம்சாவளி மலையகத் தமிழரின் ஆரம்பகால பதிப்பு முயற்சிகள் (1823–1948வரை)

கலாநிதி ஆர். மகேஸ்வரன்

பிரதம நூலகர்

பேராதனைப் பல்கலைக்கழகம்

திறவுச் சொற்கள் : இந்திய வம்சாவளி, மலையகத் தமிழர், தோட்டத் தொழிலாளி, பத்திரிகைகள், படைப்புகள்,

ஆய்வுச் சுருக்கம் :

ஐரோப்பியர் ஆட்சிக்காலத்தில் இலங்கைக்கு தொழிலுக்காக கூட்டி வரப்பட்ட இந்தியத் தமிழர்கள் மலையகத் தமிழர்கள் அல்லது இந்தியவம்சாவளித் தமிழர்கள் என அழைக்கப்படுகின்றனர். இவர்கள் புகையிரத பாதைகளமைக்க, குளங்களமைக்க மற்றும் பெருந்தோட்டதுறைக்காகவும், கூலிகளாக கூட்டிவரப்பட்டனர். இலங்கை மலையக அச்சுப் பதிப்பு முயற்சிகளை இலங்கைத் தமிழ்மொழியிலான நூல்களின் அச்சுப்பதிப்பு வரலாற்றுடனும் உலக அச்சுப்பதிப்பு வரலாற்றுடனும் நோக்கல் வேண்டும். இலங்கையிலே புரட்டஸ்தாந்து மதப் பிரச்சாரத்தை ஆரம்பித்த ஒல்லாந்து கிழக்கிந்தியக் கம்பனியால் ஒல்லாந்தரின் அச்சுக் கூடம் 1713 இல் கொழும்பில் அமைக்கப்பட்டது. 1816இல் இலங்கைக்கு வந்த அமெரிக்க மிஷனரிமார் அச்சுத் தொழிலிலே பெரிதும் ஈடுபாடு காட்டத் தொடங்கினர். தேசாதிபதி எட்வார்ட் பான்ஸ் அவர்களின் காலத்தில் (1820) அமெரிக்க மிஷனுக்காக கரற் என்பவர் இலங்கைக்கு ஓர் அச்சியந்திரத்தைக் கொண்டுவந்தார். இந்த வரலாற்றுகளுடனேயே மலையகத்தவரதும் பதிப்பு முயற்சிகள் ஆராயப்பட வேண்டும். இலங்கையில் 1802இல் பத்திரிகை என்ற வடிவத்தில் முதன் முதல் பத்திரிகையான 'வாந புழுளநசஅநவெ புயணணநவந' வெளிவந்தது. இந்த பத்திரிகை வரலாற்றுடனும் மலையக பத்திரிகை வருகையை ஆராய வேண்டும். மலையக அச்சுபதிப்புகள் இதுவரை சரிவர ஆவணப்படுத்தப்படாமை மிக முக்கிய குறைபாடாகும். இலங்கையின் முதல் தமிழ் நாவலாசிரியராக சித்திலெப்பை வெளியிட்ட ஹஅசன்பேயுடைய சரித்திரம்' (1885) கண்டியிலேயே வெளியிடப்பட்டது. ஈழத்து மலையகக் கவிதை முன்னோடி (1881–1918) அப்துல் காதிஉ புலவஉ என விதந்து கூறப்படுகின்றாஉ. இலங்கையின் மலையத்தில் ஆரம்பக்கால அல்லது சுதந்திரத்திற்கு முற்பட்ட நூற்பதிப்புத் துறையில் நடேச ஐயர் ஓர் பதிப்பாளராக, பல நூல்களை அச்சிட்டு வெளியிட்டார். தேசபக்தன், உரிமைப் போர், சுதந்திரப்போர், வீரன், சுதந்திரன், தோட்டத் தொழிலாளி மற்றும் வீரகேசரி ஆகியன மலையகத்தவர்களால் ஆரம்பிக்கப்பட்ட பத்திரிகைகளாகும்.

அறிமுகம்

வரலாற்றுப் பின்னனி

இந்திய வம்சாவளி தமிழர் அல்லது மலையகத் தமிழர் என்போர் ஐரோப்பியர் ஆட்சிக்காலத்தில், இலங்கைக்கு இந்தியாவிலிருந்து தொழிலுக்காக கூட்டிவரப்பட்ட தமிழர்கள் ஆவர். பாதைகளமைக்க, புகையிரத பாதைகளமைக்க, குளங்களமைக்க மற்றும் பெருந்தோட்டதுறைக்காகவும், கூலிகளாக கூட்டிவரப்பட்டனர். அவர்களின் ஏற்மையினையும், இந்தியாவில் குறிப்பாக தமிழ்நாட்டில் நிலவிய பட்டினி, பஞ்சம், வறுமை, சாதிக்கொடுமை, அடிமை வாழ்கை போன்ற இன்னோரன்ன காரணங்களாலும், இலங்கையில் வளமான வாழ்க்கை காத்திருப்பதாக பரவிய பொய்யான பரப்புரைகளால் கவரப்பட்டு வருகைதந்தார்கள். இவர்களோடு வர்த்தகக் காரணங்களுக்காகவும், ஏனைய

காரணங்களுக்காகவும் இந்தியாவிலிருந்து வந்த மக்கள் வம்சாவளியாக வாழ்வதால் இந்திய வம்சாவளி தமிழர்கள் என்றும், புவியியல் ரீதியாக மலையகத்தில் மிகச்செறிவாக வாழ்வதால் மலையகத்தமிழர்கள் எனப்படுகின்றனர். இவர்களது படைப்புகளும் பதிப்புகளுமே இவ் ஆய்வில் நோக்கப்பட்டுள்ளது. தமிழ் பேசும் மலையக முஸ்லீம்கள் அல்லது இந்திய வம்சாவளி முஸ்லீம்கள் பற்றியும் குறிப்பிடப்பட்டுள்ளன.

இலங்கை மலையக அச்சுப்பதிப்பு முயற்சிகளை இலங்கைத் தமிழ்மொழியிலான நூல்களின் அச்சுப்பதிப்பு வரலாற்றுடனும் உலக அச்சுப்பதிப்பு வரலாற்றுடனும் நோக்கல் வேண்டும். அவ்வகையில் உலகளாவிய ரீதியில் மிக புராதன காலந்தொட்டு மக்கள் களிமண், கல், புல், மரக்கட்டை, உலோகத் தகடுகள், ஓலையில் தமது கருத்துக்களை, ஆக்கங்களை தகவல்களை பதிவு செய்து வைத்திருந்தார்கள். அச்சுஇயந்திர கண்டுபிடிப்பின் பின் ஒரு மாற்றத்தையே கொண்டுவந்தனர். 1401 இல் சீனாவில் பி. ஷெங் என்பவர் தனித்தனி அச்சு எழுத்தை உருவாக்கினார். இவர் 1450 இல் உலோகத்தால் அச்சு எழுத்துக்களை வார்த்தெடுத்து அச்சிடும் முறையினைக் கண்டுபிடித்தார். கார்டில் ஹா (உயசவடை ாய) போர்த்துகேய லிஸ்பனில் 1554ல் கிறிஸ்தவ சமய வினாவிடை புத்தகத்தினை முதல் முதலில் தமிழில் அச்சிட்டார். 1578 இல் "தம்பிரான் வணக்கம்" என்றீகியு (உநசெஙைரந) பாதிரியாரால் தமிழில் அச்சிடப்பட்டது. 1813இல் திருசிற்றம்பலம் தேசிகரின் 'இலக்கணச் சுருக்கம்", 1812இல் வீரமாமுனிவரின் பரமார்த்த குரு கதை, 1821இல் வீரமாமுனிவரின் சதுரகராதியும் இலங்கைக்கு கொண்டு வரப்பட்ட முதல் தமிழ் நூல்களாகும். ஆனால் மலையகத்தினைரைப் பொறுத்தவரை 1869 இலேயே ஏப்ரகாம் ஜோசப் என்ற கோப்பித்தோட்ட கண்டக்டர் எழுதிய " கோப்பி கிருஷிக் கும்மி" யாழ்ப்பாணத்தில் பிரசுரிக்கப்பட்டுள்ளது. இது ஒரு வாய்மொழி மூல அடிப்படையில் தோன்றிய விவசாய நூல் எனக் கருதப்படுகிறது. இதன் பின் 1918 இலேயே "கும்மியோ கும்மி, கோப்பிக் காட்டு கும்மி" என்ற நூல் வெளியிடப்பட்டுள்ளது.

இலங்கையிலே புரட்டஸ்தாந்து மதப் பிரச்சாரத்தை ஆரம்பித்த ஒல்லாந்து கிழக்கிந்தியக் கம்பனியால் ஒல்லாந்தரின் அச்சுக் கூடம் 1713இல் கொழும்பில் அமைக்கப்பட்டது. இங்கு ஒல்லாந்து அரசாங்கம் சார்பில் 1742இல் சுவிசேஷத்தின் நான்கு பதிப்புக்கள் தமிழில் வெளியாகின. 1755இல் இலங்கையை ஆங்கிலேயர் கைப்பற்றியதன் காரணமாக அவ்வச்சகம் மூடப்பட்டது. 1816இல் இலங்கைக்கு வந்த அமெரிக்க மிஷனரிமார் அச்சுத் தொழிலிலே பெரிதும் ஈடுபாடு காட்டத் தொடங்கினர். 19ஆம் நூற்றாண்டில் தேசாதிபதி எட்வார்ட் பான்ஸ் அவர்களின் காலத்தில் (1820) அமெரிக்க மிஷனுக்காக கரற் என்பவர் இலங்கைக்கு ஓர் அச்சியந்திரத்தைக் கொண்டு வந்தார். தேசாதிபதி எட்வார்ட் பான்ஸ் இலங்கையின் மலையக பிரதேசத்தில் தேயிலையை அறிமுப்படுத்தியவர். அமெரிக்க இலங்கை மிஷனின் அச்சகம் மானிப்பாயில் உதயமானது. 1834இல் நான்கு ஊழியர்களுடன் ஆரம்பித்த இவ்வச்சகம் 1850இல் எழுபது ஊழியர்களைக் கொண்டதால் பல நூல்களையும் துண்டுப்பிரசுரங்களையும் அச்சிட்டு வெளிப்படுத்தியது. இந்த வரலாற்றுகளுடனேயும் மலையகத்தவரதும் பதிப்பு முயற்சிகள் ஆராயப்பட வேண்டும்.

இலங்கையில் 1802இல் பத்திரிகை என்ற வடிவத்தில் முதன் முதல் சிலோன் கவர்ன்மன்ட் கெசட் (ஊநலடழஎ புழஎநசஎஅநவெ புயணநவவாந) என்ற பத்திரிகை வெளிவந்தது. 1832 ஜனவரியில் கொழும்பு ஜேர்னல் (ஊழடழஅடிழ துழரசஎயட) வெளிவந்தது. இந்த மாற்றங்களுக்குப் பின்னர் த கண்டி ஹெரால்ட் (வாந முயனெல உநசயடன) என்ற பத்திரிகை வெளிவந்தது. 1802 இல் மும்மொழியுடன் சிலோன் கெசட் வந்ததைத் தொடர்ந்து, 1843 இல் வெளிவந்த சிலோன் டைம்ஸ் (ஊநலடழஎ வுஅைநள) என்ற பத்திரிகையை 1923இல் விஜயவர்த்தன ஏற்று நடத்தினார். ஈழத் தமிழ்ப் பத்திரிகை வரலாறு "உதயதாரகை" யுடன் ஆரம்பமாகிறது. 1841இல் மாதம் இருமுறையாக இவ்விதழ் வெளிவந்தது. கொழும்பில் வாழும் தமிழ் பேசும் மக்களை மையமாகக்கொண்டு 1863 பெப்ரவரி 06இல் "இலங்காபிமானி (வாந

ஊநலடழலீயவசழைவ] என்ற பத்திரிகை சி.வை. கதிரைவேற்பிள்ளையால் வெளியிடப்பட்டது. 1864இல் றொபர் நியுட்டன் என்பவரால் இலங்கைக் காவலன் [வாந ஊநலடழெ றுயவஉாஅயல] என்ற பத்திரிகையும் வெளியிடப்பட்டது. இதற்கிடையில் 1864இல் "பாலியர் நேசன் என்ற சிறுவர் பத்திரிகை இளைஞர்களின் சமய முன்னேற்றம் கருதி அமெரிக்க மிசனின் ஆதரவுடன் வில்லியம் சின்னத்தம்பி என்பவரால் வெளியிடப்பட்டது. இந்த வரலாற்றுடனும் மலையக பத்திரிகை வருகையை ஆராய வேண்டும். இதுவும் இவ் ஆய்வின் நோக்கங்களில் ஒன்றாகும்.

ஆய்வின் பிரச்சினை

மலையக அச்சு பதிப்புகள் இதுவரை சரிவர ஆவணப்படுத்தப்படாமை மிக முக்கிய குறைபாடாகும். இலங்கை பல்கலைக்கழக யாழ்ப்பாண வளாகம் வெளியிட்ட துணை நூலகர் நா. சுப்பிரமணியத்தின் தொகுப்பான " ஈழத்துத் தமிழ் நாவல்கள் நூற்பட்டியல் 1885 – 1976 மலையக பதிப்புகளான நாவல்கள் இடம் பெறவில்லை.

சில்லையூர் செல்வராசன் (1967) இல் வெளியிட்ட ஈழத்தமிழர் நாவல் வளர்ச்சி நூலிலும் மலையக நாவல்கள் இல்லை. கனக. செந்தில்நாதனின் ஈழத்தமிழ் நூல் வழிகாட்டியிலும் மலையக நூல்கள் இல்லை. எனவே, இந்த ஆய்வு மலையக அச்சுபதிப்பு முயற்சிகளை, நூல்களை எடுத்துக்காட்டும் ஆவணமாக அமையவுள்ளது.

அச்சுஊடகம் தமிழ் நாட்டுக்கு கொண்டுவரப்பட்டு, 1835இல் அது யாரும் பயன்படுத்தப்படலாம் எனப் பிரகடனப்படுத்தப்பட்டதன் பின்னரே தமிழின் பழமைச் சிறப்பை வெளிக்கொண்டு வரும் இலக்கியங்கள் [குண்டலகேசி, சிலப்பதிகாரம், வளையாபதி, புறநானூறு, கலித்தொகை ஆகியன] அச்சிற் கொண்டு வரப்பட்டன. ஆனால் 1835க்கு முன்னர் பிரிட்டிஷ் அரசாங்கமும் மிஷனரிமாரும் மாத்திரமே அச்சுரிமையைப் பெற்றிருந்த காலத்தில் பழைய தமிழ் நூல்கள் சில அச்சிடப் பெற்றிருந்தன. இவ்விடயத்தில் 1835இன் பின்னர் ஆறுமுகநாவலரின் (1882 – 1879) ஈடுபாடு மிக முக்கியமானதாகும். உ.வே.சாமிநாதஐயர். சி.வை.தாமோதரம்பிள்ளை, ஒப்பாய்வு பற்றி வாதவிவாதங்களிடையே ஆறுமுகநாவலரது பதிப்பும் பணி தமிழிலக்கிய வரலாற்றில் முக்கியத்துவம் பெறுகிறது. இந்த பின்புலத்துடனேயே மலையக இந்தியவம்சாவளியினரது பதிப்பு முயற்சிகளும் ஆராயப்பட வேண்டும்.

இலங்கை முஸ்லீம்களின் பத்திரிகைத்துறை முயற்சி 19ஆம் நூற்றாண்டின் நடுப்பகுதியிலிருந்து தொடங்குகிறது. 1869இல் துவான் பாவா யூனூஸ் ஸல்தீன் என்பவரினால் ஆரம்பிக்கப்பட்ட "ஆலாமத்லங்காபூரி" என்பதுவே இலங்கை முஸ்லீம்களின் முதல் பத்திரிகை ஆகும். இது இலங்கைத் தீவின் அடையாளம்" என்ற தமிழ்மொழி பெயர்ப்பைக் கொண்ட மலாய் மொழியில் அமைந்த பத்திரிகையாகும். இலங்கையில் தமிழில் வெளிவந்த முஸ்லீம்களின் முதல் பத்திரிகை 'புதினாலங்காரி' ஆகும். புதினம் என்றால் செய்தி எனவும் அலங்காரி என்றால் அழகுள்ள எனவும் பொருள்படத்தக்க வகையில் புதினாலங்காரி என பெயரிடப்பட்டதாக அறிய முடிகிறது. இது 1873இல் வெளியான பத்திரிகையாகும். இவை தவிர "இஸ்லாம் மித்திரன்" எனும் பத்திரிகை 1893இலிருந்து எம்.எஸ்.உத்துமான் என்பவரால் மாதமிருமுறை வெளியிடப்பட்டது. இவரே "தேசநேசன்" என்ற பத்திரிகையையும் வெளியிட்டார். அப்பத்திரிகை தினப்பதிப்பாக வெளிவர ஆரம்பித்தது.

இலங்கையின் முதல் தமிழ் நாவலாசிரியராக விளங்கும் கண்டியைச் சேர்ந்த அறிஞர் எம். எஸ். சித்திலெப்பை வெளியிட்ட ஹஅசன்பேயுடைய சரித்திரம்' (1885) கண்டியிலேயே வெளியிடப்பட்டது. இவரே 'முஸ்லீம் நேசன்' (1882–1887) என்னும்

வாரப்பத்திரிகையையும் வெளியிட்டாஉ. சித்திலெப்பை ஆரம்பித்த 'முஸ்லீம் நேசன்' (1882) இதுவே முன்னோடி பத்திரிகை என கூறப்படுகிறது. முஸ்லீம் நேசன் அச்சகம் என்ற நிறுவனத்தினையும் நிறுவி பலரது நூல்களை வெளியிடவும் முன்னோடியாக விளங்கினாஉ. அப்துல் காதீஉ 'பேரின்ப இரஞ்சிதமாலை' (1881), 'காரண பிள்ளைத்தமிழ்'(1895) 'பிரபந்தகுஞ்சகம்'(1901), கண்டிக்கலம்பகம்'(1903), தைக்கா சாகிப்ஒலியுல்லா(1908), சந்ததித்திருப்புகழ்' (1909), போன்ற கவிதை நூல்களை வெளியிட்டாஉ. எனவே ஈழத்து மலையகக் கவிதை முன்னோடி (1881–1918) அப்துல் காதிஉ புலவஉ என விதந்து கூறப்படுகின்றாஉ.

எம். என். பாவா என்பவஉ, 'கடைசிக் கண்டித் தமிழ்மன்னன் வாழ்க்கையில் நிகழ்ந்த ஒரு சம்பவம்'(1910) எனும் நூலையும், முஹிதீன் மீரா சாஹிப் என்பவஉ 'பத்திரசரத்தினக் களஞ்சியம்'(1929), என்ற நூலினையும், முஹம்மது முஹிதீன் என்பவஉ 'புகழ்ப்பா'(1930), என்ற நூலையும் வெளியிட்டுள்ளனஉ. கம்பளையிலிருந்து எம். ஏ. றஊப் 'சத்தியாஉத்தம்'(1932) என்ற நூலினையும், எம். எஸ் பீஉமுகம்மது 'கீஉத்தனாமிஉதம்'(1939) ஆகிய நூல்கள் மலையக நகரங்களிலிருந்து வெளியிடப்பட்டுள்ளது. இந்த வரலாற்று பின்னணிகளிடையே மலையக தமிழ் அச்சு பதிப்பு பற்றி நோக்க வேண்டும்.

மலையகத் தமிழர் முயற்சிகள்

1909இல் டி. கே. எம். ஜபார். "தேயிலை கொய்யும் தெம்மாங்கு", 1910இல் பி. பண்டாரம் 'தேயிலைத்தோட்ட தெம்மாங்கு" இரண்டு பாகங்கள் என்பன வெளியாகியுள்ளன. இது 28 பக்கங்களைக் கொண்டது. 1918 கும்மியோ கும்மி. கோப்பிக்காட்டு கும்மி என்ற நூல் வில்சன் வெளியிட்டுள்ளார். பஞ்சக் கொடுமை, சிந்து, நொண்டிச் சிந்து, சிந்துக் கும்மி என துன்ப துயரங்களையே வெயியிட்டுள்ளனர். இவை ரயில் வண்டிப்பாதை அமைப்பதில் ஏற்பட்டுள்ள துன்பங்களையும், துயரங்களையும் வெளிபடுத்துகின்றன.

அச்சுஊடகங்கள் மூலம் முதலில் வெளியான பத்திரிகைகளாக 1918 – ஜனமித்ரன், 1922– தேசநேசன், 1924 – தேசபக்தன், 1924 – இந்தியன், 1924 – லங்காவிகடன், 1924 – தொழிலாளி, 1925 – தேசதொண்டன், 1927 – சத்யமித்திரன், 1927 – தேச ஊழியன், 1927 – சமத்துவ ஊழியன், 1928 – தொழிலாளர் தோழன், 1928 – கங்காணி 1929, இலங்கை இந்தியன், சத்யமித்ரன் என்ற பத்திரிகைகளின் பதிப்பு மலையகத்தவரின் பதிப்பு முயற்சியில் குறிப்பிடத்தக்க வளர்ச்சியினை காட்டி நிற்கின்றன. 1930ம் ஆண்டுவரையிலும் இதன் வளர்ச்சி குறிப்பாக கவனிக்கத்தக்கது. அதற்கு பிறகு வீரகேசரி (1930), தினகரன் (1932) என்ற தமிழ்த் தினசரிகளினால் இந்தப் பணிகள் மேற்கொள்ளப்பட்டன.

தனியொருவனுக்கு உணவில்லை எனில் – ஜெகத்தினை அழித்திடுவோம்" என்ற கோட்பாட்டுடன் ஏழைகளின் விடுதலைக்காக ஓர் ஞாயிறு வெளியீடு என்ற இலக்குரையுடன் "தொழிலாளி" (1925) வெளி வந்தது. மலையக இந்திய வம்சாவளி பெருந்தோட்ட தொழிலாளிகளின் உணர்வினை வெளிப்படுத்தும் வாராந்த பத்திரிகையாக அமைந்த இப்பத்திரிகையின் ஆசிரியராக டி. சாரநாதன் என்பவர் தொழிற்பட்டுள்ளார். இதே டி. சாரநாதனையே ஆசிரியாராகக் கொண்டு ஒரு சத விலையில் நான்கு பக்கங்களைக் கொண்ட தமிழ் தினசரியாக " காந்தி" என்ற பத்திரிகையும் வெளிவந்தமை குறிப்பிடத்தக்கது.

இக்காலத்தில் இலங்கை தேசிய காங்கிரஸ் உறுப்பினர்களான எம்.ஏ. அருளானந்தனும், டாக்டர். ஈ.வி.ரட்ணமும் இணைந்து நடத்திய 'தேசநேசன்" (1920) ஏட்டின் ஆசிரியர் பொறுப்பில் கோ.நடேச ஐயர் அமர்த்தப்பட்டார். தஞ்சாவூர்ப் பிராமணரான இவர் 1919ல் தான் கொழும்புக்கு வந்தார்.

நடேசஐயர் 1914இல் 'வர்த்தக மித்திரன்" என்ற பெயரில் ஓர் பத்திரிகை இந்தியாவில் தமிழ்நாட்டு தஞ்சாவூரில் ஆரம்பித்தார். 'வர்த்தக மித்திரன்" என்ற பத்திரிகைக்கு சந்தா சேர்ப்பதற்காக இலங்கைக்கு 1919இல் வந்தார். 1920இல் தேசநேசன் பத்திரிகையும், 1924இல் தேசபக்தன் என்ற பத்திரிகையும் ஆரம்பித்தார். இவர் தனது பத்திரிகைகளை வெளியிட ஓர் அச்சகத்தினை 'சகோதரி அச்சகம்" என்ற பெயரில் ஹட்டனில் நிறுவினார். இந்தியாவில் தஞ்சாவூரில் இவர் ஒர் அச்சகத்தினை நிறுவி பதிப்புத்துறையில் ஈடுபட்டவர். இவ் அச்சகத்திலேயே வர்த்தக மித்திரன் (1914), சுதந்திரன் (1912), ஒற்றன் என்ற அவரது முதல் நாவல் வெளியிட்டுள்ளார். இந்த அனுபவத்துடனேயே ஹட்டனில் அச்சுக்கூடத்தினையும், பதிப்பகத்தையும் தனது சொந்த பத்திரிகை வெளியீடுகளையும் ஆரம்பித்தார். நடேச ஐயரை ஆசிரியராகக் கொண்டு மற்றுமொரு தமிழ்ப் பத்திரிகை, தேசபக்தன் (1924) வெளிவந்தது. தமிழ்ப் பத்திரிகை இல்லாத காரணத்தால் செய்திகளை தகவல்களை அறியமுடியாத மக்களுக்கு தகவல்களை வழங்கக்கூடியதாக " தேசபக்தன்" (1924) வெளிவந்தது. அதன் முதல் இதழில் வெளிவந்த ஆசிரியர் தலையங்கத்தில் அப்பத்திரிகையின் வெளியீட்டு நோக்கம் தெளிவாக எடுத்துரைக்கப்பட்டுள்ளது. இக்காலத்தில் 'தேசபக்தன்' பத்திரிகை, கதை, கட்டுரை, கவிதை எனப்பல அம்சங்களையும் வெளியிட்டுவந்தது. குறிப்பாக இந்திய வம்சாவளியான நடேச ஐயர் மனைவி மீனாட்சியம்மை நடேசஐயர், எச். நெல்லையா என்பவர்களாலேயே அப்பத்திரிகையில் அதிகம் எழுதப்பட்டன. தேசபக்தனுக்கு நல்ல வரவேற்பு இருக்கவே 1929 இல் நாளேடாக வெளிவந்தது.

சந்திரவதனா (1934), இரத்னாவளி அல்லது காதலின் மாட்சி (1938), சோமாவதி அல்லது இலங்கை இந்திய நட்பு வீரகேசரி வெளியீடு, கொழும்பு (1939), காந்தாமணி அல்லது தீண்டாமைக்குச் சாவுமணி (1940), என்ற நாவல் சந்திரவதனா முதல் பாகம் 468 பக்கங்களிலும் இரண்டாம் பாகம் 486 பக்கங்களிலும் வெளியாகியுள்ளது. இதனால் இலங்கையின் மலையத்தில் ஆரம்பக்கால அல்லது சுதந்திரத்திற்கு முற்பட்ட நூற்பதிப்புத் துறையில் நடேச ஐயர் ஓர் பதிப்பாளராக, பல நூல்களை அச்சிட்டு வெளியிட்டார். இவரது இம் முயற்சிகளினால் மலையகத்தில் ஒரு பதிப்புக் கலாசாரம், நூல் வெளியீட்டு கலாசாரம் குறிப்பாக பத்திரிகைகள் வெளியிடும் கலாசாரம் உருவாயிற்று எனலாம்.

நடேச ஐயர் பத்திரிகை வெளியீடுகளாக் தேசநேசன் (1920 –1923), தேசபக்தன் 1924 –1931), உரிமைப் போர் (1931), சுதந்திரப்போர் (1940), வீரன் (1942), சுதந்திரன் (1947) தோட்டத் தொழிலாளி (1947), என்பனவும், நடேச ஐயரின் ஆக்க படைப்புகளாக இன்ஸ்யூரன்ஸ் (1918), ஒயில் என்ஜின்கள் (1918), வெற்றியுனதே (1930), நீ மயங்குவதேன் (1931), புபேந்திரசிங்க அல்லது நரேந்திரபதியின் நரக வாழ்க்கை (1935), "தொழிலாளர் அந்தரப் பிழைப்பு' நாடகம் (1938), இந்தியா இலங்கை ஒப்பந்தம் (1941), தொழிலாளர் சட்டப் புத்தகம் (1942), அழகிய இலங்கை (1944), கதிர்காமம் – ஐந்து அரிய புகைப்படங்களுடன் (1946),இவரது படைப்புகளும் வெளிவரலாகின.

நடேசஐயரின் பிற்கால நூல்கள் ஹட்டன் திம்புல வீதியில் இயங்கிய 'கணேஸ் பிரஸ்சில்' பதிப்பித்துள்ளார். இவரது 'சகோதரி அச்சக" பதிப்புகளும், 'கணேஸ் பிரஸ்" பதிப்புகளும் இலங்கை மலையக தோட்டத் தொழிலாளர்களின் வாசிப்பை ஊக்குவித்ததோடு, வாசிப்பு காலாசாரம் ஒன்றினையும் ஏற்படுத்தியது. இது எதிர்காலத்தில் பலர் தமது ஆக்கங்களை வெளிக்கொண்டுவர காரணமாயிற்று. நடேசஐயரின் தொடர் நாவல்களில் ஒன்று "மூலையில் குந்திய முதியோன்' என்ற

தலைப்பில் வெளியாகியுள்ளது. தேசபக்தன் (1924–1929), பத்திரிகையில் 'மூலையில் குந்திய முதியோன் அல்லது துப்பறியுந்திறம்" என்ற தொடர் நாவலைக் கோ.நடேசய்யர் எழுதியுள்ளார். இந்நாவல் ஒக்டோபர் 1924இல் ஆரம்பமாகியுள்ளது. மற்றொன்று சத்ய மித்திரனில் ஒரு தொடர் நாவலாக வெளிவந்தது. இது "சரஸ்வதி அல்லது காணாமற்போன பெண்மணி" என்பதாகும். நடேசஐயர் 1931இல் 'நீமயங்குவதேன்". 1938 இந்திய தொழிலாளரை மையமாகக்கொண்டு 'அந்தரப் பிழைப்பு' நாடகம் போன்றவற்றை எழுதியுள்ளார். இவைகளுள் சில நூல்களாகவும் வெளிவந்தன. மற்றும் 'ராமசாமி சேர்வையின் சரிதம்" என்ற தலைப்பிலான சிறுகதை 'நீ மயங்குவதேன்"? நூலில் எழுதப்பட்டுள்ளது. இதனையே மலையகத்தின் முதல் சிறுகதையாகவும் சிலர் குறிப்பிடுகின்றனர்.

பத்திரிகைத்துறை மூலம் இலங்கை – இந்தியா நலன்காக்கப் புரட்சிகரமான கருத்துகளை வெளியிட்டு அரும்பாடுபட்டவர் இவர். பல புத்தகங்களும் எழுதினார். 1947ல் தமிழ் காங்கிரஸின் நாளேடாக சுதந்திரன் வெளிவந்தபோது அதன் முதல் ஆசிரியராகவும் இருந்தார். தேசபக்தன் பத்திரிகையில் அவருக்குத் துணையாக எச். நெல்லையா என்ற ஹரிஹர பாரதி நெல்லையா இணையாசிரியராகச் சேர்ந்தார். அவர் அப்போது எஸ்.என். வங்கி தனியார் வணிக நிறுவனத்தில் பணி புரிந்தார். நெல்லையாவின் பத்திரிகைத்துறை பிரவேசம், நடேசய்யரின் துணையுடன் தேசபக்தனில்தான் ஆரம்பமானது. தேசபக்தனும், தோட்டத் தொழிலாளர்கள் சம்பந்தப்பட்ட செய்திகளையே வெளியிட்டு அம்மக்களின் ஆதரவினைப் பெற்றிருந்தது. இதன்பின் வீரகேசரி பத்திரிகை இந்திய வம்சாவளியான சுப்ரமணியம் செட்டியாரால் ஆரம்பிக்கப்பட்டது. வீரகேசரி ஆவணிப்பட்டி பெரி. சுப்ரமணியம் செட்டியார் 1930 ஆகஸ்ட் மாதம் 6ம் நாள் ஆரம்பித்தார். இது வீரகேசரி அச்சகத்திலேயே வெளியயிடப்பட்டது. இவ் அச்சகத்தையும் சுப்பிரமணிய செட்டியாரே செட்டியார் தெருவில் நிறுவினார். அவரே பத்திரிகை ஆசிரியர். அவருக்கு உதவியாகச் சேர்ந்தவர் எச்.நெல்லையா. அவரே பின்னர் ஆசிரியர். பத்திரிகை அச்சிடும் முழுப்பொறுப்பையும் கவனிக்க செட்டியாருக்கு முடியவில்லை. அவர் எஸ்.பி.எட்வாட்டையும் துணைக்குச் சேர்த்துக் கொண்டார். எட்வாட் 'தொழிலாளர் தோழன்' (1928) என்ற பத்திரிகையின் ஆசிரியராக இருந்தவர். பின்னாளில் வீரகேசரி இயக்குனர் சபையின் நியமனம் உறுப்பினராகவும் ஆசிரியர் பகுதி பொறுப்பாளராகவும் இருந்தார்.

மீனாட்சியம்மை நடேச ஐயர் தமது பங்குக்கு பாடல்களைச் சிறுபுத்தக வடிவில் "தொழிலாளர் சட்டக்கும்மி" (1931) என்ற பெயரில் வெளியிட்டார். இந்திய தொழிலாளர் துயரச்சிந்து (1947) இவராலேயே வெளியிடப்பட்டுள்ளது. இந்தியத் தொழிலாளர் துயரச்சிந்து – இரண்டு பாகங்கள் (1931), வெளிவந்தன. இவரால் எழுதப்பட்ட இந்தியர்களது இலங்கை வாழ்க்கையின் நிலைமை கணேஸ் பிரஸ், ஹட்டன் (1940), ஊடாக வெளிவந்தது. இவரைத் தொடர்ந்து "சத்யமித்ரன்" (1927) பத்திரிகையில் சரஸ்வதி அல்லது காணமற்போன பெண்மணி என்ற தொடர் நாவலை து.தொ.க. இராசம்மாள் எழுதியுள்ளார். 1926இல் தொடர் நாவலாக வெளிவந்த இது 1929 இல் நூல் வடிவம் பெற்றது. நடேசய்யரின் உறவினர் நாகலிங்கம் வீரகேசரியில் இருந்து விலகித் தினகரனில் துணைஆசிரியரானார். கொழும்பில் 1924ல் தொழிலாளி என்ற ஏடு ஆர். சாரங்கபாணிச் செட்டியாரை ஆசிரியராகக் கொண்டு வெளிவந்தது.

பெரியார் ஜோன் என்று பின்னாளில் அறியப்பட்ட ஏ.எஸ்.ஜோன் இந்தியன் என்ற பத்திரிகையை வெளியிட்டார். கே.டி.சிதம்பரம் இலங்கை விகடனை வெளியிட்டார். 1925ல் தேசத் தொண்டன், 1928ல் ஆதித் திராவிட மித்திரன் ஆகிய ஏடுகளுக்கு கோடி. சிதம்பரமே ஆசிரியர். 1930ல் நடேசய்யரின் உறவினர் சாரநாதன் தொழிலாளி என்ற பத்திரிகையை ஆரம்பித்து நடத்தினார். பின்னர் இவர் பதுளையில் இருந்து சில காலம் இதனை வெளியிட்டார். இடையில் நின்று போன தேசபக்தனை நடேசய்யரின் மனைவி 1930ல் மீண்டும் வெளிவரச் செய்தார். அவரே அதன் ஆசிரியர். எச். நெல்லையா

'இலங்கை இந்தியர்' என்ற பத்திரிகையை ஆரம்பித்து நடாத்தினார். இப்பத்திரிகைகளைவிட வேறுபல பத்திரிகைகளும் 1920–30களுக்கிடையில் வந்துகொண்டிருந்தன. இவைகளில் பல மேலே குறிப்பிடப்பட்டுள்ளன.

இக்காலத்திலேயே மலையக ஆரம்பகால படைப்புகளாக 1937இல் "சாமளா அல்லது காதல் போதனை' என்ற நாவலைக் கண்டியிலிருந்து எஸ். செல்வநாயகமும், 1938ல் , சுந்தரமீனா அல்லது காதலின் வெற்றி" என்ற நாவலை மஸ்கெலியா, குயின்ஸ்லேண்ட் தோட்டத்தில் ஆசிரியராகக் கடமைப்புரிந்த ஏ.போல் என்பவரும், 1940ல் "கண்ணனின் காதலி" என்ற நாவலை இரத்னபுரி, மத்வாகெல தோட்டத்தில் ஆசிரியராகக் கடமைப் புரிந்த ஜி.எஸ்.எம். சாமுவேல் என்பவரால வித்தியாலோக அச்சகத்திலும் ,1942ல் கோவிந்தன் அல்லது தேசிய ஊழியன் என்ற நாவலை இரத்தினபுரியிலிருந்து பி.எஸ். வரதராஜீலு நாயுடு" என்பவரும் வெளியிட்டுள்ளனர். இந்த கோவிந்தன் நாவலை வரதராஜீலு முப்பத்தெட்டுப் பக்க நாவலான இதை இலங்கை – இந்தியன் காங்கிரஸின் தற்போதைய இலங்கை தொழிலாளர் காங்கிரஸ் – இரத்தினபுரி செயற்குழு அனுசரணையுடனும் நூலாக்கியிருந்தார். இந்த நாவல்களில் சில இரத்தினபுரி நகரில் விக்டோரியா அச்சகம், வித்தியாலோக அச்சகம் அச்சடிக்கப்பட்தை அவதானிக்கையில், அந்தப்பகுதியில் தமிழர்கள் கணிசமான அளவு படைப்பிலக்கிய ஆர்வத்துடன் வாழ்த்திருப்பதைக் காண முடிகிறது. மலையகத்தில் அச்சு ஊடகத்தின் வருகையுடன், மேல் குறிப்பிட்ட நூல்களின் வருகையானது அச்சு முறைமையின் பிரதானம் பற்றியும் அதன் பாவனை முக்கியத்துவம் பற்றியும் மலையக தமிழ்ச் சூழலில் நிலவிய முக்கியத்துவத்தினை உணர்த்துவதாக அமைகிறது.

சுப்பையாபிள்ளை, டி. 'வீரபத்தினி' என்ற நூல் கொழும்பிலிருந்து 1926 இல் வெளியிடப்பட்டுள்ளது. கே.கணேஸ் (1940) தீண்டத்தகாதவன், என்ற நூலும் நெல்லையா, எச். (1947) பிரதாபன் அல்லது மஹாராஷ்டிர நாட்டுமங்கை என்ற நூலும் கொழும்பு, ஸ்டான்ரி பதிப்பகத்தின் மூலமும், சந்திரவதனா அல்லது காதலின் வெற்றி கொழும்பு, சரஸ்வதி புத்தகசபை (1934) போஸ், ஏ., (1940) சுந்தரமீனாள் அல்லது காதலியின் வெற்றி, மஸ்கெலியா, யூனியன்பிரஸ். (1938) ,வேல்ஸ் ரத்தின பாண்டியன் எஸ்.எஸ். (1938) கள்ளத்தோனி, (குறுநாவல்) விக்டோரியா, இரத்தினபுரியிலிருந்தும் வெளியிடப்பட்டுள்ளன.

1948ல் இலங்கை சுதந்திரம் பெற்ற சமயம் வீரகேசரியில் சேர்ந்தவர் கே.கணேஷ் சுதந்திரதினச் சிறப்பிதழ் தயாரிப்பதில் முக்கிய பங்கு வகித்தார். மலையக எழுத்தாளர்களில் முதலில் வீரகேசரியில் சேர்ந்தவர் இவராகத் தான் இருக்க வேண்டும். தலாத்துஓயாவுக்கு அருகில் அம்பிட்டியில் 2.3.1930ல் பிறந்த கணேஷ், கண்டி புனித அந்தோனியார் கல்லூரியிலும், மதுரைத் தமிழ்ச் சங்கத்திலும், பின்னர் திருவையாறு ராஜா கல்லூரியிலும் படித்தவர். 1942ல் எழுதத் தொடங்கி இளைஞர் காங்கிரஸ் உருவாக்கி லோகசக்தி என்னும் முற்போக்குச் சஞ்சிகை வெளியீட்டில் பங்கேற்று தமிழகத்தில் முற்போக்கு எழுத்தாளர் சங்கத்தைத் தோற்றுவித்தபின் கணேஷ் இலங்கைக்குத் திரும்பினார். இவரது பதிப்பு முயற்சிகள், படைப்புகள் இதன்பின் முக்கியத்துவம் பெறுகிறது.

ஜப்பான் சக்கரவர்த்தியின் பிறந்தநாள் விழாவுக்கான அகில உலகக் கவிதைப் போட்டியில் கலந்து கொண்டு பரிசு பெற்று சக்ரவர்த்தியிடம் விருது பெற அழைக்கப்பட்டார். 1946ல் இலங்கையில் கே.ராமநாதனுடன் சேர்ந்து இலங்கை முற்போக்கு எழுத்தாளர் சங்கம் அமைத்தார். இருவரும் பாரதி என்னும் சஞ்சிகையும் நடத்தினர். வீரம் ததும்பும் தமிழ்த் தினசரி என்ற குறிப்புடன் எம். பெருமாள் என்பவரை ஆசிரியராகக் கொண்டு 1939இல் இந்தியா' என்ற பத்திரிகை வெளிவந்தது. தினசரி வெளிவந்த குறுகிய காலத்தில் 1939 முதல் இப்பத்திரிகை வாராந்த வெளியீடாக வந்ததாக அறியமுடிகிறது.

'அடிமை வாழ்வு அகற்றிட வேண்டும்' சுதந்திர வாழ்வு ஓளிபெற வேண்டும்.'' என்பதனைப் பிரகடனமாகக் கொண்டு எம்.எல்.ஏ.மோத்தா என்பவரால் கொழும்பிலிருந்து 1939 முதல் ஞாயிறு வெளியீடாக "பராசக்தி" பத்திரிகை வெளிவந்தது.

சர்வஜன சகோதரத்துவ தமிழ் தினப்பதிப்பாக ஸி.எஸ்.சோமசுந்தரன் அவர்களை ஆசிரியராகக் கொண்டு 'சேர்ந்து வாழ்வதே சிறந்த வலிமை'இ "உண்மையைக் கடைப்பிடி", "நாடொப்பனசெய்" முதலானவை மகுடவாசகங்களாக அமைய "ஒற்றுமை" என்ற பத்திரிகை வெளிவந்தது.

முடிவுரை

ஏட்டுப்பிரதிகள் இல்லாத அல்லது குறைந்த சமூகமாக, அச்சு இயந்திரம் இல்லாத பிற்பட்ட சமூகமாக ஐரோப்பியர் ஆட்சிக் காலத்தில் இலங்கைக்கு கூட்டிவரப்பட்ட சமூகமாக ஏனைய இலங்கை வாழ் சமூகங்களை விட குறிப்பாக இலங்கைத் தமிழர்களான வட மாகாண தமிழர்கள், கிழக்கு மாகாண தமிழர்கள் மற்றும் இலங்கை தமிழ் பேசும் முஸ்லீம்கள், தமிழ் கிறிஸ்தவர்கள் ஆகியோர்களைவிட ஒப்பீட்டுரீதியாக பின்தங்கிய சமூகமாக மலையகத் சமூகத்தினர் காணப்பட்டுள்ளனர். உலக தமிழர் வரலாற்றில் ஆரம்பத்தில் இலங்கைக்கு குடும்பங்களோடு புலம்பெயர்ந்த தமிழர்களான இந்திய வம்சாவளி அல்லது மலையகத் தமிழர்களது தமிழ் பதிப்புகள், அவர்களது புலம்பெயர்சூழலில், வாழ்வாதார சிக்கலிலும், பொருளாதார கஸ்டமான சூழலிலும் ஏனைய சமூகங்களைவிட சற்று பின்தங்கி பிற்காலத்தில் பதிப்புக்கள் ஆரம்பிக்கப்பட்டாலும் அவர்களது அச்சுபதிப்பு முயற்சிகள் மேலும் தேடுதல்கள் மூலம் ஆராயப்பட வேண்டும். இந்த எனது ஆய்வுக் கட்டுரைக்கான தேடுதல், ஆவணப்படுத்தல் என்பன எதிர்கால ஆய்வுகளுக்கான மேல்வரிச்சட்டமாகவும் முன் ஆதாரமாகவும் அமையும் என்பது என் நம்பிக்கையாகும்.

ஊசாத்துணை நூல்கள்

1. முத்துக்குமாரசாமி, இரா, (2010). 'பழந்தமிழ் அச்சு நூல்கள்', உலகத் தமிழ் செம்மொழி மாநாடு, கோயம்புத்தூர்.
2. நல்லையா, சி. சாரல்நாடன். (1998). 'பத்தரிகையாளர் நடேசய்யர்'. கண்டி, மலையக வெளியீட்டகம், 1998
3. நல்லையா, சி. சாரல்நாடன். (2000). 'மலையக இலக்கிய தோற்றமும் வளர்ச்சியும்'. சாரல் வெளியீட்டகம், கொட்டகலை.
4. நல்லையா, சி. சாரல்நாடன். (2009). 'மலையக நிர்மாணச் சிற்பி கே. நடேசய்யர்', கொழும்பு, குமரன் புத்தக இல்லம்.
5. சிவதம்பி, கா. (2007). 'தமிழ்த்துறைப் பதிப்புப் பணியில் உ.வே.சா'. குமரன் புத்தக இல்லம் கொழும்பு.
6. கார்மேகம் எஸ். எம். (2002). 'ஒரு நாளிதழில் நெடும் பயணம்'', ராணி பப்ளிகேஷன், கொழும்பு

මගේ ජීවිතයට ආලෝකයක් වූ පාසල් පුස්තකාලය

S. Menaka. Mudithangani Subasinghe,

Charted Librarian,

Medical Research Institute



සමහර මතක කාලයත් සමඟ මැකී යන්නේ නැත. ඒවා අපේ හදවතේ නිහඬව ජීවත් වෙමින්, අපේ ජීවිතයට මඟ පෙන්වයි.

මගේ ජීවිතයේ අමතක නොවන සුන්දර මතක අතර කොළොන්න ජාතික පාසලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එහි පන්ති කාමර, පාසල් මිදුල, ගුරු මණ්ඩලය මෙන්ම පොත් සුවඳින් පිරුණු පුස්තකාලය ද අදටත් මගේ මතකයේ ජීවමානව පවතී.

එදා මම කියවීමටත්, ලිවීමටත් එතරම් දක්ෂ නොවූ පුංචි දැරියක්මි. අකුරු අතරින් ලස්සන ලෝකයක් දැකීමට මට ආශාවක් තිබුණද, ඒ ලෝකයට පිවිසෙන මඟ මට පහසු නොවීය. එහෙත් මගේ ඒ පුංචි ආශාව හඳුනාගෙන, එය දිරිමත් කළ ආදරණීය මිනිසුන් කිහිපදෙනෙක් මගේ පාසලේ සිටියහ. විදුහල්පති රුවන් සර්, පුස්තකාලයාධිපති රම්‍යා මිස් සහ අපේ පුස්තකාල සහායිකාව ඒ අතරින් මගේ සිතේ සදාකාලිකව රැඳී සිටිති.

අපේ පුස්තකාල සහායිකාව දුර බැහැර ප්‍රදේශයක සිට අපේ පාසලට පත්වීමක් ලබා පැමිණි අයෙකි. ඇය තම රාජකාරියට පමණක් සීමා නොවී, දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ආදරයෙන් හා කැපවීමෙන් සේවය කළාය. පුස්තකාලයේ පොත් පිළිවෙළට තැබීම, දරුවන්ට අවශ්‍ය පොත් සොයා දීම සහ ඔවුන් කියවීමට උනන්දු කිරීම ඇය ඉතා කැපවීමෙන් ඉටු කළ කාර්යයන් විය.

මටද පොත් කියවීමටත්, අකුරු ලිවීමටත් ඇය ආදරයෙන් උපකාර කළාය. ඇයගේ දිරිගැන්වීම් නිසා මම ටිකෙන් ටික කියවීමට පුරුදු වූයෙමි. පොත්වලින් අලුත් දේ ඉගෙන ගනිමින්, මගේ සිතුවිලි වචනවලට

පෙරළීමට උත්සාහ කළෙමි. ගමේ සුන්දරත්වය, මිනිසුන්ගේ සරල ජීවිතය සහ මා දුටු සුන්දර දේවල් ගැන සිතන්නටත්, ඒවා ලියා තබන්නටත් මගේ සිත යොමු විය.

එදා මට නොවැටහුණු එක් සත්‍යයක් අද මම හොඳින් අවබෝධ කරගෙන සිටිමි. එනම්, දරුවෙකුගේ ජීවිතය වෙනස් කිරීමට විශාල දේවල් අවශ්‍ය නොවන බවයි. සමහර විට ආදරණීය වචනයක්, පුංචි දිරිගැන්වීමක් හෝ නිවැරදි පොතක් අතට දීමක් වුවද දරුවෙකුගේ අනාගතයට නව මඟක් විවර කළ හැකිය.

කාලය ගෙවී ගියේය. එක් දිනක අපේ පුස්තකාල සහායිකාවට වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවක් ලැබුණි. ඇය පාසලෙන් සමුගෙන යන අවස්ථාවේදී මුළු පාසලෙන්ම ඇයට ලැබුණු ප්‍රශංසාව මට අදටත් අමතක කළ නොහැකිය. ඇය කළ සේවය, දරුවන් වෙනුවෙන් දැක්වූ කැපවීම සහ සියලු දෙනා සමඟ ගොඩනඟා ගත් සුහදතාව එම ඇගයීමට හේතු විය.

ඇය අපේ පාසලෙන් නික්ම ගියද, ඇය කළ සේවයේ වටිනාකම එතැනින් අවසන් වූයේ නැත. ඇයගේ ආදරය හා උපකාරය ලැබූ දරුවන්ගේ මතකයන් තුළ ඇය තවදුරටත් ජීවත් වූවාය. මටද ඇය එවැනිම අමතක නොවන චරිතයකි.

අද මමත් පුස්තකාල ක්ෂේත්‍රයේ සේවය කරන විට, මගේ සිත නිතරම අතීතයට දිව යයි. එදා පුස්තකාලයේ පොත් අතර සිටි පුංචි දැරිය අද පොත් සමඟ ජීවිතය ගෙවන කාන්තාවක් වී සිටියි. මගේ පාසල් ජීවිතයේදී මට ආදරයෙන් මඟ පෙන්වූ ඒ මිනිසුන්ගේ සේවයේ වටිනාකම අද මට වඩාත් හොඳින් දැනේ.

අද මම පුස්තකාල සේවයේ නියැළෙන විට, මගේ ඉදිරියේ සිටින පාඨකයන් අතර එදා මා වැනිම කියවීමට අපහසු, නමුත් ඉගෙනීමට ආශාවෙන් පසුවන දරුවෙකු සිටිය හැකි බව මට සිතේ. එවැනි දරුවෙකුට උපකාර කරන සෑම අවස්ථාවකම මට මගේ අතීතය සිහිපත් වේ. එදා මට ලැබුණු ආදරය තවත් කෙනෙකුට ලබා දීමට හැකි වීම මගේ වෘත්තීය ජීවිතයේ වටිනාම සතුටකි.

අදත් මගේ පාසල සිහිපත් වන විට, මගේ සිතට දැනෙන්නේ වචනවලින් විස්තර කළ නොහැකි ආදරයකි. නැවතත් ඒ පුංචි දැරිය වී, පුස්තකාලයේ නිහඬ කෙළවරක වාඩි වී පොතක් අතට ගන්නට මට සිතේ. එදා මට පොත් කියවීමට මඟ පෙන්වූ ඒ ආදරණීය මිනිසුන් අද මගේ ළඟ නොසිටියත්, ඔවුන් මගේ ජීවිතයට ලබා දුන් ආලෝකය තවමත් මා සමඟ ගමන් කරයි.

ජීවිතයේ ඇතැම් මිනිසුන් අපට මතක තබා ගැනීමට විශාල දේවල් කරන්නේ නැත. ඔවුහු අපට ආදරයෙන් කතා කරති, අපේ අඩුපාඩු ඉවසති, අප තුළ සැඟවී ඇති හැකියාවන් හඳුනා ගනිති. එහෙත් ඔවුන් කළ ඒ පුංචි දේවල් අපේ ජීවිතයේ විශාල වෙනසක් ඇති කරයි. මගේ ජීවිතයට එවැනි වෙනසක් කළේ කොළොන්න ජාතික පාසලත්, එහි පුස්තකාලයත්, මට මඟ පෙන්වූ ඒ ආදරණීය මිනිසුනුත් ය.

අද මම ආපසු හැරී බලන විට මට හැඟෙන්නේ, මගේ ජීවිතයේ කතාව ලියන්නට මට අකුරු කියා දුන්නේ පොත් පමණක් නොවන බවයි. ඒ පොත් අතරදී මට හමුවූ මිනිසුන් ද මගේ ජීවිතයේ කතාව ලිවීමට දායක වූහ. ඔවුන් මගේ අතට පොතක් දුන්නා පමණක් නොව, මගේ ජීවිතයට අරුතක් දුන්හ.

කොළොන්න ජාතික පාසලේ පුස්තකාලය මට අතීතයේ මතකයක් පමණක් නොවේ. එය මගේ ජීවිතයේ ආරම්භයක්, මගේ වෘත්තීය ගමනේ පදනමක් සහ මගේ හදවතේ සදාකාලිකව දැල්වෙන පහනකි. එදා මගේ ජීවිතයට ආලෝකය ලබා දුන් ඒ පහනේ ආලෝකය, අද තවත් කෙනෙකුගේ ජීවිතයට ලබා දීමට හැකි වීම මට ලැබුණු මහඟු භාග්‍යයක් ලෙස මම සලකමි.

සමහර විට අපට ලැබුණු උතුම්ම තෑග්ග පොතක් නොව, ඒ පොතේ වටිනාකම අපට කියා දුන් ආදරණීය මිනිසෙකු විය හැකිය.


SHORT
STORIES

වැලන්ටයින් ඩේ....

ගිවෝන් යාතිකා නන්දසේන

වරලත් පුස්තකාලයාධිපතිනී

ජාතික විගණන කාර්යාලය

රාජකාරිය දේවකාරිය කර ගත්ත කසුන්දරී නෝනා දවසක් උදැහැනැක්කේ හීන් පොද වැස්සෙම වැඩට යන්න පිටත් උණා. කසුන්දරී කිව්වට මේ නෝනගෙ ඇත්ත නම ඒක නෙමෙයි. කටට හුරු නැති අමුතු නමක් නිසා කට්ටියට එක පාර මතක හිටියෙ නැති උනත් සමාජ මාධ්‍යවල මේ නෝනා තරමක් ජනප්‍රියයි. ඒ එයා කවි ලියන නිසා. මේ කවි කියවන එයාගෙ යාලුවො මේ නෝනට කවිකාර සුන්දරී නොහොත් කසුන්දරී කියලා නමක් පටබැන්දා. එදා ඉඳන් මේ නම රෙජිස්ටර්.

මේ කියන දවසේ කසුන්දරී නෝනගෙ මහත්තයා වෙන වැඩකට ගිහින් තිබුණු නිසා එයාට වැඩට යන්න වුනේ බස් එකේ. ගෙයින් එළියට බැහැලා යන්න හදනකොටම කොල්ලෙක් පාර පැත්තෙන් තාප්පේ එල්ලිලා කසුන්දරීගෙ රෝස පදුරෙ පිපිලා තිබුණු ලොකුම රෝසමල් පොකුරක් කඩන්න හදනවා...



මල් හොරෙක්....

ඒයි ඔය මොකද කරන්නේ...

කසුන්දරී ඇහුවෙ තරමක් තරහින්.

නෑ ආන්ටි මං මේ මල් පොකුර කඩා ගන්නද..

ඒ පාර මේ කොල්ලා බොහොම යටහත් පහත්ව ඇහුවා..

පූජා කරන්නද....

හා එහෙනම් කඩාගන්නකෝ..

හරිම හොඳ දරුවෙක්..

තැන්කූ ආන්ටි..

කියන පරක්කුවෙන් මල් පොකුර කඩාගත්ත කොල්ලා පාරෙ ඇතින් ඉගිලෙන කොණ්ඩ කිරිල්ලියක් පිටිපස්සෙ හතිදාගෙන පියෑඹුවෙ කසුන්දරී

අන්ද මන්ද වෙලා බලා ඉඳිද්දී සිංදුවකුත් කියාගෙන....

මං ආදරෙයි මුලු ලොවටත් වඩා...

මා කාටවත් නෑ එලෙසින් කියා..

දැන් හැදෙන ළමයි නම් ඇත්තමයි..

තනියෙන් හිනා වෙවී කසුන්දරී හන්දිය පැත්තට ගැටුවා...

එයා බස් එකට නැගලා ඉඳගන්න තැනක් බැලුවාම ඉඳගන්න තිබුනෙ පිටිපස්සේ ශීට් එක විතරයි. ජනේලෙ අයිනෙ ඉස්කෝලෙ යන වයසෙ ජෝඩුවක් තුරුල් වෙලා ඉන්න හැටි දැක්කත් නොදැක්කා වගේ පැත්තකින් ඉඳගෙන එයාගෙ හෑන්ඩ් බෑග් එකෙන් පොතක් අරගන්තෙ නිවී සැනසිල්ලේ බස් එකෙන් බහිනකම් කියවන්න හිතාගෙන...

පොත් කියවන එකයි කවි ලියන එකයි තමා කසුන්දරීගෙ විනෝදාංශෙ..

පොතේ පළවෙනි පරිච්ඡේදෙ කියවන්න ගන්නකොටම බස් එකේ බෑල් වලින් කන්අඩි පුපුරණ සද්දෙට සිංදුවක් ඇහෙන්න පටන් ගත්තා.

පොඩි කාලේ මරඳ වැල්ලේ

වැලි බත් උයාපු කෙල්ලේ

වැලලී ගියා අතීතේ

කෝ බැන්ද ඕලු මාලේ..

හොඳ නම් කලාට කම් නෑ

මා නම් ප්‍රියේ තරහා නෑ

රුචිරානනී අහන්න

එක පාර මා මරන්න...

.....

නෙතු සලන සලන තිස්සෙම රාගිනි විසෙ පෙනුනා

මගෙ ලගට ලගට ගන්නම රන්කද මට හිතුනා

එක පෙලට පෙලට හීන හතක් අඩ නින්දෙ මැව්නා

ඉග තාලෙට පද්දලා හිත කොනිත්තනවද මැනිකා

මගෙ රෝස මලක් වගෙ කෙල්ලේ

අපෙ ආදරෙ දැන් ගිනි දැල්ලේ

තව ආසනම් ඉන්න නිදැල්ලේ

ඔයයි කිරිල්ලි මගෙ මෙ පුංචි කැදැල්ලේ

නිතඹ රන් උකුල සලා...

ඒ කට පාඩම් ගොඩ මට ආදරේ

අකුරු හතරටයි මන් කැදරේ

ලග පාත ඉදින්නකො අහක නොයා

බොරු පානිය නම් එපා රාගිනියේ..

එක දිගටම ඒ බස් එකේ මහ සද්දෙට ඇහුනෙ ඔය වගේ සිංදු..

මුන්ගේ මොළේ විකාර වෙලාද මේ වගේ සිංදු දාන්න මිනිස්සු වැඩට යන මේ උදේ පාන්දර..

ඕවා අහලා තමා සමහර මිනිස්සු බලහත්කාරකම් කරන්නේ...

පිහියෙන් අනින්නේ ..

සමනොල මුදුනේ සිරි පද සිඹ සිඹ

උදා ඉරක් පායයි...

සැනසිලි සුවදෙන නව මල් සුවඳින්

දැහැමි දැයක් පිපිදෙයි

ඉස්සර නම් උදේට ඇහුනෙ මේ වගේ හිත නිවන සිංදු.. ඒකටත් එක්ක දැන්..

හිතින් කුටු කුටු ගෑවත් කසුන්දරී ඒ කිසිම දෙයක් එලියට දැම්මේ නෑ. ඒත් එයා කියවන්න ගත්ත මාරි කොරලිගෙ තෙල්මා පොත ආපහු බෑග් එකට දාගත්තේ හිතේ නොසතුටින්..

වේගෙන් ගියපු බස් එක සුදු ඉර කපලා පොලීසියෙන් ඇල්ලුව නිසා යන්තම් ඒ ශබ්ද පූජාව නතර උනා.

ඒ අවු අස්සෙ එහා පැත්තෙ එකට ඇලිලා වගේ හිටපු කොල්ලයි කෙල්ලයි රණ්ඩු වෙන්න පටන් ගත්තා..

ඇයි දැන් තමුසෙ මං එක්ක ෆිල්ම් එකක් බලන්න යන්න බෑ කියන්නේ.

අද ක්ලාස් දවසක්නෙ අයියෙ ඒකට නොගියොත් පාඩම අල්ලගන්න බැරි වෙනවා...

අද වගේ දවසක ක්ලාස් කට් උනා කියල මොකක් වෙනවද ඕයි...අනික මං තමුසෙගෙ කොල්ලා... තමුසෙ දැනගන්න ඕන මං කියන දේ අහන්න..

අනේ අයියෙ අද අමාරුම පාඩමක් තියෙන්නේ..

උඹ ඔව්වර කෙදිරි ගන්නෙ ක්ලාස් එකේ ටික්කව බලන්න නේද.. ඌත් උඹට ලයින් කියලා මං දන්නවා..

ඔයාට පිස්සුද අයියේ මොනවද මේ කියවන්නේ...

ආයෙ ඌ එක්ක කතා කරලා අහුඋනොත් මං උඹව මරනවා දැනගනින්..

ඒක ඇහෙන කොට කසුන්දරීගෙ හිත ගැස්සුනා.. තමන්ගෙ අහිංසක දැරුවො මතක් උනා..

කොහේවත් නැති හිසරදයකුත් දැනුනා..

ඉවසන්න බැරි තැන ඒ මදාවි කොල්ලට මෙහෙම කිව්වා..

පුතා ඒ දරුවට පංතියට යන්න දෙන්න..

දෙමව්පියො තමන්ගෙ දරුවන්ට උගන්වන්න කොච්චර මහන්සි වෙනවද කියලා ඕගොල්ලො දන්නේ නෑ...

අනේ මේ අක්කේ පැත්තකට වෙලා ඉන්නවද අනුන්ගේ සීනි කිරන්නෙ නැතුව..

ඒ කොල්ලා කසුන්දරීට සැර උනා. කෙල්ල තාමත් කොල්ලගෙ අතේ එල්ලුණු ගමන්..

ඈ යකඩෝ.. දැන් කාලෙ හැදෙන උන්ට හොඳක් නරකක් කියා දෙන්න බෑනෙ..

පාඩුවෙ යන්නෙ නැතුව අනුන්ගේ ඒවට හොම්බ දානවට මටත් මේව හොඳ පාඩම්.. කසුන්දරී තමන්ටම හිතින් බැනගත්තා..

වෙනදට මහත්තය එක්ක වැඩට එනකොට අමරදේව මාස්ටර්ගේ හරි නන්දා මාලනීගෙ හරි සිංදුවක් අහ අහා තමා එන්නේ.. ඒ වෙලාවට දැනෙන හිකේ සැනසීම අද අහලකවත් නෑ.

හිස බර කරගෙන බිමට බැහැපු කසුන්දරී හෙමින් හෙමින් ඔෆිස් එක පැත්තට ගියා. ගේට්ටුවෙ හිටපු ආරක්ෂක නිලධාරියා කසුන්දරීට ආචාර කළා. ඔහුට පෙරලා සුබ පතපු කසුන්දරී පුස්තකාලෙ ඇතුලෙ එයාගෙ වීදුරු කුටියට යනකොටත් හැමදේම කලීන් කරලා මේසෙ උඩ වතුර වීදුරුවක් තියලා තිබුණා. එයාගෙ ගෝලයො උදේ පාන්දරින්ම වැඩ පටන් අරන්... පත්තර බලන තැනයි පොත් ගන්න තැනයි සෙනග රොක් වෙලා...

මේසෙට වාඩි වෙලා කසුන්දරී තමන්ගේ රාජකාරි වැඩ පටන් ගත්තා... උදේම දෙපාර්තමෙන්තු ප්‍රකාශනයක් කියවලා කමිටු අනුමැතියට දාන්න තිබුණා... ඊට පස්සේ සුභසාධක සංගමයේ වැඩ වගේකුත් කලා. දඩිබිඩියේ යුනියන් එකේ ඉන්විටේෂන් ටිකකුත් හදන ගමන් මූණු පොතේ කවියකුත් කොටාගෙන ගියා. ආ තව පත්තර ටිකයි කතා ටිකයි ඩවුන්ලෝඩ් කරලා පුස්තකාල සමූහයට දැම්මා. අත් දහයක විතර වැඩ කසුන්දරී කළේ බොහොම සීරු මාරුවට හිත සතුටින්.. උදේ 10.30 වෙද්දී සරිත් ආවා කසූගෙ තේකත් අරන්.

මෙන්න මිස්ගෙ තේක..

ආ ඔහොම තියන්න සරිත්.. මොකෝ මේ මූණත් එක්ක කලුවෙලා. ඔයා ඊයෙ මට කියලා කවියකුත් ලියාගත්තනෙ තෑගි දෙන්න ගත්තු පොත ඇතුලට දාලා යාලු ගෑණු ළමයට දෙන්න කියලා වැලන්ටයින් ඩේ එකට..

අනේ වැඩක් නෑ මිස්.. මං අද උදේ බස් එකේදි ඒ පොත ඊශාට දුන්නා. ඒත් එයා ඒක ගත්තේ අදිමදි කරලා.. එයා මං වගේ පොත් ගුල්ලෙක් නෙමයි කිව්වා..

පුදුමයි පොත්වලට කැමති නෑ කිව්වම. ඉතිඃ මොනවටද එයා කැමති..

ෆිල්ම් බලන්නලු..

එහෙනම් දෙන්නා එක්ක හවස ගිහින් ෆිල්ම් එකක් බලන්න.. ඒක හරි යන්නේ නෑ මිස්...

ඒ මොකද...?

ඊශා හරිම සෙල්ලක්කාරයි .. මං එයාට දීපු තෑග්ග ඊට පැය භාගෙකට පස්සෙ පහල ස්ටෝර්ස් වල වරුණයට දීලා. මගේ වෙද අත් අකුරු අඳුරන නිසා ඌ ඒක මට ආපහු ගෙනත් දුන්නේ කිණ්ඩියට හිනා වෙලා..

සරිත් ඒක කියනකොට කසුන්දරීට හිචිස් ගාලා හිනා ගියා....

ඒ ගමන මිසුත් මට හිනාවෙනවා..

අනේ නෑ.. කොහොමහරි ඒ පොත වටේ ගිහින් ආපහු අයිතිකාරයා අතටම ආවනෙ.. පොතක් උනත් දෙන්න ඕන ඒකෙ වටිනාකමක් දන්න කෙනෙකුට

මට එහෙම කෙනෙක් කවදාවත් ලැබෙන එකක් නෑ මිස්..

ඇයි නැත්තේ අපේ ඩිවිෂන් එකේම නිකිණි. එයත් ඔයා වගේම පොත් කියවන කෙනෙක්.. අනික ඒ කෙල්ල සරිත්ට කැමතියි කියලා හොඳටම පේනවා..

මට එහෙම එකක් දැනිලා නෑ මිස්...

ඔයා පහුගිය කාලෙ ඊශා පස්සෙ තේරුමක් නැතුව දුවපු නිසා ලග හිටපු නිකිණිගෙ ආදරේ ඔයාට පෙනුනෙ නෑ..

නිකිණි මට කැමති වෙන එකක් නෑ මිස්..

කැමතිද නැද්ද කියලා බලන්න ඔයා ඔය පොත ඒ ළමයට දෙන්න.

අනික වැලන්ටයින් ඩේ කියලා ආදරේ එක දවසකට කොටු කරන්න හදන්න එපා. ආදරේ කරනවා නම් මුලු ජීවිත කාලෙම ආදරේ කරන්න. ඉතිං ඒ වැලන්ටයින් දවසෙ කසුන්දරීගෙ ලස්සන කවිය සරිත්ගෙ අත් අකුරින් ලියලා ඇතුලට දාපු සත්වෙනි සඳේ රෑ පොත සරිත් නිකිණි දුන්නා. ඒක කියවලා එදා හවසම නිකිණි සරිත්ට කැමැත්ත දුන්නා.. ඉතිං යාලුවනේ පහලින් තියෙන්නේ කසූ ලියපු ඒ කවි ටික

❄️වැහි පිරිත නුඹ 🌧️

රැල්ල වෙරළට පැමිණ හනිකට
වෙරළ සිපගෙන ගනී තුරුලට
හිරුගෙ රැස් මාලාව අඩුකොට
හෙමි හෙමින් දැන් ඇදෙයි අවරට

සඳ කිනිත්තක් අහස් කොන සිට
අත වනයි පොඩි තරු පොකුරකට
වැහි ලිහිණි ඊ ගසක වේගෙට
පියඹලා යයි තම කැදැල්ලට

ඔය සිනා මල් රැගෙන දෝතට
සිත නිවාගමි මද ඇසිල්ලට
සසර පැතුමන් පුරා එක්කොට
උර තලේ දෙමි විඩා නිවුමට

සෙනෙහසේ දිය මුදාහැරුමට
වැහි පිරිත වී වඩින් දිවියට
අගුලු ලා ගමි හදේ සිරකොට
අපට අප හිමි වෙනා දිනයට

පුණ්‍යකර්මය

ඩී රොෂානි ලක්මිනී විජේනන්ද

Department of Library and Information Science Faculty of Social Science

University of Kelaniya

උදෑසනම මා අවදි වූයේ කිරීමට සිතාගත් වැදගත් කාර්යය සිහි වූ නිසාය. වෙනදා මෙන් තේ කෝප්පය රැගෙන කාමරය වෙත පැමිණි අම්මාටද මාගේ මේ හැසිරීම පුදුමයක් විය. ඉක්මනින් හැඳ පැළඳගත් මා නිවසින් බැහැරව ප්‍රධාන පාරට පිවිසුනෙමි. සෙනග මදක් අඩු බස් රථයකට නැග ගත් මම ජනෙල් කවුළු අසල ආසනයක අසුන් ගතිමි. ජනෙල් කවුළුවෙන් පැමිනියේ ලා හිරු රශ්මියක් වුවද එහි උණුසුම ගතට දැඩිව දැනුනු නමුත් සිතට දැනුන දොම්නස එයට වඩා දැඩි විය. ඒ කිසිවක් නිසා නොව ගමේ අම්මා අප අතරින් සමුගෙන අදට වසර පහක් ඉක්මවා ගොස් ඇති බැවිනි. වෙනත් ළමයි අත්තම්මා නැතිනම් කිරිඅම්මා යන නාමයෙන් හඳුන්වන නමුත් මාත්, අයියාත්, අක්කාත් පුරුදු වී සිටියේ අම්මාගේ අම්මා "ගමේ අම්මා" යන නමින් හැඳින්වීමටය. එය මාගේ අයියා විසින් ගොඩනගන ලද්දක් බව මම පසුව දැන ගතිමි. ගමේ අම්මත් සමඟ අපේ ජීවිතයේ සුන්දර අත්දැකීම් ගොන්නක් පවතී. නමුත් ඇයත්, මාත් අතර පැවති සම්බන්ධය පිළිබඳව සිහිකිරීමේදී නම් මුවගට සිනහවක් නැගෙනු නොඅනුමානය. ගමේ අම්මාත්, මාත් නිතරම සණ්ඩු වෙන දෙදෙනෙකි. ඒ ඇයගේත් මගේත් දැනුම පරීක්ෂාවට ලක්කිරීමට යාමේදී ඇතිවන්නකි. විටෙක බුදු දහම පිළිබඳව විවිධ මතවාද ඇය ඉදිරිපත් කරන අතර ඒ සඳහා ගොඩනැගෙන මාගේ මතවාදත් සමඟ අපි දෙදෙනා බොහෝ වෙලාවකට සණ්ඩු ඇතිකර ගත්තෙමු. නමුත් ඇය කෙරෙහි මාගේත්, මා කෙරෙහි ඇයගේත් පැවති සෙනෙහසෙහි කිසිදු අඩුවක් නොවීය. දැනුමෙහි පරස්පරතාවයන්ට අමතරව අපි දෙදෙනා මාගේ වරලස නිසාද යම් යම් බහින්බස්වීම් ඇති කර ගත්තෙමු. මම තෙවන වසරේ සිට මගේ කොණ්ඩය වර්ධනය කර ගැනීම සඳහා උත්සාහ ගත් අයෙක්මි. එනිසා සිව් වසරක් පමණ වන විට දණහිස දක්වා පමණ ඇති වරලසකට හිමිකාරියක් වීමට මම වරම් ලදිමි. උදෑසන පාසල් යාම සඳහා අම්මා මාගේ කොණ්ඩය කැරලි දෙකක් සිටින සේ ගොතන සෑම අවස්ථාවකම ඒ දෙස බලා සිටින ගමේ අම්මා "ඔය කොණ්ඩේ කපන්න සුදු උරහිස ළඟට වෙනකම්, එතකොට හොඳ ඝනකමට කොන්ඩේ වවා ගන්න පුළුවන්" යැයි ඇය අප නිවසේ නතර වී සිටින සෑම කාලයක් තුළම නිරන්තරයෙන්ම පැවසුවාය. ඒ අවස්ථාවේදී අප දෙදෙනාගේ සණ්ඩුව නවතින්නේ මා පාසල වෙත නික්මුණාට පසුවය.

කොපමණ වයස්ගත වුවත් ගමේ අම්මාට කිලෝ මීටර් ගණනාවක් දුර බස් රථයක යාමටත්, පයින් ඇවිදීමටත් සෑහෙන තරමක ශක්තියක් තිබිණි. කාලයත් සමඟ වසර කිහිපයක් ගෙවී ගිය අතර, ගමේ අම්මා තුළ වූ ඒ ශක්තිය ක්‍රම ක්‍රමයෙන් අඩුවීමට ඇගේ අසනීප තත්වය හේතුවක් විය. ඇයට තිබූ විශාලම ගැටළුව වූයේ ආහාර ගැනීමේ අපහසුතාවයි. කුමන ආහාරයක් ගත්තද, එය ඇගේ උගුරෙන් පහළට නොයෑම අපහට මහත් ගැටලුකාරී තත්ත්වයක් විය. නිතරම උගුරේ යම් දෙයක් සිරවී ඇතැයි ඇය නිතරම

පැවසුවාය. වෛද්‍ය පරීක්ෂණවලින් පසුව හෙළි වූයේ ඇයට ලෝකයේ දරුණුම ලෙඩක් වන පිළිකාව යන රෝගය වැලඳී ඇති බවයි. පිළිකා මාරයා විසින් ඇයගේ අක්මාව, මහාඅන්ත්‍රය, කුඩාඅන්ත්‍රය හරහා එය ගලනාලය දක්වා පැතිර ගොස් ඇති බව වෛද්‍යවරු පැවසූහ. පිළිකාව ඇය තුළ ඇති බව අප සියලු දෙනාම දැන සිටි නමුත් ඇයට කිසිවක් නොකීමට අප තීරණය කළ අතර, දිනක් ඇය අපට ලොකු මාමාගේ දුරකථනය හරහා ඇමතුමක් ලබා දුන් අතර එයට මාගේ තාත්තා ප්‍රතිචාර දැක්වූයේය. ඒ අන් කිසිවක් නිසා නොව ඇයගෙන් සඟවා සිටින රෝගය කුමක්දැයි ඇයට පැවසීමට අපහට හැකියාවක් නොමැති නිසාය. නමුත් මේ රෝගී කාරක මාරයාට ප්‍රතිකාරයක් සොයාගෙන නොමැති නිසාත්, ගමේ අම්මාගේ ශරීරය පිළිකා මාරයා සම්පූර්ණයෙන්ම අත්පත් කරගෙන සිටින නිසාත්, එය සිහි වී ගමේ අම්මාගේ කටහඬ ඇසෙන විට මගේත්, අම්මාගේත් කඳුළු නවතාගත නොහැකි තරමට සිහින් හැඬුම් හඬක් සමග ගලා ගියෝය.

ගමේ අම්මාගේ ප්‍රතිකර්ම ආරම්භ විය. ඇයට එන්නත් කරන බෙහෙත්වල වේදනාව කොපමණ දැයි ඇය අම්මා සමග පවසා තිබුණාය. "පුතේ ඒ බෙහෙත් එක හරියටම නහරයට තියලා තමයි විඳින්නේ. මට එන වේදනාව දරා ගන්න අමාරුයි. කොන්දෙන් පුදුම වේදනාවක් එන්නේ දරුවෝ" ගමේ අම්මා එසේ පැවසූ බව අම්මා ගෙදර විත් කඳුළු සලමින් අප හට පවසා ඇති වාර අප්‍රමාණය. ප්‍රතිකාර අවසන් වූ විට ගමේ අම්මා බැලීමට මාත්, අම්මාත්, තාත්තාත් අම්මාගේ ගමේ ගිය දවසක ගමේ අම්මා රාජඅල තැම්බූ පිඟානක් රැගෙන ලොකු මාමාගේ නිවසේ සිට චූටි මාමාගේ නිවසට පයින් ඇවිදගෙන එන දුටු මම,

"අනේ ගමේ අම්මාට දැන් කිසිම ලෙඩක් නැනේ" කියා පැවසුවෙමි. එදින මා බොහෝ සෙයින් සතුටු අතර, එදින රාත්‍රියේ අම්මාත්, මමත් ගමේ අම්මා සමග නතරවී රාත්‍රිය ගත කළෝය. ගමේ අම්මා තරුණ කාලයේ සිට දිගු වරලසක හිමිකාරියක් වූ අතර ගමේ අම්මාට දැන් පවතින වරලස කුඩා බෝංචි කරලකට සමාන කළ හැකි විය. මම ගමේ අම්මාගේ පුංචි වරස හොඳින් පීරා තෙල් ගා ගෙතුවෙමි. ගමේ අම්මාට නැවත රෝහල් ගතවීමට සිදු වූයේ රෝගී තත්ත්වය උත්සන්න වීමත් සමගය. නමුත් වෛද්‍යවරු අම්මාට පවසා තිබුණේ ගමේ අම්මාව නිවසට රැගෙන ගොස් හොඳින් බලා ගන්නා ලෙසය. රෝහලින් පැමිණි පසු නැවත මම අම්මාත් සමග ගමේ අම්මා බැලීමට ගියෙමි. ගමේ අම්මා වැතිරී සිටින ආකාරය දුටු විට එක්තරා පන්සලකට ගිය විට පිළිකුල් භාවනාව වැඩීමට සඳහා ගෙනවිත් තිබූ මිනිස් ඇටසැකිල්ලේ ස්වරූපය ගමේ අම්මා වෙතින් මා හට දිස්විය. ටික දිනකට කලින් හොඳින් ඇවිදිමින් සිටි ගමේ අම්මාගේ ශරීරය ක්‍රම ක්‍රමයෙන් දිරා පත්වෙමින් තිබුණි. පසුදින අම්මා තනිවම ගමේ අම්මා බැලීමට ගිය අතර එදින දහවල් අම්මා මට දුරකථන ඇමතුමක් ලබාදෙමින් මගේ ජීවිතේ මෙතෙක් ඇසූ දුක්බරම වචන කිහිපය පැවසුවාය. "ගමේ අම්මා අපිව දාලා ගියා පුතේ."

ගමේ අම්මාගේ මතකයන් සිහිකරමින් මම අවශ්‍ය ගමනාන්තය වෙත පැමිණ තිබුණු අතර ඉක්මනින් බසයෙන් බැසගත් මා සැලොන් එක වෙත පිය නැගුවමි. සැලොන් අක්කා බුදු පහන අසල සිටි නිසාවෙන් ඇය තම රාජකාරී ආරම්භ කර ඇත්තේ ඒ මොහොතේ බව මම දැනගතෙමි. දැනටමත් දණ හිසෙන් පහළට මා සතුව ඇති වරලසට සමුදීමට සිත එක්තැන් කරගෙන සැලොන් අක්කාට ඇගේ කාර්යය ඉටු කිරීමට මම ඉඩ සැලැස්වුවෙමි. ඇය ප්‍රවේශමෙන් මගේ වරලස කොටස් කිහිපයකට බෙදා ඒ කොටස් කපා මා අතට දුන්නාය. ගමේ අම්මා වෙනුවෙන් මා හට සිදු කිරීමට හැකි පුණ්‍යකර්මය මෙයයි සිතමින් මගේ අතට ගත් මගේ වරලසේ කොටස් කිහිපය ප්‍රවේශමෙන් විනිවිද පෙනෙන බෑගයකට දමා පිළිකා රෝගීන්ගේ හිසකෙස් වෙනුවෙන් ලබා දීමට මම තැපැල් කන්තෝරුව වෙත පිය නැගූ අතර, එය තැපැල්කර නැවත නිවසට පැමිණෙන විට ගමේ අම්මා නිතරම පවසන වචන කීපයක් මගේ සිතට නැගුණි. "පුතේ මේ ලෝකේ සියල්ලම අනිත්‍යයයි."




BOOK
TALK

Book Review on Clinical Medical Librarianship

ග්‍රන්ථ විචාරය - සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය

සකුන්තලා සෙනෙවිරත්න

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති


රුහුණ විශ්වවිද්‍යාලය

කර්තෘ: ප්‍රියංකා දිල්හානි මුණසිංහ

ප්‍රකාශනය: Nine Publishing

ISBN: 978-624-5717-42-2

මිල: රු. 1800.00



“සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය” නම් කෘතිය වෛද්‍ය ක්ෂේත්‍රය හා පුස්තකාල හා තොරතුරු විද්‍යාව අතර ඇති අන්තර් සම්බන්ධය ගැඹුරින් විමර්ශනය කරන කෘතියක් ලෙස පෙන්වාදිය හැකිය. දිල්හානි මුණසිංහ මහත්මිය විසින් රචිත මෙම කෘතිය මෙරට පුස්තකාල හා තොරතුරු විද්‍යා ග්‍රන්ථ සාහිත්‍යයේ ප්‍රථම කෘතිය ලෙස ද විශේෂ වැදගත්කමක් දරයි. නවීන සෞඛ්‍ය සේවා පද්ධති තුළ කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් උදෙසා තොරතුරුවල අවශ්‍යතාව, සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිගේ භූමිකාව හා කාර්යභාරය, වෘත්තීය කුසලතා හා ආචාර ධර්ම පිළිබඳව විග්‍රහ කිරීම මෙම කෘතියේ ප්‍රධාන අරමුණ ලෙස පෙන්වා දිය හැකිය.

මෙම කෘතියේ ව්‍යුහය (Structure) විමර්ශනය කළ විට, එය ක්‍රමවත් සහ තර්ක සහගත ආකාරයෙන් සංවිධානය කර ඇති බව පැහැදිලිය. ආරම්භක පරිච්ඡේදවල සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ මූලික සංකල්ප, එහි ඉතිහාසය සහ වර්ධනය පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරයි. මෙම පදනම් විස්තර පාඨකයාට විෂය ක්ෂේත්‍රය පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබාදීමට උපකාරී වේ. එමෙන්ම පසුව ඉදිරිපත් වන සංකීර්ණ කරුණු විග්‍රහ කිරීමට අවශ්‍ය න්‍යායික පසුබිමද මෙහි සපයයි. අවශ්‍ය මොහොතේදී සායනික වෛද්‍යවරුන්ට කාලෝචිත, ගුණාත්මක පිරිපහදු කල තොරතුරු ලබා දීමෙන්

අධ්‍යාපනයට සහායවීම සඳහා සායනික පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරය සුලුපටු නොවන බව පළමු පරිච්ඡේදය තුළ දීර්ඝව සාකච්ඡාවට බඳුන්කොට ඇත. විශේෂඥ ගවේෂකයකු ලෙසත්, මනා සන්නිවේදකයකු ලෙසත්, ගුරුවරයකු මෙන්ම උපදේශකවරයකු ලෙසත්, සහයෝගිතාකරුවෙකු මෙන්ම අන්තර්ගත කළමනාකරුවෙකු ලෙසත් සිය භූමිකාව විග්‍රහ කිරීමට කතුවරිය සමත් වී ඇත.

තවද, මෙම කෘතියේ මධ්‍ය කොටස්වල විශේෂ අවධානයක් යොමු කර ඇති අංශයක් වන්නේ සෞඛ්‍ය හා වෛද්‍ය වෘත්තිකයන්ගේ තොරතුරු අවශ්‍යතා විමර්ශනය කිරීමයි. අසීමිත වූ තොරතුරු සමුදායකින් නිවරදිම තොරතුරු වෙත පාඨකයා යොමු කිරීම සුළු පටු කාර්යයක් නොවේ. ඒ සඳහා පුස්තකාලයාධිපතිවරයා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමේ සාක්ෂරතාවයෙන් ඔබ්බට ගොස් තොරතුරු සාක්ෂරතාවයෙහිද ප්‍රවීණයෙකු විය යුතුය. එය සායනික හා වෛද්‍ය පුස්තකාල වෘත්තිය තුළ වඩා වැදගත් වන්නේ රෝගී සත්කාරක තොරතුරු සැපයීම ප්‍රාණ ජීවියකු උදෙසා කරන ගණුදෙනුවක් නිසාය.

සාක්ෂි මත පදනම් කරගත් (Evidence-based practice) වෛද්‍ය විද්‍යාවට අදාළ වූ තොරතුරු සපයන ක්‍රියාවලිය පිළිබඳවද මෙම කෘතිය තුළ ගැඹුරු විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. වෛද්‍ය ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේදී විද්‍යාත්මක සාක්ෂි හා පර්යේෂණ සොයා ගැනීම් භාවිතා කිරීම අත්‍යවශ්‍ය වන අතර එම ක්‍රියාවලියට පුස්තකාලයාධිපතිවරුන්ගේ දායකත්වය මෙම කෘතියෙන් පැහැදිලි කරයි. මෙය සාම්ප්‍රදායික පුස්තකාල භූමිකාවන්ට වඩා ඉදිරියට ගොස් සෘජුවම රෝගී සත්කාරයට දායක වන වෘත්තීය භූමිකාවක් ලෙස සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය හඳුන්වා දෙයි.

මෙම කෘතියේ අන්තර්ගතය සම්බන්ධයෙන් තවත් වැදගත් පැතිකඩක් කතුවරිය විසින් ආවරණය කර ඇත. සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය හා බැදි ආකල්ප සංවර්ධනය මෙන්ම ඔවුන් සතුව තිබිය යුතු කුසලතා පිළිබඳ කරුණු රාශියක් පෙළගස්වා ඇත. තම වෘත්තීය කුසලතාවන්හි වර්ධනය කර ගත යුතු විශේෂ කුසලතා පිළිබඳ පැහැදිලි විග්‍රහයක් කර ඇත. ඒ අනුව සාමාන්‍ය වෛද්‍ය දැනුම හා ඒ සම්බන්ධ කුසලතා (Medicine related Skills), සාමාන්‍ය කුසලතා (General Skills), වෘත්තීය සායනික පුස්තකාලයාධිපතිත්ව කුසලතා (Professional Clinical Librarianship Skills) යටතේ හැකියා කුසලතාවයන් පිළිබඳ විස්තරාත්මකව කරුණු දක්වා ඇත.

ඕනෑම වෘත්තියක ඉදිරි ප්‍රගමනයට ආචාර ධර්ම පද්ධතියක් ඉතාම වැදගත් වේ. සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වයේ ආචාර ධර්ම පිළිබඳ මෙම කෘතියට එක්කොට තිබීම මෙහි අගය වඩාත් පුළුල් කරයි. තවද සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය තුළ මුහුණදෙන ගැටලු, අභියෝග හා ඉදිරි සංවර්ධනයන් පිළිබඳව ද අවධානය යොමු කොට ඇත.

මෙම කෘතියෙහි තවත් සුවිශේෂී පරිච්ඡේදයක් කතුවරිය විසින් ආවරණය කර ඇත. ඒ සෞඛ්‍ය සාක්ෂරතාවය පිළිබඳවයි. පුද්ගලයෙකුට තම සෞඛ්‍ය පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට, සෞඛ්‍ය තොරතුරු තේරුම් ගැනීමට හා භාවිතා කිරීමට හැකියාව තිබිය යුතුය. ඒ අනුව සෞඛ්‍ය සාක්ෂරතාවය වර්තමානයේ සෑම පුද්ගලයකු සතුවම තිබිය යුතු කුසලතාවයක් විය යුතුය. ලෝක සන්දර්භය තුල බොහෝ ජනතාව මේ පිළිබඳ දැනුවත් වුවද ශ්‍රී ලංකාවේ ජනතාව අතර සෞඛ්‍ය සාක්ෂරතාව පිළිබඳ ඇත්තේ මන්දගාමී අවධානයකි. එබැවින් මෙම කෘත්යේ දිගුවක් ලෙස සෞඛ්‍ය සාක්ෂරතාවය පිළිබඳ නව කෘතියක අවධානය යොමු කිරීමට කතුවරියට යෝජනා කරමි.

මෙම කෘතියේ ශක්තිමත් අංග කිහිපයක් හඳුනාගත හැක. පළමුව, එහි විද්‍යාත්මක ගැඹුර (Academic rigor) ඉහළ මට්ටමක පවතී. විෂය කරුණු න්‍යායික සහ ප්‍රායෝගික දෙපාර්ශවයන්ම ආවරණය කරමින් ඉදිරිපත් කර ඇති බැවින්, පාඨකයාට සම්පූර්ණ අවබෝධයක් ලබාගැනීමට හැකි වේ. දෙවනුව, කෘතියේ ව්‍යුහය පැහැදිලි සහ තර්ක සහගත වන අතර, එය කියවීමට පහසුකමක් සපයයි. තෙවනුව, වෘත්තීය දෘෂ්ටිකෝණයෙන් ලියා ඇති නිසා මෙම කෘතිය වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ට සහ සිසුන්ට ප්‍රයෝජනවත් වේ.

තවද මෙම ග්‍රන්ථය ලිවීම සඳහා කතුවරිය විසින් වෛද්‍ය හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ලියවී ඇති සාහිත්‍ය මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් භාවිත කර ඇති අතර අවශ්‍ය තොරතුරු වැඩි දුරටත් පැහැදිලි කිරීම සඳහා රූප සටහන් හා වගු ඇසුරින් දක්වා තිබීම විශේෂත්වයකි. එය කෘතියේ ශාස්ත්‍රීයභාවය තවත් ඔපවත් කරන්නකි. එමෙන්ම මෙම ග්‍රන්ථයේ කතුවරිය ද සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිවරියක ලෙසත්, එම ක්ෂේත්‍රයේම පර්යේෂිකාවක ලෙසත් වසර ගණනාවක කාලයක් ලබා ගත් දැනුම හා ප්‍රායෝගික අත්දැකීම් පාදක කර තිබීම කෘතියේ වටිනාකම පුළුල් කරයි.

මෙම කෘතිය තුළ නවතම තාක්ෂණික ප්‍රවණතා (Emerging Technologies) පිළිබඳ සාකච්ඡාවකට අවධානය යොමු වූයේ නම්, එය වඩාත් සම්පූර්ණ කෘතියක් වනු ඇත. උදාහරණයක් ලෙස, Artificial Intelligence, Digital Health Platforms වැනි නවීන තාක්ෂණයන් වෛද්‍ය පුස්තකාල සේවාවන්ට ඇති බලපෑම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම සුදුසු වේ.

කෙසේ වෙතත් සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වය කෘතියේ සමස්ත වටිනාකම ඉතා ඉහළය. එය නවීන සෞඛ්‍ය සේවා පද්ධති තුළ පුස්තකාලයාධිපතිවරුන්ගේ භූමිකාව විස්තරාත්මකව විග්‍රහ කරන අතර, වෘත්තීය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදෙයි. විශේෂයෙන්ම Evidence-based

Healthcare ක්‍රියාවලිය තුළ පුස්තකාලයාධිපතිවරුන්ගේ දායකත්වය වටහාගැනීමට මෙම කෘතිය ඉතා වැදගත් වේ.

සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට, පර්යේෂකයන්ට, අධ්‍යාපනඥයන්ට, ශිෂ්‍යයන්ට මෙන්ම මහජනතාවට සෞඛ්‍ය ආරක්ෂණ, පර්යේෂණ හා පුහුණුවීම්, විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව පිළිබඳ දැනුම තොරතුරු පහසුවෙන් ලබාදීමෙහි ලා සායනික වෛද්‍ය පුස්තකාලයාධිපතිත්වයේ භූමිකාව සුළු පටු නොවේ. අවසානයේ මෙම කෘතිය පුස්තකාල හා තොරතුරු විද්‍යා සිසුන්ට, වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන්ට, සහ වෛද්‍ය තොරතුරු කළමනාකරණය පිළිබඳ උනන්දුවක් ඇති පර්යේෂකයන්ට ඉතා වැදගත් ග්‍රන්ථයක් ලෙස පෙන්වා දිය හැක.

ග්‍රන්ථ විචාර දෙකක්

උදිත අලහකෝන්

Senior Assitant Librarian

NILIS, University of Colombo

අරුණෝදයේ හැන්දෑව



දකුණු ආසියානු කාන්තාවගේ සිතීම සහ චර්යාව බොහෝදුරට සංස්කෘතිය හා සම්ප්‍රදාය මගින් රාමුගත කෙරේ. මේ අනුව ස්වාධීන සිතීමක් සඳහා ස්ත්‍රියට පවත්නා අවකාශය අතිශයින් සීමිතය. එම රාමුවට අභියෝග කරන හෝ එය බිඳ දැමීමට තැත් කරන්නිය එක්කෝ විසේකාරියකි නැතහොත් නැට්ටිච්චියකි. සාම්ප්‍රදායිකත්වය පමණට වඩා කරපින්නා ගත් සමාජයකට එවන් චරිතවල ක්‍රියාකාරිත්වය දරාගැනීම දුෂ්කරය. මෙම චරිතය ගැමි ස්ත්‍රියක් වනවිට සහ අධිමාත්‍රාමය සරාගයකින් යුත් ස්ත්‍රියක් වනවිට මෙකී දරාගැනීමේ නොහැකියාව දෙගුණ තෙගුණ වේ. මෙවන් චරිතයක් තේමා කරගනිමින් රචිත රූපා ශ්‍රියානි ඒකනායකගේ අරුණෝදයේ හැනදෑව නවකතාව ලාංකීය සමාජයේ මේ මොහොතට අදාළ සංස්කෘතික කතිකාව පෝෂණය කිරීමට සහාය වන කෘතියකි.

මෙහි ප්‍රධාන චරිතය සේමානිය.ඇය ගම නැමති සාමාන්‍ය තුළ සිටින විශේෂයකි. ඇගේ රූපසොබාව ගමේ අනෙකුත් කාන්තාවන්ට වඩා ආකර්ෂණීය ය. ඇගේ නමද (සේමානි දෙපදී) සාමාන්‍ය ගැමි යුවතියකගේ නමට වඩා වෙනස්ය. ඇගේ උපත පිළිබඳ කයිකතන්දර ද අසාමාන්‍ය ය. ඇගේ සරාගික චර්යාව ද සාමාන්‍ය අබිබවා යයි. ගමේ පාසලට නගරයේ සිට පැමිණෙන ඉංග්‍රීසි ගුරුවරයා වන මධුර සර්ටද ඇය විශේෂයකි.පසු කාලයකදී ඇ වෙසෙන අබිසාරිකා මැදුර තුළ ද ඇය විශේෂයකි. එහිදී ඇයට මුණගැසී විවාහ වන ජේම්ස් නම් විදේශිකයාටද ඇය විශේෂයකි. මෙලෙස සේමානි, මධුර සර්, ජේම්ස් සහ තවත් අවශේෂ චරිත කිහිපයක් මුහුණ දෙන අත්දැකීම් ඇසුරෙන් කතුවරිය මෙහි කතාපුවත ගොඩනංවයි.

බහුකථක ආඛ්‍යාන රටාවක් ඔස්සේ කතාපුවත ගලා යයි. ප්‍රධාන කථකයන් දෙදෙනා වන්නේ සේමානි සහ මධුර සර්ය. මෙම බහුකථක ආඛ්‍යානය තුළ අතීතය සහ වර්තමානය අන්තර්ඡේදනය වේ. සේමානි සහ ජේම්ස් වර්තමානයේ වාසය කරන්නේ ඔස්ට්‍රේලියාවේය. අතීත සංසිද්ධි ජේම්ස් විසින් රචනා කරනු ලබන ඔහුගේ අලුත්ම නවකතාවේ අන්තර්ගත තොරතුරු ලෙස ඉදිරිපත් කෙරේ. මධුර සර් ජේම්ස් වෙත යවනු ලබන ඊමේල් හරහා මෙන්ම සේමානි සමඟ ඔහු කරන කතාබහ හරහා ද අතීතය නිරාවරණය වේ. සේමානි සහ මධුර සර්ගේ කතාව වෙත ජේම්ස් නම් අනෙකා හෙලන බැල්ම පාඨකයාට පුළුල් පරිකල්පන අවකාශයක් විවර කරයි. එම අවකාශය තුළ ප්‍රතිවිරෝධතා බහුල යථාර්ථයත් මිනිසුන්ගේ ආත්මාර්ථකාමී මෙන්ම පරාර්ථකාමී චර්යාවත් සරාගිකත්වයේ මහිමය , උරුමය සහ කරුමයත් ගැමි පාරිශුද්ධත්වයේ මිථ්‍යාවත් මාත්සර්යයේ හෙවත් ලිංගික ඊර්ෂ්‍යාවේ ස්වභාවයත් පාඨකයාට අභිමුඛ කිරීමට කතුවරිය පියවර ගනී.

අපගේ අවධානයට ලක්විය යුත්තේ අරුණෝදයේ හැන්දෑව මගින් රූපා ශ්‍රියානි ඒකනායක මතුකරන සංස්කෘතික කතිකාව ය. විශේෂයෙන් සංස්කෘතිය යනු ඝනීභූත වූවක් යැයි අදහන පැලෝපීය කල්පි තවමත් හොල්මන් කරන වර්තමානය පියමං කිරීමට මෙම කතිකාවේ අදාළත්වය අපමණය. ස්ත්‍රිය පිළිබඳ සංස්කෘතික කතිකාව මෙරට තුළ තවමත් පවතිනුයේ ප්‍රාථමික තලයක බව ව්‍යවස්ථාදායකයේ සිට සමාජ මාධ්‍ය දක්වා දිගහැරෙන ජවනිකාවලින් මනාව පැහැදිලි වේ. ස්ත්‍රියට තමන්ගේම වූ පෞරුෂයක් සහ අනන්‍යතාවක් ගොඩනංවා ගැනීමේදී පිරිමි සිතීම මෙන්ම චර්යාව ද බාධකයක් ලෙස ක්‍රියාකරන බව නොරහසකි. මධුර සර් ඉදිරිගාමී චින්තනයක් සහිත අයෙකු වුවද ඔහුගේ වයස සහ වෘත්තිය සේමානි මත අධිපතිවාදී ලෙස කටයුතු කරන අවස්ථා ද නැතුවා නොවේ. ජේම්ස්ගේ ක්‍රියාකාරිත්වය තුළ ද එවන් ලක්ෂණ පවතී. විටෙක ඔහු සේමානි වෙත දයාර්ද්‍ර බවක් පෙන්වන අතර තවත් විටෙක තම නවකතාවේ සාර්ථකත්වය සඳහා ඇය ප්‍රාණඇපයට ගනී.

ආර්ථිකය සහ තාක්ෂණය යම්තාක් දුරකට නවීකරණය වුවද මෙම සමාජයේ බහුතරයක් තවමත් සංස්කෘතිය, සම්ප්‍රදාය මෙන්ම සදාචාරය වෙත දක්වන්නේ අනියත භීතිකාවකි. අරුණෝදයේ හැන්දෑව මෙකී තත්ත්වය සමතික්‍රමණය කිරීමට අවැසි කතිකාමය අවකාශයක් පාඨක ලෝකයට විවර කරයි. පාඨකයා සංස්කෘතිය පිළිබඳ රේඛීය චින්තනයක සිට චක්‍රීය සිතීමකට යොමු කිරීමට එවන් අවකාශයක් පැවතීම අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ.-

බීබී



අප යථාර්ථය යැයි සිතන දෙය ප්‍රබන්ධයක් විය නොහැකි ද? අනෙක් අතට ප්‍රබන්ධය යථාර්ථය විය නොහැකි ද? නැතහොත් යථාර්ථය හා ප්‍රබන්ධය එකක්ම විය නොහැකි ද? එහෙයින් අප යථාර්ථය අවබෝධ කරගැනීමට යාමේදී නැවතත් ඇද වැටෙන්නේ ප්‍රබන්ධයේ ලෝකයටම ද? ජීවිතයට වඩාත් සමීප යථාර්ථය ද ප්‍රබන්ධය ද? සමන් වික්‍රමාරච්චි තම අලුත්ම නවකතාව වන ' බීබී' මගින් පාඨකයාට මෙම ප්‍රශ්න මාලාව සමඟ පොරබැදීමට ඉඩකඩ සලසා දෙයි.

මෙහි ප්‍රධාන චරිතය බීබී ය.(බොරලැස්ස බොරලැස්ස) ඔහුගේ පියා සුනන්ද ය. මව ජසින්තා ය. සුනන්ද දැඩි බෞද්ධයකු වන අතර ජසින්තා උග්‍ර කතෝලික බැතිමතෙකි. ජසින්තාගේ එකම පැතුම දියණියක ප්‍රසූත කිරීමය. එහෙත් ලැබෙනුයේ පුතෙකි. දියණියකට ඇති ආශාව නිසාම ඇය ඔහු අමතනුයේ මාලිනී යනුවෙනි. ඔහුගේ උප්පැන්න සහතිකයේ සඳහන් වන්නේ බොරලැස්ස බොරලැස්ස යනුවෙනි. මෙම ස්ත්‍රී නාමය නිසා ඔහුට පාසලේදීත් රැකියා ස්ථානයේදීත් සමාජයේදීත් මුහුණ දීමට සිදුවන බරපතළ අනන්‍යතා අර්බුදය ඔස්සේ කතාපුවත ගලා යයි. මෙහිදී කතුවරයා ගොඩනංවන චරිතවල අන්තර්ගත ලක්ෂණ සහ සිදුවීම් බෙහෙවින් සිත් ගනී. අලුත උපන් දරුවන්ට නම් තැබීමේ අසාමාන්‍ය හැකියාවක් ජසින්තාට තිබේ. ඒ ඇයගේ නවකතා කියවීමේ ඇබ්බැහිය නිසාය. බීබීට අත්අකුරු අලංකාර අයුරින් ලිවීමේ අසාමාන්‍ය හැකියාවක් තිබේ. (චාරුලේඛනය) මෙම අසාමාන්‍ය හැකියාවන් ඔවුන්ගේ ජීවිතවලට සාධනීය මෙන්ම නිශේධනීය ආකාරයෙන් බලපායි. බසයේදී බීබීට


මුණගැසෙන යුවතිය සැබෑවක්ද නැතහොත් මායාවක් දැයි නිශ්චිතව සිතාගත නොහැකිය. මෙම අනිශ්චිතතාව ප්‍රේමය පිළිබඳ ආත්මීය සංකථනය වෙනත් ආකාරයකින් වර නංවයි.

යථාර්ථය නැමැති ව්‍යාජය විනිවිදිමින් එහි ප්‍රබන්ධමය අපූර්වත්වය මේ සෑම චරිතයකින්ම ,සිදුවීමකින්ම සහ චරිත අතර ගොඩනැගෙන සබඳතාවලින්ද විද්‍යාමාන වේ. මවගේ මනෝභාවය හා ෆැන්ටසිය විපරීත ප්‍රාර්ථනාවක් තුළ ගිලී යයි. විශේෂයෙන් මෙම නවකතාව තුළ කතුවරයා ගොඩනංවන ලිංගිකත්වය පිළිබඳ කතිකාවද පාඨක අවධානය දිනා ගන්නකි. ආගමික හිස්ටීරියාව ඇතැම් විට ලිංගික සංතර්පණයට බාධකයක් වන ආකාරය එයින් නිරූපණය කෙරේ. එහෙයින් සුනන්දගේ සහ ජසින්තාගේ ලිංගික සම්භෝගයේ විවෘත නොවන ස්වභාවය ඔවුනට ගෙන දෙන්නේ කාංසාමය අත්දැකීමකි. එය එකිනෙකාගේ ශරීර හඳුනා ගැනීමට අසමත් එක්වීමකි. එමෙන්ම ස්ත්‍රිය වෙත ආකර්ෂණය නොවන උදාසීන සරාගිකත්වයක් සහිත චරිතයක් ලෙස දිස්වන බීබීගේ අවිඥානය ද (ආශාව)එසේ නොවන බව පෙනේ. ඔහු කාර්යාලයේ සේවය කරන කාන්තාවන්ගේ සළුපිළි මනෝමය ලෙස උනා දමා ඔවුන්ගේ නග්න ශරීර කඩදාසි මත චිත්‍රණය කරයි. මෙය අවරෝධිත ආශාවන් පිළිබඳ අවිඥානික ප්‍රකාශනයකි. මෙහි නිරූපිත චරිත සියල්ලම පාහේ මෙකී අවරෝධිත ආශාව නිසා කාංසාමය තත්ත්වයට පත්වූවෝ වෙති. මෙලෙස සමන් වික්‍රමාරච්චි බීබී නවකතාවේ දී වාස්තවික යථාර්ථය සහ චරිතවල අභ්‍යන්තර ලෝකය අතර පවත්නා සීමාමායිම් බොඳ කර දමයි.එවිට පාඨකයාට ද සිදුවන්නේ යථාර්ථය සහ ප්‍රබන්ධය වෙන්කර හඳුනාගත නොහැකි ඉමක අතරමංවීමටය. එහෙත් මෙම මංමුළාව ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බව අපටත් නොදැනීම අපට වැටහෙයි.

නොවෙල්ලාවක් හෙවත් කෙටි නවකතාවක් වන මෙහි ආකර්ෂණීයම අංගය වන්නේ එහි ආඛ්‍යාන රටාවයි. ඒ අනුව මෙහිදී මූල මැද අග සහිත කතාවක් ගොඩනැවීමට වඩා එකිනෙකට සම්බන්ධිත හෝ අසම්බන්ධිත සිද්ධි ඉදිරිපත් කිරීමට කතුවරයා නැඹුරු වේ. එම සිද්ධි වෙන් වෙන් වශයෙන් හෝ සමෝධානිතව ග්‍රහණය කරගැනීම පාඨකයාට පැවරේ. විශේෂයෙන් මෙම නවකතාවේ දී කතුවරයා භාවිත කරන අවමවාදී ශෛලිය පාඨක පරිකල්පනයට අසීමිත ඉඩක් ලබා දෙයි. ප්‍රබන්ධකරණයේදී වික්‍රමාරච්චි වඩාත් රුචි කරන ශෛලිය මෙයයි. එය ඔහුගේ රචනාමය අනන්‍යතාව ලෙසද හැඳින්විය හැකිය. බීබී නවකතාවේ කතාව, චරිත, සිදුවීම් සහ මේ සියල්ලේ අන්තර්සබඳතාව සැලකිල්ලට ගත්විට එය හිස්ටරික යථාර්ථවාදී ආඛ්‍යාන රටාවක් (Hysteric reality narrative) යනුවෙන් නම් කළ හැකිය. මෙම ආඛ්‍යාන රටාව තුළ ඇතැම් විට ලේඛකයාගේ සහ පාඨකයාගේ භූමිකා මාරුවීම සිදු වේ. ඒ අනුව සමන් වික්‍රමාරච්චි අප යථාර්ථය යැයි හඳුන්වන ප්‍රබන්ධය හෝ මායාව නිරාවරණය කරනුයේ චරිතවල පවතින මෙකී හිස්ටරික ස්වභාවය හරහා ගමන් කිරීමට පාඨකයාට අවකාශ සලසමිනි. සැබැවින්ම බීබී යනු පාඨක පරිකල්පනය සිත් සේ විකසිත කර ගැනීමටත් පාඨකයාගේ ලේඛකීය එලඹුම සවිමත් කර ගැනීමටත් මග සලසන අපූරු වැඩබිමකි. එමෙන්ම එය යථාර්ථය හා ප්‍රබන්ධය පටලවා ගැනීමෙන්ද ඊට හිස්ටරික ගතිකත්වයේ මාත්‍රාවක් එක් කිරීමෙන්ද උපදින විනෝදය අභ්‍යාස කිරීමට උචිත පසුතලයකි.-

මැයි මාර ප්‍රසංගය

ගිවෝන් යානිකා නන්දසේන



“ඇත කන්දේ ගසක් සිටුවමි

මල් පිපේවී කවද හෝ එහි

එමල් ඔබහට පෙනී

සිතට සතුටක් දැනේවා...”

සමාජ මාධ්‍ය හරහා අතිශය ජනප්‍රියත්වය පත් වුණ මේ ගීතය මතකද ?

මේ ගීතය ඇහෙද්දී සංචරණීගේ රුවත්, ඇය වටා ගොඩනැඟුණු ආදර කතාවත් මතකයට එනවා. ඒ මතක අතරේ මැයි මාර ගසටත් හිමිවෙන්නේ විශේෂ තැනක්. මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ ජනප්‍රිය නවකතාව ඇසුරින් නිර්මාණය වූ "මැයි මාර ප්‍රසංගය" චිත්‍රපටය වෙත අපව රැගෙන යන්නේ මේ ගීතයයි.

කඳුකර පරිසරය පසුබිම් කරගෙන සම්ධ සහ සංචරණී වටා දිගහැරෙන මේ කතාවේ විශේෂත්වය වන්නේ ආදරය ගැන කියන අතරම මිනිස් සිතේ නිහඬ හැඟීම්වලටත් ඉඩක් ලබාදීමයි. කෙනෙකුට ආදරය කිරීම යනු ඒ පුද්ගලයා තමන් සතු කරගැනීමමද, නැත්නම් ඔහු හෝ ඇය ගැන සිතේ උපන් හැඟීම නිහඬව රැකගැනීමත් ආදරයක්ද යන සිතුවිල්ල සම්ධගේ චරිතය හරහා මතු වෙනවා. ඒ නිසාම මේ කතාවේ ආකර්ෂණය ආදර සම්බන්ධයක සිදුවීම්වලට පමණක් සීමා වෙන්නේ නැහැ.

"මැයි මාර ප්‍රසංගය" මුලින්ම පාඨකයන් අතරට පැමිණියේ මහින්ද ප්‍රසාද් මස්ඉඹුල විසින් රචිත නවකතාවක් විදිහට. එහි කතාව ගලාගෙන යන ආකාරයත්, චරිතවල හැඟීම් සහ ස්වභාවදහම සමඟ ඒවා බැඳෙන ආකාරයත් නිසා මෙම නිර්මාණය පාඨකයන්ගේ අවධානය දිනාගත්තා. මෙහි මැයි මාර ගස හුදෙක් පරිසරයේ කොටසක් නොවෙයි. චරිතවල මතකයන් සහ සිතුවිලි සමඟ සම්බන්ධ වන සංකේතයක් ලෙසත් එය කියවාගන්න පුළුවන්.

නවකතාවක් කියවන විට පාඨකයා තමන්ගේම පරිකල්පනයෙන් චරිතවල මුහුණු සහ ඔවුන් ජීවත් වන ලෝකය මවාගන්නවා. ඒ ලෝකය සිනමාවට ගෙන ඒම වෙනස් අභියෝගයක්. එහිදී වචනවලින් විස්තර කළ හැඟීම් රංගනය, රූප, ශබ්දය සහ සංස්කරණය හරහා ප්‍රේක්ෂකයාට දැනෙන්න සැලැස්විය යුතුයි.

මේ අභියෝගය භාරගන්නේ නවකතාවේ නිර්මාණකරුවා වන මහින්ද ප්‍රසාද් මස්ඉඹුලමයි. ඔහු "මැයි මාර ප්‍රසංගය" චිත්‍රපටයේ අධ්‍යක්ෂණය මෙන්ම තිර රචනයත් සිදු කර තිබෙනවා. එය ඔහුගේ කුළුදුල් සිනමා

අධ්‍යක්ෂණය වීමත් මෙම නිර්මාණයේ විශේෂත්වයක්. තමන් වචනවලින් ගොඩනැඟූ ලෝකය සිනමා මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම ඔහුගේ නිර්මාණ ගමනේ වැදගත් පියවරක් ලෙස හඳුනාගන්න පුළුවන්.

රිදී තිරයේ සමිධගේ චරිතයට පණ පොවන්නේ රොෂාන් රවීන්ද්‍රයි. සංචරණීගේ චරිතය නිරූපණය කරන්නේ උමාලි තිලකරත්නයි. ඔවුන් සමඟ ශ්‍රියාණි අමරසේන, ප්‍රියංකා සමරවීර, සේවියර් කණිෂ්ක, විශ්වජිත් ගුණසේකර, යශෝධා රසඳුනි සහ චමින්ද බටුකොටුව ඇතුළු ශිල්පීන් පිරිසක්ද රංගනයෙන් දායක වෙනවා. නවකතාව කියවා තමන්ගේ සිතේ චරිත මවාගත් පාඨකයන්ට ඒ චරිත සිනමා රූප හරහා හමුවීම මෙහි තවත් වැදගත් අත්දැකීමක්.

චිත්‍රපටයේ නිෂ්පාදනය කුමාරි පණ්ඩිතරත්න විසින් සිදු කර ඇති අතර කැමරාකරණය භාරව කටයුතු කරන්නේ පාලිත පෙරේරායි. සංස්කරණයෙන් තිස්ස සුරේන්ද්‍රත්, කලා අධ්‍යක්ෂණයෙන් මංජුල අයගමත්, ඇඳුම් නිර්මාණයෙන් සුරේෂ් මධුශංකත් දායක වෙනවා. ශබ්ද නිර්මාණයෙන් අරුණ ප්‍රියන්ත කළුආරච්චිත්, වර්ණ සංයෝජනයෙන් අසංක වික්‍රමසිරිත් දායක වී තිබෙනවා. මේ සියලු අංශවල එකතුවෙන් කතාවේ පරිසරය සහ චරිතවල හැඟීම් සිනමා අත්දැකීමක් බවට පත් වෙනවා.

මැයි මාර ප්‍රසංගය යන නම ඇසූ විට මතකයට එන ගසටත් කතාව තුළ විශේෂ අර්ථයක් තිබෙනවා. ගසක මල් පිපීම සහ හැලී යාම ස්වභාවික සිදුවීම් වුණත්, ඒ ගස යම් පුද්ගලයකුගේ ජීවිතයේ මතකයකට සම්බන්ධ වුණොත් එය තවදුරටත් සාමාන්‍ය ගසක් පමණක් වෙන්නේ නැහැ. කාලය ගෙවී ගියත් එය දකින විට පැරණි හැඟීම් නැවත අවදි වෙන්න පුළුවන්. මේ නිර්මාණය තුළ ස්වභාවදහමට ලැබෙන තැනත් ඒ ආකාරයෙන් තේරුම්ගන්න පුළුවන්.

මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ නවකතාව ඇසුරින් නිර්මාණය වූ මෙම චිත්‍රපටය ළඟදීම තිරගත වීමට නියමිතයි. පොතකින් හඳුනාගත් කතාවක් සිනමාවට පැමිණීමත් සමඟ එය නව ප්‍රේක්ෂක පිරිසකට සමීප වන අතර, නවකතාව කියවූ අයට තමන් දැන සිටි චරිත වෙනත් මානයකින් දැකගන්නත් අවස්ථාව ලැබෙනවා.

“මලෙක සුසුමත්

සුසුමෙ ස්වරයත්

ස්වරයෙ පැහැයත් වගේ

අමුතු විදිහට සිතන්නට මම

ඉගෙන ගත්තේ ඔබෙන්

අමුතු විදිහම ආදරේ නම් ඒක එහෙමම තියේවා

තියේවා...

තියේවා...”

මේ ගමන අවසානයේ අපට මතක් කර දෙන්නේ, සමහර කතා පොතක පිටු හෝ සිනමා තිරය ඉක්මවා අපේ මතකයන් සමඟත් බැඳෙන බවයි. ගීතයක් ඇහෙද්දී මතක් වන චරිතයක්, ඈත කන්දක ගසක් දැකීමෙන් අවදි වන මතකයක් හෝ කාලය ගෙවී ගියත් සිතේ රැඳෙන හැඟීමක් - මැයි මාර ප්‍රසංගය අපට සමීප කරන්නේ එවැනි අත්දැකීම්වලටයි.

(අන්තර්ජාලය ඇසුරිනි)

'මම ලියන හැටි': සුනේත්‍රා රාජකරුණානායක

කෞශල්‍ය කුමාරසිංහ

බීබීසී සිංහල වෙනුවෙන් සුනේත්‍රා රාජකරුණානායක මහත්මිය සමග මෙම සංවාද මාලාව මෙහෙය වන කෞශල්‍ය කුමාරසිංහ නවකතාකරුවෙක්, පරිවර්තකයෙක් සහ සමාජ සංස්කෘතික ක්‍රියාධරයෙකි.



"හැදෑරීම කියන්නේ පොත් කියවන එක විතරක් නෙමෙයි. විවිධ රටවල ඇවිදින එක, කෞතුකාගාරවලට යන එක. මං මියුසියම් එකකට උදේ ගියොත් එළියට එන්නේ හැන්දෑවෙලා කකුල් කෙඩෙත්තුව හදාගෙන. මං හැම කෞතුක වස්තුවක් ළඟටම ගිහින් ඒව ගැන විස්තර සටහන් තියාගනිමින් තමයි ඇවිදින්නේ. පොත් කියවන කොට ගත්ත මේ වගේ සටහන් විශාල ප්‍රමාණයක් තියනවා. ඒ වගේම තමයි සංචාරයේදිත්. මං හිතන්නේ නවකතාකාරයෙකුගේ මල්ලේ පොඩි නෝට් පොතක් හැම වෙලේම තියෙන්න ඕන. මං ගාව මේ වෙනකොට එකතුවෙච්ච මේ විදිහෙ සටහන් මහ විශාල ප්‍රමාණයක් තියනවා"

සුනේත්‍රා රාජකරුණානායක යනු කිසිසේත්ම හැඳින්වීමක් අවශ්‍ය සාහිත්‍යකාරියක නොවේ. අසූව දශකයේ අගභාගයේ 'සඳුන්ගිර ගිනි ගනියි' නවකතාව සමග සිදුවන ඇයගේ ප්‍රවේශය සමකාලීන සිංහල සාහිත්‍යයේ හැරවුම් ලක්ෂයක් ලෙස සැළකිය හැකිය.

ප්‍රේම පුරාණය, සද්ගුණාකාරය, රිදී තිරංගනාව, කවි කඳුර, පොදු පුරුෂයා, කැන්ඩි මහල්, සිලෝනාගමනය හරහා වීසාචකයෝ නවකතාව දක්වා දිගහැරෙන ඇයගේ දීර්ඝ නවකතා ලැයිස්තුව වෘත්තීය ලේඛිකාවක ලෙස ලිවීමට ඇති ඇයගේ කැපවීම සහතික කරයි.

මීට අමතරව ඇය විසින් ප්‍රකාශයට පත් කර ඇති කෙටිකතා සංග්‍රහ සහ සංචාරක සටහන් ද සළකන විට සිංහල සාහිත්‍ය ඉතිහාසයේ කිසිසේත්ම මගහැරයා නොහැකි ලේඛිකාවක බවට ඇය පත් වෙයි.

මා ඇය සමග කතාබහක යෙදෙන්නේ නවකතාකාරියක ලෙස ඇය ලේඛනයේ යෙදෙන විට ඇයට දැනෙන හැඟීම් සහ ලිවීම සමග බැඳුණු ඇයටම අනන්‍ය වූ වතාවත් තේරුම් ගැනීමේ අරමුණින් ය.

මේ සාකච්ඡාව තුළ මා අසන ප්‍රශ්න මේ වන විට මා විසින් පළකර ඇති **'**නිම්නාගේ ඉතිහාසය' (2019) සහ **'**මේ රහස් කවුලුවෙන් එබෙන්න' (2014) නවකතා ලියන අතර මා මුහුණ දුන් අත්දැකීම් මතින් පැන නැගුනු ඒවාය.

හැම ලේඛකයෙක්ම ලිවීමේ ක්‍රියාවලියට මුහුණ දෙන්නේ තමන්ගේම වූ ආකාරයකට ය යන්න ප්‍රකට කරුණකි.

ලියන තැන, ලියන විදිහ, ලියන කාලයට හැසිරෙන හැටි සහ ලියන විට විඳින සතුට වැනි දේ අයත් වන්නේ ලේඛකයාගේ අතිපුද්ගලික අඩවියට ය.

මේ සංවාද මාලාව උත්සාහ කරන්නේ නවකතාකරුවන්ගේ එම රහස් අඩවිය වෙත එබී බැලීමට

කෞශල්‍ය : මේ සංවාද මාලාවේ සුපුරුදු සමාරම්භක ප්‍රශ්නයම මං ඔබෙනුත් අහන්නම්. ඔබේ නවකතාවල පළමු වාක්‍යය ලියවුණු හැටි ගැන යමක් කියන්න පුළුවන්ද?

සුනේත්‍රා: සමහර සමාරම්භක වාක්‍යය ලියන්න යන නවකතාව මොකද්ද කියල දැනගන්නත් කලින් ආපු අවස්ථා තියනවා. සමහර අවස්ථා වල කිසිම සැලසුමක් නැතුව ලියන්න වාඩි වෙලා පළමු වාක්‍යයේ ඉඳන් එක දිගට ලියාගෙන ගිය අවස්ථා තියනවා. එහෙම ලියාගෙන ගිහින් නවකතාව අවසන් කලාට පස්සේ නැවත පළමු වාක්‍යය වෙනස් කළ අවස්ථාත් තියනවා. එහෙම අවසන් කළ නවකතා වල එක අකුරක්වත් වෙනස් නොකළ පළමු වාක්‍යයත් තියනවා. ඒ නිසා ඒක නිශ්චිතව මෙහෙමයි කියල කියන්න බැහැ.

කෞශල්‍ය: ඒ කියන්නේ නවකතාවක පළමු වාක්‍යය ලියන මොහොතේ ලියන්න යන නවකතාව ගැන ඔබට තියන දැනුමේ ස්වභාවය විවිධාකාරයි.

සුනේත්‍රා: ඔව්. දැන් ඓතිහාසික නවකතාවක් ලියන්න පටන් ගන්න කොට ඒක ගැන තියන දැනුම ගොඩක් වැඩියි. උදාහරණයක් හැටියට මගේ 'සිලෝනාගමනය' වගේ නවකතාවකට මම අවුරුදු විස්සක් විතර රිසර්ච් කලා. රාජසිංහ රජ්ජුරුවන්ගේ නෑයෝ ඉන්නව කිව්වට මං ලිපිනයක්වත් නොදැන තමයි හොයාගෙන ගියේ. දැන් මං මේ වෙලාවෙත් නුවර ඇවිත් ඉන්නෙත් ඒ වගේ කටයුත්තකට. ඒ වගේම දේශපාලන පසුබිමක් සහිත නවකතා ලියනකොටත් එහෙමයි. නමුත් සමහර නවකතා තියනවා ඒවගේ පූර්ව දැනුමක් අවශ්‍ය වෙන්නෙ නැති. විශේෂයෙන් වර්තමාන කතා ලියනකොට. එවැනි අවස්ථාවල ලියන්න යන්නේ මොකද්ද කියන එක ගැන ලොකු දැනුමක් නැතුව ලිවීම පටන් ගන්න හැකියාවකුත් තියනවා. අපි නවකතාව ගැන උගන්නනකොට නවකයන්ට කියන දෙයක් තමයි සැකිල්ලක් එක්ක පටන් ගන්න කියන එක. නමුත් මං ලියන එක පටන් ගත්තම මගේ චරිත විසින් මගේ කතාව පාලනය කරන්න පටන් ගන්නවා. දැන් 'බුද්ධදාසි' කියන පොත පටන් ගත්තේ ඒ චරිතේ වීනේ දක්වා ගෙනියන්න. නමුත් ලියාගෙන යද්දි ඒක අවශ්‍ය නෑ කියන එක දැනෙන්න ගන්නවා. හිතන්නකෝ අපි පෙම් කතාවක් ලියනවා කියලා. ඒක පටන්ගන්න කොට අපේ හිතේ තියෙන්නෙ දෙන්නෙක්ගේ ආදර කතාවක්. දැන් ඕක ලියාගෙන යද්දි අපිට ඔන්න තව චරිතයක් එනවා කමෙන්ට් එකක් දාන්න, නිකං අහල පහළ චරිතයක්. ඒක ප්ලෑන් කරපු එකක් නෙමෙයි. හැබැයි ඒ චරිතේ ආවට පස්සේ ඒ චරිතෙත් එක්ක මේ ප්‍රධාන චරිත දක්වන අන්තර් සම්බන්ධය මත තමයි මේකේ ඊළඟ ඡේදේ තීරණය වෙන්නේ. මොකද අපිට මේ චරිතේ අතෑරල ඊටපස්සේ යන්න බැහැනේ. අපේ ජීවිතේ වගේ තමයි. අපිට හම්බෙන මිනිස්සු, අපි මුහුණ දෙන අත්දැකීම් අපි යන එන තැන්, අපි කරන රැකියා අපේ ජීවිතේට බලපානවනේ. ඒ දේවල් එක්ක ජීවිතේ වෙනස් වෙනවනේ. එතකොට කතා කලාවෙදි අපි තෝරගන්න භූගෝලීය පරිසරය, ඒ අපේ චරිතවල සමාජ පසුබිම, උගත්කම මේ දේවල් වලින් ඇති කරන සීමාවන් ටිකක් තියනවා. උදාහරණයකට දැන් මගේ 'සද්ගුණාකාරය' පොතේ

ඉන්න 'රෝස නෝනා' කියන චරිතය කොලඹටවත් ගිහින් නැහැ. එතකොට මට එයාව ලියන්න බැහැනේ මගෙ 'ප්‍රේම පුරාණය' නවකතාවේ ඉන්න නිර්මලා කියන ජර්නලිස්ට් ගැන ලියන විදිහට. රෝස නෝනගේ භාෂාව, සිතුම් පැතුම්, ඇඳුම් පැළඳුම් අර රත්නපුරේ ගමේ සීමාවෙන් එහාට ගෙනියන්න මට අවසරයක් නැහැ. කතා කලාවෙදි ලයිසන්ස් නිකුත් කරන්නේ තමන් වුනාට, ඒ කියන්නේ ලොකේෂන්, චරිත තෝර ගන්නේ තමන් වුනාට ඒකෙ සැඟවුණු නීති රීති ටිකක් තියනවා. ඒවට අවංක වෙන්න ඕන. මගේ පුද්ගලික අත්දැකීම් වලින් විතරක් චරිත ගොඩනගන්න බැහැ. ඒවට හැදෑරීම් කරන්න වෙනවා. දැන් මගේ 'ශ්‍රී ශාන්ත' කියන පොතේ තියෙන්නේ ඉන්දියාවේ ජෛන පවුලක් වටා ගෙතුන කතාවක්. එතකොට මං ජෛන පූජකයෙක් ගැන ලියනකොට ලංකාවේ මම දන්න බෞද්ධ භික්ෂුවක් ගැන හෝ කතෝලික දේවගැතිවරයෙක් ගැන ලියනව වගේ ලියන්න බැහැ. ඒක වෙනම හදාරන්න වෙනවා. ඒකෙදී ඉන්දියාවේ ගිහිල්ල ඒ අය මුණගැහිල කාලයක් ගත කරන්න වෙනවා. ඒ වගේම ඒ සම්බන්ධ ශාස්ත්‍රීය පොත පත ඇසුරු කරන්න වෙනවා.

කෞශල්‍ය: ඔබ විශාල වශයෙන් ශාස්ත්‍රීය පොත පත කියවන හදාරණ කෙනෙක්. දැන් මේ ශාස්ත්‍රීය කියවීම් ඔබ කරන්නේ නවකතාකාරියක් හැටියට ද?

සුනේත්‍රා: මං ඉස්සර ඉඳන් විශාල දැනුම් පිපාසයක් තියෙන කෙනෙක්. ශාස්ත්‍රීය පොතපත හැදෑරීම කරන්නේ මේ පිපාසය නිසා. හැබැයි එහෙම කියවන දේවල් නවකතාවලට වැදගත් වෙනවා. ඒ වගේම යම් අවස්ථා තියනවා නවකතාවක් වෙනුවෙන්ම හැදෑරීම් කරන්න සිද්ධ වෙන. ඒ දෙක වෙනස්. මං සාමාන්‍යයෙන් ශාස්ත්‍රීය පොතපත තමයි වැඩිපුර කියවන්නේ. ඒ නිසා නවකතා කියවන එක සිද්ධ වෙන්නේ අඩුවෙන්. මෙතෙන්දි හැදෑරීම කියන්නේ පොත් කියවන එක විතරක් නෙමෙයි. විවිධ රටවල ඇවිදින එක, කෞතුකාගාරවලට යන එක. මං මියුසියම් එකකට උදේ ගියොත් එළියට එන්නේ හැන්දෑවෙලා කකුල් කෙඩෙත්තුව හදාගෙන. මං හැම කෞතුක වස්තුවක් ළඟටම ගිහින් ඒව ගැන විස්තර සටහන් තියාගනිමින් තමයි ඇවිදින්නේ. පොත් කියවන කොට ගත්ත මේ වගේ සටහන් විශාල ප්‍රමාණයක් තියනවා. ඒ වගේම තමයි සංචාරයේදිත්. මං හිතන්නේ නවකතාකාරයෙකුගේ මල්ලේ පොඩි නෝට් පොතක් හැම වෙලේම තියෙන්න ඕන. මං ගාව මේ වෙනකොට එකතුවෙච්ච මේ විදිහෙ සටහන් මහ විශාල ප්‍රමාණයක් තියනවා. මං හිතන් ඉන්නේ මැරෙන්න කලින් හොඳ තරුණ ලේඛක ලේඛිකාවෝ ටිකකට කතා කරල මේව දෙන්න. මොකද මං ඒවයෙන් පාවිච්චි කරල තියෙන්නෙ ටිකයි. වෙනත් කෙනෙකුට ඒව ප්‍රයෝජනවත් වෙන්න පුලුවන්. කොහොම වුනත් මේ ශාස්ත්‍රීය පිපාසය හරිම ප්‍රිය කටයුත්තක්. මේ ප්‍රිය කටයුත්ත තියන නිසා සමාජ ආශ්‍රය ඔය මහුල් ගෙවල් වලට යන්න, වෙන එකක් තියා සාහිත්‍ය උත්සව කටයුතු වලට යන්නත් උනන්දුවක් නැහැ. මොකද අඛණ්ඩව වෙන කතිකාවතකනේ යෙදිල ඉන්නේ.

කෞශල්‍ය: ඔබ මේ හැදෑරීම සහ කියවීම ගැන කියපු දේවල් අතිශය වැදගත්. දැන් ටිකක් කතා කරන්න පුළුවන්ද ඔබ ලියන කාලය ගතවෙන හැටි.

සුනේත්‍රා: ඉස්සර නං උදේ ඉඳන් රෑ වෙනකං ලියපු කාලෙකුත් තිබුණා. ඒ කාලේ පත්තර දෙකකට විතර කොලම්ස් එහෙමත් ලිව්වා. නමුත් වැඩි කාලයක් යෙදුවේ නවකතා ලිවීමට. මට මතකයි එක දවසක්, 'රිදී තිරංගනාව' ලියන කාලෙ, මහාචාර්ය ලක්ෂ්මී ද සිල්වා මට කතා කරල මගෙ කෙටිකතාවක් ගැන අගය කිරීමක් කළා. මේකෙන් ලැබිච්ච ප්‍රමෝදයත් එක්ක මං හැන්දෑවේ හතරට විතර ලියන්න වාඩි වුණා. එක දිගට ලියාගෙන ගියා මගේ සැමියා ඇවිල්ල දැන් කෑම කෑවොත් හොඳයි නේද කියල කියන කං. ඊට පස්සේ වලං පිහන් හෝදල ආයෙත් වාඩි වුණා. දැන් මං ලියාගෙන ලියාගෙන ගිහිල්ලා මට තේ තිබහක් දැනෙනවා. එතකොටම මගේ සැමියා නැගිටලා ඇවිත් තේ බොන්න ඕන කිව්වා. එතකොට මං කිව්ව අනේ මටත් තේ තිබහක් දැනෙනව කියල. එයා කියනවා, ඔව් පුදුමයක් නෙමෙයිනේ දැන් පාන්දර පහයි කියල. ඉතින් මං දන්නේ නැතුව රෑ එළි වෙනකං ලියල හැබැයි වෙහෙසක් මුකුත් දැනුණේ නැහැ. ඔන්න එයා වෙලාව කිව්වට පස්සෙ තමයි නිදිමැරවය නිදා ගන්න ඕනය කියන ඒවා කල්පනා වුණේ. හැබැයි දැන් ලබන අවුරුද්දට මට

හැත්තෑවක් වෙන්න එනවා. ඒ නිසා රෑට ලියන එක දැන් නැවතිලා. ගොඩක් වෙලාවට හැන්දෑ වෙද්දි ලියන එක නවත්තනවා. රෑ වෙනකන් ලිව්වත් දොළහ පහුවෙනකන් ලියන එක සිද්ධ වෙන්නෙ නැහැ. තාමත් මං අතින් තමයි ලියන්නේ. අතේ ප්‍රශ්නයක් ආවෙ නැත්තං ඒක වෙනස් වෙන එකක් නෑ. දැන් නවකතාවක් ලියල ඉවර වුනාම උරහිසේ පැත්තක් ඉදිමිලා වගේ තියනවා. එහෙම තමයි ඉතින්. ලියන කාලෙට ගෙදරට කට්ටිය එනවට මං කැමති නැහැ. මං එළියට යන්නෙත් නැහැ. මිනිස්සු තරහත් වෙනව සාහිත්‍ය උත්සව වලට එහෙම ආවෙ නැති වුනාම. ඒත් කරන්න දෙයක් නැහැ. මං මගේ ට්‍රැක් එකේ ඉන්න ඕන. එහෙම එළියට ගියොත් එහෙම මගේ ට්‍රැක් එක කැඩෙනවා. ඊට පස්සේ දවස් දෙකක් විතර යනවා රිකවර් වෙන්න. ඉතින් ඒ නිසා දුරකථනයට වැඩිය කතා කරන්නෙත් නැහැ. ඥාති හිතමිත්‍රයන්ගේ කටයුතු මගේ ස්වාමි පුරුෂයට පවරල මං මගෙ ලියන ලෝකය ඇතුළට වෙලා ඉන්නවා. සමහර කාල වල මං දහනමවෙනි ශතවර්ෂයේ ඉන්නේ එතකොට මට මාර අමාරුයි විසිඑක්වෙනි ශතවර්ෂයට එන්න. එහෙම වැඩකළේ නැත්තං මෙච්චර පොත් ගොඩක් ලියන්න බැහැ. අපි අපේ ගේ පිරිසිඳු කර ගන්නවා වගේ අපිට මේ ලියන කාලෙදි කරන්න පුලුවන් වැඩ මොනවද බැරි වැඩ මොනවද කියල තේරුම් ගන්න ඕන. කෙනෙක්ගේ උපන්දින උත්සවයකට අපි යන්නම ඕනද? පන්සලේ වැඩකට යන්නම ඕනද නැද්ද කොටින්ම තමන් ඉගෙන ගත්ත පාසලේ ආදි ශිෂ්‍යාවන් මුණගැසෙන නොමිලේම යන්න ලැබෙන ට්‍රිප් එක පවා මම නං අතාරිනවා ලියන්න ඕන නිසා. වෘත්තීය ලේඛකයෙකුට ලේඛිකාවකට එයාගෙ ලෝකය තියෙන්නේ හරියට තනියම මාලිගාවක් ඇතුලේ ඉන්නවා වගේ.

කෞශල්‍ය: මේ අදහස් හරිම වැදගත් ලිවීමට කැමැත්තෙන් ඉන්න ඕනෑම කෙනෙකුට. අපි ටිකක් කතා කරමුද නවකතාවකට මූලික බීජය එන හැටි සහ ඒත් එක්ක ගත කරන කාලය ගැන? මං හිතන්නෙ මේකත් එකිනෙකට වෙනස්.

සුනේත්‍රා: ඔව් දැන් 'සිලෝනාගමනය' ප්ලොට් එක ඇවිත් මං අවුරුදු විස්සක් විතර හෙමින් ඒ ගැන හැදෑරීමක් කළා අනිත් නවකතා ලියන අතරේ. දැන් මගෙ 'සඳුන් ගිර' වගේ එකක් ගත්තොත් මට එක වෙලාවක තේරුණා දැන් මේක ලියන්න ඕන කියල. එතකොට එක දිගට ලියාගෙන ගියා. මං දැන් වෘත්තීය ලේඛිකාවක් නිසා මට කොහේ ගියත් ප්ලොට්ස් එනවා. දැන් මං මේ පාර ලන්ඩන් ගියේ ඓතිහාසික නවකතාවකට රිසර්ච් කරන්න. ඒත් ඒකට රිසර්ච් කරද්දි තව කතා කීපයකටම ප්ලොට්ස් ආවා. අනිත් එක එහෙදි මට මගෙ පරණ යාලුවෙක් අවරුදු පණහකට පස්සේ හම්බෙලා එයාල ලියන්න හදපු ඒ ගොල්ලන්ගේ කතාව මට දෙනවා. පිටු දහයක් විතර ලියල තිබුණේ. ඒකෙන් තමයි මං 'වීසාවකයෝ' නවකතාව ලියන්නේ. නමුත් ඒක ඒගොල්ලන්ගේ කතාව නෙමෙයි. ඉතින් ඔහොම තමයි. මං බස් ස්ටෑන්ඩ් එකක හිටියත් දුම්රිය පොළක හිටියත් මං බලාගෙන ඉන්නේ චිත්‍රපටියක් බලනවා වගේ. එතකොට මේ දකින දේවල් කොයි වෙලේ පාවිච්චි වෙනවද දන්නෙ නැහැ. මං 'සද්ගුණාකාරය' ලියන්නේ රත්නපුරේ ගැමි පරිසරයෙ මං අත්දැකපු දේවල් වල මතකය එක්ක. මට ලැබුණ ලොකුම වාසිය තමයි කුඩා කාලේ ඉඳන් අපේ තාත්තා සමසමාජ කාරයෙක් වීම නිසා නිතරම මාරුවීම් ලැබුන එක. මට විවිධ පරිසරයන් විවිධ මිනිසුන් ඇසුරු කරන්න ලැබුණා. උදේට ගැමි දරුවන් එක්ක ඇලේ දොළේ පිනල ඉරිදට හොඳට ඇඳ පැළඳගෙන පල්ලියේ ඉංග්‍රීසියෙන් සිද්ධ වෙන දේව මෙහෙයට යනවා. මේ විදිහට ලෝක දෙකක් අතර ඉන්න ලැබුණු නිසා මට විවිධ සමාජ තලයන් ගැන ලියන එක පහසු වුණා.

කෞශල්‍ය: දැන් ඔබ කිව්වේ ප්ලොට්ස් ගොඩක් හැමවිටම ඔළුව ඇතුලේ කැරකෙනවා කියන එක. මේකට මුහුණ දෙන්නෙ කොහොම ද?

සුනේත්‍රා: ඇත්තටම එකපැත්තකින් ඒක අමාරු දෙයක්. දැන් මං ලන්ඩන් වලදි වෙනත් නවකතාවක් වෙනුවෙන් වැඩ කරන්න ගියාට අන්තිමට ලිව්වෙ 'වීසාවකයෝ' නේ. හැබැයි එහෙමයි කියල අරක නැති වෙලා නැහැ. ඒකත් තියනවා. ඒ අතරේ තවත් කෙනෙක් කියනවා ඇහෙනවා, අනේ ඇයි මගෙ කතාව ලියන්නෙ නැත්තේ කියල. ඉතින් එහෙම තමයි. මං මේ පාර ලියන්න වාඩි වෙලා ඒ කිසිවක් නොවන එකක් ලියන්න පටන් ගත්ත. තවත් පැත්තකින් බැලුවොත් මේක නිකං තැන්පත් ධනයක් වගේ. ටිකක් එළියට

අරගෙන ඒකෙන් ලියන්න පටන්ගන්න වෙනවා. ඉතින් ඒ අතරේ අනිත් ඒව නවත්තගෙන ඉන්නවා. ඒක පහසු දෙයක් නෙමෙයි. මොකද ඇතුලේ අභ්‍යන්තර සංවාදයක් තියනවානේ.

කෞශල්‍ය: ඔබට කවදාවත් ලිවීමට අපහසුවක් දැනිල නැද්ද මං කියන්නෙ රයිටස්ඊ බ්ලොක් වගේ එකක්?

සුනේත්‍රා: එහෙම වෙන්නේ යම් යම් කම්පනයන් එක්කනේ. මට හැම කම්පනයක්ම තව තවත් ලිවීම පෝෂණය කළා. මට සිද්ධ වුණු හැම නරක දෙයක්ම මට මුණගැසුණු හැම නරක මිනිහෙක්ම මගේ ලිවීම තවතවත් ශකතිමත් කළා. කම්පනයන්ගෙන් හිතේ ඇති වුණ තුවාල නැති වෙලා නැහැ. සොහොන් පිටි වගේ ඒ තුවාල තිබුණට මට ඒ සොහොන් පිටි කිරිගරුඬ මූර්ති දාලා සරසන්න පුළුවන්නේ.

කෞශල්‍ය: නවකතාවක් ලියල ඉවර වුනාම කොහොමද දැනෙන්නේ ?

සුනේත්‍රා: ලොකු නිදහසක් දැනෙනවා. විශේෂයෙන් සංස්කරණය කරන්න නැත්තං මං එදාම ප්‍රකාශකයට යවනවා. ඊට පස්සේ දවසක් දෙකක් ගෙදර අස්කරනවා. වත්තේ වල් පැල ගලවනවා. ඒකට නං සතියක් විතර යනවා. ඒ වැඩේ ඉවර වුණාට පස්සේ ඔය වැඩිහිටි කෙනෙක්, ලෙඩෙක් බලන්න වගේ යායුතු ගමනක් තියනව නං යනවා. ඔන්න ඊට පස්සෙ මට හරි වරදකාරී හැඟීමක් දැනෙන්න ගන්නව හරියට හොරට ලෙඩ නිවාඩු දාල ඉන්නව වගේ. ඉතින් මං මගේ ඊළඟ පොත පටන් ගන්නවා. එතකොට සතියක් දෙකක් තමයි ඉන්නේ. එහෙම නැත්තං ඉන්දියාවේ යනවා. දැන් ඉස්සර වගේ ඇවිදින්නේ නෑ වැඩිය. ඔය රාමන අශ්‍රමයට වගේ ගිහින් ඉන්නවා. එතන පුස්තකාලයක් එහෙම තියනවා ආගම් දර්ශනයන් ගැන පොත් විශාල ප්‍රමාණයක් තියන. අනික ගමේ මිනිස්සුත් දැන් මාව දන්නවා. ඔහොම ඉන්නකොට ඊළඟ පොත පටන් ගන්න පුලුවන් වෙනවා.

කෞශල්‍ය: මං අවසාන වශයෙන් අහන්න කැමතියි ඔබ ලිවීම විඳින හැටි ගැන?

සුනේත්‍රා: වැදගත්ම දේ ලිවීමත් එක්ක මට මගේම කිංග්ඩම් එකක් හැදිල තියෙනවා. ඒකෙ වැසියත් මම, හතුරත් මම, රජතුමත් මම. කිසිම කෙනෙක් එක්ක කතා නොකර මට මගේම හුදෙකළාව ඇතුලෙ මාස දෙක තුනක් වුණත් ඉන්න පුළුවන්.

කාලාන්තරයක් තිස්සේ ලිවීම සිය ජීවන පැවැත්මේ අත්‍යන්ත අංගයක් බවට පත්ව ඇති නවකතාකාරියකගේ අත්දැකීම් සහ අදහස් අපට ලිවීමට අනුප්‍රාණය සපයනු ඇතුවා සේම ඇයගේ කෘතීන් කියවන විට ඒ වචන පිටුපස සිටින ඇයගේ වෙහෙස ගැන අවලෝකනය කරන්නට ද බල කරනු ඇත.

එසේම සුනේත්‍රා රාජකරුණානායකගේ සුවිශේෂී ජීවිතයේ විවිධ පැතිකඩ දෙස බලා ලේඛකයෙකුගේ පැවැත්මේ ආකර්ෂණීය බව ගැන සිතන්නට ද මේ සංවාදය ඉඩ විවර කරනු ඇත.


POEMS

කන්නන්ගරෝ මහා බුද්ධෝ



ගෙඩි කඩන කොල්ලන්ට
ලෙලිතලන කෙල්ලන්ට
දොරක් හැර, පිවිසෙන්න
ලියපියව් කියා පෙම් කරදහි වුණත්,

පොල් ගෙඩියක අරය සහ පරිධිය
පොල්වතුරේ සංයුතිය
කොටහලුවේ ඇති ඇත්ත
ලෝකයේ ළය පැත්ත
කියාදුන් මිනිහෙකි
නැතත් බෞතීශ්මය
අකුරකින් ජෙට් හදා
ස්වර්ගයට කිති කවන

සකස් කඩයට, සුභාෂිතයට, ඉඩක්
ආකිමිඩිස්ටත් පයිතගරස්ටත් නෑදෑකමක්
ගල් දොරවල් බිඳින මන්තරය මතුරමින්
අනුපම හීනයක් දැක්ක ඔහු හිඩැස් නැති දෑසින්

හඳේ භාවා ආම්ස්ට්‍රෝන්ග් ට දී
දඬු මොනරේ හුළං ඇරී
වලවු හිසට යකුළු හෙළු
පිනන්න ගොඩ ඉඳන් බැරිවට
මුහුදු විදුහල් තැනින් තැන මැවූ
මිනිහෙක්ය ජීවිතේ පියස්සට

නගින්නට සෝපාන නොමිලේ මැවූ

කන්නන්ගර, නොවේ ඔහු මිනිහෙක්

ඔහු මහා දෙවියෙක් සියුස්ටත් වඩා බලගතු

බ්‍රහ්මටත් වඩා අරුමැසි

නැත. නැත.

ඔහු වේය බුදුවරයෙක්

විසි අට ලඟට නම් විය යුතු

“කන්නන්ගරෝ මහා බුද්ධෝ”


ජාතක කතා නැති පාරමී පුරානැති

නිර්වානේ ගෙවල් වල දොරකොඩම තියා ගිය.

(නිදහස් අධ්‍යාපනයේ පියා සී. ඩබ්. ඩබ්. කන්නන්ගර)

--සඳරැසී සුදුසිංහ ❤️

The River Remembers



Rabindranath Tagore

(May 7, 1861 - August 7, 1941)

Where the Hooghly flows past Kolkata's shore,
Lives the voice we cherish evermore.
In quiet lanes and crowded streets,
Tagore's songs make life feel sweet.

When morning breaks and birds begin to sing,
His words bring hope to everything.
From the village fields to the city lights,
His songs warm our hearts on winter nights.

In Santiniketan, beneath the open sky,
His dreams still live as the years go by.
With simple words and a heart so wide,
He brought the world and Bengal side by side.

When "Rabindra Sangeet" fills the air,
We feel his presence everywhere.
On Poila Boishakh, when new days start,
His music finds a home in every heart.

He wrote of love, of freedom, and of pain,
Of sunshine after days of rain.
He taught us to dream, to learn, to be free,
And see the world with kindness and honesty.

O Gurudev, your songs still flow,
Like the gentle rivers that Bengalis know.
As long as Bengal has stories to tell,
Your words will live, and your songs will dwell.

--Sourav Dutta 💔

නිහඬ සේවයක දැනුමේ නියමුවෝ නොවෙමුද.....???

අපේ සේවය සිරස්තලවල
නොලියවෙන්නටද පුළුවන...
අපේ කැපවීම අත්පොලසන් මැද
නොඇසෙන්නටද පුලුවන...
එහෙත්
අකුරු අතරින් ලෝකය දකින්නටත්,
පොත් පිටු අතරේ
ජීවිතය කියවන්නටත්,
දැනුම සොයා යන ගමනේ
මංපෙත් විවරකර ගන්නටත්,
අපේ දැත් දිගු කරනුයේ තවත්
ජීවිතයක් ආලෝකමත්
කරන්නටත්,
අප පෙන්වූ - එක් මගකින්
ජීවිතය වෙනස් වුවහොත්,
එය අපගේ නිහඬ මෙහෙවරෙහි
සාර්ථකත්වය නොවන්නේද?
ඉදින්.....
අප විවර කරනුයේ දොරගුළු ලෑ පුස්තකාලයක
දොරටු පමණක් නොව,
නොදුටු ලෝකයට පිය මනින
නිවරැදි මංපෙත්ය,
නොසිතූ සිතුවිලි වලට
නොඉපදුන සිහින වලට
ජීවය ලබාදෙන පියාපත්ය,
අප රකිනුයේ පොත් පමණක් නොව
යහපත් සමාජයක අනාගතයයි.....

එසේ නම්

අපගේ නිහඬ බව යනු අපගේ සේවයේ

ගැඹුරයි

අපගේ මෙහෙවර යනු

අනාගතය දෙස

විශ්වාසයේ දැස් දල්වන

ප්‍රඥාවෙන් පිරි සමාජයකට

දැනුමේ බීජ වපුරන්නට

නිබඳවම කැපවෙන පිරිසක්


නොවෙමුද,

පුස්තකාලයාධිපතිවරු.....

--අයි. නිල්මිණී පොල්ගම්පල ❤️



නුඹගෙම සුවඳ



එක මග එකට යන දහසක් අය අතර
මට හුරු දෙනෙත් හමුවන්නේ නැහැ නිතර
මෙය කතරක්ය මෙහි එන මුත් සඳ වතුර
මා හද විලට සෑහේවිද නුඹ විතර

දුර මහනුවර වැව රවුමට හිත යාවී
අප හැර බොහෝ අය අදටත් එහි ඒවී
වාසල කවුලුවෙන් එන පවනක පාවී
නුඹගෙම සුවඳ තවමත් දැනෙනව දේවී

--ඉලක්ෂ ජයවර්ධන 💔

මවපු වැස්ස

දවසක් දෙකක්

හඳ දැක්කෙ නෑ

පේන්නෙම වැහි වළාකුළු
රොත්තක්..

ඇත්තමයි

එදා සිට රිදෙනවා

හදවතේ විශාලම පැත්තක්..



බැරිම තැන

අහසට ගිහින් දුන්නා

වැහි බිඳු අතුගාන කොස්සක්..


තරහ අවසර

ඉතින් හිතවත

මේක මම මවපු වැස්සක්..

--**ඉලක්ෂ ජයවර්ධන** ❤️

සයිබර් කුනාටුව



අහවරයි කාවන්තිස්ස .

තාර පාරවල් දිගේ

බඩ බැඳගෙන හිනාවෙන්න

කද බැඳගෙන අඬන්න

ෆයිට් බල්ටි දුක් සීන්

සැනින් එසැනින්

මැවී මැවී කැපෙනව කාවන්තිස්ස

වැටුණු උණු කඳුළු

සේදිලා ..වෙලිලා කාවන්තිස්ස

සද්දන්ත කුලේ බොඩිය වහන්න

අඩිය අඟලට තලන්න

මතක අමතක කරන්න

සතියක් වැඩිත් එක්ක කාවන්තිස්ස

--**ප්‍රසන්න ගුණවර්ධන** ❤️

නුඹ මට කුමට



අහසක් කුමට නොදැරිය හැකි නම් මේඝ
තරුවක් කුමට නොමැකිය හැකිනම් අඳුර
පොළොවක් කුමට නොදරන කල ඵල නේක
සෙනෙහස කුමට නොපනා කල මා සිතට

පියස්සක් කුමට තෙමෙනා කල පසෙක
සැරයටියක් කුමට වාරුව ඇති කලෙක
සන්තාපයක් කිම පිරිවර ඇති ලොවෙක
මොන සතුටක් ද නුඹ මා ළඟ නැති කලෙක

රහසක් කුමට නොරැකිය හැකිනම් එකට
ඉගියක් කුමට පෙනෙනා ලෙස දුන් කලට
පහසක් කුමට නොදැනෙන සේ උන් කලට
නුඹ මට කුමට අයිතිය නැති වූ කලෙක

--නදීකා රත්නභාහු ❤️

දවස් තුනකට ඇවිත් නුඹ කරපු හරියක්.....

දවස් දෙක තුනකට නුඹ කරපු හරියක්
හිටි හැටියෙ මහ වැස්ස ඇද හැලුණු හැටියක්
මහවැලිය මේ තරම් චණ්ඩ වූ තරමක්
දළදාවවත් හිතන්නැතුව ඇති මෙවගක්




කඳු වැටිය ඉරාගෙන ආවෙ සැඩ සුළඟක්
උන් හිටපු තැන් නැතිව පණ යදින සෙනඟක්
කන්ද පාමුල ලඟදි දැනුනෙ මට සිහියක්
එතකොටයි දන්නෙ මං වෙලා මහ විපතක්

එකම වත්කම නුඹයි මට තිබුණ සතුටක්
පණ පිටින් උදුරගෙන පස්පිඩක කැකුලක්
හොයනවා ඇති මගේ උණුසුමේ සුවඳක්
ඉතිරි කොට තනි කෙරුවෙ ඇයි ද මම විතරක්

අම්මෙකුට උහුලන්න පුලුවන්ද මෙහෙමත්
පියවුනා නම් මොකද මේ මගේ දෑසත්
මැරි මැරී උපදින්න සසරෙ කල නපුරක්
දවස් තුනකට ඇවිත් නුඹ කරපු හරියක්
(නිමින්න: දිට්වා නිසා සිය පවුල අහිමි වූ මවකගේ ශෝකාලාපය)

--සකුන්තලා සෙනෙවිරත්න ❤️

වෙනසක අරුමය



සාමා අමර සල් ගස් හැර ගිහිල්ලා
ඒ සල් ගසුත් දැන් ටික ටික කපාලා
ටාරෝ මුරුත් රට අතහැර ගිහිල්ලා
වට්ස්ඇප් එකට හෝම්වර්ක් ඇවිල්ලා....

සෙල්ලම් ගෙදර පාලුවටම ගිහිල්ලා
කෝම්පිට්ටු නෑ කලෙකින් ඉදීලා
පොල්පිති ගොනත් වත්තෙන් පැන ගිහිල්ලා
ඇගිලි තුඩට ලෝකෙම දැන් ඇවිල්ලා.....

මල්වල සුවඳ කලෙකින් නෑ දැනීලා
අඹ කජු පේර නෑ කලෙකින් රස බලලා
බැට් එක, බෝලෙ ගේ මුල්ලේ හිර කරලා
වැට් ජී පිට, පෙම්නිට වැඩ ගොඩ ගැහිලා.....

පොත් බෑගයේ බර පිටමත තියාලා
හවස් වරුවලත් සිප් කිරි සොයාලා
ඉර හද දෙකම අහසින් බැස ගිහිල්ලා
කාලය කිමද මේ තරමට වෙනස් වෙලා.....

--සකුන්තලා සෙනෙවිරත්න ❤️

ගල් පිළිමය



ඇගේ කඩු තුඩු වදන් අභියස
බිඳී ගිය දුක්බරිත හදවත
මියැදෙන්න පන අදින මොහොතක
ශූන්‍ය විය අවසන් පැතුම් පොද...

එදා හසඟන මෙදා පුරඟන
අතින් අත යන අරුම දුටුවිට
ස්නේහයේ වරපට මුදා හැර
පලා ආයෙමි නදුන් උයනට...

කසී සලු හැඳ දඬුමොණරෙ පිට
රාජසහිකෙකු සමග තෙදබල
සුපෙම්බර බස් මුමුණනා කත
ජුගුප්සාවක් හදට එක් තළ...

දුන්නු ප්‍රේමෙට ලැබූ අවමන
ලතෙත් හදවත ගලක් කරලන
ගිරි බිතක් තුළ සැඟව ගත්තෙමි
යළිත් ලෝකය නොදකිනා ලෙස...

--ගිවෝන් යානිකා නන්දසේන ❤️

පිරියම්



සඳකැන් වැටී දිලිසෙන මල් පාර දිගේ
හසකැන් නගා පියමැන යමි එළිය දිගේ
තරුකැන් රහස් පවසන විට වලා දිගේ
මල්කැන් සුළං හා නැටුවා යාය දිගේ

තෙරක් නොමැති සිතුවිලි රළ පහරදිදී
හදක් නගන සැක සංකා ඉවුරු බිඳී
රසක් සොයන විට කවියක් අතරවැදී
බිඳක් නතරවී යන්නට වරම් මදී

වීදුරු පහනෙ රූ ඡායා ඇඳෙන පැයේ
රුදුරු සිසිල ගත දැවටී පලා ගියේ
පිදුරු අතර පිපි බිම් මල් දිලෙන රැයේ
සිදුරු වසා පිරියම් කරගනිමි ළයේ

--ගිවෝන් යානිකා නන්දසේන ❤️‍🩹

සිත්තමක්...

කාලයේ වැලිතලා අතර සැඟවුණු රුවක්
ඉඳහිටක හදමඩල පහුරු ගානා හැඩක්
ජවය හීනව ගියද සිත සවිය ඇත මදක්
ඇස් මානයේ මැවෙයි දේදුන්න වැනි ළඳක්

සමු අරන් අප අපෙන් ගෙවී ඇත දිගු කලක්
එයින් පසු දුටුවෙ නෑ නුඹව යළි කිසි දිනක්
බොඳ නොවුණු රෑ රටා අතර නොතබා ඉඩක්
මවාගෙන හදවතේ අඳින්නෙමි සිත්තමක්

පින්සලේ පහර මැද නොරිදවා සඳ වතක්
රෝසපැහැ කොපුල්තල සිපගන්න වෙයි හිතක්
ඇද පලුද්දක් නැතිව ඇන්දමුත් දෙව්දුවක්
අරුමයකි නෙත් අගින් පෙනෙයි කඳුලක තෙතක්

දුර ඇත අතීතෙට පියාඹලා එක් වරක්
ළය පුරා සෙනෙහසින් තුරුලු කරගමි මදක්
ඔය නෙතේ කඳුලු බිඳු පිසලන්න දෙනු ඉඩක්
මියෙනතුරු රැගෙන යමි ආදරේ මහමෙරක්



--ගිවෝන් යානිකා නන්දසේන ❤️‍🩹

ටිව මං ඇන්දේ ඒ ලස්සන ම අහසය



සුදු පාට කොළය ගෙන මං මවපු හීනය
ටිව කියනවා අඳින්නලු කැමති චිත්‍රය
සුදු වළා හැඩ දමා අඳිනකොට අහසම
පායලා තරු දෙකක් ඒක කහ පාටය


රෑ අහසේ සඳ එළිය ඇවිත් යන ලස්සන
එතැන මං නිල් පාට විතරයි ගෑවෙම
අම්මාත් මං එක්ක අල්ලාගෙන අත්දෙක
හඳමාමා බලන්නට යනවා රෑ අහසට

ටීවගෙන් තරු ගන්න පෙන්නුවා චිත්‍රය
ගුරුතුමිය ඇන්දා ලොකු කතිරයක් ඒ මත
නිල් පාට කලුපාට විතරයි ද තිබ්බෙම
තරහා ගිය ඈ මගෙන් ඇහුවා ඒ මොහොතෙම

රෑ අහස හැඩ වුනත් සල්ලි නෑ අම්මට
හැමදාම කියනවා අරං දෙන්නම් හෙට
මං මවපු චිත්‍රයේ මොනවා අඩුපාඩු ද
ටිව මං ඇන්දේ ඒ ලස්සන ම අහසය

--දිමන්ති රත්නායක ❤️

හැර ගිය මතක



සීතල සුළඟ සමගින් මුසුවන සුවඳ
සිහිනෙන් ඇවිත් හදවත පාරයි නිතර
විටකදි මැකී ඇදෙනා සිතුවම ලඟම
වෙනසක් නොකර නවතිමි ඉඩ ඇති තැනක

දහසක් පැතුම් දුර යන්නට ඉඩක් නොදී
භාර වුන තරම් දැන් අමතකත් ඇති
වේලාසනින් නුඹ නාවට කමක් නැති
ජීවිත ගමන හරියට පාරුවක් වැනී

රළ සිප ගන්න වෙරළක දී හමුවීම
මතකයි තදින් ඇන්දා සිතුවම් බොහොම
සිහිනෙන් සොයා ගව් ගණනක් දුර ආව
අහසක් තරම් නුඹ දුර ඇයි මට තාම

--දිමන්ති රත්නායක ❤️

ජීවිතේ මල් යළි පිපේ...



අනන්තය ඉම කෙළවරින් විත්
මුහුදු රළ වෙරළේ හැපේ
සිතේ තෙරපෙන කඳුළු සුසුමන්
අරන් යනු මැන රළ පෙළේ

බිඳෙන පෙණකැටි අතර විසිරී
පරණ මතකය යළි දිලේ
නිහඬ සයුරට රහස් මුමුණන
නැවතුමක් නැති ජීවිතේ

හුදෙකලාවට ඉඩ තබා නෙත
සුළඟ හා මුමුණන පැයේ
පැතුම් බොඳ වී ගියත් මතු දින
ජීවිතේ මල් යළි පිපේ...

--නිමල් ප්‍රනාන්දු 💔

ප්‍රේමයේ තරු එළිය



ප්‍රේමය කියන්නෙ ම
නොසැලෙනා මහ ගසකට
සුළඟ ඇවිදින් කොළ සලද්දී
ගසට බර නොම වෙන එකට

කඳුකරේ ගලනා දොළකට
ගල් අතර හැපෙනා එකට
ඒ පාරෙම නිදහසේ
යන්නට ඉඩ දෙන එකට

ප්‍රේමය කියන්නෙ ම
අහස තරමට පැහෙමින්
රෑ අඳුරට පුංචි හෝ තව
තරු එළිය වී ඉන්න එකට

--නිමල් ප්‍රනාන්දු ❤️

මතකය



අතීතය යළි නොඑයි තටු සළා ඉගිළිලා
හැඟුම් ගඟ ගලා යයි දිය රැළිති නංවලා
හද දොරටු බිඳ වැටී කාලයක් ගතවෙලා
හිත පිරුණු කාන්සිය කවියකට හැරවිලා

පෙළින් පෙළ මතකයන් දිග ඇදේ මාවතේ
කවියකට පදයක්ව පෙනී නෙපෙනී ගියේ
දැන් කුමට සුදු ඉරක් කලුම කලු මාවතේ
සුදු ඉරට පැහැය ඔබ සදා නොමැකී තියේ

ජීවිතේ මිහිරැතිම කාලයේ කතාවත්
දුක උරුම කටුකතම ප්‍රේමයේ ලතාවක්
දින දිනම ඔබෙ මතක විඳ විඳම ඉඳිමත්
හැම දිනක ජීවිතය මැරි මැරි ගෙවීමක්

--කේ. ජී. වයි. රජීත් කුමාරසිංහ ❤️

ධීවර ජීවිතය

පෑලවක සඳ කිරණ මුසු වෙලා
හිමිදිරියේ නිදි අඳුර
ජල කඳන් රැළි පිටින්
සුසුම් රැලි නංවලා
සිප ගනියි සුදු වෙරළ

අඹුදරුවො හාමතේ
සුවසේ නිදි පැල්කොටේ
හිස් ඔරුව අත වනයි
කඩිනමින් පිය නගයි
බඩ වියත රැකගැනුම
අරඹයා කඩිනමින්

රැදුරු ගිනි අව්ව පිරි
මීරිදියද සුව ගෙනෙයි
අකුණු වැසි පිරි අහස
වියරු රල කළඹවයි
අඹු දරුවො රූ මැවෙයි
හදගැස්ම ඉරිතලයි

--ප්‍රීති ලියනගේ ❤️



නිමිත්ත : සම්ප්‍රදායික මත බිඳින තරුණියක්



සංවාදේ...(මවගේ යෝජනාව)
තුන් වේලම බත් කාපන් දුවේ
ලංකාවයි මේක දුවේ...
රටේ ලෝකේ මිනිස්සුන්ට
අපි ඕනෑනේ උත්තර දෙන්නට...

දින දින ගෙවී තිහත් පැනලා නේ දැන්
හතලිහත් පනිනකන්ද ඉන්නෙ බලන්
ගැලපෙන මිනිස්සු නෑ මේ ලෝකේ
ඒ හින්දා ගලපාගෙන ජීවත් වෙයන් දුවේ...

හැමදාමත් ඉගෙන ගන්නවා විතරනේ
ලැබුණ දෙයක් තියෙනවද නුඹ ට දුවේ...

අපි නැති දා
වතුර උගුරක් වත්
දෙන්නේ කවුරු ද...
අපි ව නිදහස් කරන්න ට
කැමති වෙයන් කසාදෙක ට...

(දියණිය ගේ පිළිතුර.)
හැමෝම කෑවට තුන් වේලක්
බත් ම කන්න ඕනද මම ත්...
රටේ ලෝකේ අයට
ඇයිද යන්නේ පිළිතුරු දෙන්නට...

හතලිහ පැන්නත්
නොගැලපෙන මිනිහෙක්
බඳින්නෙ නෑ මං...


මව් පියනට විලංගු ලා
නිදහස අහිමි කර නෑ මං...

ඕනෑ නෑ වතුර උගුරු මට
මම මා වී ජීවිතය විඳිනු මිස
විහින් නැහෙන්නට
මරු කටට පනින්නේ නෑ...

ඉවසනු අම්මේ මතු දවසේ
අරමුණු ඉටුවන දා සැමට
සැනසීම හිමි වෙයි යසට
කර්මය විසඳාවි දිවිය මගේ...

--ඉෂානි ලියනගේ ❤️‍🩹

කැලණි කන්දේ දෝංකාරය...



සරසවි මවුන් මුවගට ලැබ දුන් අවිය
දිවියට මගේ ලැබ දුන්නේ නිති සවිය
ලෙලමින් කගපතක් විලසට සුරු කවිය
ඔබ නෙතු අසල වෙයි ජීවන සරසවිය

නින්දට නොපරදින කෙලි සෙල්ලමට බර
හොස්ටල් එකේ කොල්ලන් ඇත කට කාර
රුව ඇති ජූනියර් ගන්නට කර කාර
සෙලියුලරයෙන් මුමුණන බස් හරි සාර

හඬන හිනැහෙන විටෙක වැලපෙන
පෙමින් සැනසෙන එවුන් රඟදෙන
බලන හැමතැන තුටින හිනැහෙන
අසන් සරසවි නිවන් පුර ගැන

--ඒ.පී කුමාරසිංහ ❤️

මධුසමය..



ආලය එපා
වී තිබූ සමයක
දෙමාපිය පෙරැත්තට
වුණා නොහඳුනා
පුරුෂයකුගේ
පතිනිය වන්නට..

ඒක යෝජිත විවාහයක්
වුණත් දුටු විට ඔහු
ගැන ඇති වුණි
ප්‍රියමනාපයක්..
ඉතින් අමතක කොට
දුක්බර අතීතයක්
පැතුවා අරඹන්නට
ලස්සන ජීවිතයක්..

ඉදින් විවාහයට පස්සේ
අපි දෙන්නා මධුසමයට
යන අස්සේ මගේ හිත
සසලව තරමක් ගැස්සේ..

අවුත් මනහර කාමරයකට
උණා ඔහු සලුපිලි පැත්තකට
පෙම් හැඟුම් පෙන්නා
හැරුණා මා දෙසට..
හද වේගයෙන් ගැහෙන විට
දෑස් පියන් මා ඔහේ සිටින විට

ඔහු ලං වී මා වෙතට
දුන්නේය හාදුවක් මගෙ නලලට..

ඔහු මා දෙස බලා සිටියේය
මා ද ඔහු දෙස බලා සිටියෙමි..

“ මේ හාදුව නොයිඳුල් හාදුවක්නම් නොවේ..
මගේ හාදුවල පළමු හිමිකාරියත් නුඹ නොවේ..
ඒත් අදින් පසු මේ හාදුවල අවසන් හිමිකාරිය නුඹ ම වේ.."

මා ගල් ගැසුණෙමි
කුමක් කියමිද සිතුවෙමි
අවසන මා ඔහුට මෙසේ කීවෙමි..

" මා හාදු ලැබූ පළමු පුරුෂයා ද නුඹ නොවේ..
මා පුරුෂයකු ස්ත්‍රියකගෙන් පතන කන්‍යා භාවය සහිත එකියක නොවේ..
එහෙත් අද පටන් මගේ හද පුරා ජීවත් වන එකම පුරුෂයා නුඹ ම වේ.."

ඔහු මා දෙස බලා හිනහුණේ ය
ඔහුගෙ දෙනෙත් දිලිහුණේය..
ඒ තුළින් මා අපේ
අනාගතය දැක්කෙමි..
එහි මාද ඔහුද අපෙ පුංචි පැටවුනුත්
හරි ආදරෙන් ජීවත් වුණෝය.

--ඒ.පී කුමාරසිංහ ❤️

බඹර හදක්

මහා සඳ එකවර වතුරට වැටුණා දෝ
විලේ පිපුණු මල විල තුල තනි වුණා දෝ
බඹරිදුගෙ ආලය හද තුල තනි වුණා දෝ
ගලේ තැනු කෝච්චිලේ පඩුරක් ගැට ගැසුණා දෝ


රෑයේ පිපුණු සුවඳ විල පුරා පැතිරුණා දෝ
ඒ සුවඳත් සුළඟෙහි තනිවි ගසා ගියා දෝ
මලේ පෙති මත රැදී තෙත බින්දු බඹරාට කඳුලක් වුණා දෝ
මල නොදැනිම බඹරා දුර ඇතක තනි වුණා දෝ



මල පිපිලා හිනා වුණා අහසට
හිත ඇතුලෙන් ඇඬුවා රහසට
බඹර හදත් නැතිවම ගිය දාට
විල තාමත් පැල් රකිනවා අහසට

--ධම්න්ද මනම්පේරි ❤️

පපුවේ කඳුළු



යල් මෝසම් හත්දා වැහි
වැටෙන හිරිකඩේ
හීගතුවට පිලට වෙලා
හිදින ගොම්මනේ

යාලත්තේ හිටි පියවර
ගෙවෙන තත්පරේ
කෝලිච්චන් කියන නුඹව
මතකෙ නැගෙන්නේ

හිල්වුණු අහසින් වැහි බිඳු
වැටෙනා ගානේ
තනිපංගලමේ මේ හිත
උඹ ගැන හිතුවේ

පුරන් කොට කොටා තනිවම
හේනෙ පැල්පතේ
ඉන්න මගේ පපුවෙ කඳුළු
නෑ නුඹ දුටුවේ

--සකුන්තලා පෙරේරා ❤️

Unicorn මනාලියක් අවශ්‍ය කර තිබේ



කොලොස්ට්‍රෝල්,පෙෂර්,සීනි

අවධානමක් නැති

වකුගඩු දෙකම නිරෝගී,

අයිස්,හෙරොයින්

දෙසවත් නොබලන,

කරාබු නොදමන,

පච්ච කොටා නැති,

සෙනඟන් වීසා

එවරෙඩි

පුතුට.....

කොණ්ඩය ටින්ට් නොකළ,

ටික්ටොක් නොකරන,

දවසම online නැති,

පචව කොටා නැති,

වයිටින් වලින් හරි කමක් නෑ

සුදු ම සුදුවුණු.....

කොරියන් BTS උන්මාදයෙන්
නොපෙළෙන,

Ex පෙම්වතුන්ගේ බලපෑම් වලින් මිදුණු,

දේපොල නැතත්,

ඩිග්‍රියක් හිමි..

හුරුබුහුටි මනාලියක්

මව්පියන් සොයයි.....

--සකුන්තලා පෙරේරා ❤️

අහිමි නුඹට.....

සුවහසක් හසකැන් මැද

පැතූ එකම මල නුඹ විය

නෙලා ගැනුමට

නොහැකි වූ



සසර භව ඉම

පතා ආ මුත්

මේ භවයට

හිමි නොමැති වූ

තනිමඟ යනෙනු මිස

වෙන කිසිවෙකුත් නොපැතූ

භව ගමන කෙළවර

නිවනම පතමි මින් මතු

--ඩී. එල්. ඒ. නදීකා ❤️

හිත බැඳිලා



නුඹේ නොවන එක මොහොතක
නුඹත් එක්ක හිත බැඳිලා
අපිට අපේ රහස් තියෙන
මතකය ඇත යළි ඇවිදිල්ලා

හිමිදිරියක තුසර බිඳුවක්
වසන්තයක අඟ රැඳුණා
මතක සැගවූ රිදෙන පපුවක
කඳුලු අතරේ සුසුම් පිට කෙරුණා

අතීතයේ සිත අත ගෑ රිදුමක
සෙනෙහස විතරක් හමුවිලා
නුඹේ දෑස අතරෙම හිනහුණ
ප්‍රේමය සැනකින් හිත බැඳුණා

--දනන්ජ වණර්කුලසුරිය ❤️

කැකුළු මතක

කිරි සුවඳ නැහැවුණු

මා බොළඳ කාලේ

මතක සැමරුම් රන් හුයකි

ජීවිතේ සදා වෙලෙනා....



කැකුළු පා පොඩි කිති කැවෙන

සිනිඳු වැලි තලාවක

තැනූ වැලි මාලිගාවේ

පුංචි රැජිනයි මම එදා....

නැසියන් පිරිවරා

සොම්නසින් දිවි ගෙවුණු

සෙනෙහසේ ආලයට

සදා පෙම් බඳිමි මම.....

--එච්. එම්. ජී. ලහිරුණි ❤️

කෝවිඩ් ඉලව් ගෙය....

මාරි බිස්කට්
කහට තේ වතුර ටික
ගොක්කොලෙත්
ඉලව් ගෙදර...
වීය සංකර
බයිට්
නෙස්කැෆේ
ඉටිකොළ
රෙස්පෙක්ට් හව්ස් විලසට....
දැං ඉතින්
ඒ
මුකුත් අවැසි නැත.
එතූ ඇද රෙද්ද
වැසෙනසේ
පොලිතින් උරය
දමා ලාබ පෙට්ටියක
රෝහලෙන්
ආදාහනාගාරයට...
නගී දුම් රොටු ඉහළට
දුර සිට බලන් සිටිද්දී
ලහම ආදරණීයයන්
පමණකගෙ
සෝ සුසුම් හැඬුම් මැද
නිමාවේ
කෝවිඩ්
ඉලව් ගෙය.....



--සමන්තිකා බාලසූරිය ❤️

නොමියන ජීවිත

කදුලු ගලනා දෙනෙතට - හැකිද නුඹට සිනාවක් දෙන්න

සුසුම් හෙලනා හදවතට - හැකිද නුඹට සැනසීමක් වන්න

මියැදෙන වෙරදරන දිවියට - හැකිද නුඹට බලාපොරොත්තුවක් වන්න

රෝගී වූ ජීවයට - හැකිද නුඹට ඔසුවක් වන්න

පිපාසිත මිනිසුන් හට - හැකිද නුඹට දිය දෝතක් වන්න

ගිනි ගන්නා මිනිසුන් ළඟ - හැකිද නුඹට සිසිලසක් වන්න

වැටෙන වෙලාවට මිනිසුන් - හැකිද නුඹට අත දෙන්න

එකට එක කරන මිනිසුන් මැද - හැකිද නුඹට අවංකව සතුටු වන්න

ඉරිසියාව පිරුණු මේ ලෝකයේ - හැකිද නුඹට අනුකම්පා කරන්න

නොමියන ජීවිත අතර - හැකිද නුඹට මියැදෙන කෙනෙකු වන්න

--මනෝහා වික්‍රමතිලක 💔



SRI LANKA LIBRARY ASSOCIATION

PRATHIRAWA

E-MAGAZINE | VOL. 4 | 2026

Explore the pages of knowledge,
creativity and inspiration.

SCAN TO READ THE MAGAZINE

ISSN 2950-2778

Published by the Sri Lanka Library Association